SUPPLEMENT

TO

# The Ceylon Government Gazette,

FRIDAY, JANUARY 11, 1907.

[Proclamation regarding the By-laws of the Municipal Council of Kandy.]

ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් දෙවාවදාළාවූ

## ප්‍ර කා ශ ප ත්‍ර ය යි.

---

යටත් ප්‍රදේශ ඇතුළුවූ ලංකාවීපයෙහි ආණ්ඩුකාරධූරය හා ප්‍රධාන සෙනාධිපතිධූරය දරන්නාවූ
ශාන්ත මයිකල් හා ශාන්ත ජෝර්ජ්ගේ අතිවිශිෂ්ඨ පදවියෙහි ශ්‍රෙෂ්ඨාධිකාරි
මන්ත්‍රිනාමොපලක්ෂිත නෛකශ්‍රීන් විරාජමාන ශ්‍රීමත් හැන්රි
ආර්තර් බ්ලෙක් උතුමානන්වහන්සේ විසිනි.

**හැන්රි ඒ. බ්ලේක්.**

වර්ෂ 1887තේ 7 වෙනි ආඥාපණතේ නියෝග ඉෂ්ටකිරීම පිණිස උචිතනායයිද යොග්‍යයයිද පෙනීයන්නාවූ අතුරු පණත් කලින්කල පැණවීමටද, එසේ පණවනලද අතුරු පණත් අවලංගුකිරීමට හෝ අලුත්වැඩියාකිරීමට හෝ මාරුකිරීමට හෙවත් වෙනස්කිරීමටද, නාගරිකසභාවට පිළිවන්යයි වර්ෂ 1901කේ 8 වෙනි ආඥාපණතේ 4 වෙනි වගන්තියේ නියමකරන ලද්දේවීද. තවද කිසියම් අතුරු පණතක් හෝ යම් අතුරු ආඥාපණතක අවලංගුකිරීමක් හෝ අලුත්වැඩියාකිරීමක් හෝ මාරුකිරීමක් හෙවත් වෙනස්කිරීමක් හෝ නීතිප්‍රතිපාදක මන්ත්‍රිසභාවේ අනුමතය පිට ආණ්ඩුකාරයාණන් විසින් ස්ථිරකරනතුරු වලංගු නොවන්නේයයිද, සියලුම අතුරු ආඥාපණත් එසේ ස්ථිරකල ඉක්බිති ඉංග්‍රීසි සිංහල දෙමළ යන භාෂාවලින් පිට පිටම දෙවරක් ආණ්ඩුවේ ගැසැට්පත්‍රයේ ප්‍රසිඬකොට නීතිදායක මන්ත්‍රිසභාවාර එවකට පවත්නේවීනම් ඒ සභාව ඉදිරියේ තබන්ට ඕනෑයයිද නොහොත් එවකට නොප වත්නේවීනම් ඊලඟ වාරය පටන්ගත්පසු හැකි පමණ ඉක්මනින් ඒ මන්ත්‍රිසභාව ඉදිරියේ තබන්ට ඕනෑයයිද, එසේ තබා 40 දිනක් ඇතුළතදී ඒ නීතිදායක මන්ත්‍රිසභාව ඉන් යම් අතුරු ආඥාපණතකට විරුඬවීනම් එකී මන්ත්‍රි සභාව විසින් නිසිප්‍රකාර යෝජනාකොට අතුරු ආඥාපණත අලුත්වැඩියාකළ හැක්කේයයිද නොහොත් නිෂ්ප්‍රභාකළ හැක්කේයයිද, එසේ එකී මන්ත්‍රි සභාව විසින් අලුත්වැඩියාකරනලද සියලුම අතුරු ආඥාපණත් සහ එසේ අලුත් වැඩියාකිරීමක් හෝ නිෂ්ප්‍රභාකිරීමක් හෝ නොකරනලද සියලුම අතුරු ආඥාපණත්ද ඉංග්‍රීසි සිංහල දෙමළ යන භාෂා වලින් පිට පිටම දෙවරක් ආණ්ඩුවේ ගැසැට්පත්‍රයේ ප්‍රකාශකරන්ට ඕනෑයයිද, එසේ ඒ ආණ්ඩුවේ ගැසැට්පත්‍රයේ ප්‍රකාශකරනලදුව වලංගුවීමට පැමිණෙන්නේයයිද, එසේ වලංගුවීමට පැමිණෙනලදුව ඉහතකී ව්‍යවස්ථාවේම පණවන ලද නියෝගයෙන් ව්‍යවස්ථාසිකව බලසහිතව වලංගුව පිළිපැදියයුතුව පවත්නේයයිද එකී වර්ෂ 1901කේ 8 වෙනි ආඥාපණතේ 6 වෙනි කාණ්ඩයේ 1 වෙනි 2 වෙනි අතුරු කාණ්ඩවල නියමකරනලද්දේවීද.

තවද මහනුවර නාගරික සභාව විසින් මීට යාකරනලද ලෙඛනයේ අඩංගු අතුරු පණත් ඉහතකී වර්ෂ 1901කේ 8 වෙනි ආඥාපණතේ 4 වෙනි කාණ්ඩයේ නියෝග යටතේ පණවනලදුව, එම ආඥාපණතේ 6 වෙනි කාණ්ඩයේ 1 වෙනි උපකාණ්ඩය යටතේ කාරකමන්ත්‍රිසභාවේ අනුමතය පිට ආණ්ඩුකාරයාණන් විසින් ස්ථිරකරනලදුව, වර්ෂ 1906ක්වූ අගොස්තු මස 3 වෙනි 10 වෙනි දිනවල පිටපිටම දෙවරක් ඉංග්‍රීසි සිංහල දෙමළ යන භාෂාවලින් ආණ්ඩුවේ ගැසැට් පත්‍රයේ ප්‍රසිඬකොට, නීතිදායක මන්ත්‍රි සභාවාරය එවකට පවත්වනලදුව එම සභාව ඉදිරියේ තබනලද්දේවීද.

තවද එකී අතුරු පණත් එකී නීතිදායක මන්ත්‍රි සභාව විසින් ඒවා අලුත්වැඩියා කිරීමක්වත් නිෂ්ප්‍රභාකිරී මක්වත් නොකරනලද්දේවීද.

එහෙහෙයින් ඉහතකී ආණ්ඩුකාරයාණන් වන අපට යටකී ප්‍රකාර ලැබීතිබෙන බලය කරණකොටගෙන මිට යාකරනලද ලෙබනයේ අඩංගු එකි අතුරු පණත් මේ වකවානුවෙන් පටන්ද ඉන්පසුද වලංගුවට පැමිණෙන බව අප විසින් මෙයින් ප්‍රකාශකරනබැව් සියල්ලන් විසින් මෙව්ට දැනගණිත්වා.

අපගේ ස්වාමින්වහන්සේගේ වෂියෙන් එක්වාදහස් නවසියහයක්වූ දෙසැම්බර් මස 18 වෙනි දින ලංකාවිපයේ කොළඹදී දෙවාවදුරනලදී,

උතුමාණන්වහන්සේගේ අණපරිදි,

ජී. ඇම්. පවුලර්,

වැඩබලන මහ ලේකම්තැන වමහ.

දෙවියන්වහන්සේ මහාරජාණන් රක්‍ෂාකරනසේක්වා.

---

## ලේඛනය.

## මහනුවර නාගරික සභාවේ නගර අඥපණත්.

---

### 1 වෙනි කාණ්ඩය.

### නිල පිහිටුවීම.

නිල සහ පඩි.

1. කලින්කල සම්මතකොට නිල ඉපදවීම සහ එසේ උපදවනලද එක එක නිලයට යොග්‍යයයි සභාවේ කල්පනාව පරිද්දෙන් පඩි නියමකෙරීමත් සභාවට යුතුවන්නේය. යම් නිල ධාරියෙක් පත්කරගැණිමට සභාපතිතැනට නීතියේ ප්‍රකාර බලය ඇත්තේවේද, ඒ නිලධාරියාට ගෙවියයුතු පඩිය, ඒ නිලයට සභාසම්මතයෙන් නියමකර තිබෙන ගණනට වැඩිනොවන්නේ නම්, සභාපතිතැන විසින් නියමකෙරීම පිළිවන්වේ.

කාරක සභාව විසින් සුදුසුයයි පිළිගතහැකි පඩිපිට සභාව නියමකළේවිනම් එක්කෙනෙක් එක නිලයකට වඩා නිලදැරීම හෝ යම් හදිසියකදී ඕනෑකරන්නාවූ වෙන නිලධාරීන් කාරක සභාවේ කැමැත්තපිට සභාපතිතැන විසින් පත්කරගැණිම හෝ මෙහි අඩංගු කිසිවකින් වලක් වනු නොලැබේ.

නිලධාරීන්ගේ කටයුතු.

2. සභාපතිතැන විසින් වරින්වර නියමකරන්ට යෙදෙන පරිද්දෙන් සභාවේ ලේකම් තැනද අනිකුත් නිලධාරීන් සහ මෙහෙකරුවන්ද ඒ ඒ කාලයන් ඇතුළතදී ඒ ඒ කටයුතු ඉෂ්ටකෙරීම යුතුවේ.

---

### 2 වෙනි කාණ්ඩය.

### වැඩසල නියමකෙරීම් ආදිය.

සාමාජිකයන්ගේ මූලස්ථානකම්.

3. සභාව සම්බන්ධවූ සියලු කටයුතුවලදීම සාමාජිකයන්ගේ මූලස්ථානකම්, සහ වැඩිහිටි කමුත් පහත සඳහන් පරිද්දෙන් පිළියෙළකරණු ලැබේ, එනම් :—

සභාපතිතැන ලඟට ඒ ඒ සමාජකයන් පත්කරගැණිමෙන් නොහොත් තෝරාගැණිමෙන් වැඩිහිටි පිළිවෙළට සහ ඉහත්දී සිටි සාමාජිකයන් නැවතත් පත්කරගන්ට නොහොත් තෝරා ගන්ට යෙදුනොත්, ඔව්හු නොකඩව සභාවේ සාමාජිකකම්කෙරීමෙන් වැඩිහිටි පිළිවෙළටද සාමාජිකයන් පෙළගසනු ලැබේ.

සභාපතිතැනගේ යුතුකම්.

4. සාමාජිකයන් සභාවේ හසුරවීම සහ ඒ හැසිරීම සම්බන්ධවූ සියලු කාරණ බේරාදීමද සභාපතිතැන විසින් කරණුලැබේ.

වැඩ පිළිවෙළ.

5. සභාව විසින් එහි රැස්වීම්වලදී කළයුතු වැඩ පහත සඳහන් පිළිවෙළින් කරණුලැබේ, එනම් :—

වාතී.

(ඒ) පසුගිය රැස්වීමේ වාතීාව කියවීම සහ (උවමනාවිනම්) වැරදි ශුඬකොට ස්ථිරකෙරීමද කරණුලැබේ.

ගණන් දීම.

(බී) මාස්පතා අයවැය ගණන්ද, බැංකු පාස් පොතද, වැඩ දෙපාත්මේන්තුවේ කෙරී තිබෙන වැඩ ප්‍රමාණයේ සහ පොදු ආදායම් එකතුකෙරීමේ වැඩ ප්‍රමාණයේත් රපෝර්තුද, නාග රික මහෙස්ත්‍රාත්තැන විසින් කරතිබෙන වැඩවල සටහනද, සනීපාරක්‍ෂක මූලාදැනිතැනගේ රපෝර්තුව සහ අනිකුත් නාගරික මූලාදැනින්ගේ රපෝර්තුද සභාවට ඉිප්පුකරණු ලැබේ.

ඉල්ලුම්පත්‍ර පෙත් සන් ආදිය.

(සී) සභාවට ඉිප්පුකරණලද ඉල්ලුම්පත්‍ර, පෙත්සම්, පැමිනිලි සහ ලියුම් සභාව ඉදිරියට ගෙණ ඒ සම්බන්ධව කළයුතු දේ නියමකරණුලැබේ.

ප්‍රශ්න.

(ඩී) යම් යම් ප්‍රශ්න ගැන කලින් දැනුම්දී තිබේද, ඒ ඒ ප්‍රශ්න විචාරණු ලැබේ.

යෝජනා ගැන දැන්වීම.

(ඊ) යම් යම් යෝජනා අනිත් සභාවාරයේදී ඉදිරියට ගෙණඑන බව දැනුම්දෙනු ලැබේ.

යෝජනාකෙරීම්.

(ඇෆ්) යම් යම් යෝජනා ඉදිරියට ගෙණඑනු ලැබේ.

කාරක සභා රපෝර්තුව.

(ජී) කාරක සභාවල රපෝර්තු ඉදිරියට ගෙණ එවෙලේම ඒවා කල්පනාකෙරීමේ වැඩ කරන්ට සභාව නියමකරනොගන්නේවිනම් ඒවා කල්පනාකෙරීමට දිනයක් නියමකර තබනු ලැබේ.

දිනයට නියම අන්තුන් වැඩ.

(එච්) මෙහි ඉහත නියමකරණලද පිළිවෙළ වෙනස්කෙරීම සුදුසුයයි සභාවට පෙණී එසේ කරන්නේවිනම්, රැස්වීම ගැන කරණලද දැන්වීම පත්‍රයෙහි සඳහන් වෙනයම් වැඩපල කරගත යුතු ලැබේ.

මහ සභාවේ කාරකත්වය.

6. කොයිවිටකවී නමුත් මුළු මහ සභාවම ඇතුළත්වූ කාරක සභාවක් මෙන් සැදී වැඩ පටන්ගෙණ කාරක සභාවේ යෝජනා මහ සභාව විසින් බේරුම්කෙරීම එම මහ සභාවට පිළිවන් වේ.

පෙත්සන් සුශික්ෂිත වියයුතු බව.

7. යම් සාමාජිකයෙක් විසින් ඉදිරියට ගෙණඑන පෙත්සමක හෝ වෙන ලියවිල්ලක හෝ වගවාසගම් සහමුළින්ම සුශික්ෂිත ස්වභාවෙන් යුක්තවීම ගැන ඒ සාමාජිකයා වගබලාගත යුතුයි.

පෙත්සන් ඉදිරියට ගෙණඒම.

8. පෙත්සමක් හෝ වෙන ලියවිල්ලක් හෝ ඉදිරියට ගෙණඑනවිට එහි භාවය දුහුඹින් කියා සිටිය යුතුවේ. නිසිප්‍රකාර ස්ථිරකරණලද යම් සාමාජිකයෙකුගේ යෝජනාවක් පිට ඒ ලියවිල්ල කියවිය යුතුද නැද්ද යන්න ප්‍රශ්නකරණුලැබේ.

පෙත්සන් විභාග කෙරීම.

9. සභාවේ යම් ක්‍රියාවකින් හෝ නියෝගයකින් හෝ ප්‍රයත්නයකින් හෝ යම් පුද්ගලික අයිතිවාසිකම්වලට විරුඬකම් පැමිණියේවිනම්, එසේ විරුඬකම් පැමිණියාවූ සියලුදෙනාගේම පැමිනිලි, පෙත්සන්පිට, තමතමන්ගෙන්ම හෝ ඒ වෙනුවෙන් ක්‍රියාකරණ නීතිඥයෙකුගෙන් හෝ මහ සභාව විසින් කාරක සභාව මෙන් සැදී විභාගකරණුලැබේ.

සාක්ෂි ලැයිස්තු.

10. සාක්ෂි විභාගකෙරීමට අරමුණුකරණලද්දේවිනම් එම සාක්ෂිකාරයින්ගේ පදිංචි ස්ථානද, නම් සහ රක්ෂාවල්ද අඩංගු ලැයිස්තුවක් එසේ විභාගකෙරීමට නියම දිනට අඩුතරමින් තුන් දවසක් කල්මත්තෙන් එම සාක්ෂි විභාගය ඕනෑකරණ පෙත්සන්කාරයා විසින් හෝ සභාවේ සාමාජිකයා විසින් හෝ සභාවේ ලේකම්තැනට භාරදිය යුතුයි.

සාක්ෂි සිතාසි.

11. එවිට මෙහි අගට යාකරණලද උප ලේඛනයේ "ඒ" අක්ෂරය ලකුණුකර තිබෙන සටහනේ ප්‍රකාර සිතාසියක් සභාපතිතැනගේ අවසරපිට ඒ එක එක සාක්ෂිකාරයාට සභාවේ ලේකම්තැන විසින් යවන්ට යෙදී ඒ එක එක සාක්ෂිකාරයාගේ පැමිණීමට නියමකරණලද වේලාවට අඩුතරමින් 48 පැයකට ප්‍රථමයෙන් ඒ සිතාසිය එම සාක්ෂිකාරයාට දීමෙන් හෝ ඔහු පදිංචි ස්ථානයේ තබා ඒමෙන් හෝ සභාපතිතැන විසින් ඒ සඳහා පත්කරණලද කෙනෙක් විසින් භාරදෙනු ලැබේ. එසේ සිතාසිකරණුලැබූ සෑම සාක්ෂිකාරයෙක්ම එම සිතාසියට කීකරුවීමට බැඳිසිටින්නේය.

පෙත්සන් ගැන කියන සාක්ෂි.

12. සෑම සාක්ෂිකාරයෙකුගේම සාක්ෂිය සභාවේ ලේකම්තැන විසින් ලියා ඒ ඒ සාක්ෂිකාරයාට කියවා දියයුතුයි. එවිට එහි යම් වැරද්දක් ශුඬකෙරීම ඕනෑවිනම්, එසේකෙරීම සාක්ෂිකාරයා විසින් ඉල්ලාසිටිය හැකිවේ. තවද එසේ යම් වැරදි ශුඬකෙරීමක් නොකරණලද්දේවිනම්, ඒ සාක්ෂිය ලියාගත් හැටියටම තිබෙන්ට යෙදෙනවාත් ඇර පසුව වෙනස්කළහැකි නොවේ.

ප්‍රශ්න සහ යෝජනා ගැන කලින් දැන්වීම.

13. ප්‍රශ්නයක් විචාරීමට හෝ යෝජනාවක් කෙරීමට හෝ අදහස් ඇති කොයියම් සාමාජිකයෙක් වුවත් (සභාවේ අවසරපිට නොවිනම්) එසේ ප්‍රශ්නයක් විචාරීමට නොහොත් යෝජනාවක් කෙරීමට අදහස් ඇති බව ප්‍රථම සභා රැස්වීමකදීවත් තමන් ඒ ප්‍රශ්නය විචාරීමට නොහොත් යෝජනාව කෙරීමට අරමුණුකරගෙණ සිටින දිනයට අඩුතරමින් තුන් දවසකට ප්‍රථමයෙන් සභාවේ ලේකම්තැන වෙත යවනලද ලියමනකින්වත් කලින් දැන්විය යුතුයි.

කලින්දන්වන්නේ කෙසේද යන වග.

14. එසේ විචාරීමට අදහස්කරණලද ප්‍රශ්නයේ නොහොත් ඉදිරියට ගෙණඑන්ට අදහස් ඇති යෝජනාවේ පිටපතක් ඉහතකී ප්‍රකාර කලින් දැනුම්දෙන සෑම සාමාජිකයෙක් විසින්ම සභාවේ ලේකම්තැනට භාරදිය යුතුවේ.

ප්‍රශ්න විචාරීම.

15. යම් ප්‍රශ්නයක් විචාරීමේදී ඒ ප්‍රශ්නය පැහැදිලිව පෙන්වීමට ඕනෑකරණ ප්‍රමාණයට වඩා යම් තර්කයක් හෝ අදහසක් හෝ ගෙණහැර දැක්වීමවත්, යම් සිදුවීමක් කියා සිටීමවත් නොකළ යුතුවේ. තවද ඒ ප්‍රශ්නය සම්බන්ධවූ කාරණය ගැන කොයියම් සාමාජිකයෙක් විසින්වත් විවාදකෙරීම නොපිළිවන් වේ.

ප්‍රශ්නය සභා සම්මුතියට පැවරීම.

16. යම් යෝජනාවක් ඉදිරියට ගෙණ ස්ථිරකරණලදුව ඒ සම්බන්ධවූ විවාදය අවසානුවූවිට ඊට හේතුවූ ප්‍රශ්නය බේරීම සභාපතිතැන විසින් සභාසම්මුතියට පවරණු ලැබේ.

ස්ථිර නොකරණලද යෝජනා.

17. ස්ථිර නොකරණලද යම්කිසි යෝජනාවක් ගැන විවාදකරණු නොලැබේ; එහි යම් සටහනක් වාර්තාවේද අඩංගුකරණු නොලැබේ.

අවුතු නොවන නියමයන්.

18. යෝජනාකෙරීමක්වත් ස්ථිරකෙරීමක්වත් නැතුව සභාවේ වැඩවල වාර්තා ස්ථිරකර ගැණීම හෝ කලින්කල පැවති තොරතුරු ලියා තබාගැණීම හෝ යන මේ අවුතු නොවන නියමයන් නිශ්චයකරගැණීම සභාපතිතැන විසින් සභා සම්මුතියට පවරණු ලැබේ. මූලාසනයට සභාපතිකෙනෙක් තෝරගැණීමද සමහර වැඩ ඉතිරි වැඩවලට පළමුකොට කෙරීම සහ රැස්වීම කල්දැමීමද යනාදිය ගැණ කරණලද යෝජනා ස්ථිරකෙරීම ඕනෑකරණ නමුත් එය ලියවිල්ලක් පිට නොවේ.

යෝජනා අහක්කර ගැණීම.

19. යෝජනාවක් ඉදිරියට ගෙණෙනලද යම් සාමාජිකයෙක් විසින් සභාවේ අවසරය පිට ඒ යෝජනාව අහක්කරගැණීම හැකිවන්නේය.

විවාදකෙරීමේ නියෝග.

20. සෑම සාමාජිකයින්ම සභාවේදී කථාකරණවිට මූලාසනාරූඪතැනට ආමන්ත්‍රණය කෙරීම සහ නැඟිසිට කථාකෙරීමත් කළයුතුවේ. කථාකරන්නාට දුහුඹු සටහන් බලාගන්ට හැකි නමුත් ලියනලද හෝ අච්චුගසනලද හෝ වාක්‍යයක් කියවීමට ඉඩනොදෙනු ලැබේ.

සාමාජිකයන් දෙදෙනෙක් කථාකෙරීමට නැඟිටීම.

21. පළමුවෙන් නැඟිටිනලද සාමාජිකයාගේ කථාව ඇසිය යුතුවේ. සාමාජිකයන් දෙදෙනෙක් හෝ වැඩිදෙනෙක් හෝ කථාකිරීම පිණිස එකවිට නැඟිසිටියේවිනම්, ඔවුන්ගෙන් සභාපතිතැනගේ කල්පනාවේ හැටියට පළමුකොට කථාකෙරීමට පිළිගතයුතු තැනැත්තාට සභාපතිතැන විසින් එසේ කෙරීමට නියමකළ යුතුවේ.

යෝජනාවක් පිළිබඳව එය පැහැදිලිකරදීම ආදිය පිණිස ඇර සාමාජිකයින් එක වරක් පමණක් කථාකළයුතු බව.

22. යම් යෝජනාවක් ගැන විවාදකරණවිට එය පැහැදිලිකරදීම පිණිස හෝ කාරක සභාවේදී යම් කාරණයක් ගැන විවාදකෙරීමේදී හෝ ඇර, කොයියම් සාමාජිකයෙකුටවී නමුත් එකවරකට වඩා කථාකෙරීමට අවසර නැතිවේ; එහෙත් ස්ථිර යෝජනාවක් ඉදිරියට ගෙණාවූ යම් සාමාජිකයෙකුට, එය වෙනස්කෙරීමක් නොවූ පිළිතුරක් දීමට ඉඩදෙනු ලැබේ. එසේ පිළිතුරුදී ඉවරවූ වහාම ඒ යෝජනාව සභා සම්මුතියෙන් බේරගැණීමට පවරණු ලැබේ.

අයෝග්‍ය අදහස් පිට දෙස් පැවරීම නුසුදුසු බව.

23. අයෝග්‍ය අදහස්පිට කරන්ට යෙදෙන සියලුම දෙස් පැවරීම් අතිශයින් චාරිත්‍ර ධර්මයට විරුඬ ක්‍රියාවක් මෙන් සලකන්ට යෙදෙනවාත් ඇර, එබඳු ක්‍රියාව වාර්තා පොතේ සටහන් කර තැබීම උවමනායයි සභාවේ වැඩිදෙනෙකුට පෙණියේ නම් එසේද කරණු ලැබේ.

**විවාදය කල්දැමීම.**

24. යම් ප්‍රශ්ණයක් ගැන විවාදකෙරීමක් කල්දැමීමට කොයි වේලාවකදී වී නුමුත් යෝජනාකෙරීම සාමාජිකයෙකුට පිළිවන්වාත් ඇර එය ස්ථිරකරණු ලැබීනම්, එකෙණෙහිම වැඩිදෙනාගේ කැමැත්ත ගැණීමට පවරණු ලැබේ.

**යෝජනා සහ එවා වෙනස්කෙරීම් ලියාදීම.**

25. යෝජනාවක් හෝ එය වෙනස්කිරීමක් හෝ කරන්නාවූ සාමාජිකතැන ඒ සෑම යෝජනා සහ වෙනස්කෙරීම්ද ලියවිල්ලක බහා සභාවේ ලේකම්තැනට භාරදියයුතු වේ.

**වෙනස්කරණලද යෝජනාවක් නැවතත් වෙනස්කළ නොහැකි බව.**

26. විවාදකරගනයන යම් යෝජනාවක වෙනස්කෙරීමක් නැවතත් වෙනස්කෙරීමට යෝජනා කළහැකි නොවේ. එහෙත් වෙනස්කරණලද යම් යෝජනාවක් ස්ථිර යෝජනාවක්වූ හැටියේම එය නැවතත් වෙනස්කිරීමට යෝජනා කළහැකිවාත් ඇර, එසේ ස්ථිරකරණලද්දේ වීනම් එයද විවාදකරණු ලැබේ.

**සාමාජිකයින් කැමැත්තදීමට බැඳිසිටින බව.**

27. යම් ප්‍රශ්ණයක් සභාසම්මුතියෙන් බේරගැණීමට පැවරුවිට සභාවට පැමිණ සිටින වැඩිහිටිකමින් බාල සාමාජිකතැනගෙන් පටන්ගෙණ ඉදිරිපිට සිටින සෑම සාමාජිකයෙක්ම ඊට පක්‍ෂව හෝ විපක්‍ෂව හෝ තමන්ගේ කැමැත්තදීමට බැඳිසිටින්නේය. සභාවේ ලේකම්තැන විසින් එසේ කැමැත්තදීමේ ගණන් සටහන්කරණලදුව ඉක්බිති සභාපතිතැන විසින් ඒ පක්‍ෂ විපක්‍ෂ දෙපාර්ශවයේ කැමැත්ත දුන් තැනැත්තන්ගේ ගණන් වෙන්වෙන් වශයේ ප්‍රකාශ කරණු ලැබේ.

**අඩු පක්‍ෂයේ සාමාජිකයාගේ විරුඬය ලියා තැබියයුතු බව.**

28. අඩු පක්‍ෂයෙහිවූ කොයියම් සාමාජිකයෙක් වූවත් වැඩිදෙනාගේ කැමැත්තට තමන් විරුඬවීමට හේතු කාරණ ලියා තැබීම සෑහෙනවාත් ඇර එසේ ලියනලද විරුඬතාවය සුමානයක් ඇතුළතදී සභාවේ ලේකම්තැන වෙත යවනලදුව එතැන විසින් එය අමුනා තැබියයුතු වේ.

**කාරකසභාවක වැඩකළහැකි සාමාජිකයින් ගණන.**

29. විශෙෂ වශයෙන් නියමනොකරණ ලද්දේවීනම් සෑම විශෙෂ කාරකසභාවක හෝ උප කාරක සභාවක හෝ වැඩකළහැකි සාමාජිකයින්ගේ අඩු ගණන තුන්දෙනෙක් විය යුතුවේ.

**කාරකසභා රැස්වීම.**

30. විශෙෂ කාරකසභාවක් හෝ උප කාරකසභාවක් හෝ පත්කරණු ලැබූවිට (මහ සභාවේ සභාපතිතැන එබඳු කාරකසභාවක සාමාජිකයෙක් නොවීනම් නැතහොත් ඔහු එම සභාවට නොපැමිණියේවීනම්) එබඳු කාරකසභාව තමන්ගේම සභාපතිතැන තෝරාගැණීම කළයුතුවේ, එසේවූ කාරකසභාවේ සභාපතිතැන විසින් එම සභාවේ පළමුවෙනි රැස්වීමට ලඟ දිනයක් නියමකොට ඊට පසු සෑම රැස්වීමක්ම ඒ ලඟ ඊට ප්‍රථම පැවැත්වූ රැස්වීමේදී නියමකර ගන්නා පරිද්දෙන් පැවැත්විය යුතුවා පමණතුත් නොව එසේ නියමකර නොගන්නාලදදේවීනම් එම කාරකසභාවේ සභාපතිතැන විසින් නියමකරන්ට යෙදෙන පරිද්දෙන් පැවැත්විය යුතුවේ.

**කාරකසභාවක වැඩ.**

31. විශෙෂ කාරකසභාවක් හෝ උප කාරකසභාවක් හෝ රපෝර්තුවක් කෙරීමට එකඟව නියමකරගත්විට එම රපෝර්තුව ඒ කාරකසභාවේ සභාපතිතැන විසින් හෝ ඒ ගැනම පත්කරණලද යම් සාමාජිකයෙක් විසින් හෝ එම සභාව ඉදිරියට ගෙණෙනලදුව එහි ලේකම්තැන විසින් කියවිය යුතුවේ; නැතහොත් ඒ ප්‍රස්ථාවේදී නියමකරගන්ට යෙදෙන පරිද්දෙන් බේරාගත යුතුවේ. මහ සභාවේ අවසර පිට යම් විශෙෂ කාරකසභාවක් විසින් හෝ උප කාරකසභාවක් විසින් හෝ එබඳු කාරකසභාවක අදහස් හෙවත් කල්පනා හෝ සාක්ෂි සටහන් පමණක් හෝ වැඩපල හෝ කලින්කල මහ සභාවට රපෝර්තුකෙරීම ඕනෑවේ.

**කාරකසභාවල භෙද.**

32. විශෙෂ කාරක සභාවක හෝ උප කාරක සභාවක හෝ යම්කිසි භෙදයක් වීනම් ඒ භෙදයට හේතුවූ යෝජනාව හෙවත් නිවේදනාවද එය ඉදිරියට ගෙණ ආ සාමාජිකයාගේ නාමයද, ඒ රැස්වීමට පැමිණිසිට ඒ භෙදයේ එක එක පක්‍ෂයට කැමැත්තදුන් සාමාජිකයන්ගේ ගණන්ද සමග එකී භෙදයන් එම කාරක සභාවේ වාර්තාවේ සඳහන්කළ යුතුවාත් ඇර එම කාරක සභාවේ රපෝර්තුව සමග එම වාර්තාව මහ සභාවට ඔප්පුකළ යුතුවේ.

**සාක්ෂි පිළිබඳව කාරකසභාවලට ඇති බලය.**

33. මෙම කාණ්ඩයේ 9වෙනි අංකයේ නියමකර තිබෙන්නාක්මෙන් සාක්ෂිකාරයින්ට සිතාසිකෙරීමට මහ සභාවට ඇති බලය නියම කාරකසභාවටද, සියලුම විශෙෂ කාරකසභාවලට සහ උප කාරකසභාවලටත් තිබෙන්නේය. එසේ සිතාසිකරණුලබන සෑම සාක්ෂිකාරයෙක්ම එම සිතාසියට කීකරුවීමටද බැඳී සිටින්නේය.

**පැමිනිලිපොත.**

34. යම් පැමිනිල්ලක් කරණලද්දේවීනම් එසේ පැමිනිලි කරන්නන් විසින් හෝ ඔවුන් වෙනුවට නීති ප්‍රකාර බලය ලැබ ක්‍රියාකරණ තැනැත්තන් විසින් හෝ ඒ පැමිනිල්ල ලියා තබන්ට යෙදෙන පැමිනිලි පොතයයි කියනුලබන පොතක් සභාවේ ලේකම්තැන විසින් සකස්කොට තබා සෑම රැස්වීමකදීම මහ සභාවට ඔප්පුකළ යුතුවේ. ඉදින් ඒ පොත සභා රැස්වීම් පවත්වන දවස්ද නිවාඩු දවස් සහ සෙනසුරාද දවසුත් අත්හැර අනිකුත් සතියේ දවස්වල දවල් 11හ පටන් සවස 4 වනතුරු කොයිවේලාවක නුමුත් නාගරිකසභා කන්තෝරුවේදී පොදු ජනයාට ලංවෙන්ට හැකිලෙස තැබියයුතුද වේ. නගරයේ සෑම පදිංචිකාරයෙකුටම තමන්ගේ නියම නම සහ පදිංචි ස්ථානයත් සභාවේ ලේකම්තැනට දැනුම්දී ඒ පොතට ලංවිය හැකිවේ.

---

## 3 වෙනි කාණ්ඩය.

## ගණන් සහ අසබඳු.

**ගණන් ක්‍රමය.**

35. නාගරික සභාවේ ගණන් "ඩබල් ඇන්ට්රි" යයි කියනලද උභයසංස්ථාන ක්‍රමයට ලියා තබනුලැබේ. ඊට මුදල් ගණන් පොතක්ද "ලැජර්" නම් මූළ ගණන් පොතක්ද, දින පතා ගණන් පොතක්ද මුදල් ගෙවීමට සහ භාරගැණීමට චැක් සහ කුයිතාන්සි පොත්ද ඇතිවේ.

**බැන්කු පාස්පොත මේසේපිට තැබීම.**

36. සභාවේ සෑම සාමාන්‍ය රැස්වීම්වලදීම ඒලඟ ගතවූ මාසය අන්තිම දක්වා ගණන් ලියනලද බැන්කු පාස්පොත මේසයපිට තැබිය යුතුවේ.

**138 වෙනි වගන්තිය යටතේ රපෝර්තු.**

37. නාගරික සභාව විසින් සපයනුලැබ එසේ සපයනුලැබූ අය විසින් ලියා අපසු එම සභාවට දියයුතු "වර්‍ෂ 1887නේ නාගරිකසභා ව්‍යවස්ථාවේ" 138 වෙනි වගන්තිය යටතේ ගෙවල්වල ගොඩනැගිලිවල හෙවත් ඉඩම්වල අයිතිකාරයින් විසින් හෝ පදිංචිකාරයින් විසින් හෝ කළයුතු රපෝර්තුව මෙහි අගට යාකරණලද උප ලේඛනයේ "බී" අක්‍ෂරය ලකුණුකර [illegible]

146 වෙනි වගන්තිය යටතේ රපෝර්තු.

38. ඉහතකී ව්‍යවස්ථාවේ 146 වෙනි වගන්තිය යටතේ ලියා දියයුතු ලේඛනය මෙහි අගට යාකරණලද උප ලේඛනයේ " සී " අක්ෂරය ලකුණුකර තිබෙන සටහනේ ප්‍රකාරවේ.

වැඩිමනත් වාහන සහ තිරිසනුන් සපයාගන්නන් ගෙන් විශේෂ දැන්වීමක් ඕනෑ බව.

39. මෙහි ඉහත සඳහන් ආඥාපණතේ සඳහන් ලේඛනය ලියාදී ඊට පසු යම් කෙනෙක් එම ලේඛනයේ සඳහන් නොකරණලද යම් අශ්වකරත්තයක්, බරකරත්තයක්, රික්ෂෝකරත්තියක්, තනිගොන් කරත්තයක්, අශ්වයෙක්, පෝනියෙක්, අශ්වතරයෙක්, ගොණෙක් නොහොත් කොටළුවෙක්වත් සපයාගත්තොත් නොහොත් ඇතුව සිටියොත් නොහොත් පාවිච්චිකළොත් එසේ යම් වාහනයක් හෝ තිරිසනෙක් හෝ සපයාගත් මාසයක් ඇතුළතදී එසේ සපයාගත්තාවූ නොහොත් ඇතුව සිටියාවූ නොහොත් පාවිච්චිකළාවූ සෑම වාහනයක් හෙවත් තිරිසනෙක් සම්බන්ධ සැබෑවූ නිවැරැදිවූ විගතුග ලියා සඳහන්කරණලද දැන්වීමක් නාගරිකසභාවේ ලේකම් තැන වෙත යැවීමට එසේ යම් වාහනයක් හෝ තිරිසනෙක් හෝ සපයාගත් අය බැඳී සිටින්නේය.

නොතාරිස්වරුන් විසින් කළයුතු රපෝර්තු.

40. නාගරිකසභාව පිහිටිතෙක් පටන් ගතවූ යම් අවුරුද්දකදී හෝ ලබාතිබෙන අවුරුද්දේදී හෝ නාගරික සීමාව තුළ වසන එක එක නොතාරිස් කෙනෙක් යටතේ නොතාරිස් නිළය ලැබීමට බැඳී වැඩකළාවූ හෝ එසේ වැඩකරන්නාවූ හෝ ලියන්නන් ඇත්තාහුද නැද්ද යන වග සහ එසේ ඇතිවීනම් ඔව්හු කිදෙනෙක් ඇතිවිද යන බවත්, ඔවුන් එකිනෙකා බැඳෙන්ට යෙදුනාවූ දිනයත්, ඔවුන් එකිනෙකා කොපමණකල් එසේ වැඩකළාහුද නොහොත් එසේ වැඩ කරන්නාහුද යන බවත් දැනගැණීම පිණිස, නාගරික සභාපතිතැන විසින් නියමකරණලද, යම් කිසිවිටක මෙහි අගට යාකරණලද උප ලේඛනයේ " ඩී " අක්ෂරය දරණ සටහනේ පිටපතක් ඒ එක එක නොතාරිස් කෙනෙකුට කලින්කල සභාවේ ලේකම්තැන විසින් භාරදෙවනුලැබේ. එකී පිටපත තමන්ට ලැබී පහළොස්දිනක් ඇතුළතදී ඉන් දැනගන්ට ඕනෑකරණලද කාරණ නිවැරිදිලෙස එහි ලියා එම පිටපත ඒ එක එක නොතාරිස් කෙනෙක් විසින් ආපසු සභාවේ ලේකම්තැනවෙත යැවිය යුතුවේ.

බරකරත්ත සහ තනිගොන් කරත්තවල ලෝහ තහඩු ගහන්ට ඕනෑ බව.

41. නාගරික සීමාව තුළ තිබාගන ඉන්නාවූ නොහොත් පාවිච්චිකරන්නාවූ එක එක බරකරත්තයක සහ එක එක තනිගොන් කරත්තයකද නීතියේ ප්‍රකාර සවිකර තිබියයුතු යම් සලකුණු තහඩු ඇර සෑම අවුරුද්දේම ජූලි මස 1 වෙනිදසින් පසු එහි සවිකර තැබීමට නාගරිකසභාවෙන් දෙන්ට යෙදෙනලද ලෝහ තහඩු ඒ එක එක කරත්තයේ සවිකර තැබියයුතුවේ. ඒ එක එක බරකරත්තය හෝ තනිගොන් කරත්තය හෝ ලියා පදිංචිකර නාගරිකසභා කන්තෝරුවේ තිබෙන පොතේ ඒ එක එක කරත්තයට නියමකරණලද නොම්මරය සහ අවුරුද්දත් ලකුණුකරණලද ඉලක්කම් සහ " කේ " අක්ෂරයත් එකී තහඩුවක සටහන්කොට තිබියයුතුවේ ; ඒ වනාහි කුලී පැටවීමට අවසරලැබ පාවිච්චිකරණ කරත්තවිනම් වර්ෂ 1887හේ නොම්මර 7 ආඥාපණතේ 128 වෙනි වගන්තිය යටතේ ඒ කරත්ත ඇදීමට පාවිච්චිකරණ ගොන් සඳහා ගෙවියයුතු අයබදු ගෙවූ බවට සාක්ෂියක් වශයෙන් සලකනුලැබේ. මෙහි පසුව සඳහන්කරණලද ලැසිසන් තහඩුව දීමට ප්‍රථම ඒ එක එක බරකරත්තයක හෝ තනිගොන් කරත්තයක හෝ ලියා පදිංචිකෙරීමේ නොම්මරය සහ අවුරුද්දත් ඒ ඒ කරත්තයේ එලිපිටට පෙණෙන ස්ථානයක සායම්කෙරීමට නාගරික සභාපතිතැන විසින් නියමකරන්ට යෙදේ.

ලැසිසන් තහඩු නැති කරත්ත අල්ලන්ට යෙදෙන බව.

42. මීට ඉහතින් තිබෙන වගන්තියේ නියමකරණලද ලැසිසන් තහඩුව නැතුව කොයි යම් කෙනෙක් විසින්වත් නාගරික සීමාව තුළ බරකරත්තයක්වත් තනිගොන් කරත්තයක්වත් තබාගැණීම හෝ පාවිච්චිකෙරීම හෝ දක්කාගන යෑම හෝ කළයුතු නොවේ. තවද එකී ලැසිසන් තහඩුව නැතුව තබාගන්නාවූ හෝ පාවිච්චිකරන්නාවූ හෝ නැතහොත් දක්කාගණයන්නාවූ සෑම බරකරත්තයක් සහ තනිගොන් කරත්තයක්ද ඊට ගෙවියයුතු අයබදු ගෙවා එබඳු ලැසිසන් තහඩුවක් ලබාගෙණ ඒ බරකරත්තයේ හෝ තනිගොන් කරත්තයේ හෝ සවිකර ගන්නාතුරු නාගරික ඉන්ස්පැක්ටර්කෙනෙක් විසින්වත් පොලිසියේ මූලාදෑනියෙක් විසින්වත් තහනමට ගැණීමට යටත්විය යුතුවේ.

---

## 4 වෙනි කාණ්ඩය.

## ගොඩනැගිලි, කානු, සනාදිය තැනීම.

ගෘහමූලිකයන් විසින් පාරවල කානු මතුපිටින් ගෙවලට යෑමට සුදුසු අන්දමේ මාර්ග තනාගැණීම.

43. යම් වීදියක පැත්තෙන් කානුවක් හාරා නොහොත් බැඳ තිබෙන්නේවේද, ඒ වීදියට යාවූ ඉඩමක හෝ ගෙයක හෝ අයිතිකාරයා නැත්නම් පදිංචිකාරයා විසින් නාගරික සභාපතිතැන විසින් නියමකරන්ට යෙදෙන නියෝගවලට යටත්ව, එකී ඉඩමට හෝ ගෙට යෑම ඊම පිණිස ඕනෑකරන්නාවූ පාලමක් නොහොත් පඩියක් නැත්නම් බෝක්කුවක්, එම කානුව මතුපිටින් සාදගතයුතුවේ. එසේ සාදගන්නාලද පාලම නොහොත් පඩිය නැත්නම් බෝක්කුව, එම කානුවේ දිගින් අඩි හතරකට අඩුනැති පමණ වැහෙන්ට නොහොත් නාගරිකසභාවේ අවසර නැතුව අඩි හයකට වඩා නොවැහෙන්ට සෑදිය යුතුවාත් ඇර එම කානුවේ වතුර බැසීමට බාධා නොපැමිණෙන හැටියටද සෑදිය යුතුවේ ; තවද එකී පාලම නොහොත් පඩිය නැත්නම් බෝක්කුව යට කානුවේ පතුලට කලුගල් හෝ ගඩොල් හෝ අතුරා මට්ටන්කර තිබීමද, නාගරිකසභාව විසින් පිළිගතයුතු අන්දමට එකී ඉඩම හෝ ගෙය අයිතිකාරයා හෙවත් පදිංචිකාරයා විසින් එම පාලම නොහොත් පඩිය හෙවත් බෝක්කුව සහ ඒ යට කානුවත් හොඳ හැටි තබාගැණීමද ඕනෑකෙරේ. ඉදින් මෙහි ඉහතකී ප්‍රකාර පාලමක්, පඩියක් හෙවත් බෝක්කුවක් සාදනොගෙණ හෝ එකී ප්‍රකාරයට වෙනස්ව සාදනලද පාලමක්, පඩියක් හෙවත් බෝක්කුවක් උඩින් හෝ ඉහතකී අන්දමට පිහිටා තිබෙන ඉඩමකටවත්, ගෙයකටවත් යම් යම් අය යාමඊම කරණ බව නාගරිකසභාවට දැනගන්ට ලැබුණේවිනම්, වහාම එබඳු පාලමක්, පඩියක් හෙවත් බෝක්කුවක් සාදගන්නා හැටියට නොහොත් සාද තිබෙන පාලම, පඩිය හෙවත් බෝක්කුව වෙනස්කර සාදගන්නා හැටියටද ඉහතකී ප්‍රකාරයට කානුව තබාගන්නා හැටියටද, එබඳු ඉඩමේ නොහොත් ගෙයි අයිතිකාරයාට හෝ පදිංචිකාරයාට හෝ දැන්වීමක් යැවීම නාගරිකසභාවට යුතුවාත් ඇර එබඳු පාලමක්, පඩියක් හෙවත් බෝක්කුවක් හෝ ඒ යට කානුවක් හෝ හොඳ හැටි තබානොගත්තේවිනම් එය හොඳ හැටි තබාගැණීමට සලස්වනමෙන් එකී ඉඩම හෝ ගෙය අයිතිකාරයාට හෙවත් එහි පදිංචිකාරයාට දැන්වීමක් යැවීමත් නාගරිකසභාවට යුතුවන්නේය ; තවද එසේ යවනලද යම් දැන්වීමක් ලැබී දවස් දහහතරක් ඇතුළතදී එම දැන්වීමේ නියෝග ඉෂ්ටකෙරීම එම දැන්වීම ලද්දානු විසින් කඩකළේවිනම් එකී වැඩය කෙරීම නාගරික සභාපතිතැන විසින් සලස්වන්ට යෙදී ඊට යන වියදම් එම ඉඩම හෝ ගෙය අයිතිකාරයා විසින් නොහොත් එහි පදිංචිකාරයා

මිදුල්, පාරවල් ගාල් යනාදියෙහි කාණු දැමීමට සභාපතිතැන විසින් නියමකරණ බව.

44. මිනිසුන් වාසයකරණ යම් ගෙයකට යාවූ බිමක හෝ මිදුලක හෝ ප්‍රසිද්ධ පාරක් නොවන මාවතක නොහොත් මුඩුක්කුවක හෝ එසේම යම් මඩුවක හෝ ගාලක හෝ එළිපට්ටියක හෝ වතුර බැසයෑම පිණිස එතැන් සිට ඊට ඉතා කිට්ටුවූ නාගරික කාණුව හෙවත් පල්දෙරුව දක්වා සෑහෙන පමණ කාණු හෝ 'පයිප්ප' නල හෝ දැමීම සහ එබඳු බිම, මිදුල, මාවත, මඩුව, ගාල නොහොත් එළිපට්ටිය නාගරික සභාපතිතැන විසින් නියමකරන්ට යෙදෙන අන්දමට ගල්වත්, ගඩොල්වත් අතුරා තිබීමටද උවමනායයි එම සභාපතිතැනට කල්පනාවේනම් එබඳු බිමක්, මිදුලක්, මාවතක්, මඩුවක්, ගාලක් නොහොත් එළිපට්ටියක් අයිතිකාරයාට ඒ සඳහා ලියා යවනලද දැන්වීමකින් එසේ කාණු ආදිය දැමීමට හෝ ගල් ආදිය ඇතිරීමට හෝ නියම කෙරීම නාගරික සභාපතිතැනට යුතුවන්නේය; තවද එබඳු ඉඩම් අයිතිකාරයෙකු විසින් ඒ කාණු නොහොත් 'පයිප්ප' නල දැමීමට ඕනෑකරණ ද්‍රව්‍ය නාගරික සභාවෙන් ඉල්ලන්ට යෙදී ඒවා ඊට ගෙවනුලැබූ මිළ ගණන්වලටම සභාව විසින් ඒ අයට දෙන්ට යෙදුනේවිනම් ඒ කාණු නොහොත් 'පයිප්ප' නල නාගරික සභාපතිතැන විසින් නියමකරන්ට යෙදෙන අන්දමේ ද්‍රව්‍ය වලින් එසේ නියමකරන්ට යෙදෙන ප්‍රමාණයට සහ මට්ටමටද හැඩයටද සෑදිය යුතුවාත් ඇර, ඉහතකී නාගරික කාණුවේ නොහොත් පල්දෙරුවේ එම සභාපතිතැන විසින් නියමකරන්ට යෙදෙන ස්ථානය දක්වා ගලාබැසීමටද සෑදිය යුතුවේ. ඉදින් එබඳු යම් ඉඩම් අයිතිකාරයෙක් විසින් යටකී ප්‍රකාර ලියා යවනලද දැන්වීමක නියමකරණලද කටයුතු ඉෂ්ටකෙරීම එසේ නියම කරණලද කාලය ඇතුළත නොකෙළේවිනම් නාගරික සභාපතිතැනද, එතැන්ගේ අවසරලත් යම් මූලාදෑනීන් හෝ කම්කරුකාරයින්ද එබඳු ඉඩමකට ඇතුල්ව ඒ ඕනෑකළාවූ වැඩය කෙරීම සලස්වනු ලැබේ; ඊට යන වියදම එම ඉඩම අයිතිකාරයා විසින් ගෙවිය යුතුද වේ.

වැසියන් සතනක පල්දෙරු හෙවත් උමං කාණුවල වාතය යාමරීමට ඉඩඇරිය යුතු බව.

45. වැසියන් සන්නක යම් පල්දෙරුවක හෝ ගෙයක, කාණුවක හෝ ගෙයක් ඇතිවූවත් නැතිවූවත් සෑහෙන පමණ වාතය යාමරීම පිණිස උවමනායයි නාගරික සභාපතිතැනට කල්පනා වෙන අන්දමේ 'පයිප්ප' නල සවිකර තැබීමට එම පල්දෙරුව හෙවත් කාණුව අයිතිකාරයාට ලියා යවනලද දැන්වීමකින් නියෝගකෙරීමට නාගරික සභාපතිතැනට බලය තිබේ. එම සභාපතිතැන විසින් නියමකරන්ට යෙදෙන ද්‍රව්‍යවලින් එසේ නියමකරන්ට යෙදෙන මහතට සහ උස ප්‍රමාණයටත් එබඳු වාතමාර්ග නල සවිකළ යුතුවේ. එබඳු පල්දෙරුවක් හෝ කාණුවක් හෝ අයිතිකාරයෙක් විසින් එකී ප්‍රකාර දැන්වීමකින් කරණලද නියෝග එසේ නියමකරණලද කාලය ඇතුළත ඉෂ්ටනොකළේවිනම්, නාගරික සභාපතිතැනද එතැන්ගෙන් බලයලත් මූලාදෑනින් සහ කම්කරුකාරයින්ද එබඳු වැඩ කළයුතු ඉඩමකට ඇතුල්ව එම වැඩය කරවන්ට ලැබේ; ඊට යන වියදම් එම වැඩය අයිතිකාරයා විසින් ගෙවිය යුතුද වේ. මෙකී වැඩේට හෝ මේ කාණ්ඩයේ මීට ඉහතින් තිබෙන අනුපණනක නියමකරණලද යම් වැඩකට හෝ ගෙවියයුතු වියදම්වල ගණන ඇති සැටියේ නියම දැන බේරා "වර්ෂ 1887 නාගරිකසභා ව්‍යවස්ථාවේ ගෙවන්ට නියමකර තිබෙන වියදමක්මෙන් ගණන්ගෙණ එම ව්‍යවස්ථාවේ 281 වෙනි සහ 282 වෙනි වගන්තිවල නියමකර තිබෙන පරිද්දෙන් අයකරණු ලැබේ.

ප්‍රසිද්ධ කාණුවක් හෙවත් පල්දෙරුවකට සහ කාණු දැමියයුතු ඉඩමකටද අතර පිහිටි ඉඩම් මැදින් කාණු දැමීම.

46. වර්ෂ 1887 නොම්මර 7 ව්‍යවස්ථාවේ 195 වෙනි වගන්තිය යටතේ යම් කාණුවකට හෝ පල්දෙරුවකට හෝ හාවීමට 'පයිප්ප' නලයක් හෝ උඩින් වසනලද කාණුවක් හෝ දැමීම ඕනෑවූවිට එම කාණුව ඕනෑකරණ ගෙය නොහොත් ගොඩනැගිල්ලට සහ එය ගලාබසින්ට යෙදෙන ප්‍රසිද්ධ කාණුව හෙවත් පල්දෙරුවටද අතර පිහිටි යම් ඉඩම් හෝ ඉඩමක් මැදින් එබඳු 'පයිප්ප' නලය හෝ කාණුව හෝ දැමීම උවමනාවිනම් එසේ 'පයිප්ප' නලයක් හෝ කාණුවක් හෝ එකී ඉඩම් නොහොත් ඉඩමක් මැදින් දැමීමට නාගරික සභාපතිතැන අර මුනුකරගෙණ සිටින බව එම ඉඩම් නොහොත් ඉඩම අයිතිකාරයාට නැත්නම් එකී පදිංචිකාරයාට දවස් දෙකක් කල්තියා දැනුම්දී, එසේ අතර පිහිටි ඉඩම්වලට නොහොත් ඉඩමට ඇතුල්ව එකී අන්දමේ 'පයිප්ප' නලයක් හෝ කාණුවක් හෝ දැමීමේ වැඩ සම්පූර්ණයෙන් කෙරීමට නාගරික සභාපතිතැනට හෝ ඒ වැඩේ කෙරීමට එතැන්ගෙන් ලියවිල්ලක්පිට බලයලත් යම් නාගරික මූලාදෑනියෙකුට හෝ බලය තිබේ.

අලුත් ගොඩනැගිලි ආදිය අයිතිකාරයින් එබඳු වැඩ ඉවරවූ බව නාගරික සභාපතිතැනට දැන්වියයුතු බව.

47. නාගරික සභාපතිතැනගේ අවසරපිට කරණලද යම් අලුත් ගොඩනැගිල්ලක අයිතිකාරයෙක් හෝ යම් කාණුවක් වැසිකිළියක් නොහොත් කුනුකසළ එකතුවීමට පතහක් බැඳීමට එම සභාපතිතැනගෙන් අවසරලත් කෙනෙක් හෝ නැතහොත් එබඳු කාණුවක්, වැසිකිළියක් නොහොත් කුනුකසළ එකතුවීමට පතහක් අමුතුවෙන් බඳින්ටවත් බැඳ තිබෙන එකක් වෙනස්කරන්ටවත් අලුත්වැඩියාකරන්ටවත් නාගරික සභාපතිතැන විසින් ව්‍යවස්ථානුකූලව තමන්ට ඇති බලයපිට නියෝගකරණුලැබූවෙකු හෝ එබඳු යම් වැඩක් ඉවරවී දවස් දහහතරක් ඇතුළතදී ඒ බව නාගරික සභාපතිතැන වෙත ලියවිල්ලකින් දැනුම්දිය යුතුවේ.

---

## 5 වෙනි කාණ්ඩය.

## කම්කරු ඉෂ්ටකෙරීම හෝ කරවීම.

නාගරික සීමාව තුළ පාරවල් අලුත්වැඩියා කෙරීම් ආදිය සඳහා සභාපතිතැනගෙන් බලයලත් තැනැත්තන්ට යම්යම් ඉඩම්වලට ඇතුල්වීමට බලය ඇති බව.

48. නාගරික සීමාව තුළ තිබෙන්නාවූ හෝ අමුතුවෙන් සාදන්ට අරමුණුකරණලද හෝ යම් වීථියක ආරක්ෂාකෙරීම්, දියුණුකෙරීම්, ශුද්ධපවිත්‍රකෙරීම්, අලුත්වැඩියාකෙරීම්, වෙන පැත්තකට හරවා සෑදීම්, වෙනස්කෙරීම්, සලකුණුකෙරීම්, මැනීම්, සෑදීම්, කම්කරුකෙරීම්, විවෘත කෙරීම් යනාදිය සඳහාද, එබඳු වීථියක හෝ ඊට යම් ආකාරයකින් සම්බන්ධවූ හෝ පාලමක්, වැටක් කාණුවක්, වේල්ලක් හෙවත් අගලක් බැඳීම්, හෑරීම්, අලුත්වැඩියාකෙරීම්, ශුද්ධපවිත්‍රකෙරීම්, දියුණුකෙරීම් යනාදිය සඳහාද නැතහොත් "වර්ෂ 1887 නාගරිකසභා ව්‍යවස්ථාවේ" නියෝග යටතේ යම්කිසි දෙයක් හෝ ක්‍රියාවක් හෝ කටයුත්තක් හෝ ඉෂ්ටකෙරීම සඳහාද උවමනාවූ සියලු කටයුතු ආදිය කෙරීමට ඕනෑකරන්නාවූද සුදුසුවූද සියලුම මෙහෙකරුවන්, කුලීකාරයින්, කම්කරුකාරයින්, යානවාහන, තිරිසනුන් සහ වෙන උපකරණත් ඇතුව එබඳු වීථියකට යාව හෝ ඒ අසල හෝ පිහිටි යම් ඉඩමකට සියලුම සුදුසු වේලාවලදී ඇතුල්වීමට සහ එහිදී එකී කටයුතු වැඩපල ක්‍රියා ආදිය වෙන්වශයේ කෙරීමටත් ඒ සඳහා නාගරික සභාපතිතැනගෙන් ලියවිල්ලක්පිට අවසරලත් කොයියම් අයෙකුට හෝ අයවළුන්ට විනුමුත් බලය තිබෙන්නේය.

එකී වැඩට ද්‍රව්‍ය ආදිය ගැනීම පිළිවන් බව.

49. දැනට තිබෙන්නාවූ හෝ අමුතුවෙන් සාදන්ට අරමුණුකරණලද හෝ යම් වීථියක ආරක්ෂාකෙරීම්, දියුණුකෙරීම්, ශුද්ධ පවිත්‍රකෙරීම්, අලුත්වැඩියාකෙරීම්, වෙන පැත්තකට හරවා සෑදීම්, වෙනස්කෙරීම්, සලකුණුකෙරීම්, මැනීම්, සෑදීම්, කම්කරුකෙරීම්, විවෘතකෙරීම් යනාදිය සඳහාද නැතහොත් එසේ ආරක්ෂාකෙරීම්, දියුණුකෙරීම්, ශුද්ධ පවිත්‍රකෙරීම්, අලුත්වැඩියා කෙරීම්, වෙන පැත්තකට හරවා සෑදීම්, වෙනස්කෙරීම්, සලකුණුකෙරීම්, මැනීම්, සෑදීම්, කම්කරුකෙරීම්, විවෘතකෙරීම් යනාදියට යම් ආකාරයකින් ආධාරදීම සඳහාද එබඳු වීථියක යම්

පාලමක්, වැටක්, කානුවක්, වේල්ලක් නොහොත් අගලක් බැඳීම හෝ හෑරීම හෝ අලුත්වැඩියාකෙරීම හෝ ශුද්ධ පවිත්‍රකෙරීම හෝ වැඩිදියුණුකෙරීම හෝ සඳහාද, එබඳු වීථියක් සම්බන්ධ යම් වැඩක යෙදීසිටින්නාවූ නාගරික මූලාදෑනියෙකුගේ හෝ ඒ මූලාදෑනියා යටතේ වැඩකරණ යම් කර්මාන්තකාරයෙකුගේ හෝ වෙන තැනැත්තෙකුගේ හෝ පාවිච්චියට හෙවත් යානවාහනාදී යම් දෙයක් තබාගැණීමට එබඳු ප්‍රසිද්ධ පාරක හෝ ඒ අසල හෝ ඕනෑකරණ මොනයම්වූ මඩු කුඩම් ගොඩනැගිලි ආදියක් විනමුත් අලුත්වැඩියාකෙරීම සඳහාත් සෑහෙන පමණ වතුර ලීදඬු අතුල් ගල් බොරළු මැටි හෙවත් වෙනයම් ද්‍රව්‍ය ආදිය එබඳු වීථියක් අසල තිබෙන මුඩුබිම්වලින් නොහොත් පාළුවට ඇර තිබෙන ඉඩම්වලින් හෝ පොදු ඉඩම්වලින් හෝ පහසුවෙන් ලබාගත හැකිවීනම් එසේ ලබාගැණීමටද, එසේ සෑහෙන පමණ ද්‍රව්‍ය ලබාගතහැකි නොවීනම් එබඳු වීථියකට යාව හෝ ඒ අසල හෝ පිහිටි යම් ඉඩමක තිබෙන ගෙයක මිදුලක්වත් පිට්ටනියක්වත් මැදින් හෝ එබඳු ගේකට යන එන පාරක් මැදින් හෝ වැට කඩුළු ඇදියකට මැදිව තිබෙන කොටුවකින්, වැවිල්ලකින්, කුඹුරකින් හෙවත් කැලයකින් හෝ එහි අයිතිකාරයාගේ කැමැත්ත නැතුව එකී ද්‍රව්‍ය ගෙණයෑමද, කපාගැණීම සහ හාරාගැණීමද නොකොට, එබඳු ද්‍රව්‍යවලට සහ ඒවා ගෙණයෑමෙන් එවැනි ස්ථානයකට පැමිණෙන අලාභහානිවලටත් එහි අයිතිකාරයාට සෑහෙන පමණ වන්දි ගෙවන පොරොන්දුවපිට, එබඳු ද්‍රව්‍ය ගැණීම පිණිස හාරන්ට යෙදෙන ගල්වළවල් වැලිවළවල් ආදියෙන් යම්කෙනෙකුට හෝ යම් සතෙකුට හෝ අනතුරු නොපැමිණෙන්ට ඒ ද්‍රව්‍ය ගෙණයන්ට යෙදෙන තැනැත්තා හෙවත් තැනැත්තන් විසින් එවැනි වළවල් ආදිය ලීවලින් හෝ යකඩවලින් හෝ ඇහිරීලිකොට, එකී වීථියකට යාව හෝ ඒ අසල හෝ පිහිටි යම් ඉඩමකින් එකී ද්‍රව්‍යාදිය සොයාගැණීමටද, හාරාගැණීමටද, කපාගැණීමට සහ ඉවත්කරගැණීමටද කොයියම් කෙනෙකුගේ ඉඩමක් මැදින් විනමුත් ඒවා ගෙණයෑමටද ඉහතකී ප්‍රකාර නාගරික සභාපතිතැනගෙන් බලයලත් යම් තැනැත්තෙකුට හෙවත් තැනැත්තන්ට, තමන් විසින් හෝ තමන් යටතේ හෝ වැඩට පත්කරගෙණ සිටින මෙහෙකරුවන්, කුලීකාරයින්, කර්මාන්තකාරයින් කැටුව, ඊට උවමනාවූ සියලුම යානවාහන තිරිසනුන් ආදී උපකරණත් ඇතුව, එබඳු ස්ථානයකට අවසර නැතුව පැමිණෙන්නෙක්මෙන් ගණන්ගණු නොලැබ, සියලුම සුදුසු කාලවලදී බලය තිබෙන්නේය.

ඉහතකී අන්දමේ වීථියකට යාවූ ඉඩම්වල කසල ආදිය දැමිය හැකි බව.

50. දැනට තිබෙන්නාවූ හෝ අමුතුවෙන් සාදන්ට අරමුණුකරණලද හෝ යම් වීථියක් දියුණුකෙරීම්, ශුද්ධ පවිත්‍රකෙරීම්, අලුත්වැඩියාකෙරීම්, වෙන පැත්තකට හරවා සෑදීම්, වෙනස්කෙරීම්, සලකුණුකෙරීම්, මැණීම්, සෑදීම්, යනාදී වැඩ සහ එබඳු වීථියක හෝ ඊට යම් ආකාරයකින් අඳාලවූ හෝ යම් පාලමක්, වැටක්, කානුවක්, වේල්ලක් නොහොත් අගලක් බැඳීම, හෑරීම්, අලුත්වැඩියාකෙරීම්, දියුණුකෙරීම් යනාදී වැඩද කරන්නාවූ යම් ස්ථානයකින් ඉවත්කළ යුතු ද්‍රව්‍ය හෝ පස් හෝ කසල හෝ, සෑහෙන පමණ කාලයක් ඇතුළතදී ගෙණයන පොරොන්දුව පිට, එකී යම් වැඩපලකට යාව හෝ ඒ අසල හෝ පිහිටි ඉඩම්වල දැමීමට ඉහතකී ප්‍රකාර නාගරික සභාපතිතැනගෙන් බලයලත් තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට හෝ බලය ඇතිවේ.

බොරු පාරවල් දැමියහැකි බව.

51. දැනට තිබෙන්නාවූ හෝ අමුතුවෙන් සාදන්ට අරමුණුකරණලද හෝ යම් වීථියක යම් වැඩක්කරණ අතර නොහොත් එබඳු වීථියකට යම් ආකාරයකින් අඳාලවූ යම් වැඩක්කරණ අතර, ගොඩනැගිල්ලක් පිහිටි යම් ඉඩමක්වත් කොටුකරණලද වත්තක් හෝ මිදුලක්වත් මැදින් නොව, එබඳු වීථියකට යාව නොහොත් ඒ අසල පිහිටි වෙනයම් ඉඩම මැදින් පාරක් දැමීමට ඉහතකී ප්‍රකාර නාගරික සභාපතිතැනගෙන් බලයලත් යම් තැනැත්තෙකුට හෙවත් තැනැත්තන්ට බලය ඇතිවේ.

ගස් යනාදිය කැපිය හැකි බව.

52. නාගරික සීමාව තුළ යම් වීථියක වැවෙනලද හෝ ඊට බරව නැමී තිබෙන්නාවූ හෝ ඊට යම් බාධා පැමිණීමට හේතුවන්නාවූ හෝ සියලුම ගස්, පඳුරු, පැලෑටි සහ ඒවායේ කොල, අතු, මුල් යනාදිය එබඳු වීථියකට යාව හෝ ඒ අසල හෝ පිහිටි යම් ඉඩමකින් කපා ඉවත්කෙරීමට සහ එකී කපාදැමීමටද, එබඳු ගස්, පඳුරු, පැලෑටි, කොල, අතු, මුල් යනාදිය කැපීම හෝ පෑහීම හෝ ඉවත්කෙරීම හෝ සඳහා ඊට උවමනාවූ උදවිය, සතුන් සහ ආයුධත් ඇතිව කොයි යම් ඉඩමකට විනමුත් ඇතුල්වීමටද, ඉහතකී ප්‍රකාර නාගරික සභාපතිතැනගෙන් බලයලත් තැනැත්තෙකුට හෙවත් තැනැත්තන්ට බලය ඇතිවේ.

වැටවල් බඳින්ටද හැකි බව.

53. යම් වීථියක් අද්දර වැටකොටු අගල් කානු හෙවත් ඉවුරු තැනීම උවමනායයි ඉහතකී ප්‍රකාර නාගරික සභාපතිතැනගෙන් බලයලත් තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට හෝ කිසිවිටක පෙණියේනම්, එබඳු වැඩ කරවීමට හෝ කෙරීමට එකී තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට හෝ බලය ඇතිවේ ; තවද එබඳු වැට කොටු කානු අගල් හෙවත් ඉවුරුවලට යාව තිබෙන ඉඩම් අයිතිකාරයින් හෝ ඒවායේ පදිංචිකාරයින් හෝ විසින් එකී වැටකොටු කානු අගල් හෙවත් ඉවුරු ශක්තිමත්ලෙස හොඳින් තබාගැණීමටද අලුත්වැඩියාකෙරීමටද මෙයින් නියමකරණලදී.

තවද අගල් ආදිය කපා නොවසා තිබිය හැකි බව සහ 'පයිප්ප' නල ආදිය තිබිය හැකි බව.

54. දැනට තිබෙන්නාවූ හෝ අමුතුවෙන් සෑදීමට අරමුණුකරණලද හෝ යම් වීථියකවත් පාරකවත් ප්‍රවේසම පිණිසද එය සුරක්ෂිතව තිබීම හෝ වැඩිදියුණුකෙරීම හෝ අලුත්වැඩියාකෙරීම හෝ සෑදීම හෝ පිණිසද උවමනායයි වැඩභාර ප්‍රධානතැනට හෝ නාගරික සභාපතිතැනගෙන් ලියවිල්ලක්පිට අවසරලත් සෑම තැනැත්තෙකුට හෝ ඒත්තුයන අන්දමේ අගල්, පීලි, කානු, හෙවත් වතුර ගලායන මාර්ග එබඳු වීථියකට හෝ පාරකට හෝ යාව නොහොත් ඒ අසල තිබෙන යම් ඉඩමකින් හෙවත් බිමකින් සොයාගැණීමටද නැතහොත් එහි තැනීමට, එළිපහළිකර තැබීමට සහ ඉඩඇර තැබීමටත්, එසේම එකී යම් ඉඩමක හෝ බිමක හෝ පීලි උමංනල, ගොඩැලි, පාලම් යනාදිය බහාලීමටත් එකී වැඩභාර ප්‍රධානතැනට සහ ඉහතකී ප්‍රකාර අවසරලත් වෙන සෑම තැනැත්තන්ටද බලය තිබේ.

තවද මාවත්වල ගල් ආදිය තැබිය හැකි බව.

55. යම් වීථියක් හෝ පාරක් හෝ අලුත්වැඩියාකරණ අතරද, එසේ අලුත්වැඩියාකෙරීම් පහසුවීම පිණිස ඕනෑකරණ පමණ ඊට කල්මන්තෙන්ද, එසේ අලුත්වැඩියාකරණලද යම් වීථියකට හෝ පාරකට හෝ ඒ ලඟදීම අනතුරු පළුදු ආදිය වීම වලක්වන පිණිස ඒ අලුත්වැඩියාකෙරීම් ඉවරවූ පසු සෑහෙන පමණ කාලයක්ද එබඳු වීථියක හෝ පාරක හෝ ගල්ගොඩක්, බොරළු ගොඩක්, ලීකොටයක්, නැතහොත් වෙන මොනයම් ද්‍රව්‍යාදියක් නමුත් බහාලීමට සහ එය එහි තිබෙන්ට ඇරීමටත් වැඩභාර ප්‍රධානතැනට සහ ඉහතකී ප්‍රකාර නාගරික සභාපතිතැනගේ අවසරලත් වෙන සෑම තැනැත්තන්ටද බලය තිබේ ; එහෙත් මාර්ගයේ යන එන්නන්ට ඉන් අනතුරාදිය පැමිණීම වැළැක්වීම පිණිස ඒ තැනැත්තන් විසින් ඊට සුදුසු කාරණා සැලැස්විය යුතුවේ.

අලාභහානිවලට වන්දිගෙවීම.

56. මේ කාණ්ඩයේ අනුපණත්වලින් වැඩභාර ප්‍රධානතැනට හෝ නාගරික සභාපතිතැනගෙන් අවසරලත් වෙන තැනැත්තන්ට හෝ දී තිබෙන යම් බලපූර්වවන්කමක් පැවැත්වීම

හේතුකොටගෙණ යම් අලාභහානි පැමිණි සෑමදෙනාම එසේ අලාභහානි පැමිණීමට හේතුවූ කාරණාව, ක්‍රියාව හෙවත් දෙය කරන්ටයෙදුන තැන් පටන් තුන්මාසයක් ගතවෙන්ට මත් තෙන් කොයියම් විටකදී නුමුත්, ඒ අලාභහානිවලට වන්දි ගෙවන මෙන් නාගරික සභාපතිතැන ගෙන් ඉල්ලන්ට යෙදුණේවිනම් එකී සෑමදෙනාම ඒ වන්දි ගෙවීම් ලැබීමට හිමිවන්නාහුය; එහෙත් එබඳු ඉල්ලීම ඉහතකී කාලය ඇතුළතදී නොකෙළේවිනම්, එසේ පැමිණියයි කියනලද අලාභහානියට වන්දි ගෙවීම පිළිනොගන්ට යෙදෙනවාත් ඇර ඔහු විසින් එය අයකරගැණීමද වලක්වනුලැබේ. ඉදින් එසේ වන්දි ගෙවීමේ ගණන අසවල් පමණයයි බේරාගත නොහැකිවී නම් එය බේරාදීම පිණිස නාගරික සභාපතිතැන විසින් තෝරාගන්ට යෙදෙන එක් තැනැත් තෙකුගෙන්ද, එසේ වන්දි ඉල්ලාසිටින අය විසින් තෝරාගන්ටයෙදෙන එක් තැනැත්තෙකු ගෙන්ද යුක්තවූ 'ආර්බිට්රේෂන්' නම් සම්මුතියකින් තීන්දුකළ හැකිවේ. තවද එකී සම්මුති යේ බේරුම්කාර දෙදෙනාගේ අදහස් එකඟනොවීනම් ඔවුන් විසින් 'අම්පයර්' නම් මධ්‍යස්ත බේරුම්කාරයෙක් පත්කොට එකී බේරුම්කාර දෙදෙනා විසින් හෝ ඒ මධ්‍යස්ත බේරුම්කාරයා විසින් හෝ ඊට සම්බන්ධවූ දෙපක්ෂයම එකඟවියහැකි පරිද්දෙන් විභාගකොට කරණලද බේරීම අන්තිම තීන්දුව වේ.

---

## 6 වෙනි කාණ්ඩය.

## වෙළඳම්පලවල්.

ප්‍රසිඩ වෙළඳම් පලවල්.

57. බෝගම්බර පිහිටුවා තිබෙන 'මාර්කැට්' නම් වෙළඳම්පල "ප්‍රසිඩ වෙළඳම්පලක්" යයි මෙයින් ප්‍රකාශකරණලදී. ප්‍රසිඩ වෙළඳම්පලවල් සම්බන්ධව මේ කාණ්ඩයේ අඩංගු අඥාපණත් ඉහතකී ප්‍රසිඩ වෙළඳම්පල ගැණ සහ නියම කාරක සභාවේ අනුමතය පිට නාගරික සභාපතිතැන විසින් මීට පසු ප්‍රසිඩ වෙළඳම්පලක් හැටියට ප්‍රකාශකරණුලබන වෙන යම් ස්ථාන යක් ගැණද පමණක් ගණන්ගණුලැබේ.

වෙළඳම්කෙරීමේ වේලාවල්.

සෑම ප්‍රසිඩ වෙළඳම්පලක්ම දිනපතා වෙළඳම්කෙරීම පිණිස උදය 5½ට ඇර තබා සවස 9½ට වසනුලැබේ.

කඩකුලී බදුදීම.

58. "වර්ෂ 1887තේ නාගරික සභා ව්‍යවස්ථාවේ" 227 වෙනි වගන්තිය යටතේ යම් ප්‍රසිඩ වෙළඳම්පලකට ගෙවියයුතු කුලී, බදු, ගාස්තු යනාදිය අයකෙරීම යම් කල් ගණනකට කලින් කල බදුදීමට නාගරික සභාවට බලය තිබේ.

බදු සම්බන්ධ ආරවුල් බේරීම කෙසේද යන බව.

59. ඉහතකී කුලී, බදු, ගාස්තු යනාදිය සම්බන්ධව යම් ආරවුලක් උපදින්ට යෙදුණේවිනම්, එය තත්වූ පරිද්දෙන් විභාගකොට ඒ ගැණ තමන්ට පෙණියන අන්දමේ සුදුසු නියෝගයක් කෙරීමට නියම කාරක සභාවට බලය තිබේ.

බදු ලැයිස්තු.

60. සෑම ප්‍රසිඩ වෙළඳම්පලකම කලින්කල ගෙවියයුතු කුලී, බදු, ගාස්තු යනාදියේ ලැයිස්තුවක් නාගරික සභාව විසින් හෝ එම සභාවේ බදුකාරයා විසින් හෝ සියල්ලන්ටම පෙණෙනලෙස එකී වෙළඳම්පලේ එල්ලාතිබීමට හෝ අලවාතිබීමට හෝ සැලැස්විය යුතුවේ.

රේන්ද අයකිරීම.

60A. යම්කිසි ප්‍රසිඩ සල්පිලක් සම්බන්ධව ගෙවියයුතු රේන්ද මුදල් සභාවට හෝ සභාවේ බදුකාරයාට හෝ සභාව විසින් හෝ සභාවේ බදුකාරයා විසින් හෝ ඊට බලේ දීතිබෙන වෙන අයෙකුට ඉල්ලූවිට වරින්වර ගෙවිය යුතුයි.

නියමකර තිබෙන රේන්දයට හෙවත් කුලියට වඩා අයකළ නොයුතුයි.

60B. සභාව විසින් අයකිරීමට නියමකර තිබෙන රේන්දයට හෝ මුදලට වැඩි ගණනක් ඉල්ලන්නාවූ හෝ ලබන්නාවූ කිසිවෙක් ඇද්ද හෙතෙම වරදක් කරන්නේය.

ඇස්කියි ඇර අයකිරීම.

60C. ඉහතකී ප්‍රකාර නියමවූ රේන්ද හෝ මුදල් ගෙවන්ට බැඳිසිටින යම්කිසිවෙක් එය ඉල්ලාපුවිට නොගෙව්වොත්, සභාව විසින් හෝ සභාවේ බදුකාරයා විසින් හෝ එය අයකිරීමට පත්කර සිටින යම් කිසිවෙක් හෝ එකී රේන්ද හෝ මුදල ගෙවන්ට බැඳිසිටින අයට අයිතිවූ සල්පිලේ තිබෙන සියලුම බඩු හෝ යම්කිසි බඩුවක් අල්ලා විකුණා එය අයකළ යුතුයි.

බලයලත් කළමනාකාරයින්ට බාධා පැමිණීම.

60D. සභාපතිතුමා විසින් යම් ප්‍රසිඩ සල්පිලක් බාරේ ඉන්ට හෝ එකී රේන්ද ගාස්තු ආදිය අයකරන්ට, එසේ නැත්නම් එකී ශුඩපවිත්‍රකම සහ පිළිවෙල පවත්වන්ට හෝ පත්කර සිටින යම්කිසි අයෙක් නොහොත් සුළු අඥාපණත්වලින් කියාතිබෙන හැටියට රේන්ද හෝ කඩ කුලී අයකෙරීමට නාගරික සභා විසින් නොහොත් සභාවේ බදුකරයා විසින් පත්කරසිටින යම්කිසි වෙක් එම කෘත්‍යය කිරීමෙහි නියුක්තව සිටිනකල ඔහට විරුඩව කිරිහැරකරණ අය වරදකාරයෝ වන්නාහුය.

ප්‍රසිඩ වෙළඳම පලක් නොවන ස්ථානයක මාංශ ආදිය විකිණීම තහනම් බව.

61. නාගරික සභාවේන් විශෙෂ අවසරපත්‍රයක් නැතුව හෝ එබඳු විශෙෂ අවසරපත්‍රයක වගන්තිවලට විරුඩව හෝ (නාගරික සභාව විසින් පිහිටුවා තිබෙන ප්‍රසිඩ වෙළඳම්පලක ඇර) නාගරික සීමාව තුළ යම් ස්ථානයකවත් වීථියකවත් හරක්මස්, එළුමස් යනාදි මාංශ හෝ මසුන් හෝ විකිණීමද, විකිණීම පිණිස එළිපිට තබාගැණීම නැතහොත් අරන් ඇවිදීමද කිසියම් කෙනෙක් විසින් කළයුතු නොවේ.

විකිණීම පිණිස නුසුදුසුලෙස එළිපිට තබා තිබෙන මාංශ ආදිය පරීක්ෂකයන් විසින් අල්ලන්ට යෙදෙන බව.

62. මේ ලඟ ඉහත තිබෙන අඥාපණතේ නියෝගවලට විරුඩව විකිණීම පිණිස එළිපිට තබා තිබෙන්නාවූ නොහොත් අරන් ඇවිදින්නාවූ හරක්මස්, එළුමස් යනාදී මාංශ හෝ මසුන් හෝ අල්ලා තහනමට ගැණීමට සහ නාගරික සභාපතිතැන විසින් හෝ මහෙස්ත්‍රාත්තැන විසින් හෝ ඒගැණ නියමකරණ පරිදි කෙරීම පිණිස එබඳු මස් මාංශ නාගරික සභා කන්තෝරුවට ගෙන්වා ගෙණයෑමටද යම් නාගරික පරීක්ෂකතැනකට හෝ පොලිසියේ මුලාදෑනියෙකුට හෝ බලය තිබේ.

විශෙෂ අවසර පත්‍රයක ගාස්තුව.

63. මේ කාණ්ඩයේ 5 වෙනි අඥාපණතේ සඳහන් එක එක විශෙෂ අවසරපත්‍රයකට මාසයකට ශත 50කට වැඩිනොවන ගාස්තුවක් අයකෙරීමට නාගරික සභාවට බලය තිබේ.

මස්මාංශ විකිණීමට වෙන්වශයෙන් තිබෙන කඩවල ඒ ඒ මස්මාංශ විකිණියයුතු බව.

64. ප්‍රසිඩ වෙළඳම්පලක මසුන් විකිණීමට වෙන්කර තිබෙන යම් කඩයක මසුන් ඇර වෙන කිසියම් බඩුබාහිරාදියක්ද, මාංශ විකිණීමට වෙන්කර තිබෙන යම් කඩයක මාංශ ඇර වෙන කිසියම් බඩුබාහිරාදියක්ද කොයියම් කෙනෙක් විසින්වත් විකිණියයුතු නොවේ.

ප්‍රසිබ වෙළඳම් පලක් අවසරපත්‍ර නැතුව පාවිච්චිකළ නොහැකි බව.

65. මෙහි අගට යාකරණලද උප ලේඛනයේ "ජ" අක්ෂරය දරණ සටහනේ ප්‍රකාර නාගරික සභාවේ ලේකම්තැන විසින් අත්සන්කොට දියයුතු අවසරපත්‍රයක් නැතුව යම් ප්‍රසිබ වෙළඳම්පලක කඩයක් තබාගැණීමවත්, පාවිච්චිකෙරීමවත්, කිසියම් කෙනෙක් විසින් නොකළ යුතුවාත් ඇර එම අවසරපත්‍රයේ මොනයම් පොරොන්දුවක්වී හුමුත් එය ලැබූ තැනැත්තහු විසින් කඩකළ යුතුද නොවේ.

එලවලු පලතුරු ආදිය විකිණීමට ස්ථාන.

66. කලින්කල නාගරීක සභාව විසින් නියමකරන්ට යෙදෙන අන්දමට දිනපතා කුලී ගෙවන අයවලුන් විසින් එලවලු පලතුරු යනාදි ද්‍රව්‍ය විකිණීම පිණිස දිගින් පළලින් අඩි හයත් හතරත් මහත ඇති නොහොත් ඇතුළත හතරැස් අඩි විසිහතරකට වඩා අඩුනොවන වෙන ප්‍රමාණ දිග පළල ඇති නිසිලෙස නොම්මර දමා සලකුණුකරණලද ස්ථාන සෑම ප්‍රසිබ වෙළඳම්පල කම වෙන්කොට තබනුලැබේ. එබඳු ස්ථානයක් නොම්මර දමා සලකුණුකර ඇතත් නැතත්, ඊට නාගරික සභාව විසින් නියමකරණ ගණන් කුලී ගෙවා කුසිතාන්සියක් ලබානොගෙණ එබඳු ස්ථානයක් හෝ උතුරෙන් හිරගෙදර පාරේ සන්ධියේ සිට වාර්ඩ් වීථියේ බස්නාහිර කෙළවර දක්වාද, නැගෙණහිරින් වාඩ් වීථියේ සිට මරක්කල පල්ලියට යන පාර දක්වා හිරගෙදර පාරද, දකුණෙන් හන්තානේ පාරට වැටෙන අලුත් හරස් පාර ඇතුළුව හිරගෙදර පාරේ සිට එකී හරස් පාරේ සන්ධිය දක්වා මරක්කල පල්ලියට යන පාරෙන් කොටසක් සහ 'මාර්කැට්' වීථිය දක්වා හන්තානේ පාරේ බස්නාහිර කෙළවරද, බස්නාහිරින් හන්තානේ පාරේ සන්ධියේ සිට වාර්ඩ් වීථිය දක්වා 'මාර්කැට්' වීථියද යන මේ පාරවල්වලට මැදිවූ බිම් කොඨාසය ඇතුළත මෙකී ප්‍රසිබ වෙළඳම්පල පිටතවත් ඇතුළතවත් වෙන යම් ස්ථානයක් හෝ විකිණීමටවත් වෙන යම් අන්දමකටවත් යම් ද්‍රව්‍යාදිය තබාගැණීම පිණිස කොයියම් කෙනෙක් විසින්වත් පාවිච්චිකළහැකි නොවේ. නාගරීක සභාව විසින් පත්කරණලද ඉහතකී ප්‍රසිබ වෙළඳම්පල භාරකාරයාගේ අත්සන ඇති කුසිතාන්සියක් ඉහතකී ප්‍රකාර කුලීගෙවන සෑම අයටම දෙන්ට යෙදේ.

කිසිකෙනෙක් විසින් ඉහතකී ස්ථානයක් අහුරාගත නොහැකි බව.

67. කොයියම් කෙනෙක් විසින්වත් ඉහතකී ස්ථානයක් හෝ ඉන් කොටසක් හෝ අහුරා ගත නොහැකිවාත් ඇර එකී තිරයක්වත් පැලැල්ලක්වත්, වෙන එවැනි යමක්වත් සාදගැණීම හෝ අඩියකට වඩා උස්වූ පෙට්ටියක්, මැස්සක් යනාදි යමක් තබාගැණීම හෝ කළහැකි නොවේ. තවද වෙළඳම්පල වහන්ට නියමකරණලද වේලාව ගතවුනාටපසු එකී යම් ස්ථානයක මොනයම් ද්‍රව්‍යාදියක්වී හුමුත් කවරෙකු විසින්වත් තබාගියයුතු නොවේ.

අවසරපත්‍ර අනුන්ට පැවරිය නොහැකි බව.

68. ප්‍රසිබ වෙළඳම්පලක යම් කඩයකට තමන්ට ලැබී තිබෙන අවසරපත්‍රයක් හෝ එහි යම් ස්ථානයකට ලැබී තිබෙන කුසිතාන්සියක් හෝ නාගරික සභාවේ අවසර නැතුව අන් කෙනෙකුට පවරාදීමවත්, එබඳු කඩයක් හෝ ස්ථානයක් හෝ ඉන් යම් කොටසක් හෝ අන් කෙනෙකුට කුලියට දීමවත් නැතහොත් එබඳු කඩයක් හෝ ස්ථානයක් හෝ ඉන් යම් කොටසක් හෝ යමෙකුගෙන් භාරගත්තායයි කියා පාවිච්චිකෙරීම හෙවත් අල්ලාගෙන සිටීමවත් කොයියම් කෙනෙක් විසින්වත් කළයුතු නොවේ.

අවසරපත්‍රලත් අය ඇර අන්කෙනෙක් වෙළඳම් නොකළ යුතු බව.

69. ප්‍රසිබ වෙළඳම්පලක, යම් කඩයක හෝ ස්ථානයක හෝ වෙළඳම්කෙරීමට අවසරපත්‍රයක් නොහොත් කුසිතාන්සියක් ලබාගත් කෙනෙක් ඇර වෙන කිසියම් කෙනෙක් ඒ අවසරපත්‍රය නොහොත් කුසිතාන්සිය ලත් අය වෙනුවෙන් වෙළඳම් කරන්ට බලය ඇත්තෙක් හැටියට එහි නම සඳහන්වීනම් මිස එසේ නොවීනම් එබඳු කඩයක් හෝ ස්ථානයක් හෝ ඉන් යම් කොටසක් හෝ පාවිච්චිකෙරීමවත් එහි වෙළඳම්කෙරීමවත් කළයුතු නොවේ.

අවසරපත්‍ර නොහොත් කුසිතාන්සි ලත් අය සහ ඒ වෙනුවෙන් කටයුතු කෙරීමට ලියාපදිංචිකළ අයත් පමණක් එකී කඩවල වෙළඳම්කෙරීම යුතු බව.

70. ප්‍රසිබ වෙළඳම්පලක යම් කඩයක හෝ ස්ථානයක හෝ වෙළඳම්කෙරීමට අවසරපත්‍රයක් නැතහොත් කුසිතාන්සියක් ලත් කොයියම් කෙනෙක් විසින්වත් මොනයම් කාරණක්පිට වී නුමුත් නාගරික සභාවේ අවසර නැතුව එසේ තමන්ට වෙළඳම්කෙරීමට ලැබී තිබෙන කඩයක් හෝ ස්ථානයක් හෝ ඉන් යම් කොටසක් හෝ (මේ ලඟ ඉහතකී ආඥාපණතේ ප්‍රකාර බලය ලත් කෙනෙකුට ඇර) වෙනයම් කෙනෙකුට පාවිච්චිකෙරීමටවත්, යම් බඩුබාහිරාදී මොනයම් ද්‍රව්‍ය වීනුමුත් එහි විකිණීමටවත්, වෙළඳම පිණිස තබාගැණීමටවත් ඉඩඇරීම හෝ අවකාශදීම හෝ කළයුතු නොවේ.

අවසරපත්‍ර සහ කුසිතාන්සි ආපසු දියයුතු බව.

71. මේ කාණ්ඩයේ 65 වෙනි 65 වෙනි ආඥාපණත් යටතේ අවසරපත්‍රයක් හෙවත් කුසිතාන්සියක් ලබාගත් යම් කෙනෙක් තමන් වෙළඳමට පාවිච්චිකළ කඩය හෝ ස්ථානය හෝ අත්ඇර යනවිට යටකී ප්‍රකාර තමන්ට ලැබී තිබෙන අවසරපත්‍ර සහ කුසිතාන්සි සියල්ලම ප්‍රසිබ වෙළඳම්පල භාරකාරයාට ආපසු දියයුතුවේ.

මායිමෙන් පිට බිමක් පාවිච්චිකෙරීම තහනම් බව,

72. ප්‍රසිබ වෙළඳම්පලක යම් කඩයක හෝ ස්ථානයක හෝ වෙළඳම්කෙරීමට අවසරපත්‍රයක් හෙවත් කුසිතාන්සියක් ලබනලද කොයියම් කෙනෙක් විසින්වත් තමන් කුලියට හෙවත් බද්දට ගත් කඩයේ හෝ ස්ථානයේ හෝ මායිමෙන් පිට කිසියම් බිම්කොටසක් පාවිච්චිනොකළ යුතුවාත් ඇර එබඳු බිමක් පාවිච්චිකෙරීමට තමන් වෙනුවෙන් කටයුතු කරණ කිසිම කෙනෙකුට ඉඩඇරීමවත් අවසරදීමවත් නොකළයුතුද වේ; තවද එකී ප්‍රකාර අවසරපත්‍රයක් නොහොත් කුසිතාන්සියක් ලත් කෙනෙකුගේ කොයියම් වැඩකාරයෙක් විසින්වත් එකී ප්‍රකාර මායිමෙන් පිට යම් බිම් කොටසක් පාවිච්චිකෙරීමද නොකළ යුතුවේ.

73. ප්‍රසිබ වෙළඳම්පලක යම් කඩයක වෙළඳම්කෙරීමට අවසරපත්‍රයක් ලත් සෑමදෙනම ප්‍රයෝජනයට නොගෙණ අහක්කරණ ද්‍රව්‍ය සහ කුණුකසළද තමතමන් විසින් දමාලීම පිණිස නාගරික සභාපතිතැනට ඒත්තුයන අන්දමේ භාජනයක් ඒ සෑම කඩයකම නොහොත් ඒලඟ තබාගත යුතුවේ.

කුණුකසළ විසිකෙරීම.

74. ප්‍රයෝජනයට නොගෙණ අහක්කරණ ද්‍රව්‍ය, කුණුකසළ, සතුන්ගේ ඇට සහ හම් යනාදිය දැමීම පිණිස තබනලද භාජනයක මිස එබඳු ද්‍රව්‍ය ප්‍රසිබ වෙළඳම්පලක හෝ ඊට අයිති බිමක හෝ නිකම් විසිකෙරීම කිසිවෙකු විසින් නොකළ යුතුවේ.

දවස්පතාම කඩ අතුගෑම කළයුතු බව.

75. ප්‍රසිබ වෙළඳම්පලක යම් කඩයක වෙළඳම්කෙරීමට අවසරපත්‍රයක් ලත් සෑමදෙනාම තමන්ගේ කඩය සහ ඒ ඉදිරිපිට හිස්ව තිබෙන ස්ථානයද දිනපතා අතුගා පිරිසිදුව තබාගත යුතුවේ.

නාගරික සතුන් මරණ මඩුවේදී නොමරණලද සතුන්ගේ මාංශ ප්‍රසිඞ වෙළඳම්පලට ගෙණඑන්ට බැරි බව.

76. මෙහි පහත සඳහන් පරිදි ඇර නාගරික සතුන් මරණ මඩුවකදී නොමරණලද යම් සතෙකුගේ මාංශ සහමුලින් හෝ ඉන් යම් කොටසක් හෝ ප්‍රසිඞ වෙළඳම්පලකටවත් යම් කෙනෙකුගේ තනි වෙළඳම්පලකටවත් නැතහොත් මේ කාණ්ඩයේ 5 වෙනි අඥපණතේ නියම පරිද්දෙන් විශෙෂ අවසරලත් යම් ස්ථානයකටවත් ගෙණඒම හෝ එබඳු මාංශ ප්‍රසිඞ වෙළඳම් පලකවත්, යමෙකුගේ තනි වෙළඳම්පලකවත්, නැතහොත් මෙකී විශෙෂ අවසරලත් ස්ථානයක වත් විකිණීම හෝ විකිණීමට තබාගැණීම හෝ කළහැකි නොවේ. මේ අඥපණතේ නියම යට පිටරටින් ලඞකාවට ගෙන්වන 'අයිස්' දමාපු මාංශද, පක්ෂීන්ගේ සහ වන මෘගයින්ගේ මාංශද මත්‍ස්‍යයන්ද අඩංගු නොවේ.

සතුන් මරන්නා විසින් මාංශවල තෙල් අඳිය නොගැයුතු බව.

77. නගරය තුළ යම් ස්ථානයක වෙළඳම පිණිස තබනලද යම් මාංශයක හෝ ඒ සඳහා මරණලද සතෙකුගේ කුණක යම් කොටසක හෝ මොනයම් කරුණක් නිසාවත් පොල් තෙල් හෝ වෙනයම් තෙලක් හෝ යම් ද්‍රව්‍යයක් හෝ ගැල්වීම නොහොත් ඇතිල්ලීම අවසරලත් යම් සතුන් මරන්නෙක් නොහොත් මාංශ වෙළෙන්දෙක් විසින් හෝ ඔහුගේ වැඩකාරයෙක් හෙ වත් ඔහු වෙනුවෙන් කටයුතු කරන්නෙක් විසින් හෝ වෙනයම් කෙනෙක් විසින් හෝ කිසි සේත් කළයුතු නොවේ.

පොදුජනයාගේ ප්‍රයෝජනයට කඩ ඇර තිබීම.

78. ප්‍රසිඞ වෙළඳම්පලක යම් කඩයක වෙළඳම්කෙරීමට අවසර පත්‍රයක් ලත් කෙනෙක් හෝ මේ කාණ්ඩයේ 5 වෙනි අඥපණත යටතේ විශෙෂ අවසර පත්‍රයක් ලත් කෙනෙක් හෝ එබඳු අවසර පත්‍රයේ බලය පවතිනතාක්කල් පිටපිටම දෙදවසක් පොදු ජනයාට වෙළඳම් බඩු දීම සිය කැමැත්තෙන්ම පැහැර ඇරියේවිනම් එසේ ඒ අයට දී තිබෙන අවසර පත්‍රය හානනම් කරන්ටවත්, අවලංගුකරන්ටවත් නාගරික සභාවට බලය ඇතිවාත් ඇර, එවැනි කෙනෙකුට ඉන්පසු යම් අවසර පත්‍රයක් නොදෙන්ටද නාගරික සභාවට බලය ඇතිවේ.

සොරකමේ වරදට අච්චුලැබූවෙක් වැඩට නොගන්න බව.

79. සොරකම්කෙරීමේ වරදට හෝ වෙනයම් එවැනි වරදකට හෝ වරදකාරයාවී අච්චු ලැබූ කිසිකෙනෙක් ප්‍රසිඞ වෙළඳම්පලක යම් කඩයක්වත් ස්ථානයක්වත් පාවිච්චිනොකළ යුතු වාත් ඇර එබඳු යම් කඩයක හෝ ස්ථානයක හෝ වෙළඳම්කෙරීමට අවසරපත්‍රයක් නොහොත් කුසිතාන්සියක් ලත් යම් කෙනෙක් විසින් එසේ වරදකාරයාවූ කිසිවෙකුව එහි වැඩට සිටවා ගැණීමද නොකළ යුතුවේ.

ප්‍රසිඞ වෙළඳම් පලෙහි අඩාවතේ ඇවිදින බල්ලන් ඇල්ලීම.

80. ප්‍රසිඞ වෙළඳම්පලක අඩාවතේ ඇවිදින බල්ලන් ඇල්ලීමට නාගරික සභාපතිතැන ගෙන් අවසරලත් යමෙකු විසින් ස්වාමියෙක් නැතුව එහි අඩාවතේ යන්ට යෙදෙන කොයියම් බල්ලෙක් වීනුමුත් අල්ලන්ට යෙදේ. එසේ අල්ලන්ට යෙදෙන බල්ලෙක් සඳහා ගෙවිය යුතු අයබද්ද සහ වැඩිපුර ශත පණහක ගාස්තුවක්ද නොහොත් ඒ බල්ලාව රාත්‍රි කාලයේ අල්ලන්ට යෙදුනේවිනම් වැඩිපුර රුපියලක ගාස්තුවක්ද ගෙවන්ට යෙදුනවිට ඒ බල්ලා ගැණ අයිතිකම් කියා ඉල්ලන්ටයෙදෙන තැනැත්තෙකුට ඒ බල්ලාව දෙනුලැබේ. ඉදින් එසේ අල්ලන්ට යෙ දෙන බල්ලෙක් ගැන යමෙක් අයිතිකම් කියන්ට නොයෙදුනේවිනම්, වර්ෂ 1893නේ නොම්මර 7තේ ව්‍යවස්ථාවේ නියමය පරිදි කෙරීම පිණිස ඒ බල්ලාව නගරයේ අඩාවතේ යන බල්ලන් තබන කොටුවට අරිණුලැබේ.

කුකුළන් ආදී ඇතිකරණ සතුන් ඇල්ලීම.

81. ප්‍රසිඞ වෙළඳම්පලක හෝ ඊට අයිති ඉඩමෙහි හෝ අඩාවතේ ඇවිදින බල්ලන් ඇර වෙන සතුන් සහ කුකුළන්, තාරාවුන්, පාත්තයින්, කළුකුන් යනාදී ඇතිකරණ සතුන් සියල්ලම උන් ඇල්ලීමට නාගරික සභාපතිතැනගෙන් අවසරලත් යමෙක් විසින් අල්ලා එවක්පටන් පැය හයක් ඇතුළතදී අයිතිකාරයෙක් පැමිණ ඉල්ලන්ට යෙදුනේවිනම් එකෙකුට ශත 25 බැගින් ගාස්තුව ගෙවූවිට ඒ සතුන් ඒ අයිතිකාරයාට භාරදෙනු ලැබේ. එකී කාලය ඇතුළතදී එකී සතුන් අයිතිකාරයෙක් පැමිණ ඉල්ලන්ට යෙදුනේ නැත්නම්, නගරයේ අඩාවතේ ඇවිදින සතුන් තබන ස්ථානයේ කොටුකරතබා, ඉහතකීලෙස අල්ලන්ට යෙදී දොළොස් පැයක් ගත වෙන තුරුත් අයිතිකාරයෙක් නොපැමිණියේ විනම්, ඒ සතුන් විකුණ ඉන් ලැබෙන මුදලෙන් නාගරිකසභාවට රුපියලක ගාස්තුවක් අයිතිව ඉතිරි මුදලක් ඇතිවිනම් එය ඒ සතුන් අයිතිකාර යාට ගෙවනුලැබේ.

සමහර ක්‍රියා තහනම්කෙරීම.

82. මෙහි පහත සඳහන් මොනයම් ක්‍රියාවක් වීනුමුත් කිසිවෙකු විසින් කළයුතු නො වේ, එනම් :—

කිත් රිදීමට හේතුවන තරහ උපදවන ක්‍රියාවක්වත් ප්‍රමාදයක්වත් කෙරීම.

(ඒ) ප්‍රසිඞ වෙළඳම්පලක යම් කඩයක හෝ ස්ථානයක හෝ වෙළඳම්කෙරීමට අවසර පත්‍රයක් නොහොත් කුසිතාන්සියක් ලබාගෙණ වෙළඳමෙහි යෙදීසිට නැත්නම් එබඳු අවසර පත්‍රයක් නොහොත් කුසිතාන්සියක් ලත් කෙනෙකුගේ වැඩකාරයෙක්ව හෙවත් ඔහු වෙනුවෙන් කටයුතුකරන්නෙක්ව සිට ඒ වෙළඳම්පලට පැමිණෙන යම් කෙනෙකුගේ හිතරිදීමට හේතු වන නිෂ්ඵල තරහ උපදවන ක්‍රියාවක් හෝ ප්‍රමාදයක් හෝ කෙරීම.

ප්‍රසිඞ වෙළඳම් පලක ආහාර පිසීම.

(බී) ප්‍රසිඞ වෙළඳම්පලක මොනයම්වූ ආහාරපානාදියක් වී නුමුත් පිසීම.

බලය ඇතිවාට වඩා කුලී ඉල්ලීම හෝ අයකෙරීම.

(සී) ප්‍රසිඞ වෙළඳම්පලක් භාරකාරයෙක්ව නොහොත් එහි බදුකාරයෙක්ව සිට නැත්නම් ඔහු යටතේ වැඩටපත් කෙනෙක්ව සිට අයකරන්ට බලය ඇතිවාට වැඩිමනත් කුලී, බදු නොහොත් ගාස්තු ඉල්ලීම හෝ අයකෙරීමද නැතහොත් තමන්ට නියම යම් රාජකාරියක් ඉෂ්ට කෙරීමයයිද, තමන්ට ලැබී තිබෙන යම් බලයක් පැවැත්වීමයයිද පෙන්වා යම් කෙනෙකුගේ හිතරිදීමට හේතුවන්නාවූ නිෂ්ඵලවූ තරහ උපදවන යම් ක්‍රියාවක් කෙරීම.

වැවේ මසුන් ඇල්ලීම.

(ඞී) බෝගම්බර ප්‍රසිඞ වෙළඳම්පල අසල තිබෙන වැවේ මසුන් ඇල්ලීම නැතහොත් කුණුකන්දල් ආදී යම් දෙයක් ඒ වැවට විසිකෙරීම.

නොසිරිත්ලෙස හැසිරීම.

(ඊ) යම් ප්‍රසිඞ වෙළඳම්පලක හෝ ඊට අයිති යම් ඉඩමක හෝ නොසිරිත්ලෙස හැසිරීම නොහොත් පොදුජනයාට හිරිහැර පැමිණියහැකි යම් අයුතු ක්‍රියාවක් කිරීම.

පාදඩයින්.

(ඇෆ්) ප්‍රසිඞ වෙළඳම්පලක් රාත්‍රි 9½ට වහන්ට යෙදුනායින් පසු යම් කෙනෙක් තමන් ගැණ සෑහෙණ කරුණක් කියනොහැකිව, එකී ප්‍රසිඞ වෙළඳම්පලක නැවතීසිටීම නොහොත් එහි මුළාව ඇවිදීම.

ප්‍රසිඞ වෙළඳම් පලකට අනතුරු කෙරීම සහ වතුර කිළුටුකෙරීම.

(ජී) ප්‍රසිඞ වෙළඳම්පලක හෝ ඒ අවට හෝ තිබෙන නාගරික සභාවට අයිති ගොඩ නැගිලිවල යම් කොටසකට හෝ කඩයකට හෝ ලාම්පුවකට හෝ වෙන කිසියම් දෙයකට හෝ අනතුරුවක්වත් යම්කිසි පළුද්දක්වත් කෙරීම නොහොත් ඒ ප්‍රසිඞ වෙළඳම්පලෙහි පාවිච්චියට තබාතිබෙන වතුර යම්කිසි ආකාරයකින් නරක්කෙරීම හෙවත් කිළුටුකෙරීම.

විශංගත රෝගයකින් පෙළෙන කිසිවෙක් වෙළඳම්පලක හෝ එහි යම් ස්ථානයක හෝ කඩයක හෝ නැවතී කටයුතු කළනොහැකි බව.

(එච්) යම්කිසි පිළිකුල් රෝගයක් හෝ බෝවෙන රෝගයක් හෝ විශංගත රෝගයක් හෝ වැළඳී සිටින යම් කෙනෙක් ප්‍රසිබ වෙළඳම්පලක හෝ යමෙකුගේ තනි වෙළඳම්පලක හෝ යම් කඩයක්වත් වාඩිවෙන ආසනයක්වත් වෙළඳම්කරණ ස්ථානයක්වත් පාවිච්චිකෙරීම නැතහොත් එබඳු වෙළඳම්පලක හෝ නාගරික සීමාවතුළ යම් වීථියක හෝ මොන යම් ද්‍රව්‍යාදි යක්වී නුමුත් එවැනි රෝගයක් වැළඳී සිටින්නෙක් විසින් වෙළඳම් පිණිස තබාගැණීම නොහොත් ගෙණඇවිදීම. තවද එබඳු රෝගයක් වැළඳීසිටින්නෙකුව ප්‍රසිබ වෙළඳම්පලක හෝ තනි වෙළඳම්පලක හෝ යම්කිසි වැඩපලාදියක යොදගැණීම කොයියම් කෙනෙක් විසින් වත් කළයුතු නොවේ.

අතපිට කුලියට වැඩකරණ කුලිකාරයින්ට අවසරපත්‍ර ඇතිවිය යුතු බව.

83. මෙහි පහත විශෙෂයෙන් සඳහන්කරණ ප්‍රකාරයට ඇර අන්කිසිසේත් නාගරික සභාපතිතැනගෙන් හෝ වෙළඳම්පලක කුලීකාරයින්ට අවසරපත්‍රදීමට ඒතැන විසින් බලය දෙනලද යම් මූලාදෑනියෙකුගෙන් හෝ නිසි අවසරපත්‍රයක් නොලත් කිසියම් කෙනෙක් ප්‍රසිබ වෙළඳම්පලකට අයිති කොතනකවී නුමුත් අතපිට කුලියට බඩු ගෙණයන කුලීකාරයෙක් හැටියට වැඩකළයුතු නොවේ.

ලියාපදිංචිකිරීමට පොතක් තැබිය යුතු බව.

84. ඉරිඳ දවස් සහ අණ්ඩුවේ නිවාඩු දවසුත් අත්ඇර අනිකුත් සියලුම දවස්වල රාජකාරි කෙරීමේ කාලය ඇතුළතදී නියම කාරක සභාව විසින් සෝදිසිකරබලන්ට හැකිලෙස තැබිය යුතුවූ අවසරපත්‍රලත් කුලීකාරයින් ලියාපදිංචිකරණලද පොතක් ප්‍රසිබ වෙළඳම්පල භාරකාර තැනගේ කන්තෝරුවේ තබනුලැබේ.

අවසරලත් කුලීකාරයෙක් බාපනය අඳින්ට ඕනෑ බව.

85. වෙළඳම්පලට නිතර පැමිණෙන සෑමදෙනාටම අවසරලත් කුලීකාරයෙක්ව ඇඳින ගැණීම පුළුවන්වෙන පිණිස බාපණයක් සහ විශෙෂ ඇඳුමක්ද, අවසරලත් සෑම කුලීකාරයෙක්ම අඳින්ට ඕනෑවාත් ඇර, අවසරලත් කුලීකාරයින් ලියා පදිංචිකරණ පොතේ නොම්මරයට සමාන නොම්මරයක් එසේ අවසරලත් සෑම කුලීකාරයෙක්ම තමන්ගේ අතේ නොහොත් තම ශරීරයේ පැහැදිලිව පෙණෙන වෙනතැනක තබාගත යුතුවේ.

අන් කිසිවෙක් බාපනය ඇඳීම නොකළ යුතු බව.

86. මේ ලඟ ඉහතකී අඝ්‍රපණතේ සඳහන් බාපනයද, විශෙෂ ඇඳුම සහ නොම්මරයද අවසරලත් කුලීකාරයෙක් ඇර වෙන කිසිවෙක් ඇඳිම යුතු නොවේ.

බාපනයට සහ ඇඳුමට අයකරණ ගාස්තුව.

87. නියම කාරක සභාව විසින් කලින්කල නියෝගකරණ පරිද්දෙන් ඉහත සඳහන්කළ බාපනයට සහ ඇඳුමටත් අවසරලත් කුලීකාරයින්ගෙන් ගාස්තුවක් අයකරණු ලැබේ.

අවසර පත්‍රයක් ආපසු ගතහැකි බව.

88. යම් කුලීකාරයෙකුට දෙනලද අවසරපත්‍රයක් ආපසුගෙන්වා අවලංගුකෙරීම සුදුසුයයි නාගරික සභාපතිතැනට පෙණීයේනම් එසේ කළහැකිවේ. යම් යම් තැනැත්තන්ගේ වැඩ කාරයින් තමන් විසින් මිළදීගන්ට යෙදෙන ද්‍රව්‍ය ගෙණයෑම පිණිස නිතර වෙළඳම්පලට පැමිණීම වැලක්වීමට මේ නියෝග වලංගුනොවේ.

---

## 7 වෙනි කාණ්ඩය.

## සතුන් මරණ මඩු.

මනුෂ්‍ය ආහාර පිණිස ගැණීමට අදහස්කරණලද ගවයින් ආදිය එලිපිට තැබියයුතු බව.

89. මෙහි පහත මේ කාණ්ඩයේ 9 වෙනි, 10 වෙනි, 11 වෙනි, 19 වෙනි අඝ්‍රපණත්වල නියමකරණ පරිදි ඇර නගරය තුළ මනුෂ්‍යයන්ගේ ආහාර පිණිස ගැණීමට අදහස්කරණලද සියලු සතුන්ම උන් බැඳ තැබීමට සූදනම්කර තිබෙන මඩුවකට උදේ 7ටත් 9ටත් අතරතුර කාලයේදී ගෙණැවිත් උන් මරන්ට යෙදෙන වේලාවට ප්‍රථම පැය 24කට අඩුනොවන කාලයක් මුලුල්ලෙහි සියල්ලන්ට පෙණෙනලෙස එහි බැඳ තැබියයුතුවේ.

මරන්ට නුසුදුසු සතුන් නාගරික පරීක්‍ෂකතැන විසින් අහක්කළ යුතු බව.

90. ඉහතකී ප්‍රකාර ගෙණෙනලද සතුන් උන් පරීක්‍ෂාකෙරීමට පත්ව සිටින නාගරික පරීක්‍ෂකතැන විසින් (නැතහොත් ඒසඳහා නාගරික සභාපතිතැනගෙන් බලයලත් වෙන තැනැත්තෙක් විසින්) සෝදිසිකරබලා බඩේ පැටවුන් ඇති එලදෙනුන්, බැටළුදෙනුන්, එළුදෙනුන් සහ යම් කිසි කරුණක් නිසා මනුෂ්‍ය ආහාර පිණිස මැරීමට නුසුදුසුයයි තමන්ට පෙණීයන වෙන සතුන්ද අහක්කරණු ලැබේ. එසේ අහක්කරණලද යම් සතෙක් ඇතිවීනම් ඒ සතා අයිතිකාරයා විසින් එකෙණෙහිම ඌ පිටතට ගෙණගිය යුතුවේ.

මරන්ට සුදුසුයයි පිළිගත් සතුන් මැරීමට බලකඩදාසියක් දියයුතු බව.

91. මනුෂ්‍ය ආහාර පිණිස මරන්ට සුදුසුයයි ඉහතකී නාගරික පරීක්‍ෂකතැන විසින් හෝ වෙන යම් බලයලත් තැනැත්තෙක් විසින් හෝ පිළිගන්නාලද සියලු සතුන්ම මේ කාණ්ඩයේ 1 වෙනි අඝ්‍රපණතේ සඳහන් පැය 24රේ කාලය ගතවෙනතුරු ඉහතකී මඩුවේ ප්‍රවේසම්කොට තබා ඒකාලය ගතවූවිට මේ අඝ්‍රපණත් යටතේ ඒ සතුන් මැරීමට දෙන බලකඩදාසිය සඳහා ගෙවියයුතු ගාස්තු ගෙවූ පසු (මෙහි අගට යාකරණලද උප ලේඛනයේ "ඇෆ්" අක්‍ෂරය දරණ සටහනේ ප්‍රකාර) බලකඩදාසියක් එසේ මරන්ට සුදුසුයයි පිළිගත් සතුන් මැරීම පිණිස එකී පරීක්‍ෂකතැන විසින්හෝ වෙනයම් බලයලත් තැනැත්තෙක් විසින් හෝ දෙනුලැබේ. තවද නාගරික සතුන් මරණ මඩුවකදී නාගරික සභාපතිතැන විසින් කලින්කල නියමකරන්ට යෙදෙන වේලාවක එබඳු සතුන් මැරිය යුතුද වේ.

බලකඩදාසිය දෙදවසක් වලංගු බව.

92. ඉහතකී ප්‍රකාර සතුන් මැරීම පිණිස දෙනලද බලකඩදාසිය එය දෙන්ට යෙදුන දින යෙන් පසු දෙදවසකට පමණක් වලංගුවේ.

පිටතට ගෙණයන්ට නොයෙදුන සතුන් ආදිය විකිණීම.

93. මේ කාණ්ඩයේ 2වෙනි අඝ්‍රපණත යටතේ අහක්කරන්ට යෙදුනාවූ යම් සතෙක් සෑහෙන පමණ කාලයක් ඇතුළතදී පිටතට ගෙණයන්ට නොයෙදුනේවීනම්ද, නොහොත් යම් සතෙක් මැරීමට බලකඩදාසියක් දෙන්ටයෙදී ඒ සතා නොමරණලද්දේවීනම්ද, නැතහොත් යම් සතෙක් සඳහා මේ අඝ්‍රපණත් යටතේ ගෙවියයුතු ගාස්තුවක් නොගෙවනලද්දේවීනම්ද, එබඳු සතෙක් ප්‍රසිබ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව ඊට දෙදවසක් කල්තියා අඬබෙර ගැස්වීමෙන් ප්‍රසිබකොට නාගරික සභාපතිතැන විසින් ඒ සතාව එසේ ප්‍රසිබ වෙන්දේසියේ විකුණ එයින් ලැබෙන මුදලෙන් ඒ සතා සඳහා ගෙවියයුතුවූ ගාස්තු සහ වෙන්දේසිය සඳහා ගිය වියදමට සෑහෙන ගණනක්ද අඩුකර ඉතුරු මුදල් ඒ සතා අයිතිකාරයා විසින් ඉල්ලන්ට යෙදුනවිට ඔහුට ගෙවනු ලැබේ.

බලකඩදාසියක් නැතුව සතුන් මරණ මඩුවට සතෙක් ගෙනෙණ ලද්දෙක් වරදකාරයෙක් වන බව.

94. මේ කාණ්ඩයේ 3වෙනි ඡේදයේ නියමකර තිබෙන පරිදි බලකඩදාසියක් නොලැබ සතුන් මරණ මඩුවට හෝ ඊට අයිති ඉඩමට හෝ යම් සතෙක් ගෙණයෑමවත්, එසේ යම් සතෙක් තමන් සන්තකව එහි තිබාගැණීමවත් කිසියම් කෙනෙක් විසින් කළයුතු නොවේ. යම් නාගරික පරීක්ෂකතැනක් විසින් එබඳු සෑම සතෙක්ම තහනම්ට ගෙණ ආ ලෙඩ ඇති සතෙක්විනම් මරා නැතිකරදමනු ලැබේ.

ලෙඩ ඇතැයි පෙණියන සතුන් මැරිය යුතු නැති බව.

95. යම් සතෙක් මැරීමට සුදුසුයයි ඉහතකී ප්‍රකාර පිළිගන්ට යෙදුනේවී නුමුත්, එසේ මැරීමට ප්‍රථම ඒ සතා ලෙඩවූ බව නැතහොත් වෙනයම් ආකාරයකින් මනුෂ්‍ය ආහාරය පිණිස මැරීමට නුසුදුසු බව පෙණියේනම්, සතුන් මැරීමට බලකඩදාසි දීමට පත්ව සිටින නාගරික පරීක්ෂකතැන විසින් (නොහොත් ඊටම නාගරික සභාපතිතැනගෙන් බලයලත් වෙන තැනැත්තෙක් විසින්) එකී ප්‍රකාර නුසුදුසුයයි පෙණියන සතෙක් මැරීමට බලකඩදාසියක් නොදීම යුතුවේ.

ලෙඩ ඇති සතුන්ගේ මාංශ නැතිකර දැමීම.

96. ඉහතකී ප්‍රකාර මැරීමට සුදුසුයයි පිළිගන්නාලද යම් සතෙක් මැරූ පසු ලෙඩක් නිසා හෝ වෙනයම් ගතයුතු කරුණක් නිසා හෝ ඒ සතාගේ මාංශ මනුෂ්‍ය ආහාර පිණිස ගැණීම නුසුදුසුයයි පෙණියේනම්, ඒ මාංශ විකිණීමට තැබීමත් මනුෂ්‍ය ආහාර පිණිස පාවිච්චි කෙරීමත් වැළැක්වීමට සුදුසු ක්‍රමයකින් ඉහතකී නාගරික පරීක්ෂකතැන විසින් හෝ නාගරික සභාපතිතැනගෙන් බලයලත් එකී වෙන තැනැත්තෙක් විසින් හෝ එවේලෙහිම ඒ මාංශ නැතිකරදමන්ට සලස්වනු ලැබේ. එකී මාංශ මනුෂ්‍ය ආහාරයට නුසුදුසුය යනු වැරදියයි යමෙක් විසින් කියන්ට යෙදුනේවිනම් එකී නාගරික පරීක්ෂකතැන හෝ වෙනයම් බලයලත් තැනැත්තෙක් හෝ තමන්කැටුව සතුන් මරණ මඩුවට යෑමට සනීපාරක්ෂක මූලාදෑනියා නැත්නම් නාගරිකසභාවේ සමාජිකයෙක් වහාම කැඳවාගෙණ ගොස් එහිදී එකී මාංශ සෝදිසිකර බලා ඒවා මනුෂ්‍ය ආහාර පිණිස ගැණීම නුසුදුසුයයි ඒ සනීපාරක්ෂක මූලාදෑනියා විසින් හෝ නාගරික සභාවේ සාමාජිකයා විසින් හෝ තීන්දුකරන්ට යෙදුනේවිනම්, ඒ ගැණ ඒ තීන්දුව ස්ථිර බැවින් මින් ඉහත මේ ඡේදයේ නියමකර තිබෙන පරිදි එකී නාගරික පරීක්ෂකතැන විසින් හෝ වෙනයම් එකී බලයලත් තැනැත්තෙක් විසින් හෝ ඉන්පසු ඒ මාංශ නැතිකර දැමීමට ඒ තැනැත්තාට බලය ඇතිවේ.

නාගරික සීමාවෙන් පිටතදී මරණලද සතුන්ගේ මාංශ අවසරපත්‍රයක් නැතුව නගරයට ගෙණ ඒම යුතු නැති බව.

97. නාගරික සතුන් මරණ මඩුවකදී නොමරණලද යම් ගවයෙකුගේ හෝ බැටළුවෙකුගේ හෝ එළුවෙකුගේ හෝ මාංශ නාගරික සභාපතිතැනගේ විශේෂ අවසරපත්‍රයක් නැතුව නගරයට ගෙණ ඒම කළයුතු නොවේ. එහෙත් පිටරටින් ගෙන්වනලද අයිස් දමාපු මාංශ ගැණ මේ ඡේදයේ බලය නොපවතින්නේය.

එසේ පිටතදී මරණලද සතුන්ගේ මාංශ සෝදිසිකර ඉවරවනතුරු නාගරික සීමාව තුළ විකිණීම යුතු නැති බව.

98. ඉහතකී ප්‍රකාර විශේෂ අවසර පත්‍රයක් පිට ගෙණෙණලද යම් මාංශයක් එය මනුෂ්‍ය ආහාර පිණිස ගැණීමට සුදුසුයයි ඒ සඳහා නාගරික සභාපතිතැන විසින් පත්කරණලද මූලාදෑනියෙක් විසින් නාගරික සතුන් මරණ මඩුවේදී සෝදිසිකර බලා පිළිගන්නාලද්දේවිනම් මිස එසේ නොවීනම්, එබඳු යම් මාංශයක් නගරය තුළ විකිණීමට හෝ විකිණීම පිණිස එළියේ තබාගැණීමට හෝ කොයියම් කෙනෙකුට වීනමුත් කිසියම් බලයක් නැතිවේ. තවද එසේ සෝදිසිකරණ එක එක වතාවට ඒ එක එක මාංශ රාත්තලකට ශත හතරකට වැඩිනොවන ගාස්තුවක් අයකෙරීමට නාගරික සභාවට බලය ඇතුවාත් ඇර එබඳු ගාස්තුව ගෙවූ පසු එකී මාංශ එසේ සෝදිසිකළ බව සඳහන්කොට ඒවා විකිණීමට බලයදී සහතිකපත්‍රයක් එකී මූලාදෑනියා විසින් දෙන්ටද යෙදේ.

සතුන් මරණ මඩුවෙන් පිටතට මාංශ ගෙණයෑමට බලපත්‍රයක් ඕනෑ බව.

99. නාගරික සතුන් මරණ මඩුවක මරන්ට යෙදුන යම් සතෙකුගේ මාංශ හෝ මේ ළඟ ඉහතකී ඡේදයේ නියමකර තිබෙන පරිදි සෝදිසිකරණලද යම් මාංශයක් හෝ, එසේ මරන්ට යෙදුන බව නොහොත් සෝදිසිකරන්ට යෙදුන බව සහතිකකර සතුන් මරණ මඩුව භාරකාරයා නැත්නම් බලපත්‍ර දීමට පත්වසිටින වෙන මූලාදෑනියෙක් විසින් දෙන්ට යෙදෙන, මෙහි අග උප ලෙඛනයේ 'ජී' අක්ෂරය දරණ සටහනේ ප්‍රකාර, බලපත්‍රයක් නැතුව කොයියම් කෙනෙක් විසින්වත් සතුන් මරණ මඩුවෙන් පිටතට ගෙණගියයුතු නොවේවාත් ඇර, අවසරලත් යම් මාංශ වෙළෙන්දෙකුට එබඳු බලපත්‍රයක් දීම සතුන් මරණ මඩුව භාරකාරයාගේ නොහොත් ඒ ගැන පත්වසිටින වෙනයම් මූලාදෑනියෙකුගේ යුතුකම වේ.

හාත්පස වැස්මක් ඇති කරත්තවලින් මාංශ ගෙණයන්ට ඕනෑ බව.

100. නාගරික සතුන් මරණ මඩුවකින් හෝ වෙනයම් ස්ථානයකින් හෝ වෙළඳම්පලට වත් නගරය තුළ වෙනයම් ස්ථානයකටවත් රාත්තල් විස්සකට වැඩියෙන් යම් සතෙකුගේ මාංශ ගෙණයනවිට එය මාර්ගයේදී සැමදෙනාටම එකහෙලා පෙණීම වලක්වන පිණිස සහ අව්වෙන්ද වැස්සෙන්ද දූලියෙන්ද ඊට වියහැකි දෙෂ වලක්වන පිණිසද අඹරාවක් හෙවත් වැස්මක් ඇති වටකර අහුරණලද කරත්තයකින් නොහොත් වෙනයම් වාහනයකින් මිස අන්කිසි විධියකින් එසේ රාත්තල් විස්සකට වැඩි මාංශයක් ගෙණයෑම හෝ ගෙණයන්ට සැලැස්වීම හෝ ඊට ඉඩ දීම හෝ කිසියම් කෙනෙක් විසින් කළයුතු නොවේ. තවද යම් සතෙකුගේ අමු සම් නොහොත් සමක් එක් තැනක සිට තවත් තැනකට ගෙණයෑමේදී සැමදෙනාටම එකහෙලා පෙණෙනලෙස එය ගෙණයෑම හෝ එසේ ගෙණයන්ට සැලැස්වීම හෝ කිසියම් කෙනෙක් විසින් නොකළ යුතුද වේ.

කරත්ත දවස්පතා සෝදා ශුඩකළ යුතු බව.

101. ඉහතකී ප්‍රකාර මාංශ සහ සම් ගෙණයෑමට පාවිච්චිකරණ සෑම කරත්තම දවස්පතා හොඳහැටි සෝදා ශුඩකොට සතුන් මරණ මඩුව භාරකාරයාට හෝ නාගරික පරීක්ෂක තැනකට හෝ පෙන්විය යුතුවේ.

පරීක්ෂකතැන විසින් ගව ලෙඛනයක් තැබියයුතු බව.

102. තමන් විසින් සෝදිසිකරණලද සියලුම ගවයින්ගේ හන් නිවරණ අඩයාලන් යනාදී විස්තර ලියනලද මෙහි අග උප ලෙඛනයේ 'එච්' අක්ෂරය දරණ සටහනේ ප්‍රකාර ගව ලෙඛනයක් ගවයින් පරීක්ෂාකෙරීමේ කටයුතුකරණ නාගරික පරීක්ෂකතැන විසින් හෝ ඉහතකී ප්‍රකාර ඒ සඳහා බලයලත් වෙන තැනැත්තෙක් විසින් හෝ සකස්කොට තැබිය යුතුවේ. තවද ඉරිදා දවස් සහ ආණ්ඩුවේ නිවාඩු දවස් අත්ඇර අනිකුත් සෑමදුම සවස 1 සිට 4 දක්වා යන මේ අතරතුර කාලයේ නාගරිකසභා කන්තෝරුවේදී පොදු ජනයාට ලංවෙන්ට හැකිලෙස එකී ගව ලෙඛනය තැබිය යුතුද වේ.

ගවයින් අයිතිකාරයන් විසින් තමන්ගේ හිමිකම ඔප්පුදිය යුතු බව.

**103.** ඉහතකී ප්‍රකාර සෝදිසිකෙරීමට ගෙණෙන එක එක ගවයා අයිතිකාරයාගේ අයිතිකම ඔප්පුවෙන පිණිස ඒ අයිතිකාරයාට ඌ දුන්නාවූ නොහොත් විකුණුවාවූ තැනැත්තන් හෙවත් තැනැත්තා විසින් අත්සන්කරණලද ඌගේ හං අඩයාලන්ද, එකී තැනැත්තන්ගේ හෙවත් තැනැත්තාගේ නම සහ පදිංචි ස්ථානයද සඳහන්කරණලද ඒ සතා යම් පලාතකින් හෙවත් කොඨාසයකින් ගෙණවේද්ද, ඒ පලාතේ හෙවත් ඒ කොඨාසයේ පොලිස් විදානේ හෝ කොස්තාපල් හෝ වෙනයම් ගම්මුලාදෑනියෙක් හෝ ඇතුළුව සාක්ෂිකාරයින් දෙදෙනෙක් විසින් සහතිකකරණලද අයිතිකාරකමේ සහතිකපත්‍රයක් පෙන්වනලෙස එකී එක එක ගවයා අයිතිකාරයාට ඉහතකී නාගරික පරීක්ෂකතැන විසින් හෝ වෙනයම් බලයලත් තැනැත්තෙක් විසින් හෝ නියමකළ යුතුවේ; තවද මේ ලඟ ඉහතකී ආඥාපණතේ නියමකර තිබෙන ගව ලේඛනයත් සමඟ මෙහි ඉහතකී සහතිකපත්‍ර හෙවත් 'හරක් කුසිතාන්සි' දවස්පතාම නාගරිකසභා කන්තෝරුවට යැවිය යුතුද වේ.

යම් සතෙකුට අයිතිකම් කියා සිටින අය.

104. ඉහතකී ප්‍රකාර සියල්ලන්ට පෙණෙනලෙස බැඳ තබා තිබෙන අතර හෝ මරන්ට ප්‍රථම නාගරික සතුන් මරණ මඩුවකදී හෝ කිසියම් කෙනෙක් යම් සතෙකුට අයිතිකම් කියා සිටියේවීනම් ඒ සතා මැරීම නවත්වා එසේ අයිතිකම් කියාසිටින අයගේ නම ගම සහ ඉහතකී නාගරික පරීක්ෂකතැනට හෝ වෙනයම් බලයලත් තැනැත්තෙකුට හෝ පෙනීයන අන්දමට ඒ ගැන වැඩිදුර උවමනා තොරතුරුත් සමග ඒ අයිතිකම් කියන්නාගේ අයිතිකමේ විස්තර පැය 24ක් ඇතුළතදී ලියා ඔප්පුකරණ හැටියට ඒ අයට දැනුම්දෙන්ට එකී නාගරික පරීක්ෂකතැනට හෝ වෙනයම් බලයලත් තැනැත්තෙකුට හෝ මෙයින් නියමකරණලදී.

අයිතිකම් කියා සිටීමට හේතුවූ සතා මහෙස්ත්‍රාත් තැන ඉදිරියට ගෙණගිය යුතු බව.

105. ඉහතකී අයිතිකමේ විස්තර එකී නියායෙන් ලියා ඔප්පුදුන් කඩිනමින් එකී නාගරික පරීක්ෂකතැන විසින් හෝ එකී වෙනයම් බලයලත් තැනැත්තෙක් විසින් හෝ ඒ සතාව මහෙස්ත්‍රාත්තැන ඉදිරියට ගෙණයන්ට සලස්වා එහිදී එතැන විසින් ඒ අයිතිකම්කීම අප්‍රමාදව විභාගකොට සුදුසු තීන්දුවක්කරණු ලැබේ; එහෙත් එකී ප්‍රකාර අයිතිකම් කියා සිටින අය විසින් තමාගේ ඒ අයිතිකමේ විස්තර ඉහත නියමකර තිබෙන පරිද්දෙන් ලියා ඔප්පුදෙන්ට නොයෙදුනොත් යටකී පැය 24 ගතවූවිට ඒ සතා මරන්ට අවසරදීම ඉහතකී නාගරික පරීක්ෂකතැනට හෝ එකී වෙනයම් බලයලත් තැනැත්තෙකුට හෝ යුතුවන්නේය.

මාංශ වෙළෙන්දන් නාගරයෙන් පිට යන්ට අදහස් ඇති විට ඒ බව නාගරික සභාවට කලින් දැනුම්දීම.

106. කිසිවිටක නාගරයෙන් පිට යන්ට අදහස්කරගෙන සිටින අවසරලත් සැම මාංශ වෙළෙන්දෙක් සහ ප්‍රසිඬ වෙළඳම්පලක, යම් කඩෙක වෙළඳාමට අවසර පත්‍රයක්ලත් සැම දෙනාද, තමන් එසේ අදහස්කරගෙන සිටින බව අඟවමින් ඊට දවස් දෙකක් කල්තියා නාගරික සභාවට ලියා දැනුම්දෙන්ට ඕනෑවාත් ඇර එසේ තමන් නාගරයෙන් පිටගොස් සිටින්ට යෙදෙන අතර තමන් වෙනුවෙන් වෙළඳාම්කෙරීමට පත්කරගන්නාවූ අයගේ සම්පූර්ණ නාමය එසේ ලියාදෙන දැන්වීමේ සඳහන්කරන්ටද ඕනෑවේ; තවද එසේ තමන් වෙනුවෙන් වෙළඳාම් කෙරීමට පත්කරගන්නාවූ එක එක අයගේ නාමය තමන් විසින් හෝ තමන්ගේ කළමනාකාරයා විසින් හෝ එය ලියා පදිංචිකෙරීම පිණිස නාගරික සභා කන්තෝරුවේ තිබෙන ලේඛනයේ ලියාපදිංචිකළ යුතුවා පමණකුත් නොව ඒ වෙළෙන්දා මහනුවර පලාතෙන් එසේ පිටත යෑමේ දවස් හතක් ඇතුළතදී ඒ ලියාපදිංචිකෙරීම කළයුතුද වේ. කොයියම් මාංශ වෙළෙන්දෙක් හෝ ප්‍රසිඬ වෙළඳම්පලක කඩකාරයෙක් හෝ වුවත් යටත්වියයුතු සියලුම අනපණත් රෙගුලාසි ආදියට කෙනෙක් වෙනුවෙන් වෙළඳාම්කෙරීමට යටකී ප්‍රකාර පත්වෙන සැමදෙනාම යටහත්ව බැඳිසිටින්නොවෙයි.

මාංශ වෙළෙන්දන් විසින් කලින් දැනුම් දීම කඩකිරීම.

අවසරලත් යම් මාංශ වෙළෙන්දෙක් හෝ ප්‍රසිඬ වෙළඳම්පලක වෙළඳාම්කෙරීමට අවසරපත්‍රයක් ලත් වෙන කෙනෙක් හෝ ඉහත නියමකරණලද දැනුම්දීම නොකෙළේවීනම් ඔහුට දී තිබෙන අවසර පත්‍රය නාගරික සභාපතිතැන විසින් අවලංගුකරණුලැබේ.

අයකරන්ට යෙදෙන ගාස්තු.

107. පහත පෙනෙන ගාස්තු ගෙවීම ඕනෑකෙරේ :—

| | ශත. |
|---|---|
| ළලහරකෙක් හෝ මීහරකෙක් හෝ මැරීමට දෙන බලකඩදාසියකට ... ... ... | 50 |
| එළුවෙක් හෝ බැටළුවෙක් හෝ මැරීමට දෙන බලකඩදාසියකට | 12½ |
| ඌරෙක් මැරීමට දෙන බලකඩදාසියකට ... ... | 25 |
| එක හරකෙක් බැඳ තබා කෑම දෙන එක එක පැය 24ට නොහොත් ඉන් කොටසකට ... ... | 25 |
| එක එළුවෙක් හෝ බැටළුවෙක් හෝ බැඳ තබා කෑම දෙන එක එක පැය 24ට නොහොත් ඉන් කොටසකට ... | 12½ |
| එක ඌරෙක් කොටුකර කෑමදෙන එක එක පැය 24ට නොහොත් ඉන් කොටසකට ... ... | 12½ |

ඉහත පෙණෙන ගාස්තු කලින්කල වෙනස්කෙරීමට නාගරික සභාවට බලය තිබෙනවාත් ඇර එසේ වෙනස්කරණලද ගාස්තු ආණ්ඩුවේ ගැසැට් පත්‍රයේ ප්‍රසිඬකළාට පසු ඉහත පෙණෙන ගාස්තු වෙනුවට ගෙවිය යුතුද වේ.

විශෙෂ අවසර පත්‍රයකට ගාස්තුව.

108. නාගරික සභාපතිතැනගෙන් විශෙෂ අවසරපත්‍රයක් නැතුව හෝ එබඳු අවසර පත්‍රයක නියමයට විරුඬව හෝ යම් සතෙක්වත් ඌරෙක්වත් මැරීමට අවසරලත් මාංශ වෙළෙන්දෙක් නොවන්නාවූ කිසිකෙනෙකුට බලය නැත්තේය. එබඳු එක එක විශෙෂ අවසර පත්‍රයට මුද්දර ගාස්තුවත්, කලින්කල නාගරික සභාව විසින් නියමකරණලද ගාස්තුවකුත් අයකරණු ලැබේ.

109. මෙහි ඉහත පෙණෙන කාණ්ඩ දෙකේ ගවයන්ට නොහොත් හරකුන්ටද, බැටළුවන්ට සහ එළුවන්ටද "සතුන්" යයි කියනුලැබේ; තවද "ගවයන් නොහොත් හරකුන්" සහ "අවසරලත් මාංශ වෙළෙන්දන්" ද යන මේ දෙකට මාංශ වෙළෙන්දන් සම්බන්ධ ව්‍යවස්ථාවේ ඒ ඒ වාට දෙනලද තේරුම් ඇතිවේ.

---

## 8 වෙනි කාණ්ඩය.

## ඉඩම් අල්ලාගැනීම් සහ අවහිරකෙරීම්.

සම්හර කරුණු වලදී ඉඩම්වල

110. නාගරික සීමාව තුළ තිබෙන නාගරික සභාවට අයිති කිසියම් මුඩුබිමක හෙවත් වෙනයම් බිමක හෝ යම් වීදියක හෝ යම් ගොඩනැගිල්ලක්, නැත්නම් වැටක් බැඳතිබෙන

ඔප්පු කඩදසි පෙන්වනලෙස නාගරික සභාව විසින් ඉල්ලන බව.

බවක්වත්, එබඳු බිමක් හෝ වීථියක් හෝ අවහිරකර තිබෙන බවක්වත්, නැතහොත් නිසිප්‍රකාර බලයක් නැතුව යම් වීථියක මායිමක් වෙනස්කළ බවක්වත්, නාගරික සභාවට පෙණීයන කොයි විටකවී නුමුත් එබඳු ගොඩනැගිල්ලක් හෙවත් වැටක් බැඳ තිබෙන නැතහොත් එසේ අවහිර කර තිබෙන නොහොත් එසේ වෙනස්කරණලද වීථි මායිම වැටිතිබෙන ඉඩමට නොහොත් බිමට අයිතිකම් කියන තැනැත්තෙකුගේ අයිතිවාසිකම ගැන කාරණ ගෙණහැරදක්වන සෑම ඔප්පුතිරප්පු ලියුම් යනාදිය සහ එබඳු ඉඩමක පිඹුරුකඩදසියක් තිබේනම් එයද පෙන්වන හැටියට එසේ අයිතිකම්කියන තැනැත්තෙකුගෙන් ලියමනකින් ඉල්ලීමට නාගරික සභාපතිතැනට බලය තිබේ. එබඳු බිමක නොහොත් ඉඩමක පදිංචිකාරයාම එහි අයිතිකාරයා නොවීනම් එහි අයිතිකාරයාගේ නම සහ පදිංචි ස්ථානයත් ගැන සම්පූර්ණ තොරතුරු දැනුම්දෙන හැටියට නාගරික සභාපතිතැන විසින් එහි පදිංචිකාරයාට නියමකළවිට එසේ ඒ තොරතුරු දැනුම්දීමට ඔහු බැඳිසිටින්නේය ; තවද එහි ඉඩමට නොහොත් බිමට එසේ අයිතිකාරයායයි කියන තැනැත්තාගේ අයිතිවාසිකම ගැන තමන් ලඟ තිබෙන සෑම ඔප්පු තිරප්පු ලියුම් යනාදිය සහ එබඳු ඉඩමක නොහොත් බිමක පිඹුරුකඩදසියක් තිබේනම් එයද පෙන්වන හැටියට ඔහුට නියම කර දවස් දහයක් ඇතුළතදී ඒවා එසේ පෙන්වීමටද නොහොත් එබඳු ඔප්පු තිරප්පු ලියුම් සහ පිඹුරුකඩදසිත් තමන් ලඟ නැතිවීනම් ඒවා කා ලඟ තිබේදැයි ඇසූවිට එසේ ඒවා තිබෙන තැන නාගරික සභාපතිතැනට දැනුම්දීමටත් එහි අයිතිකාරයා බැඳිසිටින්නේය; තවද ඒ ඔප්පු තිරප්පු ලියුම් සහ පිඹුරුකඩදසිත් යමෙක් ලඟ තිබේද, ඒවා පෙන්වනලෙස නාගරික සභාපතිතැන විසින් ඔහුට ලියා දන්වා දවස් දහයක් ඇතුළතදී එසේ ඒවා පෙන්වීමට ඒ අයද බැඳිසිටින්නේය.

ඔප්පු කඩදසි පෙන්වනලෙස ඉල්ලීමේදී ඒවා පරීක්ෂාකිරීමටත් බලය ඇති බව.

111. මේ ලඟ ඉහත පෙණෙන අඥාපණතේ සඳහන් ඔප්පු තිරප්පු ලියුම් සහ පිඹුරුකඩදසිත් යම් ඉඩමක් සම්බන්ධවීද, ඒ ඔප්පු තිරප්පු ලියුම් සහ පිඹුරුකඩදසි ඒ ඉඩමේදීම හෝ නාගරික සභාපතිතැන විසින් නියමකරන්ට යෙදෙන වෙන යම් ස්ථානයකදී හෝ පෙන්විය යුතුවා පමණකුත් නොව එසේ ඒවා පෙන්වනලෙස ඉල්ලන්ට ඉහත පෙණෙන අඥාපණතේ ප්‍රකාර දී තිබෙන බලය ඒ ඔප්පු තිරප්පු ලියුම් සහ පිඹුරුකඩදසිත් උවමණ පරිද්දෙන් පරීක්ෂා කෙරීමට සහ ඒවායින් පිටපත් ගැණීමටත් බලය ඇතුළුව වේ; තවද ඒ ඔප්පු තිරප්පු ලියුම් සහ පිඹුරුකඩදසිත් පරීක්ෂාකෙරීමට සහ ඒවායින් පිටපත් ගැණීමටත් ඒවා අයිතිකාරයින් විසින් නාගරික සභාපතිතැනට ඉඩදිය යුතුවේ,

යම් ඉඩමක් මැණීමට සභාපතිතැන විසින් බලය දියහැකි බව.

112. මේ කාණ්ඩයේ 1 වෙනි අඥාපණතේ සඳහන් ප්‍රකාර යම් ගොඩනැගිල්ලක්වත් වැටක්වත් බැඳ තිබෙන නැතහොත් අවහිරකර අල්ලාගෙණ තිබෙන නොහොත් යම් වීථි මායිමක් වෙනස්කර තිබෙන යම්කිසි ඉඩමකට හෙවත් බිමකට සහ ඒ සම්බන්ධව පරීක්ෂාකර බැලීමටත් මැණීමටත් ඕනෑකරණ වෙන මොනයම් ඉඩමකට හෙවත් බිමකටද, එහි පදිංචිකාරයාට සෑහෙන පමණ කල්තියා දැනුම්දී ඇතුල්වීමටද එබඳු ගොඩනැගිල්ලක්වත් වැටක්වත් බැඳීමෙන් හෝ එසේ අවහිරකෙරීමෙන් හෝ නාගරිකසභාව සන්තක යම් වීථියක හෙවත් ඉඩමක කොටසක් ඊට අයුතුකරගෙණ තිබේද, නොහොත් යම් වීථියක මායිමක් සැබවින්ම වෙනස්කර තිබේද යන බව නොඅනුමාණලෙස නාගරික සභාපතිතැනට දැන ගැණීම පුළුවන්වෙන පිණිස එබඳු සියලුම ඉඩම් පරීක්ෂාකර බැලීමට සහ මැණීමටද එම නාගරික සභාපතිතැනට හෝ ඒ තැනගෙන් ලියවිල්ලක් පිට අවසරලත් වෙන තැනැත්තෙකුට හෝ බලය තිබෙන්නේය.

අල්ලාගෙණ තිබේයයි පෙණීයන ඉඩම් ගැණ අයිතිවාසිකම ඔප්පුදීම ඊට අයිතිකම්කියන තැනැත්තාපිට රඳා තිබෙන බව.

113. ඉහතකී ප්‍රකාර මැණ බැලූ පසු එකී ගොඩනැගිල්ලව වැටට නොහොත් අවහිර කෙරීමට එකී යම් වීථියක කොටසක් අයුතුකරගෙණ තිබේයයිද, නැතහොත් එකී යම් වීථි මායිමක් සෑහෙන බලයක් නැතුව වෙනස්කර තිබේයයිද නාගරික සභාවට පෙණීයන්නේ වීනම්, ඒ ගොඩනැගිල්ල හෙවත් වැට බැඳ තිබෙන නොහොත් එසේ අවහිරකිරීමෙන් හෝ වීථිමායිම වෙනස්කිරීමෙන් හෝ අල්ලාගෙණ තිබෙන ඉඩම නොහොත් බිම නාගරික සභාපතිතැනගේ අවසරපිට මැණීන්ට යෙදී ඒ මැණීමේ සටහන එබඳු ඉඩමේ නොහොත් බිමේ පදිංචිකාරයාට අසවල් ස්ථානයේදී පරීක්ෂාකර බලන්ට ඉඩතිබෙන බව සහ ඒ බව ඔහුට ලියා දැනුම්දී මාසයක් ඇතුළතදී එබඳු ඉඩම නොහොත් බිම ගැණ තමන්ගේ අයිතිවාසිකම ස්ථිරකරගැණීම් පිණිසත් එකී ගොඩනැගිල්ල, වැට නොහොත් අවහිරකෙරීම නාගරිකසභාව විසින් ඉවත්කෙරීම වලක්වන පිණිසත්, නොහොත් ඒ අයුතුලෙස වෙනස්කර තිබෙන වීථි මායිම ඉහත තිබුන හැටියට නැවත පිහිටුවීම වලක්වන පිණිසත්, එකී ඉඩමේ නොහොත් බිමේ පදිංචිකාරයා විසින් හෝ එය ඔහුට පදිංචියට දී තිබෙන අය විසින් හෝ නඩු පවුණන්ට නොයෙදුනොත් එසේ ඒ ගොඩනැගිල්ල, වැට හෙවත් අවහිරකෙරීම නාගරිකසභාව විසින් ඉවත් කරණ බවද, නොහොත් ඒ වීථි මායිම ඉහත තිබුනහැටියට නැවතත් පිහිටුවන බවද, නාගරික සභාපතිතැන විසින් එකී පදිංචිකාරයාට ලියා දැනුම්දෙනු ලැබේ. එසේ යම් නඩුවක් පවුණන්ට නොයෙදුනොත් හෙවත් එසේ නඩු පවුණ ඒ නඩුව ඔප්පුකෙරීමේ කටයුතු හරිආකාර කරන්ට නොයෙදුනොත්, එකී ගොඩනැගිල්ල, වැට නොහොත් අවහිරකෙරීම වහාම ඉවත් කෙරීම නොහොත් ඒ වෙනස්කරණලද වීථි මායිම ඉහත තිබූන හැටියට නැවත පිහිටුවීම නාගරික සභාව විසින් කරවනු ලැබේ. තවද එබඳු වැඩකෙරීම පිණිස ඕනෑකරණ අයුධ ආදී උපකරණ ඇතුව ඊට උවමනා තැනැත්තන් එකී යම් ගෙයකට හෝ වත්තකට හෝ කොටු කරණලද ස්ථානයකට හෝ වෙන කිසියම් ස්ථානයකට හෝ ඇතුල්කරවීමට සහ තමුන්නුත් එහි ඇතුල්වීමටද, නාගරික සභාවට නොහොත් ඒ සඳහා නාගරික සභාවෙන් ලියවිල්ලක්පිට අවසර ලත් කෙනෙකුට බලය තිබේ. තවද මෙකී වැඩකෙරීම සඳහා වෙන්නාවූ වියදම් එකී ගොඩනැගිල්ල හෙවත් වැට බඳිනලද නොහොත් එසේ අවහිරකෙරීමෙන් හෝ වීථි මායිම වෙනස් කෙරීමෙන් හෝ අල්ලාගන්නාලද ඉඩම නොහොත් බිම ගැන අයිතිකම් කියාසිටින තැනැත්තා විසින් ගෙවිය යුතුවා පමණකුත්නොව ඒ වියදමේ ප්‍රමාණය නියම දැන බේරා "වර්ෂ 1887 නාගරිකසභා ව්‍යවස්ථාවේ" ගෙවන්ට නියමකර තිබෙන වියදම් මෙන් ඒ ව්‍යවස්ථාවේ 281 වෙනි සහ 282 වෙනි වගන්තිවල කියා තිබෙන පරිද්දෙන් අයකරණු ලැබේ. ඉදින් මේ ඉහතකී ප්‍රකාර නඩු පවුණන්ට යෙදුනේවීනම් එකී ගොඩනැගිල්ල හෙවත් වැට බැඳීමෙන් හෝ එසේ අවහිර කෙරීමෙන් හෙවත් ඒ වීථි මායිම වෙනස්කෙරීමෙන් හෝ අල්ලාගන්නාලද ඉඩම නොහොත් බිම ගැන තමාගේ අයිතිවාසිකම ඔප්පුදීම ඊට අයිතිකම්කියන තැනැත්තා පිටම රඳා තිබෙන්නේ වේයි.

## 9 වෙනි කාණ්ඩය.
## බල්ලන් ලියාපදිංචිකෙරීම.

ගෙවල්හි පදිංචිකාරයින් විසින් ඕනෑකළවිට ලෙබන පූරවාදීම.

114. සියලුම ගෙවල්හි පදිංචිකාරයන් විසින් මීට යාකර තිබෙන උප ලෙඛනයේ "අයි" අක්ෂරය දරණ සටහනේ ප්‍රකාර ලෙඛනයක් තමන්ගේ ගෙවල්හි සිටිනා බල්ලන් ගණන සහ ලකුණුද ක්‍රමයෙන් උන් අයිතිවන්නේ කාටද කියා පෙන්නා එවනලෙස නාගරික සභාව විසින් වරින්වර නියමකරන්ට එම සභාවට බලය තිබේ. එම ලෙඛනය ලැබී සතියක් ඇතුළතදී එය සම්පූර්ණකර නාගරික සභාව විසින් ඉල්ලාසිටිනා තොරතුරු එහි සැබෑලෙස අනාගතකොට එවන්ටත් එය පිළිගන්වත් සියලු ගෙවල්හි පදිංචිකාරයෝ බැඳිසිටිත්.

බල්ලෙක් ලබාගත් කෙනෙක් විසින් නාගරික සභාවට ඒ බව දැන්වීම.

115. යම් බල්ලෙක් ලබාගන්නාවූද, ඇතිකරගන්නාවූද, නොහොත් හිමිකරගන්නාවූද සියලු අය විසින් එබඳු බල්ලා සපයාගැණීමේ නොහොත් අයිතිවීමට පැමිණීමේ සිට මාසයක් ඇතුළතදී ඒ ගැන සතාගේ සම්පූර්ණ විස්තර සහිත දැන්වීමක් නාගරික සභාවට කළ යුතුයි.

බල්ලන් ගෙණැවිත් පෙන්වනතුරු ලියාපදිංචිකෙරීම නහනම්කෙරීම.

116. යම් බල්ලෙක් ලියාපදිංචිකෙරීමට ඉල්ලාසිටි විටක ඒ බල්ලාව ගෙණැවිත් පෙන්නා සිටින හැටියට ඕනෑකෙරීමටද, එසේ ගෙණැවිත් පෙන්වනතුරු ලියාපදිංචිකළ බවට දෙන සහතිකපත්‍රය නොදෙන්ට පුළුවන් බලයද නාගරික සභාපතිතුමාට ඇත්තේය.

සහතිකපත්‍ර නහනම්කෙරීම.

117. සනීප ආරක්ෂක මුලාදෑනියා විසින් යම් බල්ලෙක් බෝවෙන රෝගයකින් පෙළෙන බව දැනගත්හොත් එය පොදුජනයාට අනතුරුවක්ය කියා කලපනාවූයේ නම් එබඳු සෑම බල්ලෙක් ගැනම දෙන ලියාපදිංචිකෙරීමේ සහතිකපත්‍ර දීම නහනම්කෙරීමට සභාපතිතුමාට බලය තිබේ.

ලියාපදිංචිකෙරීමේ ගාස්තුව.

118. අවුරුදුපතා ලියාපදිංචිකෙරීමේ ගාස්තුවක් වශයෙන් බල්ලෙකුට රුපියල් එකක් බැගින් අයකරණු ලැබේ.

සහතිකපත්‍රය.

119. දෙනලද සහතිකපත්‍රයද මීට යාකරණලද උප ලේඛනයේ දක්වනලද "ජේ" අක්ෂරය දරණ සටහන්පත්‍රය වන්නේය.

ජීවත්වීමට අයොග්‍ය බල්ලන්ගේ සහතිකපත්‍ර අවලංගුකෙරීම.

120. බල්ලා සුවකරණු නොහැකිතරම් ඔත්පලවූයේනම් නොහොත් රෝගීවූයේනම් ඌ ජීවත්වීමට අයොග්‍යයයි කියා ප්‍රධානතැනට නොහොත් සනීප ආරක්ෂක මුලාදෑනියාට කලපනාවූයේනම් සහතිකපත්‍රය අවලංගුකෙරීමට යටහත්ව තිබේ.

බල්ලන් නැතිකර දැමීම.

121. සහතික පත්‍රයක් නුදුන් නොහොත් අවලංගුකරන්ට යෙදුන යම්කිසි බල්ලෙක් නැතිකර දැමීමට නාගරික කන්තෝරුවට ගෙණැවිත් පෙන්නා සිටිනලෙස දැනුම්දුන්විට අයිතිකරයා විසින් එසේකළ යුතුවේ.

බල්ලන්ට කරපටි.

122. නාගරික සභාමණ්ඩලය ඇතුළත තිබාගන ඉන්නාවූ සියලුම බල්ලන් නාගරික සභාවේ මුද්‍රයද ලියා පදිංචිකෙරීමේ නොම්මරය සහ අවුරුද්දද මුද්‍රකරණලද කරපටි දැරියයුතුවේ.

කරපටිවලට ගෙවියයුතු බව.

123. නාගරික සභාවෙන් කරපටි සපයාදෙන්ට යෙදේනම්, කරපටියකට රුපියලකට වැඩිනොවන ගණනක් අයකෙරීමට මෙයින් බලයදී තිබේ.

## 10 වෙනි කාණ්ඩය.
## අසනීපදායක මාංශ ආදිය නහනාමට ගැණීම.

ආහාරයට නුසුදුසු මාංශ ආදිය නහනමට ගෙණ කල යුතු දෙය.

124. නගරය තුළ විකිණීම පිණිස ගෙණෙනලද නොහොත් තබාගන්නාලද ගව මාංශ හෝ කුකුළන් ආදි ඇතිකරණ සතුන් හෝ මාලු හෝ දඩමස් හෝ වෙන මාංශ වර්ග හෝ එළවලු හෝ ගඩාගෙඩි හෝ කෑමටගන්නා වෙනයම් ද්‍රව්‍ය හෝ අසනීපදායකයයි නොහොත් මනුෂ්‍ය ආහාර පිණිස ගැණීමට නුසුදුසුයයි කියා නාගරික පරීක්ෂකතැනක් විසින් අල්ලා නහනමට ගත්විට සනීපාරක්ෂක මුලාදෑනියා වෙතට හෝ ඔහු නගරයේ එවකට නොසිටියේනම්, නොහොත් එබඳු මුලාදෑනියෙක් පත්කරගෙණ නැත්නම් මහෙස්ත්‍රාත්තැන වෙතට හෝ ඒවා ගෙණයෑම එකී නාගරික පරීක්ෂකතැනට යුතුවන්නේය. ඉදින් එසේ අල්ලාගෙණ යනලද මාංශ හෝ කුකුළන් ආදි ඇතිකරණ සතුන් හෝ මාලු හෝ එළවලු හෝ ගඩාගෙඩි හෝ වෙන යම් ද්‍රව්‍ය හෝ මනුෂ්‍ය ආහාර පිණිස ගැණීමට නුසුදුසුයයි එකී සනීපාරක්ෂක මුලාදෑනියාට නොහොත් එකී මහෙස්ත්‍රාත්තැනට පෙණීයේනම්, ඒවා විකිණීම පිණිස තබාගැණීමවත් ආහාර පිණිස ගැණීමවත් වැලැක්වීමට සුදුසු පරිද්දෙන් නැතිකර දැමීමට හෙතෙම විසින් නියමකරණුලැබේ.

## 11 වෙනි කාණ්ඩය.
## අනතුරුදායක නොහොත් අප්‍රියදායක වෙළඳාම්.

පෝර මඩුවලට අවසරපත්‍ර ඕනෑ බව.

125. නාගරික සීමාව තුළ ගොම පෝර හෝ ගෙරිඇට කුඩු හෝ වෙන යම් පෝර වර්ග හෝ දුර්ගන්ධය අටගන්නාවූ කිසියම් ද්‍රව්‍යයක් හෝ විකිණීමටවත්, ගබඩාකෙරීමටවත් තබාගන්නාලද යම් ස්ථානයකට හෙවත් මඩුවකට මෙහි අග උප ලේඛනයේ "කේ" අක්ෂරය දරණ සටහනේ ප්‍රකාර සටහනක ලියවා නාගරික සභාපතිතැන විසින් දෙන්ට යෙදෙන එසේ දුන් දිනේ සිට ඒ ලඟ ලබන දෙසැම්බර් මස 31 වෙනි දින වනතුරු බලය පවතින අවසරපත්‍රයක් නැතුව එබඳු යම් ස්ථානයක හෝ මඩුවක හෝ එබඳු ද්‍රව්‍ය තබාගැණීමවත්, තබාගන්ට සැලැස්වීමවත් කිසිවෙකු විසින් නොකළ යුතුවේ.

1887 නොම්මර 7 ව්‍යවස්ථාවේ 259 වගන්තිය යටතේ අවසරපත්‍ර.

126. නාගරික සභාවේ අනුමතය පිට එම සභාව විසින් කලින්කල නියමකරන්ට යෙදෙන පරිද්දෙන් එක අවසර පත්‍රයකට රුපියල් 30කට වැඩිනොවන ගණනක් අවුරුදුපතා අයකෙරීමට වර්ෂ 1887 නොම්මර 7 ව්‍යවස්ථාවේ 259 වෙනි වගන්තිය යටතේ නාගරික සභාපතිතැනට බලය තිබේ.

259 වෙනි වගන්තියේ සඳහන් වැඩපල පරීක්ෂාකෙරීමට යටහත් බව.

127. වර්ෂ 1887 නොම්මර 7 ව්‍යවස්ථාවේ 259 වෙනි වගන්තියේ විස්තරලෙස සඳහන් කරණලද කිසියම් කටයුත්තක් සඳහා නගරය තුළ කොයියම් ස්ථානයකවී නමුත් කරගෙණයන යම් වැඩපලාදියක් හෙවත් වැඩපලාදිය කෙරීම හෝ කරවීම හෝ නාගරික සභාපතිතැන විසින් සහ ඒ තැනගේ අවසරපිට ක්‍රියාකරණ සියලුදෙනා විසින්ද සෑම කල්හිම පරීක්ෂාකෙරීමට යටහත්ව සහ ඉඩ ප්‍රස්ථා ඇතුවත් තිබිය යුතුවේ.

**අවසර පත්‍රයක් ලත් තැනැත්තා කොන්දේසි ආදියට යටහත් විය යුතු බව.**

128. අනතුරුදායක නොහොත් අප්‍රියදායක ද්‍රව්‍ය සෑදීමේ හෝ ගෙණයෑමේ හෝ ගබඩා කෙරීමේ හෝ තබාගැණීමේ හෝ පිළිවෙළ ගැණද නොහොත් එබඳු ද්‍රව්‍ය මොනයම් කාරුණක් නිසා සෑදීම හෝ ගෙණයෑම හෝ ගබඩාකෙරීම හෝ තබාගැණීම හෝ කළයුතුද යන්න ගැනද, නොහොත් යම් දෙයක් එබඳු ද්‍රව්‍ය හා සමග එකට ගෙණයතහොත් නොහොත් ගබඩා කරතහොත් ඒ මොන අන්දමේ දේවල්ද යන බව ගැනද එසේ ඒ දේවල් එබඳු ද්‍රව්‍ය හා එකට ගෙණයෑමට හෝ ගබඩාකිරීමට හෝ අවසරදීමවත් නොහොත් එසේ ගෙණයෑම හෝ ගබඩා කෙරීම හෝ තහනම්කෙරීමවත් ගැනද, නොහොත් එබඳු අනතුරුදායක ද්‍රව්‍යයන්ගේ හෝ ඉන් එකක හෝ ස්වභාවවත් බලයවත් වරින්වර පරීක්ෂාකෙරීම හෝ අත්හදාබැලීම හෝ දැනගැණීම හෝ ගැනද නාගරික සභාපතිතැන විසින් කලින්කල නියමකරන්ට යෙදෙන කොන්දේසි අණපණත්වලට ඉහතකී වගන්තිය යටතේ අවසරපත්‍රයක් ලත් සෑමදෙනාම ඒ අවසරපත්‍රයේ බලය පවතිනතාක්කල් සියලු වේලෙහිම යටහත්විය යුතුවේ.

**ගව පට්ටි ආදිය පවිත්‍රව තැබීම.**

129. සතුන් බඳින සෑම ඉස්තාලයක් හෝ ගව පට්ටියක් හෝ ගවයින් නවතින ස්ථානයක් හෝ ගාලක් හෝ අයිතිකාරයා නොහොත් බදුකාරයා විසින් එය උළු සෙවිලිකළ වහලකින් වසා බිමට ගඩොල්වත් ගල්වත් බදාමවත් සිමෙන්තිවත් වෙනයම් එබඳු ද්‍රව්‍යයක්වත් අතුරා නාගරික සභාපතිතැන විසින් නියමකරණ අන්දමකට සාදනලද ආවරණකළ වළකට එය සෝදන වතුර සහ සතුන්ගේ මුත්‍රාද ගලාබැසීමට සුදුසුලෙස සිමෙන්ති බදාම අතුරණලද කාණු එහි දමා තිබියයුතුවා පමණකුත් නොව එහි වළ එහි අයිතිකාරයා නොහොත් බදුකාරයාගේ වියදමෙන් දවස්පතා ශුඩකොට එහි තිබෙන්නාවූ කසලවලින් පොදු ජනයාට හිරිහැරයක් නොයෙදෙනලෙස ඒවා ඉවත්කළ යුතුදවේ. එබඳු සෑම ඉස්තාලයක් හෝ ගවපට්ටියක් හෝ ගවයින් නවතන ස්ථානයක් හෝ ගාලක් හෝ දවස්පතා සෝදා පවිත්‍රව තබන්ට ඕනෑවත් ඇර අඩු තරමින් තුන් මාසයකට වරක් සුදු හුණුගාන්ටද ඕනෑවේ. තවද එබඳු ඉස්තාලයක, ගවපට්ටියක, ගවයින් නවතන ස්ථානයක නොහොත් ගාලක ගොම සහ වියලි තුණ කන්දල් ආදිය එහි අයිතිකාරයා නොහොත් බදුකාරයා විසින් ඉන් පිටත සෑහෙන ස්ථානයක නාගරික මූලාදෑනින් විසින් ඉවත ගෙණයෑම පිණිස දවස්පතා දමා තිබියයුතුවේ.

**කරත්ත නවතන ස්ථානවලින් බූලි කුණු කසල් ආදිය දවස්පතා ඉවත්කළ යුතු බව.**

130. “වර්ෂ 1887 නාගරිකසභා ව්‍යවස්ථාවේ” 259වෙනි වගන්තියේ විශෙෂලෙස සඳහන්කරණලද කිසියම් කටයුත්තක් සඳහා පාවිච්චිකරණ නාගරික සීමාව තුළ තිබෙන යම් ස්ථානයක සෑම අයිතිකාරයෙක් නොහොත් පදිංචිකාරයෙක් විසින්ද කරත්ත නවතන ස්ථානයක හෝ ගවයින් බඳින ස්ථානයක හෝ පාන් පෝරණුවක හෝ රථ සාදන ස්ථානයක හෝ කර්මාන්ත ශාලාවක හෝ සෑම අයිතිකාරයෙක් නොහොත් පදිංචිකාරයෙක් විසින්ද (උදේ 6 පටන් 8 දක්වාත් සවස 4 පටන් 6 දක්වාත්) පැය විසිහතරකට දෙවරක් සියලුම රොඩු කුණු බූලි යනාදිය ඒ සෑම ස්ථානයකින්ම ඉවත්කොට නොහොත් ඉවත්කරවා නාගරික සභාපතිතැනට ඒත්තුයන අන්දමේ ස්ථානවල ඒවා තැන්පත්කළ යුතුවේ.

**කරත්ත නවතන ස්ථාන ආදිය වතුර බැසයෑමට හැකි ලෙස තැබීම.**

131. සෑම කරත්ත නවතන ස්ථානයක්ද, ගවයින් බඳින ස්ථානයත් සහ එළු පට්ටියක්ද නාගරික සභාපතිතැනට ඒත්තුයන අන්දමට බිමට බදාම අතුරා කාණු දමා වතුර බැසයාමට හැකිලෙස තැබියයුතුවේ.

---

## 12 වෙනි කාණ්ඩය.

## නාගරිකසභාව විසින් වතුර සැපයීම.

**වතුර බද්ද කෙසේ අයකළයුතුද යන වග.**

132. වර්ෂ 1887 නාගරිකසභා ව්‍යවස්ථාව යටතේ අයකරන්ට නියමවූ වෙනයම් බද්දක්මෙන් ම වර්ෂ 1884 සහ 1895 මහනුවර ජලකර්මාන්ත සම්බන්ධවූ මුදල් නයටගැණීමේ ආඥාවෙන් නියම කරන්ටත්, අයකරන්ටත් බලයද ආඥද ලැබුවාවූ නාගරිකසභාව විසින් වතුර බද්ද සහ මේ කාණ්ඩයේ වගන්තිවලට යටත්ව අයකළයුතුවන්නාවූ වෙනයම් මුදල් ගණන්ද අයකළයුතු වන්නේය.

**නිලධාරීන් පත්කෙරීම.**

133. කර්මාන්ත ඉඩකෙරීමටත් මෙහි පහත සඳහන්වූ වැඩකරගෙණ යෑමටත් ඕනෑකරණ පමණ නිලධාරීන් පත්කෙරීම සහ සභාවට සුදුසුයයි පෙණෙන පරිද්දෙන් ඔවුන්ට පඩිද, වියදම්ද ගෙවීමත් සභාවට යුතුවන්නේය.

**බදු එකතුකෙරීමේ වියදම ආදිය වතුර බද්දෙන් ගෙවිය යුතුයි.**

134. වතුර සැපයීමෙහිද නොහොත් වතුර සැපයීම ගැනද, වතුර බද්ද එකතුකෙරීම ගැනද වෙන්නාවූ සියලුම වියදම් වතුර බද්දට ලැබෙන ආදායමෙන් ගෙවිය යුතු වේ.

**ජලකර්මාන්ත සභාවට අයිති වන්නේය.**

135. මේ නගර නීති වලංගුවෙන කාලයේ නාගරිකය ඇතුළත ඊට අයිතිව තිබෙන නොහොත් පසුව සාදනලද හෝ තබනලද හෝ ගොඩනගණලද හෝ සියලුම ප්‍රසිඬ වැව්ද, ජලාසද, පොකුණුද, ජලස්ථම්භද, උල්පත්ද, දිය දොරවල්ද, ලිංද, දියනලද, වතුර පාරවල්ද, වතුර ඉහලනගන පොම්පද, වෙනත් ජලකර්මාන්තද, එබඳු ජලකර්මාන්ත සම්බන්ධවූ නොහොත් ඊට අයිතිවූ සියලුම ගොඩනැගිලි, කර්මාන්ත සහ ද්‍රව්‍යයන්ද, නාගරික සභාවට අත්පත්වන්නේය.

**වතුර පෙරෙණ වැව් ආදිය සභාව විසින් සෑදිය යුතුයි.**

136. නගරයේ වැසියන්ගේ ප්‍රයෝජනයට ඕනෑයයි කලින්කල හැඟෙන වතුර පෙරෙණ වැව්ද, ජලාසයන්ද, කාණු නොහොත් වෙන කර්මාන්තද සාදවන්ටත් උල්පත් හා ජලස්ථම්භ පිහිටුවන්ටත් දියනල තබවන්ටත් නාගරික සභාවට බලය ඇතිවන්නේය.

**විදි ආදිය බිඳවීමටත් හැරවීමටත් පුද්ගලික ඉඩම්වලට ඇතුල්වීමටත් බලය.**

137. යම් යම් දියනල පිහිටුවීමේදී හෙවත් වැළලීමේදී උවමණයයි කල්පනාවේ නම් දියනල යම් වීදියක් නොහොත් ඉඩමක් නොහොත් වීදියකට අදහස්කර තිබෙන තැනක් මැදින් හෝ හරහට හෝ යටින් හෝ නොහොත් යම් ගොඩනැගිල්ලක්, බිම්ගෙයක් හෙවත් පොළව යට සාදා තිබෙන කාමරයක් යටින් හෝ කොටුකරණලද ඉඩමකට හෝ එබඳු ඉඩමක් මැදින් හෝ පිහිටුවාගෙණ යෑමට නාගරිකසභාවට හැකිවන්නේය. එසේවිනමුත් මේ ආඥාව යටතේ පුද්ගලික ඉඩම් ආදිය සම්බන්ධව එසේකරණ සෑමකල්හිම එසේකරන්ට යන බව ඒ ඉඩම් ආදිය අයිතිකාරයින්ට දැන්විය යුතුයි; වැඩය සම්පූර්ණවූවිට ඒවා අයිතිකාරයින්ගේ අලාබය වෙනුවට සෑහේයයි කල්පනාවෙන මුදල් ගණනක්ද ගෙවිය යුතුයි. එබඳු ගෙවීමේ ගණන හෝ බෙදීම ගැන හෝ යම් ආරවුලක් හටගත්තොත් ඒ ගෙවිය යුතු ගණනද බෙදීමද, මහෙස්ත්‍රාත්තැනක් විසින් තීන්දුකළ යුතුවේ ; ඒ මහෙස්ත්‍රාත්තැනගේ තීන්දුවට විරුඬව ශ්‍රෙෂ්ඨාධිකරණ සභාවට ඇපැල්ගැණීමටද බලය තිබේ.

කවරෙක් විසින් වත් වතුර අපිරිසිදු කළ යුතු නොවේ.

138. සභාවට අයිති ජලාසයක, උල්පතක, පොකුණක, ජලසම්භායක නොහොත් වෙන යම් ජලකම්ානතයක ජලය කිසියම් ප්‍රමාණයකට කිළුටුවෙන, නරක්වෙන, දූෂ්‍යවෙන නොහොත් අපිරිසිදුවෙන අන්දමේ කිසියම් දෙයක් කිසිවෙකු විසින් නොකළයුතු වේ; තවද එබඳු යම් ජලකම්ානතයකට කිසියම් පළුද්දක් හෝ අනතුරුවක් හෝ වියහැකි යමක්ද කිසිවෙකු විසින් නොකළ යුතුවේ.

නොහොත් හිටවා තිබෙන ජලසම්භායකින් නොසේදිය යුතුයි.

139. යම්කිසි කෙනෙක් විසින් නාගරිකය තුළ විදිවලවත් පාරවලවත් වෙනයම් තැනක වත් දැනට තිබෙන නොහොත් මින්පසු පිහිටුවන නොහොත් සාදන ජලාසයක හෝ ජල සම්භායක හෝ උල්පතක හෝ පොකුණක හෝ දියනලයක හෝ වෙනයම් ජලය නවත්වා තිබෙන තැනක හෝ ඒ ලඟ හෝ කැමවත් තමන්ගේ ශරීරය නොහොත් ඉන් යම් කොටසක් සේදීමවත්, යම් හරකෙක්වත්, අශ්වයෙක්වත්, බල්ලෙක්වත්, වෙන කොයියම් සතෙක්වත් නොහොත් යම් වාහනයක්වත්, ඇඳුම්වත්, බඩුවත් වෙන මොනයම් දෙයක්වත් සේදීමවත් නොකළ යුතුවේ.

බදු ගෙවන අයට ගෙවල්වල හිඳනස් ලෙස වතුර පාවිච්චි කිරීමට බලය තිබේ.

140. මේ කාණ්ඩයේ පළමුවෙනි අංකපණතේ සඳහන් ප්‍රකාර බදු ගෙවන්නන්ට ඊට වැඩිමණත් ගෙවීමක් නැතුව තමතමාටම සහ පවුල්වලටත් ගෙදර පාවිච්චිය පිණිස නාගරික සභාවේ ප්‍රසිඩ උල්පතකින් හෝ ජලසම්භායකින් හෝ වතුර ගැණීමට බලය තිබේ.

බාල්දිවල පමණක් වතුර ගෙණයිය යුතුයි.

141. යම් නාණුවකටවත් පාර අයිනේ ඇලකටවත් මාවතකටවත් අඩිපාරකටවත් වෙන යම් ස්ථානයකටවත් ගලානොයනලෙස බාල්දියක හෝ වෙනයම් සුදුසු භාජනයක හෝ වතුර ගෙණයිය යුතුවේ.

කිසියම් ජලසම්භායකට හම් නලයක් යාකළයුතු නොවේ.

142. ප්‍රසිඩ වැඩකට ඕනෑවූවිට නාගරික සභාවේ අවසර ඇතුව යොදනවා මිස අන්‍ය කවර කාරණයකටවත් හම් නලයක්, දිය නලයක්, බටයක්, නාලයක් නොහොත් වෙන කිසියම් දෙයක් කලකටවත් පවතින්ටවත් යම් ජලසම්භායකට යානොකළ යුතුවේ.

"ගෙවල්වල පාවිච්චිය" යන්නට ඇතුළත් නොවන දේවල්.

143. "ගෙවල්වල පාවිච්චියට ගන්නා වතුර" යන්නට අශ්වයන් හෝ හරකුන් හෝ වාහන හෝ විකිණීමටවත් කුලියට දීමටවත් තබා තිබෙන තැන්හි ඒ අශ්වයන්ටවත් හරකුන්ටවත් දීමට හෝ වාහන සේදීමට හෝ වතුර ගැණීමද නොහොත් යම් වෙළඳාමකට, හස්තකම්ානතයකට, වැඩකට, උල්පතකට, පීනා නාන ස්ථානයකට, යම් අලංකාරකෙරීමේ වැඩකට, යන්ත්‍රකර්මයකට හෙවත් ගොයිතැන් අද්යට වතුර ගැණීමද ඇතුළත් නොවේ.

පුද්ගලික ප්‍රයෝජනයට සභාව ඉඩදීම.

144. ගෙයක පදිංචිකාරයා හෝ අයිතිකාරයා හෝ විසින් ඇයදීමක් කළවිට සභාවේ කල්පනාවේ ප්‍රකාර සභාවට සෑහේයයි හැගෙන ගෙවලට සෑහේයයි හිතෙන ප්‍රමාණයකට සුදුසු පොරොන්දු ඇතුව පුද්ගලික ප්‍රයෝජනයට වතුර දීම සභාව විසින් කළ හැකිවේ. පුද්ගලික ප්‍රයොජනයට වතුර දෙනවිට නාගරික සභාවේ ප්‍රධාන ජල නලයේ සිට ඒ වතුර දෙනු ලබන ඉඩමට සම්බන්ධකරන්නාවූද, එසේම ඊට ඕනෑකරන්නාවූද ජල නල සහ අනිකුත් උප කරණත් සෑදීම හෝ පිහිටුවීම හෝ සවිකෙරීම හෝ එසේ පුද්ගලික ප්‍රයෝජනයට වතුර ඉල්ලන්නාගේ වියදමෙන් ජලකම්ානත භාර සුපිරින්ටැන්ඩැන්ට්තැන යටතේ නාගරික කම්ානත කාරයින් විසින් කරණුලැබේ. එබඳු පුද්ගලික වැඩක් ගැන ගණන් බලනලද වියදම ඒ වැඩේ පටන්ගන්ට ප්‍රථමයෙන් නාගරික සභාවට ගෙවනලෙස ඉල්ලන්ට එම සභාවට හැකිවන්නේය.

නාන කාමර සේදීමේ කාමර ආදියට වතුර ගැණීම.

145. සෑම නාන කාමරයකට, සේදීමේ කාමරයකට, බාල්දියකට නොහොත් කුණුවතුර බැස යෑමේ කාණුවකට වතුර ඇතුල්වෙන සිදුර එයින් වතුර පිටවෙන සිදුරට සම්පූර්ණයෙන් වෙන්කොට සාදා තිබිය යුතුවේ; තවද ඒ වතුර ඇතුල්වෙන සිදුර එබඳු නාන කාමරයක, සේදීමේ කාමරයක, බාල්දියක නොහොත් කුණුවතුර බැසයන කාණුවක ඉහළින් නොහොත් මුදුනෙන් තිබිය යුතුවේ.

නය වෙනුවට වතුර නල අල්ලාගත නොහැකි බව.

146. වතුර ගලාඒමට හෝ වතුර ගැණීමට හෝ යොදනලද නල හෙවත් නලයක්වත් ඒ ගැන සවිකරණලද වෙන දෙයක්වත් කිසියම් නයකට අල්ලාගැණීම නොහැකිවේ.

සභාවේ අවසර නැතුව ප්‍රධාන නල හෙවත් නලය පටන් ගෙවලට නල නොතැබිය යුතු බව.

147. ලියවිල්ලක්පිට සභාවේ අවසර නොහොත් කැමැත්ත නොලබා නාගරික සභාවේ ප්‍රධාන දියනල හෙවත් නලයක් පටන් යම් ගෙයකට, ඉඩමකට නොහොත් වත්තකට සම්බන්ධ කරණ නලයක් නොහොත් වතුර ගන්නා නලයක් තැබීම හෝ වෙනස්කෙරීම හෝ දිඝීකෙරීම හෝ වෙනස්කෙරීම හෝ දැනට තිබෙන නලයක් වෙන්කෙරීම හෝ නොකළ යුතුයි; නොහොත් සභාවේ වැඩකරුවන් ඇර වෙන අය ලවා එබඳු දියනල නොපිහිටුවිය යුතුයි. තවද ඒ නල තැබියයුතු තැන කොතනද කියා සභාව ඒත්තුගන්නාතුරුද එසේ දියනල නොතැබියයුතුයි.

අලාභ ගැන සභාව වගනොකියන බව.

148. පුද්ගලික ප්‍රයෝජන ගැන නාගරික සභාවේ ඉල්ලීම් ඉෂ්ටකරණුලැබුවේවී නුමුත් පුද්ගලික ඉඩමේදී යම් නලයක්, මීටරයක්, ඇබයක් නොහොත් සන්ධියක් පිපිරීමෙන් හෝ උතුරා යෑමෙන් හෝ සිඩවෙන අලාභ ගෙවීමට සභාව යටහත්නොවන්නේය; තවද ප්‍රසිඩ පාරක තිබෙන ප්‍රධාන නලවලින් පිට සිඩවෙන කාරණ ගැන වගකීමටද යම් අවසරයකින් හෝ ක්‍රියාවකින් හෝ නාගරික සභාව බැඳී නැත්තේය.

ගෙවල් කාණ්ඩයකට වතුර ගන්නා නල.

149. නාගරික සභාව විසින් වෙන අන්දමකට නියමනොකළේවිනම් දැනට වතුර දී තිබෙන නොහොත් මින්පසු වතුර දෙනුලබන සෑම ගෙයකට නොහොත් ඉඩමකට වතුර ගන්නා නලය වෙනමම තිබියයුතුවේ; තවද කිසිම ගෙයකට වතුර ගන්නා නල එකකට වැඩිය නොතිබිය යුතුද වේ, නොහොත් එක ගෙයකට වතුර ගන්නා නලය වෙන ගෙයකට වතුර ගන්නා යම්කිසි නලයකට හෝ භාජනයකට හෝ වෙනයම් යෙදීමකට හෝ සම්බන්ධකළ යුතු නොවේ.

අවසර නැතුව තබනලද නල අහක්කරන්ට සහ වියදම අයකරන්ටත් සභාව විසින් නියමකළ හැකිවේ.

150. ඉහත දක්වනලද නගර අංකපණත්වල නියෝගවලට විරුඩව යමෙක් විසින් කිසි යම් සම්බන්ධ නල හෙවත් නලයක්වත් වතුර ගන්නා නල හෙවත් නලයක්වත් පිහිටුවීම හෝ වෙනස්කිරීම හෝ දිඝීකෙරීම හෝ කරන්ට යෙදුනේවිනම් එකී නල හෙවත් නලය අහක් කරණලෙස නියමකරන්ට සභාවට බලය තිබේ; තවද එසේ අහක්කරන්ට කියා එබඳු කෙනෙකුට දැනුම්දී තුන් දවසක් ඇතුළතදී එය එසේ අහක්නොකළහොත් සභාව විසින් එය අහක් කරවා ඊට යන්නාවූ වියදම් නියමදූන බේරා වර්ෂ 1887 නාගරිකසභා ව්‍යවස්ථාවේ 281 වෙනි සහ 282 වෙනි වගන්තිවල නියම්කර තිබෙන පරිද්දෙන් එම ව්‍යවස්ථාවෙන් ගෙවන්ට නියම් කරණලද වියදමක් මෙන් එකී අයගෙන් අයකරණු ලැබේ.

නල සම්බන්ධකෙරීම.

151. සභාව විසින් සපයනලද වතුර ගලාඑන නල නොහොත් වතුර යාකරණ නල ඇති වතුර රඳා සිටීමට පාවිච්චිකරණ හෙවත් පාවිච්චිකෙරීමට යොමුකර තිබෙන කිසියම් පොකුණකට ජප්පයකට නොහොත් වෙනයම් භාජනයකට සම්බන්ධ නොකළයුතු වේ.

ජලාස හෙවත් බාල්දි ආදියට නාලිඹුබවාර තැබීම.

152. ජල කම්මතනයෙන් වතුර සපයනලද සෑම ජලාස ආදියකටම පිළිගතයුතු විධියකට සාදනලද බර සහ බලය එක ප්‍රමාණයට ඇති නාලිඹුබවාර නොහොත් ඇබයකින් වැසියහැකි දොරක් හෙවත් සිදුරක් ඇතිවිය යුතුයි; ජලාස අද්දයේ ගැටියක් නොහොත් වතුර ඉතිරීයයා තැනක් ඇතිවිනම් ජලමට්ටම එබඳු තැනට අඟල් දෙකක් පාත්ව තිබෙද්දී වතුර ඒම නැවැත් වියහැකි විධියකට එම නාලිඹුබවාරය සවිකර තැබියයුතුයි.

වතුර ඇතුල්වෙන නලය.

සෑම ජලාසයකටම වතුර ඇතුල්වෙන නොහොත් වතුර ගන්නා නලය එම ජලාසයේ ජල මට්ටමට උඩින් තිබියයුතුවේ.

වතුර ඉතිරීයන නලය.

සියලුම ජලාස ආදියේ වතුර ඉතිරීයෑමට තබන නල ඒවායේ පිටපැත්ත දක්වා සවිකොට එහි දිය වෑස්සීමක් ඇතිවිනම් දැනගතහැකිවෙන පිණිස පහසුවෙන් පෙනෙන තැනකදී කෙළවරකළ යුතුවේ.

යම් ජලාසයකින් ඉතිරීයන වතුර කිසියම් කානුවකට නොහොත් පල්දෙරුවකටවත් නාන කාමරයක හෝ කුණුවතුර බාල්දියක හෝ වෙනයම් සනීපාරක්‍ෂක යෙදීමක හෝ කුණු වතුර යන නලයකටවත් වෙනයම් ජලාසයකින් ඉතිරීයන ජලයටවත් මොනයම් කාරණයක් නිසා විවුමුත් යානොකළ යුතුවේ. එක එක ජලාසයකට වෙන වෙනම වතුර ඉතිරීයන නල ඇතිවිය යුතුවේ.

වතුර පිටවෙන නලය.

153. වතුර පිටවෙන නලය හෙවත් සිදුරුවල වතුර පිටවෙන පැත්ත ඉන් වතුර වෑස්සීම පහසුවෙන් සොයාගැණීම පුළුවන්වෙන පිණිස හොඳකාර පෙනෙන තැනක තැබියයුතු වේ; තවද ඒ නලයෙන් වතුර වැටෙන යම් ජලාසයක, පොකුණක, හෙවත් වෙනයම් භාජනයක මුදුනේ ජලමට්ටමට පහතින් වතුර පිටවෙන කෙළවර කිසිසේත් නොතැබිය යුතුවේ.

වතුර රැස්කර තැබීමට පොළව යට ජලාස පාවිච්චි නොකළ හැකිවේ.

154. සභාව විසින් ලියවිල්ලකින් අවසරදී තිබේනම් මිස නැත්නම් පොළව යට බහාලන ලද නොහොත් භාරණලද ජලාසයක් සභාව විසින් සපයනලද වතුර රැස්කර තැබීමට පාවිච්චි නොකළයුතු වේ.

වතුර රැස්කර තැබීමට භාජන.

155. සුදුසු ලෝහ තහඩුවක් ඇතුළේ අලවා නැති කිසියම් ලී භාජනයක් සභාව විසින් සපයනලද වතුර රැස්කර තැබීමට පාවිච්චිනොකළයුතු වේ.

වතුර අපතේ ඇරීම.

156. යම් ගෙදරක අයිතිකාරයෙක් හෝ පදිංචිකාරයෙක් හෝ විසින් තමන්ගේ ස්ථානයේ තිබෙන කිසියම් ජලාසයකින් හෝ ජල නලයකින් හෝ සිදුරකින් හෝ වතුර අපතේ යෑමට ඉඩනොදිය යුතුයි.

වතුර වෑස්සීයෑම දැනුම්දිය යුතුයි.

යම් ගෙයක හෝ ඉඩමක හෝ තිබෙන වතුර යාකරණ නොහොත් වතුර ගන්නා නලයකින් හෝ ජලාසයකින් හෝ දිය සිදුරකින් හෝ වෙනයම් සවිකරණලද්දකින් හෝ වතුර වෑස්සී යනහොත් එහි අයිතිකාරයා නොහොත් පදිංචිකාරයා විසින් විසිහතර පැයක් ඇතුළත ඒ බව ලේකම්තැනට දැනුම්දිය යුතුවේ.

අයුතුලෙස වතුර පාවිච්චිකෙරීම ආදිය කළවිට ජල මිම්මක් භාවිතාකිරීම.

157. යම් ගෙයක නොහොත් ඉඩමක පදිංචිකාරයින් ඇර වෙන අය විසින් නාගරික ජලකම්මතනවලින් ලැබෙන වතුර පාවිච්චිකරණ බව හෝ ගෙදර වැඩට ඇර වෙන යම් දෙයකට පාවිච්චිකරණ බව හෝ නොහොත් අපතේ අරින බව හෝ නිෂ්ඵලයේ නැතිකරණ බව හෝ නාගරික සභාවට විශ්වාසකරන්ට හේතු ඇතිවූයේවිනම් එබඳු ගෙයකට නොහොත් ඉඩමකට වතුර සපයන නලයට ජල මිම්මක් සවිකෙරීමට සභාවට බලය තිබේ; තවද එබඳු ගෙයකින් වතුර බදු පිණිස ගෙවන එක එක රුපියලට වතුර ගැලොන් දෙදහසකට (2,000) වැඩිය වියදම්වෙන බව ඒ ජල මිම්මෙන් දැනගන්ට ලැබුනොත් එසේ වැඩිය වියදම්වෙන එක එක ගැලොන් දහසකට රුපියලක් බැගින් එබඳු ගෙයි නොහොත් ඉඩමේ පදිංචිකාරයා හෝ අයිතිකාරයා හෝ විසින් නාගරික සභාවට ගෙවියයුතුවේ.

පොරොන්දුවක් පිට වතුර සැපයීම.

මෙහි අග ඇඳ ලෙඛනයේ "ඇල්" අක්‍ෂරය දරණ සටහනේ ප්‍රකාර නාගරික සභාපතිතැන සමග පොරොන්දුවකට බැඳුනොත් ගෙදර පාවිච්චිය ඇර වෙන උවමනාවලට වතුර සපයා දීමට යම් කෙනෙකුට පොරොන්දුවීමට නාගරික සභාවට බලය තිබේ.

ජල මිම් සභාව විසින් සැපයීම.

158. ජල මිම් සභාව විසින් සපයනුලැබේ; තවද සෑහේයයි සභාවට කල්පනාවෙන බද්දක් එබඳු ජල මිම්වල පාවිච්චිය සඳහා අයකරණු ලැබේ.

ලැබියයුතු මුදල් අයකරණ විධිය.

159. මේ ලඟ ඉහත දක්වූ නාගර අණපණත් දෙක යටතේ අයකළයුතු මුදල් ගණන් "එකි 1887 නාගරිකසභා ව්‍යවස්ථාව" යටතේ ගෙවන්ට නියමකරණලද වියදමක්මෙන් එම ව්‍යවස්ථාවේ 281 වෙනි සහ 282 වෙනි වගන්තිවල නියමකර තිබෙන පරිද්දෙන් අයකරණුලැබේ.

ජල මිම් පාවිච්චිය පිණිස බදු.

160. ජල මිම් පාවිච්චිය පිණිස එක් කාර්තුවකට හෙවත් තුන් මාසයකට හෝ ඉන් යම් කොටසකට හෝ ඒ ඒ කාර්තුවේ මුලදී මෙහි පහත දක්වන බදු ගණන් නාගරික සභාවට ගෙවිය යුතුවේ; එබඳු කාර්තු ජනවාරි මස පළමු වෙනිදද, අප්‍රේල් මස පළමුවෙනිදද, ජූලි මස පළමුවෙනිද සහ ඔක්තෝම්බර් මස පළමුවෙනිදත් පටන්ගණු ලබන්නේය :—

| | | | | රු. | ශ. |
|---|---|---|---|---|---|
| අඟල් 3 ජල මිම්මට | කාර්තුවකට | නොහොත් ඉන් කොටසකට | ... | 35 | 0 |
| එම 2 | එම | එම | ... | 20 | 0 |
| එම 1½ | එම | එම | ... | 15 | 0 |
| එම 1 | එම | එම | ... | 7 | 0 |
| එම ¾ | එම | එම | ... | 5 | 75 |
| එම ½ | එම | එම | ... | 4 | 40 |
| එම ⅜ | එම | එම | ... | 3 | 0 |

මාස්පතා ජල මිම් පරීක්‍ෂාකර බැලීම

161. සෑම මාසයකටම වරක් ජල මිම් පරීක්‍ෂාකර බලනු ලැබේ; ජල මිම්මක් පරීක්‍ෂාකර බැලුවිට එසේ එය පරීක්‍ෂාකර බැලූ බවට මෙහි අග ඇඳ ලෙඛනයේ "ඇම්" අක්‍ෂරය දරණ සටහනේ ප්‍රකාර සිහිවීම්පත්‍රයක් ඒ මිම්මෙන් වතුර සපයනුලබන ස්ථානයේ පදිංචිකාරයාගේ නමට පිටලියා ඒ ස්ථානයේ තබනුලැබේ.

**ජල මීටර් නරක්වී තිබුනොත්.**

162. ජල මීටරයක් නරක්වී තිබුනොත් නොහොත් අලුත්වැඩියාකොරීමට හෝ වෙනස්කර සෑදීමට හෝ ගෙණයනුලැබුවොත් මෙහි 161 වෙනි අඥාපණයේ සඳහන් සිතිවිලිපත්‍රයේ ඒ බව සටහන්කරනු ලැබේ. අලුත් ජල මීටරයක් සවිකෙරීමේදී හෝ පරණ ජල මීටරය නැවත සවිකෙරීමේදී හෝ ඒ මීටරයෙන් වතුර දෙනුලබන ස්ථානයේ දෙවැනි සිතිවිලිපත්‍රයක් තබනුලැබේ.

**සාමාන්‍ය ගණන ගැනීම.**

මීටරය නරක්වී තිබුන කාලයේ නොහොත් මීටරයක් නැතුව වතුර ලැබුන කාලයේ පාවිච්චි කළ වතුරේ ප්‍රමාණය මීටරය අහක්කෙරීමට ප්‍රථම ඒ ලඟම පිටපට දෙවතාවක එය හොඳව තිබෙද්දී පරීක්ෂාකර බැලූවිට පෙණීගිය දිනපතා වියදම්වූ වතුරේ සාමාන්‍ය ගණනේ හැටියට ගණන් බලනුලැබේ.

**වියදම්වූ වතුරේ වටිනාකම.**

163. කාර්තුවකදී හෙවත් තුන්මාසයකදී වියදම්වූ වතුරේ වටිනාකම ඉහත සඳහන් ක්‍රමයට නියම දූන ගණන් බලනුලැබේ.

**වියදම්වූ වතුරේ ගණන කාර්තුපතා සෑදීම.**

164. කාර්තුවකට හෙවත් තුන්මාසයකට වරක් ඊලඟ ගතවූ කාර්තුවේ හෙවත් තුන්මාසයේ වියදම්වූ වතුරට ගෙවියයුතු ගණන සාදා දෙනුලැබේ. ඒ සාදාදෙන ගණන් පත්‍රය මෙහි අග උප ලේඛනයේ "ඇත්" අක්ෂරය දරණ සටහනේ ප්‍රකාරවේ; එසේ වතුර ගැන අයවියයුතු ගණන සාදා පහළොස් දවසක් ඇතුළතදී ඒ මුදල් ගණන නාගරික සභාවට කාසිවලින්ම සම්පූර්ණයෙන් ගෙවියයුතුදවේ.

**පහළොස් දවසක් ඇතුළත ගෙවීම.**

165. ජල මීටරයක් පිහිටුවනලද සියලුම තැන්හිම ඒ මීටරය ගැන කලින් ගෙවියයුතු බදුමිළ සටහනක් කාර්තුපතා සාදාදෙනුලැබේ. ඒ බදුමිළ සටහන මෙහි අග උප ලේඛනයේ "ඇත්" අක්ෂරය දරණ සටහනේ ප්‍රකාරවේ; එබදු බදුමිළ සටහන සාදා පහළොස් දවසක් ඇතුළතදී එහි පෙණෙන මිළ ගණන නාගරික සභාවට කාසිවලින් සම්පූර්ණයෙන් ගෙවිය යුතුදවේ.

**පරීක්ෂාකරීමාදිය පිණිස සභාව විසින් ජලමීටර් ඉවත ගෙණ යෑම.**

166. හරි වැරදි පරීක්ෂාකෙරීමට හෝ සෝදිසිකර බැලීමට හෝ අළුත්වැඩියාකෙරීමට හෝ ඒ වෙනුවට වෙන එකක් තැබීමට හෝ කිසියම් පුද්ගලික පාවිච්චියක් නැවැත්වීමේදී හෝ කලින්කල ජල මීටර් ඉවත ගෙණයෑම නාගරික සභාවට හැකිවන්නේය.

**සභාවේ වැඩකරුවන් ලවා පමණක් ජල මීටර් අලුත්කරවිය යුතු බව.**

167. සභාවේ ගුරුකම්පිට නොහොත් සභාව ගණනේ වැඩකරන්නන් ලවා මිස වෙන විධියකින් ජල මීටරයක් වෙනස්කෙරීම හෝ අළුත්වැඩියාකෙරීම හෝ නොකළ යුතුවේ. ජල මීටර් පාවිච්චිකරන්නන්ගේ නිතුවක්කාරකමකින් හෝ නොසැලකිමකින් හෝ නරක්වෙන ඒවා ඇර අනිත් සියල්ලම අළුත්වැඩියාකෙරීම ඔවුන්ගෙන් කිසි වියදමක් නැතුව සභාව විසින් කරවනුලැබේ; එහෙත් වතුර සපයනුලබන ඉඩමක අයිතිකාරයෙකුගේ හෝ පදිංචිකාරයෙකුගේ හෝ නිතුවක්කාරකමකින් හෙවත් නොසැලකිමක්න්වූ පළුද්දක් විනම් එය ප්‍රකෘතිමත්කෙරීම නොහොත් අළුත්වැඩියාකෙරීම ගැන වෙන්නාවූ වියදම සභාවේ නියමයලෙස එකී අයිතිකාරයා හෙවත් පදිංචිකාරයා විසින් ගෙවිය යුතුවේ.

**සභාව විසින් වතුර නැවැත්විය හැකි බව.**

168. සභාවට ඕනෑයයි කල්පනාවෙන වේලාවල් අතරතුරදී වතුර දීම වලක්වන්ට හෙවත් නවත්වන්ට සභාවට බලය තිබේ.

**වැලකිය නොහැකි කාරණාවලින් වතුර නැවතීම ගැන සභාව වග නොකියන්නේය.**

169. කිසියම් හදිසි අනතුරකින් හෝ අනියම් යද නියඟයකින් හෝ වෙනයම් වැලැකිය නොහැකි කාරණයකින් හෝ නගරයට වතුර සැපයීම නැවතුනාට ඒ ගැන යම් දඩයකටවත් වන්දි ගෙවීමකටවත් සභාව යටත්නොවේ.

**පුද්ගලික ප්‍රයෝජනයට වතුර ලබන ගෙයක අයිතිකාරයින් විසින් අනුන්ට වතුර දීම යුතුනොවේ.**

170. පුද්ගලික ප්‍රයෝජනයට වතුර සපයනු ලබනලද කිසියම් ඉඩමක අයිතිකාරයෙක් නොහොත් පදිංචිකාරයෙක් විසින් ගින්නක් නිවීමට නැතහොත් වෙනත් පුද්ගලික ප්‍රයෝජනයට වතුර සපයනු ලබන්නෙකුගේ දියනල ආදිය ඔහුගේ වරදකින් නොව අන්විධියකින් නරක්වී අළුත්වැඩියානොකර තිබේනම් ඔහුට ඇර වෙන කිසියම් කෙනෙකුට තමන්ගේ ඉඩමේ තිබෙන ජලාසයකින් හෝ නල ආදියකින් හෝ වතුරදීමවත් වතුර ගැණීමට කැමැත්තෙන් ඉඩදීමවත් නොකළ යුතුවේ.

**අයුතුලෙස වතුර පාවිච්චිකිරීම අපරාධයක් බව.**

171. ගෙදර පාවිච්චියට හැර වෙනයම් කරුණකට නාගරික සභාවේ ජලකම්භනයකින් වතුර නොලබා සිටින කිසියම් කෙනෙක් එබදු ජලකම්භනයකින් තමන්ට දෙනලද නොහොත් තමන් විසින් ලබනලද වතුර ගෙදර වැඩටම මිස වෙනයම් වැඩකට පාවිච්චිනොකළ යුතුවේ.

**පුද්ගලික ප්‍රයෝජනයට වතුර ලැබී තිබෙන ඉඩමකට ඇතුල්වීමට සහ පරීක්ෂාකෙරීමටත් බලය දීම සභාවට හැකිවේ.**

172. සභාවෙන් බලයදී සිටින කිසියම් තැනැත්තෙකුට යම් ගෙදරක හෝ ඉඩමක හෝ දියනල, ජලකම්භන, සවිකෙරීම් ආදියේ තත්වය පරීක්ෂාකෙරීම පිණිස සහ එහි වතුර අපතේ ඇරීමක්වත්, අයුතුලෙස පාවිච්චිකෙරීමක්වත් තිබේදැයි නියමලෙස දැනගැණීම පිණිසත් එකී අයිතිකාරයාට හෙවත් පදිංචිකාරයාට පැයක් කල්මත්තෙන් දැනුම්දී එබදු ගොඩනැගිල්ලකට හෝ ඉඩමකට හෝ ඔර්ලෝසු පැය ගණනින් උදේ අටටත් සවස පහටත් අතර කොයිවේලාවක හෝ වුවත් ඇතුල්විය හැකිවේ. ඉදින් සෑහෙන කරුණක් නැතුව ඉහතකී කටයුතු පිණිස එබදු කෙනෙකුට එකී යම් ස්ථානයකට ඇතුල්වෙන්ට ඉඩනුදුන්නේවීනම්, නොහොත් සෑහෙන කරුණක් නැතුව එකී පරීක්ෂාකෙරීම වලක්වන්ට යෙදුණේවීනම්, නොහොත් වතුර අපතේ ඇරීම වලක්වන්ට ඉඩනුදුන්නේවීනම්, එබදු ගෙයකට හෝ ඉඩමකට හෝ වතුර සැපයීම සභාව විසින් නැවැත්විය හැකිවේ.

**නගර අඥාපණත් කඩකරීම හේතුකොටගෙණ වතුර දීම වැලැක්විය හැකිවේ.**

173. යම් ගෙයක හෝ ඉඩමක හෝ අයිතිකාරයා නොහොත් පදිංචිකාරයා වතුර බද්ද ගෙවන්ට නියම දිනෙන් පසු පහළොස් දවසක් ගතවෙනතුරු එය නොගෙවා සිටියේවීනම්ද, නොහොත් එබදු අයිතිකාරයෙක් හෙවත් පදිංචිකාරයෙක් මේ කාණ්ඩයේ සඳහන් නගර අඥාපණත්වල යම් නියෝගයක් කඩකෙරීම හෝ කඩකරවීම හෝ කඩකරන්ට ඉඩදීම හෝ කෙළේවීනම්ද, නොහොත් නාගරික ජලකම්භනයට අයිති වතුර අපතේ ඇරීම හෝ වැරදිලෙස පාවිච්චිකෙරීම හෝ අනිසිලෙස පාවිච්චිකෙරීම හෝ අපිරිසිදුකෙරීම් ආදිය හෝ වැලැක්වීම පිණිස කරන්ට ඕනෑවූ යම් දෙයක් අයුතුලෙස නොකර ඇරියේවීනම්ද, එබදු ගෙයකට හෝ ඉඩමකට හෝ පුද්ගලික ප්‍රයෝජනය පිණිස වතුරදීමද සභාව විසින් නැවැත්විය හැකිවේ.

සභාවෙන් බලය ලත් අයට ඉඩම් වලට ඇතුල්ව දියනල කපා හරින්ට හැකි බව.

174. යම් ගෙයකට හෝ ඉඩමකට හෝ දෙනලද වතුර නැවැත්වීමට හෙවත් වැලැක්වීමට වත් යම් නල හෙවත් නලයක් ඉවත්කරන්ටවත් මේ නගර ආඥාපණත්වලින් නාගරික සභාවට බලය ඇති සියලු කාරණවලදීම සහ පුද්ගලික ප්‍රයෝජනයට වතුර ලබනලද යම් ගෙයක හෝ ඉඩමක හෝ පදිංචිකාරයෙක් නැතිවූවිටදීත් එබඳු ගෙයක හෝ ඉඩමක හෝ පදිංචිකාරයෙක් සිටියිනම් ඔහුටවත්, නැත්නම් එහි අයිතිකාරයාටවත්, පැය හයක් කල්මත්තෙන් දැනුම්දී ඔර්ලෝසු පැය ගණනින් උදේ අටටත් සවස පහටත් අතර කාලයේදී එබඳු යම් ගෙයකට හෝ ඉඩමකට හෝ ඇතුල්වීමටද, ඊට නාගරික ප්‍රධාන ජලනලයේ සිට වතුර ගෙණයන යම් නල හෙවත් නලයක් කපාහැරීමට සහ ඉන් ඉවත්කරගැනීමට නාගරික සභාවට බලය ඇති යම් කිසි නලයක්, ජලමීටරයක් හෙවත් සවිකරණලද්දක් ගෙණයෑමටද, ඒ සඳහා සභාවෙන් බලය ලත් යම් තැනැත්තෙකුට සහ ඔහුගේ කම්කරුවන්ටද හැකිවන්නේය.

වචන තේරුම්, හෙවත් පද විස්තර.

175. මේ කාණ්ඩයේ කොතනකවීනමුත් "ප්‍රධාන නල" යන්නෙන් කියනලද්දේ නාගරික සභාවට අයිති මහ ජලාසයේ සිට මහනුවර නගරයට වතුර ගෙණඑන නලය සහ ඒකේ සියලුම අතු නලත්වේ.

"සම්බන්ධ නලය" යන්නෙන් කියනලද්දේ ප්‍රධාන නලයේ සිට යම් ගෙයකට හෙවත් ඉඩමකට ඇතුල්වෙනතැන නොහොත් ඒ ලඟ පිහිටුවනලද නාලිමුඛවාරය දක්වා තබනලද දියනලයට වේ.

"වතුර සපයන නලය" යන්නෙන් කියනලද්දේ ඉහතකී නාලිමුඛවාරයේ සිට යම් ගෙයක් ඇතුළට නොහොත් ඉඩමක් ඇතුළට තබනලද දියනලය සහ එහි අතු සියල්ලත් වේ.

---

## 13 වෙනි කාණ්ඩය.

## කිරිගෑර පැමිණීම් වැලැක්වීම සහ පොදුජනයාගේ ප්‍රවේසමත් පහසුවත්.

වැසිකිළි ඇදිරියේ කසල ඉවත්කෙරීම.

176. නාගරික සීමාව තුළ පිහිටි යම් ගෙයකට, ගොඩනැගිල්ලකට, කොටුකරණලද ස්ථානයකට, හෙවත් යම් ඉඩමකට අයිති වැසිකිළියක හෝ කසල වළක හෝ අතුගෙයක හෝ අඩංගුවූ හෙවත් එකතුවූ අහිතු කසල ආදිය නාගරික සභාපතිතැන විසින් ලියාදෙන දැන්වීමේ නියමකරන්ට යෙදෙන කාලය ඇතුළත එහිම නියමකරන්ට යෙදෙන ස්ථාන හෙවත් ස්ථානයකට ඉවත්කරණලෙස හෝ ඉවත්කරවනලෙස හෝ එකී යම් ගෙයක, ගොඩනැගිල්ලක, කොටුකරණලද ස්ථානයක, හෙවත් යම් ඉඩමක අයිතිකාරයාට නොහොත් පදිංචිකාරයාට කොයියම් වේලේවිදුවුත් ලියා යවනලද දැන්වීමකින් නියමකරන්ට නාගරික සභාපතිතැනට බලය තිබේ. ඉදින් එබඳු දැන්වීමක් එකී අයිතිකාරයාට නොහොත් පදිංචිකාරයාට භාරදී තුන්දවසක් ඇතුළත එහි සඳහන් නියෝග ඔහු විසින් ඉෂ්ටනොකළේවීනම් ඒ ඕනෑකරණලද වැඩය නාගරික සභාපතිතැන විසින් කරවිය හැකිවාත් ඇර ඒ පිණිස ඕනෑකරණ මෙහෙකරුවන්ද ආයුධ ආදී උපකරණද ඇතුව එබඳු යම් ගෙයකට, පිටමඩුවකට, ගොඩනැගිල්ලකට, කොටුකරණලද ස්ථානයකට, හෙවත් යම් ඉඩමකට ඒ සඳහා ඇතුල්වීමට බලයද ඇත්තේය; තවද ඊට යන්නාවූ වියදම් එකී අයිතිකාරයා නොහොත් පදිංචිකාරයා විසින් ගෙවිය යුතුවා පමණකුත් නොව ඒ වියදම් "1887 වෙනි නාගරිකසභා ව්‍යවස්ථාවෙන්" ගෙවන්ට නියමකරණලද වියදම් මෙන්ම එම ව්‍යවස්ථාවේ 281 වෙනි සහ 282 වෙනි වගන්තිවල නියමකර තිබෙන පරිද්දෙන් නියම දඩ බේරා අයකරණු ලැබේ.

අයිතිකාරයා විසින් භාජනය සහ විශලි පස් දියයුතු බව.

177. දිනපතා ශුද්ධකරණ වැසිකිළියක් තිබෙන සෑම ගෙයක නොහොත් ඉඩමක අයිතිකාරයෙක් විසින්ම එම වැසිකිළියට විශලි පස් නොහොත් වෙන යම් දුර්ගන්ධය නැතිකරණ ද්‍රව්‍යයක් දැමීම පිණිස නිසි අන්දමකට සාදනලද සෑහෙනතරම් මහත ඇති භාජනයක් තැබිය යුතුවා පමණකුත් නොව එහි බහාලීමට ඕනෑකරණ පමණ විශලි පස් නොහොත් වෙනයම් දුර්ගන්ධය නසන ද්‍රව්‍යයක් එබඳු භාජනයට පහසුවෙන් ඇතුල්විමට හැකිවෙන හැටියකට ඔහු විසින් ඒ භාජනය සෑදීම හෝ සවිකෙරීම හෝ තැබීම හෝ කළයුතු වේ.

අයිතිකාරයා විසින් වැසිකිළිය සහ භාජන සුරක්ෂිතව තැබීම.

178. දිනපතා ශුද්ධකරණ වැසිකිළියක් තිබෙන සෑම ගෙයක නොහොත් ඉඩමක සෑම අයිතිකාරයෙක් විසින්ම රාත්‍රිගතව අශුචි ඉවත්කෙරීමට තිබෙන සෑම වැසිකිළියක් සහ භාජනයක්ද, එයාකාරයට තැබීම හෝ පාවිච්චිකෙරීම හෝ සැලැස්විය යුතුවාත් ඇර එබඳු වැසිකිළියද, භාජනය සහ එහි විශලි පස් දමා තබනලද භාජනයත් සියලු කල්හිම සුරක්ෂිතව සහ සනීපාරක්ෂාවට ඔබින අන්දමටද තැබිය යුතුවේ.

බද්දකාරයා නොහොත් පදිංචිකාරයා විසින් විශලි පස් සැපයීම.

179. දිනපතා ශුද්ධකරණ වැසිකිළියක් තිබෙන සෑම ස්ථානයකම බද්දකාරයා නොහොත් පදිංචිකාරයා විසින්ද පටුමාවත් නොහොත් දෙබිඩිවිවිකම් අයිතිකාරයා හෙවත් බද්දකාරයා විසින්ද එහි විශලි පස් දමා තිබෙන භාජනයේ එම පස් ගැනීම පිණිස හැන්දක් වැනි භාජනයක් සහ සෑහෙන පමණ විශලි පස්ද සපයා නොහොත් සපයවා තැබියයුතු වේ.

බද්දකාරයා නොහොත් පදිංචිකාරයා විසින් දුර්ගන්ධය නසන බෙහෙත් සැපයීම.

180. සනීපාරක්ෂ මුලාදෙනිතැන විසින් උවමනායයි කල්පනාකොට නියමකළේවීනම් දිනපතා ශුද්ධකරණ වැසිකිළියක් තිබෙන යම් ඉඩමක බද්දකාරයා නොහොත් පදිංචිකාරයා විසින්ද, පටු මාවත් හෙවත් දෙබිඩිවිවිනම් එහි අයිතිකාරයා විසින්ද, සෑහෙන පමණ දුර්ගන්ධය නසන බෙහෙත් ද්‍රව්‍ය සුදුසු භාජනයක ලා එහි තැබිය යුතුවේ.

අයිතිකාරයා නොහොත් බද්දකාරයා විසින් විශලිපස් පාවිච්චිය.

181. සෑම පටුමාවතක් හෙවත් දෙබිඩිවියක් අයිතිකාරයා නොහොත් බද්දකාරයා විසින් එහි තිබෙන එක එක වැසිකිළියකට සෑහෙන පමණ විශලි පස් සහ දුර්ගන්ධය නසන බෙහෙත් ද්‍රව්‍යද වරින්වර දැමීම හෝ දැම්මවීම හෝ කළයුතු වේ.

අයිතිකාරයා විසින් බාල්දි සැපයීම.

182. දිනපතා ශුද්ධකරණ වැසිකිළියක් තිබෙන සෑම ගෙයක හෙවත් ඉඩමක අයිතිකාරයා විසින් එහි පදිංචි නොහොත් නැවතිසිටින (දසඅවුරුද්දකට අඩු වයසේ ළමයින් දෙන්නෙක් සම්පූර්ණ වයස ඇති එක්කෙනෙක්මෙන් ගණන්ගෙණ) සම්පූර්ණ වයසේ අයවළුන් දොළොස් දෙනෙකුට එක වැසිකිළි බාල්දියක් බැගින් ඕනෑකරණ බාල්දි සපයා තබන්ට ඕනෑවාත්ඇර එකී බාල්දි ශක්තිමත්ලෙස සහ හොඳහැටියටත් පවත්වාගත යුතුවේ.

**මිනිසුන් වසන ගෙයක සිට අඩි සියයක් ඇතුළත යම් තැනක වැසිකිළියකින් ඉවත්කළ කසළ වැළලීම තහනම්වේ.**

183. කිසියම් වැසිකිළියක, කසළවළක හෙවත් අතුගෙයක රැස්වූ අශූචි කසළ යනාදිය යම් ගෙයක්වත්, ගොඩනැගිල්ලක්වත්, ඊට අදාල ඉඩම්කිවත් ඇතුළත හෝ යම් දියපාරකට, ඇලදොළකට, ළිඳකට හෙවත් මිනිසුන් වසන ගෙයකට අඩි සියයක් ඇතුළත පිහිටි යම් බිමක හෝ වළලන්නාවූ හෝ වළලවන්නාවූ හෝ තැන්පත්කරන්නාවූ හෝ කරවන්නාවූ හෝ කොයියම් කෙනෙක් වීනමුත් අපරාධයක් කළායයි දොෂාරෝපණයකරණුලබන්නේය. දැන්වීමක් ලැබූවිට එබඳු කෙනෙක් විසින් එකී අශූචි කසළ යනාදිය නාගරික සභාපතිතැන විසින් නියම්කරණලද කාලයක් ඇතුළත එසේ නියම්කරණලද ස්ථානයකට වහාම ගෙණගිය යුතුවේ. ඉදින් එසේ නියමකරණලද කාලය ඇතුළත එකී දැන්වීමේ හැටියට ක්‍රියානොකළේවීනම් නාගරික සභාපතිතැන සහ එතැනගෙන් බලයලත් යම් මූලාදෑනී හෝ වැඩකරුවෝද එබඳු ගෙයකට, ගොඩනැගිල්ලකට හෙවත් ඉඩමකට ඇතුල්ව ඒ ඕනෑකරණලද වැඩය කරවනුලැබේ; තවද ඒ සඳහා ගිය වියදම් එසේ ඒ වැඩය නොකර පැහැරඇරියාවූ තැනැත්තා විසින් ගෙවිය යුතුවා පමණකුත්නොව ඒ වියදම් "වර්ෂ 18·7තේ නාගරිකසභා ව්‍යවස්ථාවෙන්" ගෙවන්ට නියමකරණලද වියදම්මෙන් එම ව්‍යවස්ථාවේ 281 වෙනි සහ 282 වෙනි වගන්තිවල නියමය පරිද්දෙන් ගණන්බලා බේරුම්කර අයකරණු ලැබේ.

**ගෙවල් අයිතිකාරයින් සහ එකී පදිංචිකාරයින් විසින් අවසරලත් තැනැත්තන් පමණක් වැඩට ගතයුතු බව.**

184. නාගරික සීමාව තුල පිහිටි යම් ගෙයක නොහොත් ඉඩමක තිබෙන යම් වැසිකිළියක අශූචි ආදිය ඉවත්කෙරීම ඕනෑකරන්නාවූ නොහොත් එසේ කෙරීමට මේ කාණ්ඩයේ පළමු වෙනි ආඥාපනතේ නියමකර තිබෙනලෙස අනකරණුලැබූවාවූ එකී ගෙය හෙවත් ඉඩම් අයිතිකාරයා නොහොත් එකී පදිංචිකාරයා විසින් එබඳු වැඩය කරවාගන්ට තමන් නියමකර තිබෙන දිනය සහ වේලාවත් ගැන නාගරික සභාපතිතැනට කලින් දැන්වියයුතුවේ; එවිට ඒ සඳහා නාගරික සභාපතිතැන විසින් දෙනලද බලපත්‍රයේ සඳහන්කරණ පොරොන්දු කොන්දේසිපිට නාගරික මූලාදෑනියෙකුගේ ගුරුකම් අනුව මෙහි පහත නියමකරණ පරිදි අවසරලත් වැසිකිළි ශුධකරන්නෙක් ලවා ඒ වැඩය කරවාගැණීමට නාගරික සභාපතිතැන විසින් එකී අයිතිකාරයාට නොහොත් පදිංචිකාරයාට එකී බලපත්‍රය දෙන්ට යෙදේ. තවද නාගරික සභාපතිතැනගෙන් එසේ අවසරලත් තැනැත්තෙක් ඇර වෙන කෙනෙක් එබඳු වැඩෙහි යොදගැණීම එකී කිසියම් අයිතිකාරයෙක් නොහොත් පදිංචිකාරයෙක් විසින් නොකළ යුතුවේ.

**රාත්‍රිගතව අශූචි ඉවත්කෙරීම ද්නපතා කළයුතු බව.**

185. රාත්‍රිගතව අශූචි ඉවත්කෙරීමට බාල්දි තබා දැනට පාවිච්චිකරණ නොහොත් මින්පසු පාවිච්චිකරන්ට යෙදෙන වැසිකිළි ඇති නාගරික අයබදු ගෙවීමට තක්සේරුකරණුලැබූ සෑම ගෙයක්, ගොඩනැගිල්ලක්, ඉඩමක් හෙවත් කාමරයක් නාගරික සභාපතිතැනගේ අත්සන් ඇති ලියවිල්ලක්පිට මේ ආඥාපණතේ බලයෙන් නිදහස්කර නැතිවිනම් එබඳු ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක නොහොත් කාමරයක තිබෙන වැසිකිළියක අශූචි ඒවා ඉවත්කෙරීමට බැඳීසිටින තැනැත්තා විසින් අඛණ්ඩතරමින් දවසකට එක් වරක්වත් ඉන් ඉවත්කෙරීම හෝ කරවීම හෝ කළයුතුවේ. එබඳු ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක නොහොත් කාමරයක වෙන වෙනම කුලී ගෙවීමේ පොරොන්දුපිට එක පවුලකට වැඩිය පදිංචිකාරයෝ ඉන්නාහුනම් නොහොත් එකී වාසස්ථාන එකකට වඩා තිබේනම් වර්ෂ 1887තේ නොම්මර 7 ව්‍යවස්ථාවේ 3 වෙනි වගන්තියේ විස්තරලෙස සඳහන්කර තිබෙන ප්‍රකාර එසේ ඒ වැඩේ කෙරීමට හෝ කරවීමට හෝ බැඳීසිටින තැනැත්තානම් එබඳු ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක නොහොත් කාමරයක අයිතිකාරයා වන්නේය; තවද වෙන යම් ගෙයක්, ගොඩනැගිල්ලක්, ඉඩමක් හෙවත් කාමරයක්විනම්, එකී පදිංචිකාරයා වන්නේය. යම් ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෙවත් කාමරයක අයිතිකාර, පදිංචිකාර දෙදෙනාගෙන් එසේ බැඳීසිටින්නේ කවිද යන වග ගැණ ඔවුන් දෙදෙනා අතර ආරාවුලක් අටගන්ට යෙදුනොත් ඒ ගැණ නාගරික සභාපතිතැන විසින් කරන්ට යෙදෙන බේරුම ස්ථිරවන්නේය.

**නාගරික සභාවේ මූලාදෑනියෙක් වැඩෙහි යොදගැණීම.**

186. ඉහතකී තැනැත්තා විසින් එසේ තමන්ගේ ස්ථානයෙන් අශූචි ඉවත්කරවීම සඳහා නිසිප්‍රකාර සභාපතිතැනගෙන් බලයලත් නාගරික සභාවේ මූලාදෑනියෙක්වත් මේ කාණ්ඩයේ 14 වෙනි ආඥාපණතේ ප්‍රකාර සභාපතිතැනගෙන් ලබනලද අවසරපත්‍රයක් ඇති තැනැත්තෙක්වත් පත්කරගතයුතුවාත් ඇර තමන්ගේ සහ එසේ තමන් විසින් පත්කරගත් නාගරික මූලාදෑනියාගේ නොහොත් අවසරලත් තැනැත්තාගේත් නම් සහ පදිංචි ස්ථාන නාගරික සභාපතිතැනට වහාම ලියා දියයුතුවේ; තවද එබඳු තැනැත්තෙතුගේ ස්ථානයේ තිබෙන වැසිකිළියේ අශූචි හරි මිම්මේ බාල්දි එකක හෝ වැඩි ගණනක හෝ තිබේනම් ඒ සියල්ලම ඉවත්කරවියයුතු වේ.

**හරි මිම්මේ බාල්දියේ මිහත.**

187. එක එක හරි මිම්මේ බාල්දියක් රාත්තල් දහයකට වැඩිනොවන බරට තුත්තනාගස් යකඩ තහඩුවලින් සාද පහත සඳහන් මහත ප්‍රමාණ ඇතිවිය යුතුවේ:—එනම්, උස අඟල් 14යි, ගැටියේ වට ප්‍රමාණය අඟල් 12යි, අඩියේ හෙවත් පතුලේ වට ප්‍රමාණය අඟල් 9යි.

**අශූචි ගෙණයෑමට ගෙවියයුතු ගණන්.**

188. ඉහතකී ප්‍රකාර නාගරික මූලාදෑනියෙක් හෙවත් මෙහෙකරුවෙක් අශූචි ගෙණයෑමට පත්කරගන්නාවූ සෑම තැනැත්තෙක් විසින්ම එකී මෙහෙකරුවා විසින් ගෙණයෑව පිණිස තමන්ගේ ස්ථානයේ අශූචි දමා තිබෙන එක එක හරි මිම්මේ බාල්දියකට මසකට රුපියල් දෙකක් කල්මත්තෙත් නාගරික සභාවට ගෙවිය යුතුවේ; එහෙත් නාගරික අය බදු පිණිස අවුරුද්දකට රුපියල් 400කට අඩු වටිනාකමට තක්සේරුකරණලද යම් ගෙයක්, ගොඩනැගිල්ලක්, ඉඩමක් හෙවත් කාමරයක්විනම් එක හරි මිම්මේ බාල්දියකට ගෙවියයුතු ගණන මසකට රුපියලක් පමණක් වේ. ඉදින් එසේ යම් මාසයකට ගෙවියයුතු මුදල ඒ මාසේ 10 වෙනි දින නොහොත් ඊට ප්‍රථමයෙන් නොගෙවීවේවීනම් ඒ බව නාගරික සභාපතිතැන විසින් මහෙස්ත්‍රාත්තැනට රපෝර්තුකර ඒ මහෙස්ත්‍රාත්තැන විසින් දඩගසනලද මුදලක් මෙන් අයකරණුලැබේ.

**අවසරලත් වැසිකිළි ශුධකරන්නා හෙවත් රාත්‍රි ගතව අශූචි ගෙණයන්නා.**

189. නාගරික සීමාව තුළ අවසරලත් වැසිකිළි ශුධකරන්නෙක්ව වැඩකෙරීමට කැමති සෑමදෙනෙක්ම පළමුකොට නාගරික සභාපතිතැනගෙන් ඒ සඳහා (මෙහි අග උප ලේඛනයේ "බී" අක්ෂරය දරණ සටහනේ ප්‍රකාර) අවසර පත්‍රයක් ලබාගතයුතුවේ.

**අවසර නොලත් කෙනෙක් අශූචි ගෙණගියයුතු නොවේ.**

190. නගරය තුළ කිසියම් ගෙයකින් හෝ ඉඩමකින් හෝ නාගරික සභාවේ කොන්ත්‍රාත්කාරයෙක්වත්, එම සභාව යටතේ වැඩකරණ මූලාදෑනියෙක්වත්, අවසරලත් වැසිකිළි ශුධකරන්නෙක්වත් නොවන්නාවූ කෙනෙක් අශූචි ගෙණගියයුතු නොවේ. මේ ආඥාපණත යටතේ දෙනලද අවසර පත්‍ර සියල්ලම එසේ ඒවා දුන්නාවූ අවුරුද්ද අන්තිම වනතුරු වලංගු වන්නේය.

**අවසරලත් වැසිකිළි ශුද්ධකරන්නන් විසින් තමන් ශුද්ධකළ වැසිකිළි ගණන ගැන ලැයිස්තු දීම.**

191. ඉහතකී ප්‍රකාර අවසරලත් කොයිකම කෙනෙක් වුවත් තමන් විසින් අශුචි ගෙණගියාවූ ගෙවල් නොහොත් ඉඩම් ගණන ගැන නාගරික සභාපතිතැන විසින් ඕනෑකරණ අකාරෙට විස්තර කලින්කල ඔප්පුදිය යුතුවේ.

**සුදුසුයයි පිළිගන්නාලද කරත්ත හෙවත් භාජනවල පමණක් අශුචි ගෙණයෑම.**

192. සනීපාරක්ෂක මූලාදානිතැන විසින් හෝ නාගරික සභාපතිතැන විසින් ඒ සඳහා බලයදී පත්කරණලද වෙන තැනැත්තෙකු විසින් හෝ සුදුසුයයි පිළිගන්නාලද විධියකට සාදා තිබෙන කරත්තවල නොහොත් භාජනවල මිස වෙන හැටියකට අශුචි ගෙණගියයුතු නොවේ: තවද එබඳු කරත්ත හෝ භාජන හෝ වතුර කාන්දු නොවෙන ලෙසටත් සුරක්ෂිත ලෙසටත් ශක්තිසම්පන්නතාවත් සියලු වේලේම තිබියයුතුවේ.

**පාවිච්චිකෙරීමට ප්‍රථමයෙන් අශුචි කරත්ත සහතික කරණු ලැබීම.**

193. යම් කරත්තයක් අශුචි ගෙණයෑමට සෑහෙන්නේයයි සනීපාරක්ෂක මූලාදානිතැන විසින් හෝ නාගරික සභාපතිතැන විසින් ඒ සඳහා බලයදී පත්කරණලද වෙන තැනැත්තෙක් විසින් හෝ සහතිකකරන්ට ප්‍රථම නොහොත් සහතිකපත්‍රයක් දෙන්ට ප්‍රථම ඒ කරත්තය අශුචි ගෙණයෑම පිණිස පාවිච්චි නොකළ යුතුවේ; ඒ සහතිකපත්‍රයද නාගරික සභාපතිතැන විසින් අනකරණ පරිද්දෙන් කලින්කල අලුත්කරණු ලැබේ.

**සහතිකකරණු ලැබූ කරත්ත ගැන ලේඛන පොතක් තැබීම.**

194. අශුචි ගෙණයෑමට සෑහෙන්නේයයි සහතිකකරණලැබූ සියලුම කරත්ත ගැණ ලේඛන පොතක් තබනුලැබේ. එබඳු කරත්ත පිළිවෙළට නොම්මර දමා "වැසිකිළි කරත්තය" යන වචන සහ ඒ ඒ කරත්තවලට ලේඛන පොතේ දමා තිබෙන නොම්මරත් අවසර පත්‍රයලත් අයගේ වියදමෙන් නාගරිකසභා කන්තෝරුවේදී ඒවායේ පින්තාරුකරණු ලැබේ.

**අවසර පත්‍රයේ පිටපැත්තේ තිබෙන නියෝගවලට අවසරපත්‍රය ලත් අය යටත් බව.**

195. වැසිකිළි ශුද්ධකෙරීමට අවසරලත් සෑම දෙනෙක්ම තමන්ගේ අවසරපත්‍රයේ පිට පැත්තේ සඳහන් නියෝග අණපණත්වලට කීකරුවියයුතුවේ; ඒ නියෝග අණපණත්වලින් යමක් ඔහු විසින් කඩකළවිට ඔහුගේ අවසරපත්‍රය නාගරික සභාපතිතැන විසින් අවලංගුකළ හැකිවේ.

**අශුචි ගෙණයන වැසිකිළි ශුද්ධ කරන්නෙක් මූලාව නැවිද්ද යුතුයි.**

196. විදියක් මැදින් අශුචි ගෙණයන කිසිවෙක් එහි මූලාව ඇවිද්දයුතු නොවේවා පමණ තුන් නොව අශුචි දමනලද නොහොත් දමන්ට ගෙණෙනලද යම් භාජනයක් කිසියම් ප්‍රසිද්ධ පාරක හෝ විදියක හෝ එහි අයිනක හෝ නොතැබිය යුතුවේ.

**අශුචි ගෙණයන වාහන හෙවත් කරත්ත පලින්පල නවත්වා නොතැබීම.**

197. කිසියම් වැසිකිළියකින්, අශුචිවළකින් හෙවත් අශුචි දමන භාජනයකින් අශුචි හෝ කසල හෝ වෙන ද්‍රව්‍යයක් හෝ පැටවීමට සහ ගෙණයෑමටත් පාවිච්චිකරණ රෝද දෙකේ කරත්තයක්වත් රෝද හතරේ කරත්තයක්වත් වාහනයක්වත් එකී ද්‍රව්‍ය ඒවාට පැටවීම පිණිස ඕනෑකරණ කාලයට වැඩි වේලාවක් කිසියම් ප්‍රසිද්ධ විදියක හෝ පදිංමාවතක හෝ මහ මාවතක හෝ ප්‍රසිද්ධ පාරක හෝ නවත්වා තැබීමට ඉඩදීම එබඳු රෝදදෙකේ කරත්තයක්වත්, රෝද හතරේ කරත්තයක්වත්, වාහනයක්වත් භාරකාර කිසිකෙණෙක් විසින් නොකළ යුතුවේ.

**අශුචි ගෙණයෑම.**

198. නාගරික සභාපතිතැන විසින් නියමකරණලද මාර්ගදිගේ පමණක් අශුචි ගෙණ යනු ලැබේ.

**අශුචි ආදිය දැමීමට නියමකර තිබෙන ස්ථානවල පමණක් ඒවා දැමීම.**

199. වර්ෂ 1887 නොම්මර 7 ව්‍යවස්ථාවේ 172 වෙනි වගන්තියේ නියමකර තිබෙන ප්‍රකාර ඉඩම්වල මිස වෙනයම් ස්ථානයක අශුචිවත් තිරිසනුන් පැහැරූ අහිතුවත් වෙන කසල වර්ගයක්වත් ධූලිවත් අළුවත් කුණු කන්දල් ආදියවත් දමාලීම කිසිවෙකු විසින් නොකළ යුතුවේ.

**අශුචි කෙසේ නැතිකර දැමිය යුතුද යන බව.**

200. නාගරික සභාපතිතැන විසින් නියමකරන්ට යෙදෙන පරිද්දෙන් අශුචි එකී ඉඩම් වල වළලීම හෝ වෙන විධියකින් නැතිකරදැමීම හෝ කරණුලැබේ.

**නාගරික සභාව ගණනේ සිටින දින පතා කුලීකාරයෙක් හෝ විශේෂ කුලීකාරයෙක් හෝ පත්කර හැරීම.**

201. අශුචි ඉවත්කෙරීම පිණිස නාගරික මූලාදානියෙක් වැඩට පත්කරණලෙස යම් කෙනෙක් විසින් ඉල්ලාසිටිවිට දිනපතා කුලියට වැඩකරණ කුලීකාරයෙක් හෝ විශේෂ කුලී කාරයෙක් හෝ පත්කරණු ලැබේ.

**දිනපතා කුලීකාරයෙකුගේ කටයුතු.**

202. දිනපතා කුලියට වැඩකරණ කුලීකාරයෙක් විසින් කළයුතු වැඩ පහත සඳහන් ප්‍රකාරවේ:—ඔහු ගෘහ මූලිකයාගේ ස්ථානයට පැමිණ නියමකරණලද වැඩය දවසකට විනාඩි 15ක් පමණ වේලා කරන්ට ඕනෑවේ.

(ඒ) ඔහු විසින් ගෘහමූලිකයා විසින් සපයනලද හරි මිම්මේ බාල්දියකට නොහොත් හරි මිම්මේ බාල්දියකට වඩා මහත්තැති වෙන බාල්දියකට 'පිස්පොත්තු' නම් කාමරවල මළමූත්‍ර කෙරීමට පාවිච්චිකරණ භාජනවල සහ කුඩා බාල්දි ආදියේත් තිබෙන මළමූත්‍ර යනාදිය අවසාන කොට, (බී) ඒවා ශුද්ධකර (දුර්ගන්ධය නසන බෙහෙත් ද්‍රව්‍ය ගෘහමූලිකයා විසින් සපයාදී තිබේනම්) ඒවාට දුර්ගන්ධය නසන බෙහෙත්ද්‍රව්‍ය දමා ඒ ඒ භාජන පළමු තිබූන තැන්වලම නිසිහැටියට තැබීමද, (සී) එසේ මළමූත්‍ර ආදියෙන් පුරවනලද හරි මිම්මේ බාල්දිය රාත්‍රිගතව අශුචි ගෙණයන කුලීකාරයාට පහසුවෙන් ගන්ට පුළුවන්ලෙස එය තැබීමට නියමකර තිබෙන සෙවනක් ඇති විවේක ස්ථානයක (මේ ස්ථානය කලින් ගෘහ මූලිකයා සමග බේරා නියමකර ගතයුතුවේ) තැබීමද, (ඩී) ගෘහමූලිකයා විසින් ඕනෑවූවිට ගැණීමට සපයා තබනලද වියලි පස් නොහොත් වැලි හෝ කොහුබත් හෝ ඇතිවිනම් ඒවා දමා තබන භාජනවලට ඒවා පුරවා තැබීමද, (ඊ) වැසිකිළි හෝ ඒවායේ වෙන වෙන කොටස හෝ අතුගා ශුද්ධපවිත්‍රකෙරීමද කළයුතුවේ.

**විශෙෂ කුලීකාරයෙකුගේ කටයුතු.**

203. විශෙෂ කුලීකාරයෙක් විසින් කළයුතු වැඩ පහත සඳහන් ප්‍රකාරවේ :—ඔහුව ඉල්ලා වැඩට පත්කරගත් තැනැත්තාගේ සම්පූර්ණ කැමැත්තේ හැටියට දවසකට පැය අටක කාලයක් ඔහුගෙන් වැඩගතහැකිවේ. මේ කුලීකාරයාට තමාව වැඩට පත්කරගත් තැනැත්තා සමග නියමකරගත් හැටියට වැඩෙහි යෙදීමට නියමකරණලද වේලාවක වැඩ නැවැත්විය හැකිවා සහ ඒ වැඩකරණ කාලය මුළුල්ලේම ඒ ස්ථානයේ තිබෙන වැසිකිළි අතුගෙවල් ආදිය ශුඩපවිත්‍ර කොට තැබීමෙහිද වෙනත් වැසිකිළි සම්බන්ධ සියලු වැඩපලකෙරීමෙහිද ඔහු යෙදී සිටිය යුතුවේ.

**දිනපතා කුලීකාරයෙකුට හෝ විශෙෂ කුලීකාරයෙකුට හෝ ගෙවන කුලී.**

204. දිනපතා කුලීකාරයෙක් හෝ විශෙෂ කුලීකාරයෙක් හෝ වැඩට පත්කරගන්නා තැනැත්තෙකු විසින් නාගරික සභාවට ගෙවියයුතු ගණන් පහත දක්වන ප්‍රකාරවේ :—

සෑම මාසයකට හෙවත් මාසයකින් කොටසකට දිනපතා කුලීකාරයෙකුට රුපියල් එකයි.

සෑම මාසයකට නොහොත් මාසයකින් කොටසකට විශෙෂ කුලීකාරයෙකුට රුපියල් පහළොහයි.

**මුදල් ගෙවීම කල්වත්තෙන් කළයුතු බව.**

205. මෙහි සියලුම මුදල් ගෙවීම් කල්මත්තෙන් ගෙවිය යුතුවා සහ මෙහි 204 වෙනි අංශපණතේ සඳහන් මුදල් ගණන් ගෙවීමට බැඳිසිටින සෑමදෙනෙක්ම දිනපතා කුලීකාරයාගේ හෝ විශෙෂ කුලීකාරයාගේ හෝ වැඩ නැවැත්වීමට තමන් කැමතිබව එසේ ඒ වැඩ නැවැත්වීමට තමන් කැමතිව සිටින්නේ අසවල් දිනයේ සිටය යන බවත් සමග නාගරික සභාපතිතැන වෙත ලියා දැනුම්දෙනතුරු එකී මුදල් ගෙවීමට එසේ ඔහු නොකඩව බැඳිසිටින්නේය.

**නොගෙවා පැහැරඇරියොත් අයකරණ විධිය.**

206. මෙහි 204 වෙනි අංශපණත යටතේ ගෙවියයුතු සියලුම මුදල් ගණන් යම් මාසයක් නොහොත් යම් මාසයක කොටසක් සඳහා ගෙවන්ට ඇත්තේවේද, ඒ මාසේ 10 වෙනි දින නොහොත් ඊට ප්‍රථමයෙන් එය නොගෙවීවේවිනම් හෙවත් පළමුවෙනි වරට දිනපතා කුලීකාරයෙක් හෝ විශෙෂ කුලීකාරයෙක් හෝ ඉල්ලුවිටකදී ඒ කුලීකාරයාගේ වැඩ පටන්ගන්න බව දැනුම්දුන් කඩිනමින් නොගෙවීවේවිනම් වර්ෂ 1887 නොම්මර 7 නාගරිකසභා ව්‍යවස්ථාවෙ 282 වෙනි වගන්තියේ නියමකර තිබෙන පරිද්දෙන් අයකරණු ලැබේ.

**ගෘහමූලිකයා විසින් සැපයූ භාජනවල කුණුකන්දල් දමා තැබීම.**

207. තමන්ගේ ස්ථානයෙන් අළු හෝ අතුගාදමන රොඩු හෝ කුණුකන්දල් යනාදිය හෝ නාගරික සභාවේ කුණුකන්දල් ගෙණයන්නන් ලවා ඉවත්කරවීමට කැමතිවනලද කොයියම් කෙනෙක් විනුමුත් ඒවා වැස්මක් ඇති බාල්දියක හෝ පෙට්ටියක හෝ වෙනයම් එබඳු භාජනයක හෝ දමා නාගරික සභාව විසින් නියිප්‍රකාර කරණලද දැන්වීමකින් කලින්කල නියම කරන්ට යෙදෙන වේලාවල තමන්ගේ ස්ථානයේ ගල්පඩියපිට නොහොත් තමන්ගේ ස්ථානයට ඇතුල්වෙන පාරේ කෙලවරේ තැබිය යුතුවේ; එබඳු බාල්දියක්, පෙට්ටියක් නොහොත් වෙන යම් භාජනයක් ඒවාගේ දමනලද කුණුකන්දල් යනාදිය කුණුකන්දල් ගෙණයන්නන් විසින් අහක්කරගත් පසු පැය බාගයක් ඇතුළත අපසු ගතයුතුද වේ. අළු හෝ අතුගාදමන රොඩු හෝ කුණුකන්දල් යනාදිය හෝ වැස්මක් ඇති බාල්දිවලවත් පෙට්ටිවලවත් වෙනයම් එබඳු භාජනවලවත් මිස කිසියම් විදියක දමාතැබීම කිසිකෙනෙක් විසින් නොකළ යුතුවේ.

**පටුමාවත් හෙවත් දෙබිඩ්ඩි අයිතිකාරයින් විසින් භාජන සැපයීම.**

208. වෙනවෙනම කාමරවලට, කට්ටිවලට හෙවත් කෑලිවලට බෙදා කුලියට දෙන ගොඩනැගිල්ලක් අයිතිකාරයා විසින් ඒ ගොඩනැගිල්ලේ සෑම කාමරයක නොහොත් කට්ටියක පදිංචිකාරයාට අතුගාදමන රොඩු, කුණුකන්දල් යනාදිය දැමීම පිණිස වැස්මක් ඇති බාල්දි හෝ පෙට්ටි හෝ වෙනයම් එබඳු භාජන හෝ සපයා දියයුතුවේ.

**පොදු ඉඩමක් පාවිච්චිකෙරීම.**

209. ප්‍රසිද්ධ දැන්වීමකින් නාගරික සභාපතිතැන විසින් තහනම්කරණලද මොනයම් කරුණකට හෙවත් වැඩකට විනුමුත් නාගරිකය ඇතුළත කොයියම් ප්‍රසිද්ධ ඉඩමක්වත් පාවිච්චි නොකළ යුතුවේ.

**ඉස්තෝප්පු ආදිය සතුන් බැඳීමට පාවිච්චිකෙරීම තහනම් බව.**

210. අශ්වයෙක්වත්, ගවයෙක්වත්, වෙනයම් සතෙක්වත් තමන්ගේ ගෙයි ඉස්තෝප්පුවේ හෝ ඒ සඳහා නියිප්‍රකාර පිළිවෙලකර නැති තමන්ගේ ගෙය ඉදිරිපිට යම් ස්ථානයක හෝ යම් විදියක් අද්දර ස්ථානයක හෝ බැඳ තැබීම කිසිකෙනෙක් විසින් නොකළ යුතුවේ.

**අශ්වයින් ආදීන් විදිවල පිනදැවීම අයුතු බව.**

211. යම් විදියක නොහොත් ඒ අද්දර සක්මන් මලුවක, නැතහොත් එහි ඇතුළත යම් වාහනයක්වත්, සතෙක්වත් සේදීම හෝ පිහදැමීම හෝ, සෝදන්ටවත් පිහදැන්ටවත් ඉඩදීම නොහොත් සැලැස්වීම හෝ, කිසියම් කෙනෙක් විසින් නොකළ යුතුවේ.

**සතුන්ගේ මළකුණු වැළලීම.**

212. යම් අශ්වයෙක් හෝ ගවයෙක් හෝ බැටළුවෙක් හෝ එළුවෙක් හෝ ඌරෙක් හෝ මැරෙන්ට යෙදී පැය හතරක් ඇතුළත් නොහොත් රාත්‍රියකදී මැරුණේවිනම් එළියවැටී පැය හතරක් ඇතුළත නාගරික සභාව විසින් නියමකරණලද ස්ථානයකට තමාගේ වියදමෙන් ඒ මළකුණ ගෙණගොස් දැමීම හෝ පලාත භාර නාගරික පරීක්‍ෂකතැනට ඒ සතාගේ මරණය ගැන දැන්වීම හෝ එසේ ඒ සතා මැරුණ ගෙයි හෙවත් ඉඩමේ පදිංචිකාරයා විසින් කළයුතුවේ; තවද එසේ නාගරික පරීක්‍ෂකතැනට දන්වනලද්දේවිනම් ඒ මළකුණ ගෙණගොස් දැමීමේ හෙවත් වැළලීමේ වියදමට නාගරික සභාපතිතැන විසින් නියමකරන්ට යෙදෙන ගණනක් එකී පරීක්‍ෂකතැනට ගෙවියයුතුද වේ.

**අනතුරුදායක ගස් අහක්කෙරීම.**

213. යම් ගහක් හෝ ගහක අත්තක් නොහොත් ගෙඩියක් හෝ නාගරික සීමාව තුළ යම් ගෙයක් නොහොත් ගොඩනැගිල්ලක් පිට වැටී එහි පදිංචිකාරයින්ට අනතුරුවිය හැකියයි නාගරික සභාපතිතැනට පෙනීයන කිසියම් විටකදී නොහොත් යම් විදියකට නැමී බරව තිබෙන කිසිවිටකදී එබඳු ගහ හෝ ගහක අත්ත නොහොත් ගෙඩිය හෝ කපාහෙලා අහක් කෙරීමට ඒ ගහ තිබෙන ඉඩමේ අයිතිකාරයාට නොහොත් පදිංචිකාරයාට ලියවිල්ලකින් දැනුම්දෙවන්ට නාගරික සභාපතිතැනට බලය තිබෙන්නේය. තවද එසේ දැනුම්දී විසිහතර පැයක් ඇතුළත එකී අයිතිකාරයා නොහොත් පදිංචිකාරයා එය කපාහෙලා අහක්නොකෙළේවිනම් නාගරික සභාපතිතැන සහ එතැන විසින් බලයදී පත්කරණලද යම් මුලාදෑණි හෝ කම්කරුකාරයෝ හෝ එබඳු ඉඩමකට ඇතුල්ව ඒ වැඩේ කරවිය හැකිවා සහ එකී අයිතිකාරයා නොහොත් පදිංචිකාරයා විසින් ඊට ගිය වියදම් ගෙවියයුතුද වේ; ඒ වියදම්ද "වර්ෂ 1887තේ නාගරිකසභා ව්‍යවස්ථාවේ" 281 වෙනි සහ 282 වෙනි වගන්තිවල නියමකර තිබෙන පරිද්දෙන් ගණන්බලා බේරා එම ව්‍යවස්ථාවෙන් ගෙවන්ට නියමකරණලද වියදමක්මෙන් අයකරණු ලැබේ.

දඬුවම්.

214 පහත දැක්වෙන ක්‍රියාවලින් කොයියම් එකක්වත් යම්කිසි කෙනෙක් විසින් නොකළ යුතුවේ :—

අඩි විස්සක් දිග ලීදඬු එකකටඑකක් පසුපස්සෙන් ඇඳපු කරත්තවල ගෙණයෑම.

(1) අඩි විස්සකට වඩා දිග ඇති ලීදඬු නොහොත් වෙන ද්‍රව්‍යයක් එක කෙළවරක් වැඩිපුර කරත්තයකට හෙවත් පස්සෙන් ඇඳපු කරත්තයකට අහුරන්නේ නැතුව යම් කරත්තයක ගෙණයෑම.

(2) අඩි විස්සකට වඩා දිග ඇති ලීදඬු නොහොත් වෙන ද්‍රව්‍යයක් එක කෙළවරක් වැඩිපුර කෙණෙක් උසුලාගෙණ නැතුව උසුලාගෙණ යෑම.

යකඩපොළු තදින් බැඳ ගෙණයෑම.

(3) යකඩ පොලු ආදියෙන් අවගන්නාවූ ශබ්දය වැලැක්වීම පිණිස ඒවායේ කෙළවරවල් නිසිහැටියට තදින් නොබැඳ කරත්තයක පටවාගෙණ යෑම.

දරකරත්ත.

(4) කරත්තයක තට්ටුවේ සිට අඩි හයකට වඩා උස්ව තිබෙන්ට දර හෝ පිජ්ජ ආදිය හෝ වෙනයම් ද්‍රව්‍ය හෝ යම් කරත්තයක පැටවීම.

ලීදඬුආදිය හරස් අතින් පිටතට නෙරා නොතැබීම.

(5) යම් කරත්තයක හෝ වාහනයක හෝ රෝදවලින් පිටතට කෙළවරවල් හරස්ව තිබෙන්ට ලීදඬු හෝ, දර හෝ, පිජ්ජ ආදිය හෝ, පිදුරු හෝ, වෙන මොනයම්, අඤ්වක බඩුබාහිරාදිය හෝ ඒ කරත්තයට හෙවත් වාහනයට පැටවීම.

අනියම්ලෙස පැටවිලිකළ කරත්ත නැවැත්වීම.

215. මේ ලඟ ඉහත පෙණෙන අඤ්ඥාණත් නියෝගවලට විරුඬව යම් ලීදඬු හෝ ඉහතකී වෙනයම් බඩුබාහිරාදියක් හෝ පැටවිලිකරණලද නොහොත් ගෙණයනලද යම් කරත්තයක් එබඳු ලීදඬු හෝ වෙන බඩුබාහිරාදිය හෝ එකී අඤ්ඥාපණෙන් තහනම් නොකරණලද හැටියකට ගෙණයෑම පිණිස අහුරා සකස්කරණතුරු නැවැත්වීමට යම් නාගරික මූලාදූනියෙකුට හෝ පොලිස් මූලාදූනියෙකුට හෝ බලය ඇතුවාත් ඇර එසේ කෙරීමට ඔවුන්ට මෙයින් නියමකරන්ටද යෙදුණේය.

නොසැලකිලිලෙස හෙවත් අප්‍රවේසම් ලෙස පැටවිලිකළ ද්‍රව්‍ය ගෙණයන කරත්ත.

216. කසල, කුණු කන්දල්, කබුක්ගල්, හුණු සහ කුඩිගල්, ගඩොල්, හුණු, නොහොත් වෙන මොනයම් බඩුබාහිරාදිය හෙවත් ද්‍රව්‍ය ගෙනයන්නාවූ යම් බරකරත්තයක්වත් තනි ගොන් කරත්තයක්වත් එකී ද්‍රව්‍යවලින් යම් කොටසක් ප්‍රසිඬ වීදියක වැටීම වැලැක්වීමට සුදුසු අන්දමට ඒවා එකී නිසිආකාර නොඅහුරා දක්කාගණ යෑම කිසිකෙණෙක් විසින් නොකළ යුතුවේ.

බර පැටවූ කරත්ත සමහර පාරවල ගෙණනොයෑම.

217. "ලේඩිගෝර්ඩන් පාර," "ලේඩි හෝර්ටන් පාර," "ලේඩි මැකාර්දි පාර" යන මේ පාරවල් දිගේ ගවයින් අදින කරත්තයක් නොහොත් බර සහිත ද්‍රව්‍ය හෝ බඩුබාහිරාදිය හෝ පැටවිලිකොට ගෙණයන යම්කිසි කරත්තයක් හෙවත් වාහනයක් දක්කාගණ යෑම කිසිකෙනෙක් විසින් නොකළ යුතුවේ.

සක්මන් මළුවල කරත්තවත් වාහනවත් පාවිච්චි නොකිරීම.

218. පයින් ගමන්කරන්නන් සඳහා යම් වීදියක දෙපැත්තෙන් නොහොත් පැත්තකින් සාදාතිබෙන හෙවත් අදහස්කරණලද යම් සක්මන් මළුවක හෝ අඩිපාරක හෝ මොනයම්වූ අන්දමක වාහනයක් විනුමුත් තල්ලුකරගෙණයෑමවත් ඇදගෙණයෑමවත් දක්කාගෙණයෑම්වත් කිසිකෙණෙක් විසින් නොකළයුතුවාත් ඇර මොනයම් අන්දමක ද්‍රව්‍ය හෙවත් ද්‍රව්‍යයක් විකිණීම පිණිස යම් මඩුවක්, මැස්සක් හෙවත් මේසයක් නිතිපතාවත් කලකටවත් තබාගැණීමට හෝ පයින් ගමන්කරන්නන්ට හෙවත් වාහනයන්ට හිරිහැරයක්වත් අවහිරයක්වත් පැමිණියහැකිවන්නාවූ යම් කටයුත්තකට හෝ එබඳු යම් සක්මන්මළුවක් නොහොත් අඩිපාරක් හෙවත් ඉන් යම් කොටසක් නැත්නම් කොටස් හෝ යම් වීදියක කොටසක් හෝ පාවිච්චි කෙරීමවත් පාවිච්චිකිරීමට සැලැස්වීමවත් කිසිකෙනෙක් විසින් නොකළයුතු වේ.

අඩිපාරවල ගවයින් දක්කාගෙණ නොයාම.

219. පයින් ගමන්කරන්නන්ගේම පාවිච්චිය පිණිස වෙන්කොට තබා තිබෙන යම් අඩිපාරක හෝ සක්මන් මළුවක හෝ යම් සතෙක් පිට නැගී යාමවත් යම් ගවයෙක් දක්කාගෙණ යාමවත් කිසියම් රෝද දෙකේ රථයක් හෝ රෝද තුනේ රථයක් හෝ (බයිසිකල් නොහොත් ත්‍රයිසිකල්) වෙන එබඳු වාහනයක් හෝ පැදගෙණ යාමවත් කිසිකෙනෙක් විසින් නොකළ යුත්තේමය.

වීදිවලට යාව තිබෙන ගෙවල් වල පිටපැත්තේ බිත්ති.

220. ප්‍රසිඬ වීදිවලට යාව තිබෙන ගෙවල්වල සහ මිදුල්වල පිට බිත්ති හෙවත් තාප්ප පිරිසිදුලෙසද නිසිආකාර අළුත්වැඩියාකොටද තැබිය යුතුවේ.

දැන්වීම් පත්‍ර නියමකර තිබෙන ස්ථානවල පමණක් ඇලවීම.

221. නාගරික සභාව විසින් යම්කිසිවිටක නියමකරන්ට යෙදෙන යම් ස්ථානයක ඇර වෙන කිසියම් ස්ථානයක හෝ ගහක හෝ ඉඩමක හෝ ගෙයක හෝ ගොඩනැගිල්ලක හෝ බිත්තියක හෙවත් තාප්පයක හෝ කිසියම් දැන්වීමක්වත් පත්‍රයක්වත් සටහනක්වත් තැබීමට නොහොත් ඇලවීමට කිසිකෙනෙකුට බලය නැත්තේය.

හරක් ඇල්ලීම.

222. යම් කරත්තයක බඩු පැටවිලිකරණ කල්හි නොහොත් ඉන් බඩු බානකල්හි එහි යොදා හෙවත් ඊට බැඳ ඒ කරත්තයට අයිති යම් සතෙක් විනම් මිස එසේ නොවීනම් නාගරිකය ඇතුළත යම් ප්‍රසිඬ පාරක මේච්චල්කරන්නාවූ හෝ අනිසි අන්දමට දක්කාගෙණයන්නාවූ හෝ අඬාවතේ යන්නාවූ හෝ දිගඑලිකරණලද්දාවූ හෝ බැඳ තිබෙන ලද්දාවූ හෝ යම් හරකෙක්වත් අශ්වයෙක්වත් බැටළුවෙක්වත් එළුවෙක්වත් වෙන සතෙක්වත් ඔවුන් ඇල්ලීමට නාගරික සභාපතිතැනගෙන් අවසරලත් තැනැත්තෙකුට සම්භවූවිට ඒ සතුන් ඇල්ලීමට ඒ තැනැත්තාට බලය තිබෙන්නේය. එහෙත් එසේ තමන් විසින් අල්ලනලද නොහොත් අල්ලවනලද සෑම සතෙක්ම මහනුවර පොලිස් ස්ථානය භාර පොලිස් මූලාදූනියාට වහාම භාරදිය යුතුවේ. තවද එබඳු මූලාදූනියා විසින් ඒ ඇල්ලීම නාගරික සභාපතිතැනට රපෝර්තුකරන්ට ඕනෑ. එසේ රපෝර්තුකරණවිට ඒ සතාට අයිතිකම් කියා ඉල්ලන්නෙක් නොසිටියේනම් ඒ සතාට කෑම දී ප්‍රවේසමකොට තැබීම පිණිස උචිතවූ කටයුතු සලස්වන්ට සහ ඒ සතාව එසේ ඇල්ලූ බව සිරිත් ප්‍රකාර ප්‍රසිඬකෙරීමටත් එකී මූලාදූනියාට නාගරික සභාපතිතැන විසින් නියමකරන්ට යෙදේ. එසේ ඇල්ලුවාවූ සතෙක් සඳහා රුපියලක ගාසතුවක් සහ ඒ සතා එකී මූලාදූනියා භාරේ උන් එක එක දවසකට ශත පනහකට වැඩිනොවන ගණනක් ඒ මූලාදූනියාගේ ප්‍රයෝජනයට වැඩිපුර කණු ගාසතුවක් වසයෙන්ද ගෙව්වොත් මිස නැත්නම් ඒ සතා අයිතිකාරයාට ඌව භාරදෙනු නොලැබේ. තවද එසේ ඒ සතාව අල්ලා දහ දවසක් ඇතුළත ඌට අයිතිකම් කියා ඉල්ලන්නෙක් නොපැමිණියේවිනම් නොහොත් ඉහතකී ගාසතු නොගෙව්වේවිනම් ඒ සතාව ප්‍රසිඬ වෙන්දේසියේ විකුණුවා ඉන් ලැබෙන මුදලෙන් ඌ නඩත්තුකෙරීම සහ ප්‍රවේසම්

කෙරීමත් පිණිස ඉහතකී මුලාදෑනියාට ගෙවියයුතු මුදල ගෙවා ඉතුරු මුදලක් ඇතිවිනම් එය නාගරික සභාවේ ලේකම්තැනට ගෙවීමට නාගරික සභාපතිතැනට බලය තිබෙනවාත් ඇර මෙයින් නියමකරන්වද යෙදුනා ඇත.

---

## 14 වෙනි කාණ්ඩය.

## බෝවෙන රෝග සහ වසංගත රෝග.

**වසූරි නොහොත් කොලරා ලෙඩුන් ඉස්ප්‍රිතාලයට ගෙණයාම.**

223. වසූරියෙන් හෝ කොලරාවෙන් හෝ වෙනයම් බෝවෙන රෝගයකින් හෙවත් වසංගත රෝගයකින් හෝ පෙලෙන යම් කෙනෙකුව යම් ගෙදරක නොහොත් ඉඩමක අව ශෙෂ පදිංචිකාරයන් කෙරෙන් වෙන්කර තැබීමට ඉඩප්‍රසථා නැතිවිනම් නොහොත් එබඳු රෝගාතුරයෙකුව එබඳු ගෙදරක හෙවත් ඉඩමක තැබීම අනිකුත් අයවලුන්ට අනතුරුදායක විය හැකියයි ආණ්ඩුවේ ප්‍රධාන වෛද්‍යාචාර්යයාට හෙවත් සනීපාරක්‍ෂක මුලාදෑනියාට පෙණියන්නේවි නම් ප්‍රසිඬ ඉස්ප්‍රිතාලයකට හෝ නාගරික සභාපතිතැන විසින් නියමකරණලද වෙනයම් තනි ඉඩම කට හෝ එබඳු රෝගාතුරයෙකුව අහක්කරවීමට නාගරික සභාපතිතැනට බලය තිබේ.

**එක් සථානයක සිට වෙනින් සථානය කට ලෙඩා ගෙණ යෑම.**

224. එකී ප්‍රසිඬ ඉස්පිරිතාලයකට හෙවත් තනිගෙයකට ගෙණයෑම වෙනුවට එසේ රෝගාතුරවූ කෙනෙක් හෝ ඔහුගේ මිත්‍රාදීන් හෝ විසින් නියමකරගන්නාවූ, එකී ආණ්ඩුවේ ප්‍රධාන වෛද්‍යාචාර්යයා හෙවත් සනීපාරක්‍ෂක මුලාදෑනියා විසින් එපා නොකරන්නාවූ, යම් පලාතකට හෙවත් සථානයකට එසේ රෝගාතුරවූ කෙනෙක්ව ගෙණ යෑමට අවසරදෙන්ට නාගරික සභාපතිතැනට බලය තිබේ.

**නාගරික සභාපතිතැන විසින් නියම නොකර ගෙණ නොයෑම.**

225. වසූරියෙන් හෝ කොලරාවෙන් හෝ වෙනයම් බෝවෙන රෝගයකින් නොහොත් වසංගත රෝගයකින් හෝ පෙලෙණ අයෙකුව, මේලඟ ඉහත පෙණෙන අඥාපණතේ නියම කර තිබෙන ප්‍රකාර නාගරික සභාපතිතැනගේ අවසර ඇතුව මිස, ඒ අය සිටින ගෙයි හෙවත් සථානයේ සිට වෙන යම් ගෙයකට හෙවත් සථානයකට ගෙණ යෑම හෝ ඊට උපකාරවීම හෝ කිසිකෙනෙක් විසින් නොකළ යුතුවේ.

**වසංගත රෝගීන් නවතන ඉස්පිරිතාල අවහිරකර තැබීම.**

226. නාගරික සභාපතිතැන විසින් නියමකරණලද සියලුම ඉස්පිරිතාල සහ තනි ගෙවල්, ඒවාට වසූරියෙන් හෝ කොලරාවෙන් හෝ වෙන යම් බෝවෙන රෝගයකින් හෙවත් වසංගත රෝගයකින් හෝ පෙලෙන්නන් භාරගැණීමට පාවිච්චිකරණ කල්හි, වෙන ගෙවල් ආදිය සමග ගණුදෙනු අඥ නැතුව අවහිරකොට තබනුලැබේ; තවද නිසිප්‍රකාර පත්කරණලද සාතතු කාරාදීන් ඇර වෙන කිසියම් කෙනෙකුට මොනයම් කරුණක් නිසාවත් එබඳු යම් ඉස්පිරිතාලය කට හෙවත් තනි ගෙයකට යාම් ඊම් කරන්ට, එය භාර වෛද්‍ය මුලාදෑනියාගේ අවසරපිට මිස, ඉඩදෙනු නොලැබේ.

**ඉස්පිරිතාලයෙන් පිටවී යෑම පිණිස ලෙඩෙකුට වෛද්‍යක සහතික පත්‍රයක් ඕනෑබව.**

227. එබඳු යම් ලෙඩෙක් එකී ඉස්පිරිතාලයෙන් හෙවත් ලෙඩුන් නවතන තනි ගෙයින් පිටවියාමට සුදුසු වන්නේයයි එහි භාරකාර වෛද්‍ය මුලාදෑනියා විසින් සහතිකකරණ තුරු ඒ ලෙඩාට ඉන් පිටවී යෑමට ඉඩදෙනු නොලැබේ.

**ලෙඩුන් නාන සථාන වෙන්කර තැබීම.**

228. සුවවේගනඑන ලෙඩුන්ට නෑම පිණිස විශෙෂලෙස වෙන්කර තබනලද සථානවල මිස යම් ප්‍රසිඬ සථානයක එබඳු ලෙඩෙකුට නාන්ට ඉඩදෙනු නොලැබේ.

**ලෙඩුන් අහක්කළාට පසු වසංගත රෝග තිබුන ගෙවල් අවහිරකොට තැබීම.**

229. වසූරියෙන් හෝ කොලරාවෙන් හෝ වෙනයම් බෝවෙන රෝගයකින් හෙවත් වසංගත රෝගයකින් පෙලෙණ ලෙඩෙකුව යම් ගෙයකින් හෙවත් ගොඩනැගිල්ලකින් අහක් කළේවේද, ඒ ගෙට හෙවත් ගොඩනැගිල්ලට වසංගත නාසන බෙහෙත් දමා ශුඩ පවිත්‍රකෙරීම පිණිස එය අවහිරකර තැබීම උවමනායයි නාගරික සභාපතිතැනට හෝ ආණ්ඩුවේ වෛද්‍යාචාර්යයාට හෝ සනීපාරක්‍ෂක මුලාදෑනියාට හෝ කල්පනාවූවිට එසේ ඒ ලෙඩා ඉන් අහක්කරන්ට යෙදුන කඩිනමින් නාගරික සභාපතිතැනට හෝ එකී ආණ්ඩුවේ වෛද්‍යාචාර්යයාට හෝ සනීපාරක්‍ෂක මුලාදෑනියාට හෝ සෑහේයයි කල්පනාවෙන පරිද්දෙන් හත්දවසකට වැඩිනොවන කාලයක් එය අවහිරකොට තබනුලැබේ; තවද නිසිප්‍රකාර පත්කරණලද වැඩකාරයන්ට ඇර වෙන කිසිකෙනෙකුට මොනයම් කරුණක් නිසාවත්, එකී ආණ්ඩුවේ වෛද්‍යාචාර්යයාගේ හෙවත් සනීපාරක්‍ෂක මුලාදෑනියාගේ අවසරපිට මිස, ඒ ගෙට හෙවත් ගොඩනැගිල්ලට යාම් ඊම් කරන්ට ඉඩදෙනු නොලැබේ. ඉහතකී ප්‍රකාර අවහිරකොට තබනලද යම් ගෙයක හෙවත් ගොඩනැගිල්ලක පදිංචිකාරයින්ගේ නඩත්තුව පිණිස යන වියදම් උවමනාවිනම් නාගරිකසභාව විසින් ගෙවනුලැබේ.

**වසංගත ඇතිවූ ගෙවල් තනිකිරීම.**

230. එබඳු යම් ගෙයක් හෙවත් ගොඩනැගිල්ලක් අවහිරකිරීම වැඩි සඵලලෙසකිරීම පිණිස එය හාත්පසින් වැටක් බැඳ නොහොත් නාගරික සභාපතිතැනට හෝ ආණ්ඩුවේ වෛද්‍යාචාර්යයාට හෝ සනීපාරක්‍ෂක මුලාදෑනියාට හෝ සෑහේයයි කල්පනාවෙන පරිද්දෙන් වෙන විධියකින් කොටුකර තැබීමට නැතහොත් ඒ අසල යම් පාරක, වීදියක, මාවතක නොහොත් මාර්ගයක මිනිසුන් ගමන්කෙරීම වලක්වා අවහිරකිරීමට එකී නාගරික සභාපතිතැනට හෝ ආණ්ඩුවේ වෛද්‍යාචාර්යයාට හෝ සනීපාරක්‍ෂක මුලාදෑනියාට හෝ උවමනාවිනම් බලය තිබෙන්නේය.

**වසංගත ඇතිවූ ගෙවල් අසල මිනිසුන්ගේ රැස්වීම් තහනම් බව.**

231. වසූරිය හෝ කොලරාව හෝ වෙනයම් අනතුරුදායක බෝවෙන රෝගයක් හෙවත් වසංගත රෝගයක් හෝ පවතිනකල්හි ප්‍රසිඬ ඉස්පිරිතාලයක හෝ ලෙඩුන් වෙන්කොට තබනලද තනිගෙයක හෝ ඉහත නියමකරතිබෙන පරිද්දෙන් අවහිරකොට තබනලද ගෙයක හෙවත් ගොඩනැගිල්ලක හෝ නියමරකණලද සීමාවක් ඇතුලත මිනිසුන් එකතුවීම හෙවත් රැස්වීම තහනම්කෙරීමට නාගරික සභාපතිතැනට නොහොත් නාගරික මහෙස්ත්‍රාත්තැනට බලය ඇත්තේවේ.

**මිනීවළක ගැඹුර.**

232. වසූරියෙන් හෝ කොලරාවෙන් හෝ වෙනයම් අනතුරුදායක බෝවෙන රෝගයකින් හෙවත් වසංගත රෝගයකින් හෝ මැරෙණලද කෙනෙකුගේ මෘතශරීරයක් අඩි හයකට වඩා ගැඹුර අඩු වළක වැළලිය යුතුනොවේ.

**ආණ්ඩුවේ වෛද්‍යාචාර්යයා.**

233. මේ කාණ්ඩයේ කිසිවිටක "ආණ්ඩුවේ වෛද්‍යාචාර්යයා" යනු පාවිච්චිකරණලද්දේද එහි තේරුම මහනුවර පොරෙත්තු ආණ්ඩුවේ ප්‍රධාන වෛද්‍ය මුලාදෑනිතැන වන්නේය.

## 16 වෙනි කාණ්ඩය.

## අශ්ව සහ වෙනත් රථ.

*රථ වාහන පරීක්ෂකවරුන් පත්කෙරීම.*

234. නිසි බලකාරතැන විසින් කලින්කල රථ වාහන සහ කෝච්චි පරීක්ෂකවරුන් පත්කරන්ටද අහක්කරන්ටද යෙදේ; තමන් පත්වසිටින කොට්ඨාසයේ මාර්ගවල යන එන රථවාහන සහ කෝච්චිවල ස්වභාව ගැන ඒ නිසි බලකාරතැන වෙත රපෝර්තුකෙරීම එකී පරීක්ෂකවරුන්ගේ නියම වැඩයද වේ. නිසි බලකාරතැන විසින් නියමකරණලද කාලය ඇතුළත පරීක්ෂකවරුන්ගේ රපෝර්තු එතැන වෙත යැවිය යුතුවාත්ඇර කොයියම් වේලාවක විනුමුත් එතැන විසින් විශෙෂ රපෝර්තුවක් ඉල්ලුම්කළහැකිද වේ.

*සම්පූර්ණ විස්තර පරීක්ෂකවරුන්ගේ රපෝර්තුවල අන්තර්ගතවිය යුතු බව.*

235. රථයෙහි නොහොත් කෝච්චියෙහි සායම්කරණලද නොම්මරය වෙන්වශයෙන් සඳහන්කෙරීම සහ රථයෙහි නොහොත් කෝච්චියෙහි ස්වභාවද එය ඇදීමට පාවිච්චිකරණ අශ්වයින්ගේ නොහොත් වෙනයම් සතුන්ගේ ස්වභාවද (පෙණියන අනුමට) ඒ අශ්වයින්ගේ නොහොත් අශ්වයාගේ උස ප්‍රමාණයද, අශ්ව ඇඳුම්වල ස්වභාවද මේ නගර අඥාපණත් යටතේ එබඳු රථයක නොහොත් කෝච්චියක කියවීමට පහසුලෙස සහ හොඳකාර පෙණෙන්ටත් තිබිය යුතුවූ දැන්වීමේ ස්වභාවද ගැන විස්තරත් රථවාහන සහ කෝච්චි පරීක්ෂක කෙනෙකුගේ රපෝර්තුවේ අන්තර්ගතවිය යුතුවේ.

*රථ සෝදිසිකිරීම පිණිස රථ නවත්වන ස්ථානවලට සහ ඉඩම්වලටත් පරීක්ෂකකෙනෙකුට ඇතුල්වියහැකි බව.*

236. ඉහතකී ප්‍රකාර පත්වසිටින පරීක්ෂක කෙනෙකුගේ කොට්ඨාසය ඇතුළත යම් නගර යක හෝ අවසරලත් රථ සහ කෝච්චි යනඑන්නාවූ යම් මාර්ගයක හෝ රථ නොහොත් කෝච්චි තබන ස්ථානමෙන් පාවිච්චිකරණ යම් ඉඩමකට ඇතුල්ව එහි තිබෙන රථවල නොහොත් කෝච්චිවල අවසරපත්‍රද ඒ රථවල නොහොත් කෝච්චිවල යොදා පාවිච්චිකෙරීමට ඒ ස්ථානයේ තබාගෙණ ඉන්නාවූ අශ්වයන් සහ අශ්වඇඳුම්ද, තමන් විසින් පරීක්ෂාකෙරීම පිණිස පෙන්වන ලෙස ඒ ස්ථානය භාරකාරයාගෙන් ඉල්ලුම්කරන්ට එකී පරීක්ෂකතැනට බලය තිබේ; තවද ඒ පරීක්ෂකතැනට එසේ පරීක්ෂාකෙරීමේදී සියලුම සැහෙන ආධාර නොදෙන්නාවූ එබඳු ස්ථානයක් භාරකාරයෙක් ඇත්තේවීද ඔහු අපරාධයක් කළායයි දෝෂාරෝපණයකරණලබන්නේ වෙයි.

*පරීක්ෂකතැන විසින් සහතික පත්‍රයක් දුන්නොත් මිස නැත්නම් කොයියම් වාහනයකටවත් අවසරපත්‍රයක් නොදෙන බව.*

237. යම් රථයක් හෝ කෝච්චියක් හෝ මගීන්ගේ පාවිච්චිය පිණිස සියලු ආකාරයෙන්ම සැහෙන්නේයයි සහ ආරක්ෂාසහිතයයිද ඒ ගැන "වර්ෂ 1901කේ රථ වාහන සම්බන්ධ ව්‍යවස්ථාවේ" සහ මේ නගර අඥාපනත්වලත් ඕනෑකර තිබෙන කට්යුතු ඉෂ්ටකර තිබෙන්නේයයිද පරීක්ෂක කෙනෙක් විසින් ප්‍රථමයෙන් සහතික කෙළේවිනම් මිස නැතිවිනම් කොයියම් රථයකටවත් කෝච්චියකටවත් ඉහතකී ව්‍යවස්ථාවේ නියෝග යටතේ අවසරපත්‍රයක් දෙනු නොලැබේ.

*සහතිකපත්‍රයක් ඉල්ලන්ට ප්‍රථමයෙන් තමන් ඊට අදහස්කර සිටින බව අයිතිකාරයා විසින් දැනුම්දෙන්ට ඕනෑවේ.*

238. යම් රථයක් හෙවත් කෝච්චියක් අයිති සෑම දෙනෙනක්ම සහතිකපත්‍රයක් ඉල්ලන්ට ප්‍රථමයෙන් තමන් එය ඉල්ලන්ට අදහස්කරගෙණ ඉන්න බව නිසි බලකාරතැන වෙත දැනුම්දීම ඒ අයිතිකාරයාගේ යුතුකමවේ; එතැන විසින් ඒ ඉල්ලුම්කාරයාගේ නම සහ ඔහුට නියමකරණලද නොම්මරයත් ලේඛන පොතක ලියාතබා වාහනයේ දුරියයුතු නොම්මරයද අකුරෙන් සහ ඉලක්කම්වලිනුත් ඒ දැන්වීම්පත්‍රයේ පිටපැත්තේ සඳහන්කොට එය ආපසු ඉල්ලුම්කාරයාට දෙන්ට යෙදේ. නිසි බලකාරතැන විසින් බලයදී පත්කරණලද තැනැත්තෙක් විසින් එකී දැන්වීම්පත්‍රයේ පිටපැත්තේ සඳහන්කරණ ලියවිල්ලට අත්සන් තබනුලැබේ.

*මගීන් ගණන නියමකෙරීම.*

239. මෙකී සහතික පත්‍රය දෙනකල්හි ඒ රථයෙහි නොහොත් කෝච්චියෙහි ගෙණ යෑමට අවසරදිය යුතු මගීන් ගණන පරීක්ෂකතැන විසින් නියමකළ යුතුවේ.

*සෑම රථයකම ලාම්පු දෙකක් තිබෙන්ට ඕනෑ බව.*

240. අවසරලත් සෑම රථයකම එය දක්කන්නා නැගියන ස්ථානයට දෙපැත්තෙන් සෑහෙන තරම් හොඳ ලාම්පු දෙකක් ඕනෑකළවිට පත්තුකෙරීමට සූදානම්ව සියලු වේලේම තබාගෙණ ගිය යුතුවා සහ සවස 6ටත් උදය 5කුත් 30ටත් අතර කාලයේදී ඒ රථය පාවිච්චිකරන්නේවිනම් මෙකී ලාම්පු පත්තුකළ යුතුද වේ.

*පාවිච්චියට අයෝග්‍ය රථ පාවිච්චිනොකළ යුතු බව.*

241. අවසරලත් රථයක හෝ කෝච්චියක හෝ නැගියන මගීන්ගේ ප්‍රවේසමද, එහි යොදනලද සතා කෙරෙහි කරුණාවන්තලෙස ක්‍රියාකෙරීමද ගැණ සලකාබලනවිට එසේ ඒ වාහනය ඇදීමට පාවිච්චිකරණ සතා හෝ ඊට අයිති ඇඳුම් ආදී උපකරණ හෝ එසේ පාවිච්චිකෙරීමට යෝග්‍ය අන්දමට නොතිබෙන්නේවිනම් එබඳු යම් සතෙක් හෝ ඇඳුම් ආදී උපකරණ හෝ පාවිච්චිකෙරීමවත් ඊට ඉඩප්‍රස්ථා දීමවත් කිසියම් අවසරලත් රථයක් නොහොත් කෝච්චියක් අයිතිකාරයෙක් විසින් නොකළ යුතුවේ.

*අවසරපත්‍රයේ පිටපතක් හොඳකාර පෙණෙනලෙස එක එක රථයක තැබියයුතු බව.*

242. නිසි බලකාරතැන විසින් දෙනලද අවසර පත්‍රයේ පිටපතක් වණිව ආදියෙන් එය ආරක්ෂාවීම පිණිස විදුරු වැස්මක් ඇති සෑහෙන රාමුවක දමා සෑම රථයකම හෙවත් කෝච්චියකම හොඳකාර පෙණෙන තැනක් තැබිය යුතුවේ.

*වාහනයක ගෙණියා යුතු මගීන් ගණන සඳහන් දැන්වීමක් හොඳකාර පෙණෙනලෙස තැබිය යුතු බව.*

243. එක එක රථයක නොහොත් කෝච්චියක (එය දක්කන්නා සහ වෙන වැඩකාරයිනුත් ඇතුළුව) ගෙණියන්ට අවසරදෙනලද මගීන් ගණන සඳහන් දැන්වීමක් ඒ රථයෙහි හෙවත් කෝච්චියෙහි හොඳකාර පෙණෙන තැනක තැබිය යුතුවේ. ඕනෑකලේවිනම් කලින්කල අලුත්කර, මේ දැන්වීම පවිත්‍රව සහ කියවීමට පහසුලෙසත් තැබිය යුතුවේ. අවසර පත්‍රයේ බලයදී තිබෙන ගණනට වැඩි මගීන් ගණනක් කොයියම් රථයක හෙවත් කෝච්චියක විනුමුත් ගෙණියා යුතු නොවේවත් ඇර කොයියම්විටක විනුමුත් නියම මගීන් ගණන සම්පූර්ණයෙන් ගෙණියන්ට බැරියයි දක්කන්නා විසින් එපාකෙරීම නොකළ යුතුදවේ.

*පරීක්ෂකතැන විසින් සහතික පත්‍රය දෙන්ට බැරියයි කීමට හේතුවූ කාරණ දැනුම්දිය යුතු බව.*

244. පරීක්ෂකතැනක් 237 වෙනි නගර අඥාපණතේ සඳහන් සහතිකපත්‍රය නොදෙන්නේවිනම් තමන් එසේ කෙරීමට හේතුවූ කාරණ එතැන විසින් නිසි බලකාරතැන වෙත ලියා රපෝර්තුකළ යුතුවාත් ඇර ඒ සහතිකපත්‍රය නොදීමට හේතුවූ වැරදි හරිගස්සා ගැණීම ඉල්ලුම්කාරයාට පුළුවන්වෙන පිණිස පරීක්ෂකතැනගේ රපෝර්තුවේ පිටපතක් ඒ ඉල්ලුම්කාරයාට එවේලෙහිම යැවිය යුතුද වේ.

*නගර ආඥාපණත් කඩකෙරීම් ගැන අයිතිකාරයා සහ දක්කන්නාත් යන දෙදෙනාම වගකිය යුතු බව.*

245. තමන්ගේ රථවල හෙවත් කෝච්චිවල අශ්වයන් හෝ වෙන උපකරණ හෝ මේ නගර ආඥාපණත්වල කියා තිබෙන ප්‍රකාර අයෝග්‍යවූවිට ඒ ගැණද, යම් රථයක හෝ කෝච්චියක හෝ අවසරපත්‍රයේ බලයදී තිබෙනවාට වඩා මගීන් ගණනක් ගෙණ ගියවිට ඒ ගැනද, රථ නොහොත් කෝච්චි ඇදීමට නුසුදුසුවූ සතුන් පාවිච්චිකළ විට ඒ ගැනද, තමන් දක්කාගණ යන රථයෙහි හෝ කෝච්චියෙහි හෝ යොදනලද සතුන්ට කෲරලෙස හිරිහැරකළ විට ඒ ගැනද වාහන අයිතිකාරයන් සහ දක්කන්නන්ද යන දෙගොල්ලම වගකිය යුතුවේ. රථයක හෝ කෝච්චියක හෝ ගෙණයෑමට අවසරදී තිබෙන සම්පූර්ණ මගීන් ගණන ඉන්නාවූ යම් රථයකට හෝ කෝච්චියකට හෝ නගින්ට යෙදෙන තැනැත්තාද, මේ නගර ආඥාපණත් කඩකෙරීම ගැන වරදකාරයාවී ඊට සුදුසු දඩුවම් ලැබිය යුත්තෙක් වේ.

*සෑම රථ දක්කන්නෙක්ම ඊට සුදුසුවන්නේ විනම් ඔහුට අවසර පත්‍රයක් දෙනු ලැබේ.*

246. අවසරලත් වාහන දක්කන්නාවූ සියල්ලන්ම ඊට සුදුස්සන් බවට ඔප්පු සාක්ෂි නිසි බලකාරතැනට ඕනෑකෙරේ. එතැනට ඒත්තුයනලෙස ඒ ඔප්පු සාක්ෂි පෙන්නාදුන් විට එබඳු රථ දක්කන්නාට එතැන විසින් අවසරපත්‍රයක් දෙන්ට යෙදෙනවාත් ඇර ඒ ගැනම තබන ලද පොතක ඒ අවසරපත්‍රය ලියා පදිංචිකරණු ලැබේ. අවසරලත් රථ දක්කන්නෙක් ඇර වෙන කිසිවෙක් අවසරලත් වාහනයක් දක්කීම හෝ එය භාරේ ඉදීම හෝ නොකළ යුතුවේ.

*නගර ආඥාපණත් කඩකෙරීම ගැන අයිතිකාරයා සහ දක්කන්නාද යන දෙදෙනාටම විරුඬව නඩු පැමිණිය යුතුබව.*

247. තමන්ට පෙණියන්නාවූ යම් වැරදි ක්‍රියාවක් ගැන හෝ මේ නගර ආඥා කඩකිරීමක් ගැන හෝ යම් රථයක නොහොත් කෝච්චියක අයිතිකාරයාද දක්කන්නාද යන දෙදෙනාටම විරුඬව නඩු පැමිනිලිකෙරීම සහ ඒ නඩුව සම්බන්ධව පැමිනිල්ලේ කටයුතු අන්තිම තීන්දුව දක්වා කෙරීමත් සෑම පරීක්ෂකයෙකුගේම නියම වැඩය වේ.

*අයිතිකාරයා සහ දක්කන්නාද යන දෙදෙනාම යම් වැරදි ක්‍රියාවක් ගැන වගකියයුතු බව.*

248. යම් රථයක හෝ කෝච්චියක හෝ කිසියම් තැනක පෙණෙනලෙස තැබීමට මේ නගර ආඥාපණත්වලින් නියමකරණලද යම් නොම්මරයක්වත් දැන්වීමක්වත් යනාදි ලියවිල්ලක් මකාදැමීම හෝ අහක්කෙරීම හෝ වෙනස්කෙරීම හෝ කෙළේවිනම් එහි අයිතිකාරයා සහ දක්කන්නාද යන දෙදෙනාම අපරාධයක් කළායයි පිළිගණු ලැබේ.

*කෝච්චියකින් ගමන්කරන්නාවූ එක එක මගියාට රාත්තල් 28ක් බර මාගෝපකරණ ගෙණයන්ට ඉඩ තිබෙන බව.*

249. අවසරලත් කෝච්චියකින් ගමන්කරන්නාවූ එක එක මගියෙකුට රාත්තල් 28ක් බරට වැඩිනොවන්නාවූ මාගෝපකරණාදිය ගෙණයන්ට ඉඩදෙනු ලැබේ; ඒ එක එක මගියාට රාත්තල් 28කට වැඩිමනත් බරඇති මාගෝපකරණාදිය ගෙණයන්නාවූ සියලු ප්‍රස්ථාවලදීම ඒ වැඩිමනත් ද්‍රව්‍යවල බර හොන්ඩරයකට එක මගියෙක් බැගින් මගීන් ගණන අඩුවෙන් ගෙණ ගියයුතුවේ. මෙහි ඉහත සඳහන් නියමයපිට ඇර කොයියම්විටකවී ඳාමුත් බාභා මලු හෝ වෙන බඩු ජාති හෝ අවසරලත් කෝච්චියකින් ගෙණගියයුතු නොවේ.

*ඒජන්තවරුන් සහ කෝච්චි දක්කන්නන් ලියාපදිංචිකරන්ට ඕනෑ බව.*

250. කෝච්චිපාරවල නොයෙකුත් කෝච්චිකන්තෝරු භාර තමන්ගේ ඒජන්තවරුන්ගේ සහ කෝච්චි දක්කන්නන්ගේත් පොරොන්තු ස්ථාන සහ නම් ලියාදී එබඳු ඒජන්තවරුන් සහ සියලුම කෝච්චි දක්කන්නන්ද නිසි බලකාරතැනගේ කන්තෝරුවේ ලියා පදිංචිකෙරීම සියලුම කෝච්චි අයිතිකාරයින්ගේ නියම යුතුකම වේ.

*පොදු ජනයාට අනතුරුවියහැකි තරම් වේගයෙන් "මොටෝර්කාර්" නම් විදුලිරථ දුවවන්ට අයුතුබව.*

251. "මෝටෝර් කාර්" නම් විදුලි රථ හෝ දුමෙන් අටගන්නාවූ විදුලි බලයෙන්වත් වෙනයම් ආකර්ෂණ බලයකින්වත් දුවවන්නාවූ වෙන වාහන හෝ, ඒවා දුවවන්නාවූ ස්ථානයේ හැසිරෙන සෙනගගේ ප්‍රමාණය සහ එහි අනිකුත් තොරතුරු ගැණත් කල්පනාකළාම, පොදු ජනයාට අනතුරුවියහැකි තරම් වේගයෙන් දිවවියයුතු නොවේ. එබඳු වාහනයක් දිවවීමට සුදුස්සෙක් හැටියට නිසි බලකාරතැනගෙන් සහතිකපත්‍රයක් ලත් කෙනෙක් ඇර වෙනයම් කෙනෙක් එබඳු වාහනයක් දුවවීමද නොකළ යුතුවේ.

*අවසරලත් වාහනවල පඞ්ක්ති නියමකෙරීම.*

252. කෝච්චිත් බරකරත්තත් තනිගොන්කරත්තත් ඇර අනිකුත් සියලුම අවසර ලත් වාහන පළමුවෙනි දෙවෙනි පඞ්ක්තිවල වාහනයන් හැටියට පඞ්ක්ති නියමකෙරීම සහ ඒ එක එක වාහනයක ගෙණගියයුතු මගීන් ගණන නියමකෙරීමද නිසි බලකාරතැන විසින් කරණු ලැබේ. එක එක වාහනයක් අයිති පඞ්ක්තියද ඒ වාහනයේ ගෙණයෑමට අවසර දෙනලද මගීන් ගණනද නිසි බලකාරතැන විසින් අවසරපත්‍රයේ සටහන් කරවනු ලැබේ.

*අවසරලත් රථ වාහන ඒවා නවතින පේළියේ සිට යාම් ඊම් කළයුතු බව.*

253. කුලියට මගීන් ගෙණයෑමට අවසරලත් යම් රථ වාහනයක් (මෙහි පහත නියම කරණ පරිච්ඡේදෙන් ඇර) එය නැවතී සිටීමට නියමකරණලද පේළියක සිට මිස කුලීපැටවීමට යාම් ඊම් කෙරීමට එහි අයිතිකාරයා හෝ දක්කන්නා හෝ විසින් ඉඩප්‍රස්ථා දියයුතු නොවේ.

*වාහන නැවැත්වීමට නාගරික සභාව විසින් පේළි නියම කරණ බව*

254. අවසරලත් රථ වාහන නවත්වා තබන පොදු පේළි හැටියට කලින්කල ස්ථාන නියම කෙරීම සහ එබඳු පොදු පේළිවල පිහිටීම අත්ඇරදැමීම හෝ වෙනස්කෙරීම හෝ සභා සම්මතයෙන් කරණලද යෝජනාවක් පිට කොයියම් විටකදී ඳාමුත් කෙරීමත් නාගරික සභාවට හැකි වන්නේය.

පහත සඳහන් පොදු පේළි දැනට පාවිච්චිකරණ ඒවා වේත් :—

නොම්මර 1 අවසරලත් අශ්වරථවලට, වාර්ඩ් වීදියේ.
නොම්මර 2 අවසරලත් රික්ෂෝ රථවලට, වාර්ඩ් වීදියේ.
නොම්මර 3 අවසරලත් බක්කි කරත්ත සහ තනිගොන් කරත්තවලට, කර්ක් වීදියේ (ගුදම ඉදිරිපිට).
නොම්මර 4 අවසරලත් රික්ෂෝ රථවලට, කොටුගොඩැල්ල වීදියේ.
නොම්මර 5 කටුගස්තොට පාලම ළඟ.
නොම්මර 6 ත්‍රිකුණාමල වීදියේ උතුරු කෙළවරේ.

**පේළි විවෘතකරණ බව දැනුම්දිය යුතු බව.**

255. මෙකී පොදු පේළි විවෘතකරණවිට ඒ සඳහා කරන්ට යෙදෙන දැන්වීමේ නියම් කරණලද දිනයක පොදු ජනයාගේ පාවිච්චියට ඒවා විවෘතකරණ බව නිසි බලකාරතැනට පෙණියන ප්‍රකාර යොග්‍යවූ ප්‍රසිබ ක්‍රමයකින් සෑහෙන පමණ කල්තියා එතැන විසින් දැනුම් දෙවනු ලැබේ; එවක් පටන් එබඳු පොදු පේළියක සිට හෝ අයිතිකාරයාගේ ගෙදර සිට හෝ කුලී පැටව්මෙහි යෙදී සිටින ස්ථානයක සිට හෝ මිස කුලියට දෙන්ට අවසරලත් කොයියම් රථයක්වත් කුලී පැටවීම පිණිස යාම් ඊම් කළයුතු නොවේ.

**පේළියේ තිබෙන සෑම රථයකම පසු පැත්තෙන් ඉඩඇර තැබීම.**

256. සෑම පේළියකම තිබෙන හතරවෙනි රථයට පසු පැත්තෙන් පසින් ගමන්කරණ මගීන්ගේ යාම ඊම පිණිස හොඳටම අඩුතරමින් අඩි අටක් ප්‍රමාණ ඉඩඇර තැබිය යුතුවේ.

**පේළියේ රථය නැවැත්විය යුතු පිළිවෙළ.**

257. සෑම රථයක්ම පොදු පේළියකට පැමිණිවිට එවකට එහි නවත්වා තිබෙන රථවල අන්තිම කෙළවරට ගෙණගොස් නැවැත්විය යුතුවා සහ සෑම පේළියකම එක පෙළක පමණක් සියලු රථම තබාගත යුතුවේ.

**පේළියේ රථය නවත්වා තිබෙන අතර ඒ කැටුව දක්කන්නා සිටිය යුතු බව.**

258. (වේලාසනින් කුලියට දී තිබෙන්නේවිනම් මිස හෝ මෙහි පහත වෙන්වශයේ නියම කරණලද පරිද්දෙන් මිස හෝ විනා) කුලීගෙණයන අවසරලත් රථ සියල්ලම විවේක පිණිස වැඩ නවත්වාසිටින කාලය අත්හැර උදය හයහමාරට පොදු පේළියට පැමිණ සවස හත වනතුරු කුලීගෙණයෑමට ලෑස්තිවසිටිය යුතුවා සහ මගීන් ගෙණයෑමට පාවිච්චිකරණ අවසරලත් සෑම රථයකම දක්කන්නා එය පේළියේ නවත්වාතිබෙන විට ඒ රථය කැටුව සිටිය යුතුද වේ.

**කුලී මිල සටහනක් රථය ඇතුළේ තබන්ට ඕනෑ බව.**

259. එවකට අයකරන්ට නියම කුලී මිල සටහනක් සණ කඩදාසියක අච්චුගසා හෝ තහඩුවක කොටවා හෝ කුලී ගෙණයන සෑම රථයකම ඇතුල්පැත්තේ හොඳකාර පෙනෙන තැනක සවිකර තැබිය යුතුවා සහ ඒ රථය කුලී ගෙණයෑමට පාවිච්චිකරණ කාලය මුලුල්ලේම එකී සණ කඩදාසිය නොහොත් තහඩුව පහසුවෙන් කියවන්ට පුළුවන්ලෙස නොමැකී තිබෙන්ට ඇරිය යුතුද වේ.

**කුලී මිල ගණන්.**

260. අයකළයුතු කුලීමිල ගණන් පහත සඳහන් ඒවා වෙත්. තනිගොන් කරත්ත ඇර වෙන රථවලට විශෙෂ පොරොන්දුවක් පිට මිස දුර ප්‍රමාණයේ හැටියට කුලී අයකළ හැකිනොවේ :—

| | උදේ 6ටත් රෑ 7ටත් අතර. රු. ශ. | රෑ 7ටත් උදේ 6ටත් අතර. රු. ශ. |
|---|---|---|
| තනි අශ්වයෙක් අදින පළමුවෙනි පඩිකැතියේ රථයකට :— | | |
| උදේ 6 පටන් රෑ 7 වනතුරු | 5 0 | — |
| නොකඩවූ කිසියම් පැය 6කට | 2 50 | 3 20 |
| පළමුවෙනි පැයට | 1 20 | 1 50 |
| ඊලඟ සෑම පැයකට | 0 30 | 0 35 |
| පැය බාගයකට ... | 0 60 | 0 75 |
| තනි අශ්වයෙක් අදින දෙවෙනි පඩිකැතියේ රථයකට :— | | |
| උදේ 6 පටන් රෑ 7වනතුරු | 4 0 | — |
| නොකඩවූ කිසියම් පැය 6කට | 2 0 | 2 50 |
| පළමුවෙනි පැයට | 1 0 | 1 25 |
| ඊලඟ සෑම පැයකට | 0 25 | 0 30 |
| පැය බාගයකට ... | 0 50 | 0 60 |
| අශ්වයින් දෙන්නෙක් අදින රථවලට :— | | |
| තනි අශ්වයෙක් අදින රථයක ගණනින් දෙකෙන් කොටසක් වැඩිකරණු. | | |
| තනි ගොණෙක් අදින කරත්තයකට :— | | |
| සෑම පැයකට නොහොත් ඉන් කොටසකට | 0 25 | 0 30 |
| හැතැක්මකට ... | 0 8 | 0 10 |
| පළමුවෙනි පඩිකැතියේ ජින්රික්ෂෝ එකකට :— | | |
| පළමුවෙනි පැය බාගයට නොහොත් ඉන් කොටසකට | 0 30 | 0 35 |
| දෙවෙනි පැය බාගයට නොහොත් ඉන් කොටසකට | 0 30 | 0 35 |
| ඊලඟ යම් පැය බාගේකට නොහොත් ඉන් කොටසකට | 0 15 | 0 20 |
| දෙවෙනි පඩිකැතියේ ජින්රික්ෂෝ එකකට :— | | |
| පළමුවෙනි පැය බාගයට නොහොත් ඉන් කොටසකට | 0 25 | 0 30 |
| දෙවෙනි පැය බාගයට නොහොත් ඉන් කොටසකට | 0 25 | 0 30 |
| ඊලඟ යම් පැය බාගයට නොහොත් ඉන් කොටසකට | 0 10 | 0 15 |
| කාන්දේවීදිය, බ්‍රවුන්රිග්වීදිය, වෝර්ඩ්වීදිය, කච්චේරියේපාර යන මේ වීදිවල යම් ස්ථානයක සිට හෝ මෙකී වීදිවලින් වට කරණලද මායිම් ඇතුළත සහ කච්චේරියේ පටන් කාන්දේ වීදියේ කෙළවර දක්වා අඳිනලද ඉරකින් වටවූ මායිම ඇතුළත යම් ස්ථානයක සිට හෝ එම වීදිවල වෙනයම් ස්ථානයකට නොහොත් මෙකී මායිම් ඇතුළත එක ගමනකට :— | | |
| පළමුවෙනි පඩිකැතියේ ජින්රික්ෂෝ එකකට | 0 15 | 0 20 |
| දෙවෙනි පඩිකැතියේ ජින්රික්ෂෝ එකකට | 0 10 | 0 15 |
| පෝනියෙක් අදින බක්කි කරත්තයකට :— | | |
| පළමුවෙනි පැය බාගයට | 0 40 | 0 55 |
| දෙවෙනි පැය බාගයට | 0 40 | 0 55 |
| දෙවෙනි පැයට නොහොත් ඉන් කොටසකට | 0 40 | 0 55 |
| ඊලඟ සෑම පැයකට හෝ ඉන් කොටසකට | 0 16 | 0 26 |
| ගොණෙක් අදින බක්කි කරත්තයකට ඉහත පෙනෙන ගණන්වලින් දෙකෙන් කොටසයි. | | |

රථයක් අයිතිකාරයා හෝ දක්කන්නා හෝ එය කුලියට දෙන්ට බැඳිසිටින බව. ඒ ගැන කොන්දේසිය ඉල්ලූවිට කුලිය ගෙවන්ට ඕනෑ බව.

261. කොයියම් අවසරලත් රථයක් වීනමුත් එය කලින් කුලියට දීතිබුනොත් මිස හෝ කුලියට නොදෙන්ට හේතුවූ වෙනයම් ගතයුතු කරුණක් ඇතිවූවහොත් මිස හෝ නැත්නම් ඒ රථය ප්‍රසිබ ජේළියක තිබුනත් අයිතිකාරයා පදිංචි ස්ථානයේ තිබුනත් (වෙන කොයියම්තැනක තිබුනත්) එය කුලියට ඉල්ලන්නාවූ යම් කෙනෙකුට දෙන්ට සහ නාගරිකය ඇතුළත කොයිම කරත්ත පාරක වීනමුත් එක් ස්ථානයක සිට වෙන ස්ථානයකට ඉන් ඔහුව ගෙණයන්ටත් එබඳු යම් රථයක් අයිතිකාරයා නොහොත් දක්කන්නා සියලු වේලෙහිම බැඳී සිටින්නේය. එහෙත් කුලියට නොදීමට හේතුවූ ගතයුතු කරුණක් තිබුනේය යන්න ඔප්පුදීම එය අයිතිකාරයා පිට නොහොත් දක්කන්නා පිට රඳාතිබෙන්නේ වෙයි; තවද නීතියේ ප්‍රකාර නියමකර තිබෙන කුලී මිළ ගණන ඉල්ලූවිට ඒ මිළ ගණන ඒ රථය පාවිච්චිකරන්ට ප්‍රථමයෙන් වහාම එය කුලියට ගන්නාවූ තැනැත්තා විසින් එකී අයිතිකාරයාට නොහොත් දක්කන්නාට ගෙවන්ට ඕනෑවාත් ඇර වැඩිදුරටත් කිසියම් පැය දෙළහක කාලයක් ඇතුළත හැතැක්ම දහයකට වැඩිදුර අවසරලත් රථයකින් මගින් ගෙණයන්ට බලකළ හැකිද නොවේ.

පාවිච්චියට සුදුසු නුසුදුසු රථ ප්‍රසිබ ජේළිය ඇතුළට නොගන්න බව.

262. අප්‍රවේසම් සහිතවූ හෝ පලුදු අළුත්වැඩියාකෙරීම් හොඳකාර නොකරණලද හෝ වෙනයම් අකාරයකින් මගින්ගේ පහසුවටද, නැගියෑමටද නොවටින්නාවූ හෝ කොයියම් අවසරලත් රථයක් වී නුමුත් කිසිම ප්‍රසිබ ජේළියකට ඇතුල්කළයුතු නොවේ.

අවසරලත් රථයක් දක්කන අය වීදියේ එහා මෙහා යායුතුනොවන බව.

263. මගින් බැස්සවීමටත්, නන්ගවාගැණීමටත්, ඇර කොයියම් අවසරලත් රථයක් වූවත් කිසියම් වීදියක් දිගේ හෝ වෙනයම් රථයක පැත්තෙන් හෝ තබාගැණීමටවත් එහා මෙහා ගෙණයාමටවත් එබඳු රථයක් දක්කන්නෙක් ඉඩදියයුතු නොවේ; වෙනයම් රථයක් දක්කන්නෙකුට යම් කෙනෙකුව බැස්සවීමට හෝ නන්ගවාගැණීමට හෝ අවහිරකෙරීමද නොහොත් බාධාකෙරීමද වෙනයම් අවසරලත් රථයක් දක්කන්නෙකුට කුලියක් ලබාගැණීමට ඉඩනොදී කැමැත්තෙන්ම වැලැක්වීම නොහොත් වලක්වන්ට උත්සාහකෙරීමද ඔහු විසින් නොකළයුතු වේ.

අවසරපත්‍රයේ අන්දම.

264. කුලියට දෙන යම් රථවාහනයක අයිතිකාරයාට දෙන්නාවූ අවසරපත්‍රය රථවාහන සම්බන්ධ ව්‍යවස්ථාවේ උප ලේඛනයේ “ බී ” අක්‍ෂරය දරණ සටහනේ ප්‍රකාරවාත් ඇර ඒ අවසරපත්‍රය අන්කෙනෙකුට පාවාදියහැකිද නොවේ. එහෙත් තනි පොරොන්දුවක් හෙවත් විශෙෂ පොරොන්දුවක් පිට පමණක් කුලියටදෙන්ට යෙදෙන යම් රථයකට තමන්ට පෙනීයන ප්‍රකාර සුදුසු නියෝගපිට තමන් කැමති පරිද්දෙන් විශෙෂ අවසරපත්‍රයක් දී මේ කාණ්ඩයේ ඉහත පෙණෙන යම් නගර අඥාපණතකට යටහත්වීමෙන් එබඳු රථයක අයිතිකාරයාව සහ දක්කන්නාවත් නිදහස්කෙරීමට නාගරික සභාපතිතැන්ට හැකිවන්නේය. එසේ විශෙෂ අවසරපත්‍රයක්ලත් රථයක් ප්‍රසිබ ජේළියක් ඇතුළට වැද්දගන්නේ නැත.

දක්කන්නා කෝට් එකක් ඇගලා තමන්ගේ අවසරපත්‍රයේ නොම්මරය දරණ බාපනයක් ගෙණගියයුතු බව.

265. අවසරලත් රථයක් දක්කන සැම්දෙනෙක්ම ජකෙට්ටුවක් නොහොත් කෝට් එකක් ඇගලා ඒ දක්කන්නාගේ අවසරපත්‍රයේ නොම්මරය අඩංගුකොට නිසි බලකාරතැන විසින් සපයාදෙනලද බාපනයක් ගෙණගිය යුතුවේ.

සහතිකපත්‍රය ලබාගැණීම පිණිස එක රථයකට අයිති උපකරණ වෙන රථයකට නොයෙදියයුතු බව.

266. පරීක්‍ෂක කෙනෙකුගෙන් සහතිකපත්‍රය ලබනලද රථයක හෝ කෝච්චියක හෝ උපකරණවලින් මෙහි පහත දක්වන යම් කොටසක්, වෙනින් රථයකට හෝ කෝච්චියකට හෝ සහතිකපත්‍රයක් ලබාගැණීම අදහස්කොට එහි තබන්ට යෙදුනොත් එය අයිතිකාරයා අපරාධයක් කළායයි දොෂාරෝපණයකරණුලබන්නේය, එනම් :—

| | |
|---|---|
| ලාම්පු<br>අවසරපත්‍රයේ රාමුවක දමා තිබෙන පිටපත | මෙත්ත<br>තැන්ද නොහොත් වැස්ම |

සතා නොබැඳි රථයක් පාරක තිබිය නොහැකි බව.

267. අවසරලත් යම් වාහනයක් කිසියම් ප්‍රසිබ වීදියකදී හෝ පාරකදී හෝ හදිසියෙන් කඩාවැටුනොත් මිස එසේ නොවීනම්ද, එසේ හදිසියෙන්වූවිට එය එතනින් අහක්කරගැණීමට ඕනෑකරණවාට වඩා දීඝ කාලයක්ද, එබඳු යම් වාහනයක් එහි බඳිනලද හෙවත් යොදනලද ගවයින් හෝ අශ්වයින් හෝ වෙන සතුන් හෝ නැතුව ප්‍රසිබ වීදියක හෝ පාරක හෝ තිබෙන්ට ඇරීම හෙවත් එසේ තිබෙන්ට අවකාශදීම කිසිකෙනෙක් විසින් නොකළ යුතුවේ. වාහන නැවැත්වීමට සුදුසු ස්ථාන ඇරතබනතුරු මේ නියෝගයේ බලය පවත්වනු නොලැබේ.

රථවල තිබී සම්භවෙන බඩු ගැණ.

268. යම්කිසි අවසරලත් වාහනයක් කුලියට ගත්තාවූ නොහොත් ඉන් ගමන්කළාවූ යම් කෙනෙක් කිසියම් බඩුවක් අමතකව එහි දමා ගියේවීනම් ඒ බඩුව ඒ වාහනයේ තිබී සම්භවී පැය දෙළහක් ඇතුළත එසේ එය සම්භවෙනවිට තිබුන අන්දමටම ඒ වාහනය අයිතිකාරයා විසින් හෝ එය දක්කන්නා විසින් හෝ ඉතා ළඟදුරු පොලිස් ස්ථානයට ඒ බඩුව ගෙණගොස් නොහොත් යවා එය අයිතිකාරයාට නැවත ලබාගන්ට හැකිවීම පිණිස එහි තැබියයුතු වේ; (ඒ බඩුව රන් රිදී ආදී ආභරණයකින් යුක්තනොවීනම්) එය ආපසු දෙන්ට ප්‍රථමයෙන් එය හිමි අය විසින් ගෙවියයුතුවූ ශත විසිපහක ගාස්තුවක් ලැබීමට ඒ බඩුව එසේ ගෙණගොස් දුන්නාවූ නොහොත් යැවූවාවූ වාහනය අයිතිකාරයාට නොහොත් දක්කන්නාට හිමිව තිබේ. එහෙත් එසේ සම්භවූ බඩුව රන් රිදී ආදියෙන් යුක්තවීනම් එය අයිතිකාරයා විසින් වාහනය අයිතිකාරයාට හෝ දක්කන්නාට හෝ රුපියලක ගාස්තුවක් හෙවත් කුලියක් ගෙවියයුතුවේ. එසේ යම් වාහනයක තිබී සම්භව එකී ප්‍රකාර ඉතා ළඟදුරු පොලිස් ස්ථානයේ තබනලද එබඳු බඩුවක් එසේ තැබූ තැන් පටන් මාසයක් ඇතුළතදී එකී නියම අයිතිකාරයා විසින් ඉල්ලා නොසිටියේ වීනම්, ඒ බඩුව ප්‍රසිබ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව පොදු ප්‍රවෘත්ති පත්‍ර එකක හෝ වැඩිගණනක හෝ නිසි ප්‍රකාර ප්‍රසිබකර එසේ ප්‍රසිබ වෙන්දේසියේ එය විකුණන්ට යෙදෙනවාත් ඇර ඉන් ලැබෙන මුදලෙන් ඒ විකිණීම ප්‍රසිබකෙරීම සඳහා ගිය වියදම් අඩුකර ඉතුරු මුදල පොදු ආදායමට එකතුකරණු ලැබේ.

## 16 වෙනි කාණ්ඩය.

## ප්‍රසිද්ධ නාන ඉඩම්.

*ප්‍රසිද්ධ නාන ඉඩම්වල ලින්වලට තාප්ප තැබීම.*

269. වතුර නෑම පිණිස පාවිච්චිකරන්නාවූ පොදු ජනයාට ඉඩඇර තබනලද සෑම ලිඳකටම අඩි දෙකකට වඩා අඩුනොවන උසට ආරක්‍ෂා තාප්පයක් තිබෙන්ට ඕනෑවා සහ එම තාප්පයේ පිට පැත්ත පොළව මතුපිට පටන් අඩි දෙකක් යටට සිමෙන්ති බදාම දමා තිබෙන්ටත් ඕනෑවේ.

*කානු දමා තිබෙන්ට ඕනෑවේ.*

270. එබඳු ප්‍රසිද්ධ ලිඳක් හාත්පස ඊට හොඳටම ලංව තිබෙන බිම පිටතට ගලාබසින සැහෙන කානුවක් දක්වා සාදනලද කානුවකට එහි වතුර ගලාබැසීමට ඉඩ ඇතිලෙස හැඩ ගසා තිබෙන්ට ඕනෑවේ.

*ලින් ලඟ රෙදි ආදිය සේදීම තහනම් බව.*

270. එබඳු ප්‍රසිද්ධ ලිඳක නොහොත් ඒ ලඟ අඳින රෙදි පිළි හෝ පෑදුරු හෝ වෙනයම් දෙයක් හෝ සේදීමට බලයනැත්තේ වේ.

*බාල්දිවලට තීන්ත ගෑම.*

272. ඉහතකී අන්දමේ ප්‍රසිද්ධ ලිඳකින් නෑම පිණිස පාවිච්චිකරණ බාල්දිවලට අඩුතරමින් අවුරුද්දකට වරක්වත් තීන්ත ගාන්ට ඕනෑවාත් ඇර ඒවා දවස්පතා ශුද්ධපවිත්‍රකරන්ටද ඕනෑවේ.

*ලෙඩක් ඇති කෙනෙක් එහි නොනෑම.*

273. වන, හොරි කුෂ්ඨාදියෙන් පෙළෙන්නාවූ කෙනෙක් හෝ වෙනයම් වසංගත රෝගය කින් හෙවත් බෝවෙන රෝගයකින් පෙලෙන්නාවූ කෙනෙක් හෝ එබඳු රෝගයකින් ලඟදී සුවවූ කෙනෙක් හෝ එකී යම් ප්‍රසිද්ධ ලිඳක නොහොත් නාගරික සභාව විසින් නාන ඉඩමක් කොට වෙන්කරණලද යම් ස්ථානයක නෑමවත් ඇඟ සේදීමවත් එහි වතුර වෙන කිසියම් ආකාර යකින් පාවිච්චිකෙරීමවත් නොකළ යුතුවේ.

*නියෝග කඩ කෙරීම ගැණ බදු කාරයාට දඩුවම්.*

274. එබඳු යම් ප්‍රසිද්ධ ලිඳක අයිතිකාරයා නොහොත් බදුකාරයා තමන් විසින්ම මෙහි ඉහත පෙණෙන ආඥාපණත්වල නියෝග ඉෂ්ටකරන්ට ඕනෑවාත් ඇර එයින් යමක් කඩකෙරීමට ඉඩදිය යුතුද නොවේ.

*වැවේ නෑම තහනම් බව.*

275. නාන ඉඩමක් මෙන් වෙන්කොට තබනලද ස්ථානයක ඇර මහනුවර වැවේ කොයි යම් කොට්ඨාසයකවත් නැතහොත් වැවේ වතුර ගලාබසින දොරටුව ලඟ පාලම යට හෙවත් ඒ ලඟවත් නෑම හෝ යමක් සේදීම හෝ කිසිවෙකු විසින් නොකළ යුතුවේ.

*මසුන් ඇල්ලීම තහනම් බව.*

276. නාගරික සභාපතිතැනගෙන් අවසර පත්‍රයක් නැතුව මහනුවර වැවේ හෝ උඩ වත්තේකැලේ පොකුණුවල හෝ දුනුමඩලාවේ ඔයේ ජලකර්මාන්ත ජලාසයේ හෝ මසුල් ඇල් ලීමට කිසිකෙනෙකුට බලය නැත්තේ වේ.

*වැවේ සතුන් නාවන්ට ඉඩ නොදෙන බව.*

277. මහනුවර වැවේවත් නාන ඉඩමක්මෙන් වෙන්කරණලද යම් ස්ථානයකවත් එබඳු නාන ඉඩමකට ගලාබසින යම් දිය පාරකවත් හරකෙක්, අශ්වයෙක්, එළුවෙක්, ඌරෙක්, බැටළු වෙක්, බල්ලෙක් හෙවත් වෙනයම් සතෙක් නැතහොත් අඳින රෙදිපිළි පෑදුරු යනාදී යම් දෙ යක් නෑවීම හෙවත් සේදීම හෝ නාවන්ට හෙවත් සෝදන්ට සැලැස්වීම හෝ එබඳු යම් සතෙක් මොනයම් කරුණක් සඳහා විනුමුත් එකී වැවටවත් නාන ඉඩමකට නොහොත් දිය පාරකටවත් ගෙණයෑම හෙවත් දක්කාගෙණයෑම හෝ කරන්ට කිසියම් කෙනෙකුට බලය නැත්තේ වේ.

---

## 17 වෙනි කාණ්ඩය.

## මගපෙන්වන්නන් ගැන.

*අවසරලත් මගපෙන්වන්නන් ආභරන පැලඳීම.*

278. වර්ෂ 1887තේ නොම්මර 15 ව්‍යවස්ථාවේ නියෝග යටතේ පත්කරණලද සෑම අවසර ලත් මගපෙන්වන්නෙක්ම නිල්මුසු කළු පාට "සර්ජ්" රෙදිවලින් සාදනලද ඉස්සරහට පච්ච පාට පටි අල්ලාපු "කෝට්" එකක් සමග එකී ව්‍යවස්ථාවේ 5 වෙනි වගන්තියේ නියමකර තිබෙන බාපණය පපුවේ දකුණු පැත්තේ පලඳින්ට ඕනෑවේ; "කෝට්" එක නාගරිකසභාව විසින් නොමිළයේ සපයාදෙන්ට යෙදෙනවාත් ඇර අවසර පත්‍රයේ කාලය ඉකුත්වූවිට නො හොත් අලුත් "කෝට්" එකක් දෙන්ට ප්‍රථමයෙන් ආපසු නාගරික සභාවට දියයුතුද වේ.

*අත් පොතක් ගෙණයායුතුදවේ.*

279. මගපෙන්වන්නෙක්ව කුලියට අඬගහගන්නාවූ යම් කෙනෙක් විසින් හෝ යම් පො ලිස් මුලාදෑනියෙක්වත් නාගරිකසභාවේ මුලාදෑනියෙක්වත් විසින් හෝ ඉල්ලූවිට පෙන්වීම පිණිස අත් පොතක් සෑම අවසරලත් මගපෙන්වන්නෙක් විසින්ම තමන් කැටුව ගෙණයා යුතුවේ; මගපෙන්වන්නෙකුට ඔහුගේ අවසරපත්‍රය ලැබෙන වේලෙහි ඒ අත් පොත නාගරික සභාව විසින් නොමිළයේ දෙනුලැබ නාගරික සභාපතිතැන විසින් කලින් නියමකරන්ට යෙ දෙන ක්‍රමයකට එය සටහන්කොට තැබිය යුතුවේ.

*අවසරලත් මගපෙන්වන්නන්ට ගෙවන ගාස්තු.*

280. අවසරලත් සෑම මගපෙන්වන්නෙක් විසින්ම තමාගෙන් වැඩගන්නාවූ යම් කෙ නෙකුගෙන් පහත දක්වන ගාස්තු නීතියේ ප්‍රකාර ඉල්ලිය හැකිවේ :—

| | | ශත. |
|---|---|---|
| පළමුවෙනි පැයට නොහොත් ඉන් කොටසට | ... | 50 |
| ඊට වැඩි සෑම පැයකට නොහොත් ඉන් කොටසකට | ... | 25 |

---

## 18 වෙනි කාණ්ඩය.

## මිනී වැලලීම සහ සොහොන්භූමි ගැන

*මිනී වැලලීමට සහ ආදාහනකිරීමට ඉඩදෙන්නේ කොතැන්හිද යන බව.*

281. වර්ෂ 1862කේ නොම්මර 12 ව්‍යවස්ථාව යටතේ නිසිප්‍රකාර එළිදරව්කරණලද සො හොන් භූමියකවත් (වර්ෂ 1894රේ නොම්මර 2 ව්‍යවස්ථාව යටතේ) මිනීවළලන ඉඩමක් හෙවත් ආදාහන භූමියක්මෙන් නාගරිකසභා කන්තෝරුවේ විශෙෂයෙන් ලියා පදිංචිකරණලද ඉඩමක වත් ඇර වෙනයම් ඉඩමක මිනියක් භූමදානකෙරීම හෙවත් ආදාහනකෙරීම හෝ භූමදානකෙරී මට හෙවත් ආදාහනකෙරීමට ආධාරදීම හෝ නාගරික සභාවෙන් විශෙෂ අවසර නැතුව කිසි කෙනෙක් විසින් නොකළ යුතුවේ.

**සොහොන්භූමි සහ ආදාහනභූමි ලියා පදිංචිකොට එහි භාරකාරයාගේ නම නියමකර තැබීම.**

**282.** සොහොන්භූමියක් හෝ ආදාහන භූමියක් හෝ තමන් සන්තකකොට තබාගැනීමට බලය ඇත්තාවූ කොයියම් කෙනෙක් වුවත් "සර්වේයර් ජනරාල්" නම් ආණ්ඩුවේ ප්‍රධාන මිනින්දෝරුතැන විසින් හෙවත් නිසිප්‍රකාර අවසරලත් මිනින්දෝරුතැනක් විසින් සහතික කරණලද එබඳු ඉඩමක පිඹුරුකඩදාසිය සමග අමුනනලද ලියවිල්ලකින් ඒ සොහොන්භූමිය හෙවත් ආදාහනභූමිය ලියාපදිංචිකරණ ලෙස නාගරික සභාපතිතැනගෙන් ඉල්ලා ඒ ඉල්ලීම් පත්‍රයේ එහි භාරකාරයාගේ නමද සඳහන්කළ යුතුවන්නේය. තවද ඒ භාරකාරයා හැටියට නම නියමකරණලද තැනැත්තාද තමන් ඒ භාරකාරකම සහ එහි කටයුතු කෙරීමත් පිළිගත් බවට සාක්ෂි පිණිස තමන්ගේ අත්සන ඒ ඉල්ලීම්පත්‍රයේ තැබියයුතුවේ.

**භාරකාරයෙකුගේ නම නියම නොකළේවිනම් කවරෙක් භාරකාරයා වන්නේද යන බව.**

**283.** භාරකාරයෙකුගේ නම නියමනොකළේ විනම් හෙවත් භාරකාරයා හැටියට නම නියමකරණලැබූ තැනැත්තා ඉහතකී ප්‍රකාර ඉල්ලීම්පත්‍රයේ අත්සන් නොකළේවිනම් එසේ සොහොන්භූමියක් නොහොත් ආදාහනභූමියක් ලියා පදිංචිකරණලෙස ඉල්ලුම්කරණලද තැනැත්තාම එහි භාරකාරයා හැටියට ගණන්ගණු ලබනවාත්ඇර ඒ සම්බන්ධවූ නියෝග යම් විධියකින් කඩකෙරීම ගැන ඔහු වගකිය යුතුද වේ.

**භාරකාරයෙකුගේ මරණයක් ආදිය වූවහොත් අලුතුවෙන් ලියා පදිංචිකරන්ට ඕනෑ බව.**

284. සොහොන්භූමියක හෝ ආදාහනභූමියක හෝ භාරකාරයා මැරෙන්ට යෙදුනොත් හෙවත් යම් හේතුවක් නිසා තමන්ගේ කටයුතුකෙරීම ඔහුට නොහැකිවූවහොත් මේ කාණ්ඩයේ දෙවෙනි ඡේදයෙන් නියමකර තිබෙන පරිද්දෙන් ඒ භූමිය ලියා පදිංචිකරණ ලෙස අලුතුවෙන් ඉල්ලුම්කළයුතුවා සහ ඒ ඉල්ලීම පිට ලියාපදිංචිකෙරීම ඉෂ්ටකරණතුරු නාගරික සභාපතිතැනගෙන් හෙවත් ඒතැන නැතිවිටක සනීපාරක්ෂක මූලාදෘනියාගෙන් විශේෂ අවසර පත්‍රයක් පිට ඇර ඒ භූමියේ මිනියක් භූමදානකෙරීම හෝ ආදාහනකිරීම හෝ නොකළ හැකිවේ.

**භූමදානයට ප්‍රථමයෙන් සහතික පත්‍රය ගැනීම.**

285. "**වර්ෂ 1895 උප්පැන්න සහ මරණ ලියා පදිංචිකෙරීමේ ව්‍යවස්ථාවේ**" නියමකර තිබෙන සහතිකපත්‍රය සොහොන්භූමිය නොහොත් ආදාහනභූමිය භාරකාරයාට පෙන්වනතුරු මිනියක් භූමදානය හෝ ආදාහනය හෝ නොකළ හැකිවේ.

**භාරකාරයා විසින් ලේඛනයක් තැබීම.**

286. නාගරික සීමාව තුළ සෑම සොහොන්භූමියක හෙවත් ආදාහනභූමියක සිඬකරණලද සියලුම භූමදානවල සහ ආදාහනවලත් ලේඛනයක් නාගරික සභාපතිතැන් විසින් නියමකරණලද ක්‍රමයකට ඒ සුසානභූමිය භාරකාරයා විසින් තැබීම ඔහුගේ යුතුකමවා පමණකුත් නොව එහි භූමදානයක් හෝ ආදාහනයක් හෝ සිඬවී පැය විසිහතරකට වැඩිනොවන කාලයක් ගතවූ විට ඒ ලේඛනයේ පිටපතක් නාගරික සභාවේ කන්තෝරුවට භාරදෙවීමද ඔහුගේ යුතුකම වේ.

**සුසානභූමි නාගරික සභාපතිතැන විසින් පරීක්ෂාකරණ බව.**

287. කොයියම් විටක වුවත් යම් සොහොන්භූමියකට හෝ ආදාහනභූමියකට ගොස් ඒ භූමිය සහ ඒ සම්බන්ධ සියලුම පොත්පත්ද පරීක්ෂාකෙරීමට නාගරික සභාපතිතැනට හෝ එතැනගෙන් ලියවිල්ලක් පිට ඒ සඳහා බලයලත් තැනැත්තෙකුට හෝ බලය තිබේ.

**ඉඩම් ශුඬපවිත්‍ර ලෙස තැබීම.**

288. නාගරික සභාපතිතැන විසින් හොඳයයි පිළිගතහැකි ලෙස සෑම සොහොන් භූමියක් හෙවත් ආදාහනභූමියක් ශුඬපවිත්‍රව සහ යහපත් පිළිවෙළකටද තැබීම ඒ භූමිය භාරකාරයාගේ යුතුකම වන්නේය.

**ගාස්තු සෑහෙන ඒවායයි නාගරික සභාපතිතැන විසින් විධානකිරීම.**

289. භූමදාන සහ ආදාහන පිණිස අයකරණ ගාස්තුවල සටහනක් නාගරික සභාපතිතැන විසින් සෑහේයයි විධානකෙරීම සඳහා සෑම සොහොන්භූමියක් හෙවත් ආදාහනභූමියක් භාරකාරයෙක් විසින් සාදදිය යුතුවා සහ නාගරික සභාපතිතැන විසින් එසේ සෑහේයයි විධානකරණලද ගාස්තු පමණක් අයකළ යුතුද වේ.

**සුසානභූමි වැටක්න්වත් තාප්පයකින්වත් කොටුකර තැබීම.**

290. සෑම සොහොන්භූමියක් හෙවත් ආදාහන භූමියක්ම නාගරික සභාපතිතැන විසින් සුදුසුයයි පිළිගන්නාලද වැටකින් හෝ ශක්තිමත් තාප්පයකින් හෝ කොටුකර තැබිය යුතුවේ.

**මෘතශරීර පොදු සොහොන්භූමියේ නොහොත් ලියා පදිංචිකරණලද සොහොන්භූමියක භූමදානකෙරීම.**

291. මහනුවර නාගරිකය ඇතුළත මියයන්ට යෙදෙන සෑමදෙනාගේම මෘතශරීර එකී නාගරිකය සඳහා සූදානම්කර තිබෙන සාමාන්‍ය සොහොන්භූමියේ හෝ සුසානභූමියක් හැටියට ලියාපදිංචිකරණලද සොහොන්භූමියක හෙවත් ආදාහන භූමියක හෝ භූමදානකෙරීව නොහොත් ආදාහනකෙරීම කළ යුතුවේ.

**නාගරිකයෙන් පිටත මිනී භූමදානකෙරීම පිණිස බලපත්‍රයක් ලැබියයුතු බව.**

**292.** එකී මහනුවර නාගරිකය ඇතුළත මියයන්ට යෙදෙන යම් කෙනෙකුගේ මෘතශරීරයක් එම නාගරිකය සඳහා සූදානම්කර තිබෙන සාමාන්‍ය සුසානභූමියක හෙවත් එම නාගරිකය සඳහා නිසිප්‍රකාර ලියාපදිංචිකරණලද සොහොන්භූමියක නැතහොත් ආදාහන භූමියක මිස වෙනයම් ස්ථානයක හෝ සුසානභූමියක හෝ භූමදානකෙරීමවත් ආදාහනකෙරීමවත් පිණිස එකී නාගරිකයේ සීමාවෙන් පිටතට එබඳු යම් මෘතශරීරයක් ගෙණයෑම හෝ ගෙණයන්ට සැලැස්වීම, ඉඩදීම හෙවත් අවකාශදීම හෝ කොයියම් තැනැත්තෙක් හෙවත් තැනැත්තන් විසින්වත් නොකළ යුතුවේ; එහෙත් ඊට සෑහෙන වැදගත් කාරණ පෙන්නා එකී මහනුවර නාගරිකයේ නාගරික සභාපතිතැනට හෝ ඔහු නගරයේ නැතිවිට නාගරික සභාවේ ලේකම්තැනට හෝ ඒ සඳහා ඉල්ලුම්පත්‍රයක් ඔප්පුකළවිට එම සභාපතිතැන විසින් නැතහොත් එම ලේකම්තැන විසින් ඒ ගැන දෙන්ට යෙදෙන බලපත්‍රයේ නම සඳහන්කරණලද යම් තැනැත්තෙකුගේ මෘතශරීරය එකී නගර සීමාවෙන් පිටත කිසියම් ස්ථානයක හෙවත් සොහොන්භූමියක භූමදානකරන්ටවත් ආදාහනකරන්ටවත් පුළුවන් හැටියට තමන්ගේ අත්සන් ඇති බලපත්‍රයක් ලියා දෙන්ට එකී නාගරික සභාපතිතැනට නොහොත් එසේ ඔහු නැතිවිට සභාවේ ලේකම්තැනට බලය තිබෙන්නේය. තවද එබඳු යම් ඉල්ලුම්පත්‍රයක් එකී සභාපතිතැනට (හෙවත් එකී නගරයේ නාගරික සභාවේ ලේකම්තැනට හෝ සනීපාරක්ෂක මූලාදෘනියාට හෝ) ඔප්පුදී පැයක් ඇතුළත එකී සභාපතිතැන නැතහොත් එකී ලේකම්තැන ඊට බලපත්‍රයක් දීම ඉෂ්ටනොකළේ විනම් එවිට ඒ මෘතශරීරය එකී නගර සීමාවෙන් පිටත කිසියම් ස්ථානයක හෙවත් සොහොන්භූමියක භූමදානකෙරීමට හෝ ආදාහනකෙරීමට හෝ ගෙණයෑමට කොයියම් කෙනෙකුට වුවත් බලය තිබෙන්නේය. එසේ ඉල්ලුම්පත්‍රයක් ඔප්පුකළ බව ගැන සහ එසේ ඔප්පුකළ වේලාව ගැනත් සාක්ෂි ඔප්පුදීම ඒ ඉල්ලුම්පත්‍රය ඔප්පුකරණ තැනැත්තාපිට රඳතිබේ.

## 19 වෙනි කාණ්ඩය.

### උකස් ලියාපදිංචිකෙරීම.

උකස් ලැබුන්කාරයෙක් උකස ලියාපදිංචිකරන්ට ඕනෑ බව.

293. නාගරිකය ඇතුළත පිහිටා තිබෙන යම් නිශ්චල දේපලාදියක උකසක් නාගරික සභා කන්තෝරුවේ ලියාපදිංචිකරවා තැබීම එබඳු උකසක් ලබනලද සෑම කෙනෙකුට හෝ ඔහුගේ උරුමක්කාරදින්ට හෝ ඉන් එක්කෙනෙකුට හෝ ඒ උකස ලැබුන්කාරයා මැරෙන්ට යෙදුනේවිනම් නඩුමාතියේ ප්‍රකාර ඔහුගේ දේපල භාරකාරයාට හෝ යුතුව තිබෙනවා පමණක් නොව එබඳු යම් උකසක් ලබාසිටින්නාවූ එය ලියාපදිංචිකරවා තැබීමට කැමැත්තාවූ සෑම දෙනෙක්ම ඒ උකස්කරණලද ඉඩමේ විශෙෂ තොරතුරු සම්බන්ධවූ නොහොත් ඒ ඉඩම නිසි ප්‍රකාර දැනගැණීම පිණිස ඕනෑකරන්නාවූ විස්තර ආදිය සමග තමන්ගේ නම සහ පදිංචි ස්ථාන යද එසේ උකස්කළාවූ ඉඩම අයිතිකාරයාගේ නොහොත් උකස්කාරයාගේ නම සහ පදිංචි ස්ථාන යද තමන් විසින්ම හෝ තමන් වෙනුවෙන් කටයුතුකරන්නෙක් ලවා හෝ නාගරික සභාවට දැනුම්දිය යුතුවන්නේය; තවද එසේ දැනුම්දී ඒ තැනැත්තා විසින් ඒ සඳහා ගෙවන්ට ඕනෑකරණ ශත 50ක ගාස්තුව ගෙවූවිට ඉහතකී විස්තර ආදිය ලියාතැබීම පිණිස නාගරිකසභා කන්තෝරුවේ තිබෙන පොතක ඒ විස්තර ආදිය නාගරිකසභාව විසින් ලියා පදිංචිකරණුලැබේ.

ලියාපදිංචිකිරීමේ පොත පරීක්ෂා කෙරීමට ඉඩ තැබීම.

294. එකී ප්‍රකාර ලියා පදිංචිකෙරීමේ සෑම පොතක්ම නාගරිකසභාවේ කටයුතුකෙරීමට නියමකර තිබෙන වේලාවලදී එම සභාවට ශත 25ක ගාස්තුවක් ගෙවා සියලු කල්හිම එය පරීක්ෂාකෙරීමට කැමති යම් කෙනෙක් විසින් එසේ පරීක්ෂාකෙරීමට ඉඩප්‍රස්ථා ඇතිව තබනුලැබේ.

ලියාතහනම්කිරීම නාගරිකසභාව විසින් උකස අයිතිකාරයාට දැනුම්දිය යුතු බව.

295. මේ කාණ්ඩයේ 1 වෙනි අඥාපණතේ නියමකර තිබෙන පරිද්දෙන් ලියා පදිංචිකරණලද යම් උකසකට බැඳී තිබෙන කිසියම් ඉඩමක් වර්ෂ 1887තේ නොම්මර 7 නාගරිකසභා ව්‍යවස්ථාවේ 149 වෙනි වගන්තිය යටතේ ලියා තහනම්කරන්ට යෙදුනොත් එසේ එය ලියා තහනම්කරන්ට යෙදුන බව සහ ඒ ඉඩම එසේ ලියා තහනම්කෙරීමෙන් අයකරන්ට තිබෙන නාගරික අයබදුවල හිඟ ගණන අසවල් පමණය යන බවත් ඉහතකී ව්‍යවස්ථාවේ 151 වෙනි වගන්තිය යටතේ ඒ ඉඩම විකුණන බව ප්‍රසිඬකරන්ට අඩුතරමින් දහහතර දවසකට ප්‍රථමයෙන් ඉහතකී උකස ලියා පදිංචිකෙරෙව්වාවූ අයට නාගරිකසභාව විසින් තැපැල් මාර්ගයෙන් හෝ කෙනෙක් ලවා භාරදෙවීමෙන් හෝ ලියා දැනුම්දිය යුතුවේ.

උකස අයිතිකාරයා විසින් හිඟ අයබදු ගෙවිය හැකි බව.

296. ඉහතකී ප්‍රකාර ලියා තහනම්කරණලද යම් ඉඩමක අයිතිකාරයා හෙවත් උකස්කාරයා විසින් ගෙවියයුතුවූ සියලුම හිඟ අයබදු නොහොත් යම් හිඟයක් සඳහා එසේ ලියා තහනම් කෙළේවිද ඒ හිඟ ගණන ඒ ඉඩම විකුණන්ට ප්‍රථමයෙන් කොයිවේලාවක නුමුත් නාගරිකසභාවට ගෙවීමට එකී යම් උකස් අයිතිකාරයෙකුට හෝ ඔහුගේ උරුමක්කාරදින්ට හෝ ඉන් එක්කෙනෙකුට හෝ නඩුමාතියේ ප්‍රකාර ඔහුගේ දේපල භාරකාරයෙකුට හෝ බලය තිබෙන්නේය; තවද එසේ ඒ හිඟ අයබදු ගෙවූවිට ඒ ඉඩම ලියාතහනමෙන් නිදහස්කරණුලැබේ

---

## 20 වෙනි කාණ්ඩය.

### පාන්ගෙවල් සම්බන්ධ අණපණත් ආදිය.

වර්ෂ 1896යේ නොම්මර 1කේ ව්‍යවස්ථාවේ 20 වෙනි වගන්තියේ 3 වෙනි උප වගන්තියෙන් අලුත්වැඩියාකරන්ට යෙදුනු ප්‍රකාර වර්ෂ 1887තේ නොම්මර 7තේ ව්‍යවස්ථාවේ 122 වෙනි වගන්තිය යටතේ පණවන්ට යෙදුනාවූ මෙහි පහත සඳහන් නගර අඥාපණත් තිරිඟු පිටිවලින් පාන් සාදන්නාවූ පාන්ගෙවල්වලට පමණක් අදාළවේ :—

පාන්ගෙවල් වාතය සහ එලිය ඇතුව තිබෙන්ට ඕනෑබව යනාදිය.

297. සෑම පාන්ගෙයක්ම ඊට හොඳකාර වාතය සහ එලිය ලැබෙන්ට සලස්වා එහි බිත්ති හුනු බදාමෙන් කපරාදුකර සුදුහුනු ගා තිබෙන්ට ඕනෑවත් ඈර බිමට සිමෙන්ති අතුරා හොඳකාර වතුර බැස යෑමට සලස්වා තිබිය යුතුදවේ.

අඩි 30ක් ඇතුළත කසල වළක් නොතිබිය හැකි බව.

298. යම් කසල වළක, වැසිකිළියක හෙවත් පල්දෙරු කානුවක සිට අඩි 30ක් ඇතුළත හෝ එයින් නගින දුර්ගන්ධය ලැබෙන ස්ථානයක හෝ කිසියම් පාන්ගෙයක් නොතිබිය යුතුවේ.

මිනිසුන් වසන ගෙයක්මෙන් පාවිච්චිකරන්ට බැරි බව.

299. පාන්ගෙයක් මෙන් පාවිච්චිකරණ යම් ස්ථානයක් මිනිසුන් පදිංචිව සිටින්නාවූ ස්ථානයක්කොට නොහොත් වෙන මොනයම් කටයුත්තකටවත් පාවිච්චිනොකළ යුතුවේ.

භාජන උපකරණ ආදිය ශුඬ පවිත්‍ර ලෙස තැබීම.

300. යම් පාන්ගෙයක පාවිච්චිකරන්නාවූ නොහොත් ඊට අයිතිවන්නාවූ සියලුම භාජන, උපකරණ හෙවත් වෙන උවමනා දේවල් ශුඬ පවිත්‍රව තැබිය යුතුවේ.

පිටි සහ වතුර සනීපදායකව තිබෙන්ට ඕනෑ බව.

301. පාන් සෑදීම පිණිස පාවිච්චිකරන්නාවූ පිටි සහ වතුරද වෙන ද්‍රව්‍යයන්ද සනීපදායකව සහ හොඳවද තිබෙන්ට ඕනෑවේ.

පාන්ගෙට අයිති ස්ථාන පිරිසිදුව තිබෙන්ට ඕනෑ බව.

302. පාන්ගෙයකට අයිති ස්ථානයන්හි සහ ඒ අවට සියලුම කුණු කසල යනාදිය අප්‍රමාදව අහක්කරන්ට ඕනෑවා සහ එහි කානු හොඳකාර සෝදුහරින්ටද ඕනෑවේ.

රෝගයක් ඇති කෙනෙක් වැඩට ගන්ට බැරි බව.

303. කිසියම් පිළිකුල් රෝගයකින් හෙවත් ස්පර්ශවීමෙන්වත් ළඟ වැදීමෙන්වත් බෝවිය හැකි රෝගයකින් පෙළෙන්නාවූ කෙනෙක් හෝ එවැනි රෝගකාරයෙකුට ළඟදී සාත්තුකළාවූ කෙනෙක් හෝ ඇඟපත නොසෝදා හෙවත් වෙන අන්දමකින් අපිරිසිදුව සිටින කෙනෙක් හෝ පාන්ගෙයක වැඩට නොගතයුතුවේ.

කෙරීමත් පිණිස ඉහතකී මූලාදැනියාට ගෙවියයුතු මුදල ගෙවා ඉතුරු මුදලක් ඇතිවිනම් එය නාගරික සභාවේ ලේකම්තැනට ගෙවීමට නාගරික සභාපතිතැනට බලය තිබෙනවාත් ඇර මෙයින් නියමකරන්ටද යෙදුනා ඇත.

---

## 14 වෙනි කාණ්ඩය.

## බෝවෙන රෝග සහ වසංගත රෝග.

**වසූරි නොහොත් කොලරා ලෙඩුන් ඉස්ප්‍රිතාලයට ගෙණයාම.**

223. වසූරියෙන් හෝ කොලරාවෙන් හෝ වෙනයම් බෝවෙන රෝගයකින් හෙවත් වසංගත රෝගයකින් හෝ පෙළෙන යම් කෙනෙකුට යම් ගෙදරක නොහොත් ඉඩමක අවශෙෂ පදිංචිකාරයන් කෙරෙන් වෙන්කර තැබීමට ඉඩප්‍රස්ථා නැතිවිනම් නොහොත් එබඳු රෝගාතුරයෙකුව එබඳු ගෙදරක හෙවත් ඉඩමක තැබීම අනිකුත් අයවලුන්ට අනතුරුදායක විය හැකියයි ආණ්ඩුවේ ප්‍රධාන වෛද්‍යාචාර්යයාට හෙවත් සනීපාරක්ෂක මූලාදැනියාට පෙණියන්නේවිනම් ප්‍රසිඬ ඉස්ප්‍රිතාලයකට හෝ නාගරික සභාපතිතැන විසින් නියමකරණලද වෙනයම් තනි ඉඩමකට හෝ එබඳු රෝගාතුරයෙකුව අහක්කරවීමට නාගරික සභාපතිතැනට බලය තිබේ.

**එක් ස්ථානයක සිට වෙනින් ස්ථානයකට ලෙඩා ගෙණ යෑම.**

224. එකී ප්‍රසිඬ ඉස්පිරිතාලයකට හෙවත් තනිගෙයකට ගෙණයෑම වෙනුවට එසේ රෝගාතුරවූ කෙනෙක් හෝ ඔහුගේ මිත්‍රාදීන් හෝ විසින් නියමකරගන්නාවූ, එකී ආණ්ඩුවේ ප්‍රධාන වෛද්‍යාචාර්යයා හෙවත් සනීපාරක්ෂක මූලාදැනියා විසින් එපා නොකරන්නාවූ, යම් පලාතකට හෙවත් ස්ථානයකට එසේ රෝගාතුරවූ කෙනෙක්ව ගෙණ යෑමට අවසරදෙන්ට නාගරික සභාපතිතැනට බලය තිබේ.

**නාගරික සභාපතිතැන විසින් නියම නොකර ගෙණ නොයෑම.**

225. වසූරියෙන් හෝ කොලරාවෙන් හෝ වෙනයම් බෝවෙන රෝගයකින් නොහොත් වශංගත රෝගයකින් හෝ පෙළෙණ අයෙකුව, මෙලග ඉහත පෙණෙන අඥාපණතේ නියම කර තිබෙන ප්‍රකාර නාගරික සභාපතිතැනගේ අවසර ඇතුව මිස, ඒ අය සිටින ගෙයි හෙවත් ස්ථානයේ සිට වෙන යම් ගෙයකට හෙවත් ස්ථානයකට ගෙණ යෑම හෝ ඊට උපකාරවීම හෝ කිසිකෙනෙක් විසින් නොකළ යුතුවේ.

**වසංගත රෝගීන් නවතන ඉස්පිරිතාල අවහිරකර තැබීම.**

226. නාගරික සභාපතිතැන විසින් නියමකරණලද සියලුම ඉස්පිරිතාල සහ තනි ගෙවල්, ඒවාට වසූරියෙන් හෝ කොලරාවෙන් හෝ වෙන යම් බෝවෙන රෝගයකින් හෙවත් වසංගත රෝගයකින් හෝ පෙළෙන්නන් භාරගැණීමට පාවිච්චිකරණ කල්හි, වෙන ගෙවල් ආදිය සමග ගණුදෙනු අශ්‍ර නැතුව අවහිරකොට තබන්නුලැබේ ; තවද නිසිප්‍රකාර පත්කරණලද සාතතු කාරාදීන් ඇර වෙන කිසියම් කෙනෙකුට මොනයම් කරුණක් නිසාවත් එබඳු යම් ඉස්පිරිතාලයකට හෙවත් තනි ගෙයකට යාම් ඊම් කරන්ට, එය භාර වෛද්‍ය මූලාදැනියාගේ අවසරපිට මිස, ඉඩදෙනු නොලැබේ.

**ඉස්පිරිතාලයෙන් පිටවී යෑම පිණිස ලෙඩෙකුට වෛද්‍යක සහතික පත්‍රයක් ඕනෑබව.**

227. එබඳු යම් ලෙඩෙක් එකී ඉස්පිරිතාලයෙන් හෙවත් ලෙඩුන් නවතන තනි ගෙයින් පිටවියාමට සුදුසු වන්නේයයි එහි භාරකාර වෛද්‍ය මූලාදැනියා විසින් සහතිකකරණ තුරු ඒ ලෙඩාට ඉන් පිටවී යෑමට ඉඩදෙනු නොලැබේ.

**ලෙඩුන් නාන ස්ථාන වෙන්කර තැබීම.**

228. සුවවේගනඑන ලෙඩුන්ට නෑම පිණිස විශෙෂලෙස වෙන්කර තබනලද ස්ථානවල මිස යම් ප්‍රසිඬ ස්ථානයක එබඳු ලෙඩෙකුට නාන්ට ඉඩදෙනු නොලැබේ.

**ලෙඩුන් අහක්කළාට පසු වසංගත රෝග තිබුන ගෙවල් අවහිරකොට තැබීම.**

229. වසූරියෙන් හෝ කොලරාවෙන් හෝ වෙනයම් බෝවෙන රෝගයකින් හෙවත් වසංගත රෝගයකින් පෙළෙණ ලෙඩෙකුව යම් ගෙයකින් හෙවත් ගොඩනැගිල්ලකින් අහක් කළේවේද, ඒ ගෙට හෙවත් ගොඩනැගිල්ලට වසංගත නසන බෙහෙත් දමා ශුඬ පවිත්‍රකෙරීම පිණිස එය අවහිරකර තැබීම උවමනායයි නාගරික සභාපතිතැනට හෝ ආණ්ඩුවේ වෛද්‍යාචාර්යයාට හෝ සනීපාරක්ෂක මූලාදැනියාට හෝ කල්පනාවූවිට එසේ ඒ ලෙඩා ඉන් අහක්කරන්ට යෙදුන කඩිනමින් නාගරික සභාපතිතැනට හෝ එකී ආණ්ඩුවේ වෛද්‍යාචාර්යයාට හෝ සනීපාරක්ෂක මූලාදැනියාට හෝ සෑහේයයි කල්පනාවෙන පරිද්දෙන් හත්දවසකට වැඩිනොවන කාලයක් එය අවහිරකොට තබන්නුලැබේ ; තවද නිසිප්‍රකාර පත්කරණලද වැඩකාරයන්ට ඇර වෙන කිසිකෙනෙකුට මොනයම් කරුණක් නිසාවත්, එකී ආණ්ඩුවේ වෛද්‍යාචාර්යයාගේ හෙවත් සනීපාරක්ෂක මූලාදැනියාගේ අවසරපිට මිස, ඒ ගෙට හෙවත් ගොඩනැගිල්ලට යාම් ඊම් කරන්ට ඉඩදෙනු නොලැබේ. ඉහතකී ප්‍රකාර අවහිරකොට තබනලද යම් ගෙයක හෙවත් ගොඩනැගිල්ලක පදිංචිකාරයින්ගේ නඩත්තුව පිණිස යන වියදම් උවමනාවිනම් නාගරිකසභාව විසින් ගෙවන්නුලැබේ.

**වසංගත ඇතිවූ ගෙවල් තනිකිරීම.**

230. එබඳු යම් ගෙයක් හෙවත් ගොඩනැගිල්ලක් අවහිරකිරීම වැඩි සඵලලෙසකිරීම පිණිස එය හාත්පසින් වැටක් බැඳ නොහොත් නාගරික සභාපතිතැනට හෝ ආණ්ඩුවේ වෛද්‍යාචාර්යයාට හෝ සනීපාරක්ෂක මූලාදැනියාට හෝ සෑහේයයි කල්පනාවෙන පරිද්දෙන් වෙන විධියකින් කොටුකර තැබීමට නැතහොත් ඒ අසල යම් පාරක, වීදියක, මාවතක නොහොත් මාර්ගයක මිනිසුන් ගමන්කෙරීම වලක්වා අවහිරකිරීමට එකී නාගරික සභාපතිතැනට හෝ ආණ්ඩුවේ වෛද්‍යාචාර්යයාට හෝ සනීපාරක්ෂක මූලාදැනියාට හෝ උවමනාවිනම් බලය තිබෙන්නේය.

**වසංගත ඇතිවූ ගෙවල් අසල මිනිසුන්ගේ රැස්වීම් තහනම් බව.**

231. වසූරිය හෝ කොලරාව හෝ වෙනයම් අනතුරුදායක බෝවෙන රෝගයක් හෙවත් වසංගත රෝගයක් හෝ පවතිනකල්හි ප්‍රසිඬ ඉස්පිරිතාලයක හෝ ලෙඩුන් වෙන්කොට තබනලද තනිගෙයක හෝ ඉහත නියමකරතිබෙන පරිද්දෙන් අවහිරකොට තබනලද ගෙයක හෙවත් ගොඩනැගිල්ලක හෝ නියමකරණලද සීමාවක් ඇතුළත මිනිසුන් එකතුවීම හෙවත් රැස්වීම තහනම්කෙරීමට නාගරික සභාපතිතැනට නොහොත් නාගරික මහෙස්ත්‍රාත්තැනට බලය ඇත්තේවේ.

**මිනීවළක ගැඹුර.**

232. වසූරියෙන් හෝ කොලරාවෙන් හෝ වෙනයම් අනතුරුදායක බෝවෙන රෝගයකින් හෙවත් වසංගත රෝගයකින් හෝ මැරෙණලද කෙනෙකුගේ මෘතශරීරයක් අඩි හයකට වඩා ගැඹුර අඩු වළක වැළලිය යුතුනොවේ.

**ආණ්ඩුවේ වෛද්‍යාචාර්යයා.**

233. මේ කාණ්ඩයේ කිසිවිටක "ආණ්ඩුවේ වෛද්‍යාචාර්යයා" යනු පාවිච්චිකරණලද්දේද එහි තේරුම මහනුවර පොරොත්තු ආණ්ඩුවේ ප්‍රධාන වෛද්‍ය මූලාදැනිතැන වන්නේය.

## 16 වෙනි කාණ්ඩය.

## අශ්ව සහ වෙනත් රථ.

**රථ වාහන පරීක්ෂකවරුන් පත්කෙරීම.**

234. නිසි බලකාරතැන විසින් කලින්කල රථ වාහන සහ කෝච්චි පරීක්ෂකවරුන් පත් කරන්ටද අහක්කරන්ටද යෙදේ; තමන් පත්වසිටින කොට්ඨාසයේ මාර්ගවල යන එන රථවාහන සහ කෝච්චිවල ස්වභාව ගැන ඒ නිසි බලකාරතැන වෙත රපෝර්තුකෙරීම එකී පරීක්ෂකවරුන්ගේ නියම වැඩයද වේ. නිසි බලකාරතැන විසින් නියමකරණලද කාලය ඇතුළත පරීක්ෂකවරුන්ගේ රපෝර්තු එතැන වෙත යැවිය යුතුවාත්ඇර කොයියම් වේලාවක වුණුමුත් එතැන විසින් විශේෂ රපෝර්තුවක් ඉල්ලුම්කලහැකිද වේ.

**සම්පූර්ණ විස්තර පරීක්ෂකවරුන්ගේ රපෝර්තුවල අන්තර්ගතවිය යුතු බව.**

235. රථයෙහි නොහොත් කෝච්චියෙහි ස්ථාපිතකරණලද නොම්මරය වෙන්වශයෙන් සඳහන්කෙරීම සහ රථයෙහි නොහොත් කෝච්චියෙහි ස්වභාවද එය ඇදීමට පාවිච්චිකරණ අශ්වයින්ගේ නොහොත් වෙනයම් සතුන්ගේ ස්වභාවද (පෙණියන අන්දමට) ඒ අශ්වයින්ගේ නොහොත් අශ්වයාගේ උස ප්‍රමාණයද, අශ්ව ඇඳුම්වල ස්වභාවද මේ නගර ආඥාපණත් යටතේ එබඳු රථයක නොහොත් කෝච්චියක කියවීමට පහසුලෙස සහ හොඳකාර පෙණෙන්ටත් තිබිය යුතුවූ දැන්වීමේ ස්වභාවද ගැන විස්තරත් රථවාහන සහ කෝච්චි පරීක්ෂක කෙනෙකුගේ රපෝර්තුවේ අන්තර්ගතවිය යුතුවේ.

**රථ සෝදිසිකිරීම පිණිස රථ නවත්වන ස්ථානවලට සහ ඉඩම්වලටත් පරීක්ෂකකෙනෙකුට ඇතුල්වියහැකි බව.**

236. ඉහතකී ප්‍රකාර පත්වසිටින පරීක්ෂක කෙනෙකුගේ කොට්ඨාසය ඇතුළත යම් නගරයක හෝ අවසරලත් රථ සහ කෝච්චි යනඑන්නාවූ යම් මාර්ගයක හෝ රථ නොහොත් කෝච්චි තබන ස්ථානමෙන් පාවිච්චිකරණ යම් ඉඩමකට ඇතුල්ව එහි තිබෙන රථවල නොහොත් කෝච්චිවල අවසරපත්‍රද ඒ රථවල නොහොත් කෝච්චිවල යොදා පාවිච්චිකෙරීමට ඒ ස්ථානයේ තබාගෙණ ඉන්නාවූ අශ්වයන් සහ අශ්වඇඳුම්ද, තමන් විසින් පරීක්ෂාකෙරීම පිණිස පෙන්වන ලෙස ඒ ස්ථානය භාරකාරයාගෙන් ඉල්ලුම්කරන්ට එකී පරීක්ෂකතැනට බලය තිබේ; තවද ඒ පරීක්ෂකතැනට එසේ පරීක්ෂාකෙරීමේදී සියලුම සැහෙන ආධාර නොදෙන්නාවූ එබඳු ස්ථානයක් භාරකාරයෙක් ඇත්තේවිද ඔහු අපරාධයක් කළායයි දෝෂාරෝපණයකරණලබන්නේ වෙයි.

**පරීක්ෂකතැන විසින් සහතික පත්‍රයක් දුන්නොත් මිස නැත්නම් කොයියම් වාහනයකටවත් අවසරපත්‍රයක් නොදෙන බව.**

237. යම් රථයක් හෝ කෝච්චියක් හෝ මගීන්ගේ පාවිච්චිය පිණිස සියලු ආකාරයෙන්ම සැහෙන්නේයයි සහ ආරක්ෂාසහිතයයිද ඒ ගැන "වර්ෂ 1901කේ රථ වාහන සම්බන්ධ ව්‍යවස්ථාවේ" සහ මේ නගර ආඥාපනත්වලත් ඕනෑකර තිබෙන කටයුතු ඉෂ්ටකර තිබෙන්නේයයිද පරීක්ෂක කෙනෙක් විසින් ප්‍රථමයෙන් සහතික කෙළේවිනම් මිස නැතිවිනම් කොයියම් රථයකටවත් කෝච්චියකටවත් ඉහතකී ව්‍යවස්ථාවේ නියෝග යටතේ අවසරපත්‍රයක් දෙනු නොලැබේ.

**සහතිකපත්‍රයක් ඉල්ලන්ට ප්‍රථමයෙන් තමන් ඊට අදහස්කර සිටින බව අයිතිකාරයා විසින් දැනුම්දෙන්ට ඕනෑවේ.**

238. යම් රථයක් හෙවත් කෝච්චියක් අයිති සෑම දෙනෙකක්ම සහතිකපත්‍රයක් ඉල්ලන්ට ප්‍රථමයෙන් තමන් එය ඉල්ලන්ට අදහස්කරගෙණ ඉන්න බව නිසි බලකාරතැන වෙත දැනුම්දීම ඒ අයිතිකාරයාගේ යුතුකමවේ; එතැන විසින් ඒ ඉල්ලුම්කාරයාගේ නම සහ ඔහුට නියමකරණලද නොම්මරයත් ලේඛන පොතක ලියාතබා වාහනයේ දැරියයුතු නොම්මරයද අකුරෙන් සහ ඉලක්කම්වලින්නුත් ඒ දැන්වීම්පත්‍රයේ පිටපැත්තේ සඳහන්කොට එය ආපසු ඉල්ලුම්කාරයාට දෙන්ට යෙදේ. නිසි බලකාරතැන විසින් බලයදී පත්කරණලද තැනැත්තෙක් විසින් එකී දැන්වීම්පත්‍රයේ පිටපැත්තේ සඳහන්කරණ ලියවිල්ලට අත්සන් තබනුලැබේ.

**මගීන් ගණන නියමකෙරීම.**

239. මෙකී සහතික පත්‍රය දෙනකල්හි ඒ රථයෙහි නොහොත් කෝච්චියෙහි ගෙණයෑමට අවසරදියයුතු මගීන් ගණන පරීක්ෂකතැන විසින් නියමකළ යුතුවේ.

**සෑම රථයකම ලාම්පු දෙකක් තිබෙන්ට ඕනෑ බව.**

240. අවසරලත් සෑම රථයකම එය දක්කන්නා නැගියන ස්ථානයට දෙපැත්තෙන් සැහෙන තරම් හොඳ ලාම්පු දෙකක් ඕනෑකළවිට පත්තුකෙරීමට සූදානම්ව සියලු වේලේම තබාගෙණ ගිය යුතුවා සහ සවස 6ටත් උදය 5කුත් 30ටත් අතර කාලයේදී ඒ රථය පාවිච්චිකරන්නේවිනම් මෙකී ලාම්පු පත්තුකළ යුතුද වේ.

**පාවිච්චියට අයෝග්‍ය රථ පාවිච්චිනොකළ යුතු බව.**

241. අවසරලත් රථයක හෝ කෝච්චියක හෝ නැගියන මගීන්ගේ ප්‍රවේසමද, එහි යොදනලද සතා කෙරෙහි කරුණාවන්තලෙස ක්‍රියාකෙරීමද ගැණ සලකාබලනවිට එසේ ඒ වාහනය ඇදීමට පාවිච්චිකරණ සතා හෝ ඊට අයිති ඇඳුම් ආදී උපකරණ හෝ එසේ පාවිච්චිකෙරීමට යෝග්‍ය අන්දමට නොතිබෙන්නේවිනම් එබඳු යම් සතෙක් හෝ ඇඳුම් ආදී උපකරණ හෝ පාවිච්චිකෙරීමවත් ඊට ඉඩප්‍රස්ථා දීමවත් කිසියම් අවසරලත් රථයක් නොහොත් කෝච්චියක් අයිතිකාරයෙක් විසින් නොකළ යුතුවේ.

**අවසරපත්‍රයේ පිටපතක් හොඳකාර පෙණෙනලෙස එක එක රථයක තැබියයුතු බව.**

242. නිසි බලකාරතැන විසින් දෙනලද අවසර පත්‍රයේ පිටපතක් වතාව ආදියෙන් එය ආරක්ෂාවීම පිණිස විදුරු වැස්මක් ඇති සැහෙන රාමුවක දමා සෑම රථයකම හෙවත් කෝච්චියකම හොඳකාර පෙණෙන තැනක් තැබිය යුතුවේ.

**වාහනයක ගෙණයා යුතු මගීන් ගණන සඳහන් දැන්වීමක් හොඳකාර පෙණෙනලෙස තැබිය යුතු බව.**

243. එක එක රථයක නොහොත් කෝච්චියක (එය දක්කන්නා සහ වෙන වැඩකාරයින්නුත් ඇතුළුව) ගෙණයන්ට අවසරදෙනලද මගීන් ගණන සඳහන් දැන්වීමක් ඒ රථයෙහි හෙවත් කෝච්චියෙහි හොඳකාර පෙණෙන තැනක තැබිය යුතුවේ. ඕනෑකලේවිනම් කලින්කල අලුත්කර, මේ දැන්වීම පවිත්‍රව සහ කියැවීමට පහසුලෙසත් තැබිය යුතුවේ. අවසර පත්‍රයේ බලයදී තිබෙන ගණනට වැඩි මගීන් ගණනක් කොයියම් රථයක හෙවත් කෝච්චියක වුණුමුත් ගෙණයා යුතු නොවේවත් ඇර කොයියම්විටක වුණුමුත් නියම මගීන් ගණන සම්පූර්ණයෙන් ගෙණයන්ට බැරියයි දක්කන්නා විසින් එපාකෙරීම නොකළ යුතුදවේ.

**පරීක්ෂකතැන විසින් සහතික පත්‍රය දෙන්ට බැරියයි කීමට හේතුවූ කාරණ දැනුම්දිය යුතු බව.**

244. පරීක්ෂකතැනක් 237 වෙනි නගර ආඥාපණතේ සඳහන් සහතිකපත්‍රය නොදෙන්නේවිනම් තමන් එසේ කෙරීමට හේතුවූ කාරණ එතැන විසින් නිසි බලකාරතැන වෙත ලියා රපෝර්තුකළ යුතුවාත් ඇර ඒ සහතිකපත්‍රය නොදීමට හේතුවූ වැරදි හරිගස්සා ගැණීම ඉල්ලුම්කාරයාට පුළුවන්වෙන පිණිස පරීක්ෂකතැනගේ රපෝර්තුවේ පිටපතක් ඒ ඉල්ලුම්කාරයාට එවේලෙහිම යැවිය යුතුද වේ.

නගර ආඥාපනත් කඩකෙරීම් ගැන අයිතිකාරයා සහ දක්කන්නාත් යන දෙදෙනාම වගකිය යුතු බව.

245. තමන්ගේ රථවල හෙවත් කෝච්චිවල අශ්වයන් හෝ වෙන උපකරණ හෝ මේ නගර ආඥාපනත්වල කියා තිබෙන ප්‍රකාර අයෝග්‍යවූවිට ඒ ගැනද, යම් රථයක හෝ කෝච්චියක හෝ අවසරපත්‍රයේ බලයදී තිබෙනවාට වඩා මගීන් ගණනක් ගෙණ ගියවිට ඒ ගැනද, රථ නොහොත් කෝච්චි ඇදීමට නුසුදුසුවූ සතුන් පාවිච්චිකළ විට ඒ ගැනද, තමන් දක්කාගෙණ යන රථයෙහි හෝ කෝච්චියෙහි හෝ යොදනලද සතුන්ට කෲරලෙස හිරිහැරකළ විට ඒ ගැනද වාහන අයිතිකාරයන් සහ දක්කන්නන්ද යන දෙගොල්ලම වගකිය යුතුවේ. රථයක හෝ කෝච්චියක හෝ ගෙණයෑමට අවසරදී තිබෙන සම්පූර්ණ මගීන් ගණන ඉන් නාවූ යම් රථයකට හෝ කෝච්චියකට හෝ නගින්ට යෙදෙන හැනැත්තාද, මේ නගර ආඥාපණත් කඩකෙරීම ගැන වරදකාරයාවී ඊට සුදුසු දඩුවම් ලැබිය යුත්තෙක් වේ.

සෑම රථ දක්කන්නෙක්ම ඊට සුදුසුවන්නේ වීනම් ඔහුට අවසර පත්‍රයක් දෙනු ලැබේ.

246. අවසරලත් වාහන දක්කන්නාවූ සියල්ලන්ම ඊට සුදුස්සන් බවට ඔප්පු සාක්ෂි නිසි බලකාරතැනට ඕනෑකෙරේ. එතැනට ඒත්තුයනලෙස ඒ ඔප්පු සාක්ෂි පෙන්නාදුන් විට එබඳු රථ දක්කන්නාට එතැන විසින් අවසරපත්‍රයක් දෙන්ට යෙදෙනවාත් ඇර ඒ ගැනම තබන ලද පොතක ඒ අවසරපත්‍රය ලියා පදිංචිකරණු ලැබේ. අවසරලත් රථ දක්කන්නෙක් ඇර වෙන කිසිවෙක් අවසරලත් වාහනයක් දැක්කීම හෝ එය භාරේ ඉදීම හෝ නොකළ යුතුවේ.

නගර ආඥාපණත් කඩකෙරීම ගැන අයිතිකාරයා සහ දක්කන්නාද යන දෙදෙනාටම විරුඬව නඩු පැමිණිය යුතුබව.

247. තමන්ට පෙණියන්නාවූ යම් වැරදි ක්‍රියාවක් ගැන හෝ මේ නගර ආඥා කඩකිරීමක් ගැන හෝ යම් රථයක නොහොත් කෝච්චියක අයිතිකාරයාද දක්කන්නාද යන දෙදෙනාටම විරුඬව නඩු පැමිනිලිකෙරීම සහ ඒ නඩුව සම්බන්ධව පැමිනිල්ලේ කටයුතු අන්තිම තීන්දුව දක්වා කෙරීමත් සෑම පරීක්‍ෂකකෙනෙකුගේම නියම වැඩය වේ.

අයිතිකාරයා සහ දක්කන්නාද යන දෙදෙනාම යම් වැරදි ක්‍රියාවක් ගැන වගකියයුතු බව.

248. යම් රථයක හෝ කෝච්චියක හෝ කිසියම් තැනක පෙණෙනලෙස තැබීමට මේ නගර ආඥාපණත්වලින් නියමකරණලද යම් නොම්මරයක්වත් දැන්වීමක්වත් යනාදි ලියවිල්ලක් මකාදැමීම හෝ අහක්කෙරීම හෝ වෙනස්කෙරීම හෝ කෙළේවීනම් එහි අයිතිකාරයා සහ දක්කන්නාද යන දෙදෙනාම අපරාධයක් කළායයි පිළිගණු ලැබේ.

කෝච්චියකින් ගමන්කරන්නාවූ එක එක මගියාට රාත්තල් 28ක් බර මාගෝපකරණ ගෙණයන්ට ඉඩ තිබෙන බව.

249. අවසරලත් කෝච්චියකින් ගමන්කරන්නාවූ එක එක මගියෙකුට රාත්තල් 28ක බරට වැඩිනොවන්නාවූ මාගෝපකරණදිය ගෙණයන්ට ඉඩදෙනු ලැබේ; ඒ එක එක මගියාට රාත්තල් 28කට වැඩිමනත් බරඇති මාගෝපකරණදිය ගෙණයන්නාවූ සියලු ප්‍රස්ථාවලදීම ඒ වැඩිමනත් ද්‍රව්‍යවල බර හොන්ඩරයකට එක මගියෙක් බැගින් මගීන් ගණන අඩුවෙන් ගෙණ ගියයුතුවේ. මෙහි ඉහත සඳහන් නියමයපිට ඇර කොයියම්විටකවී ශුනූන් බානා මලු හෝ වෙන බඩු ජාති හෝ අවසරලත් කෝච්චියකින් ගෙණගියයුතු නොවේ.

ඒජන්තවරුන් සහ කෝච්චි දක්කන්නන් ලියාපදිංචිකරන්ට ඕනෑ බව.

250. කෝච්චිපාරවල නොයෙකුත් කෝච්චිකන්තෝරු භාර තමන්ගේ ඒජන්තවරුන්ගේ සහ කෝච්චි දක්කන්නන්ගේත් පොරොත්තු ස්ථාන සහ නම් ලියාදී එබඳු ඒජන්තවරුන් සහ සියලුම කෝච්චි දක්කන්නන්ද නිසි බලකාරතැනගේ කන්තෝරුවේ ලියා පදිංචිකෙරීම සියලුම කෝච්චි අයිතිකාරයින්ගේ නියම යුතුකම වේ.

පොදු ජනයාට අනතුරුවියහැකි තරම් වේගයෙන් "මොටෝර්කාර්" නම් විදුලිරථ දුවවන්ට අයුතුබව.

251. "මෝටෝර් කාර්" නම් විදුලි රථ හෝ දුමෙන් අටගන්නාවූ විදුලි බලයෙන්වත් වෙනයම් ආකර්ෂණ බලයකින්වත් දුවවන්නාවූ වෙන වාහන හෝ, ඒවා දුවවන්නාවූ ස්ථානයේ හැසිරෙන සෙනගගේ ප්‍රමාණය සහ එහි අනිකුත් තොරතුරු ගැණත් කල්පනාකළාම, පොදු ජනයාට අනතුරුවියහැකි තරම් වේගයෙන් දිවවියයුතු නොවේ. එබඳු වාහනයක් දිවවීමට සුදුස්සෙක් හැටියට නිසි බලකාරතැනගෙන් සහතිකපත්‍රයක් ලත් කෙනෙක් ඇර වෙනයම් කෙනෙක් එබඳු වාහනයක් දුවවීම්ද නොකළ යුතුවේ.

අවසරලත් වාහනවල පඞ්ක්‍ති නියමකෙරීම.

252. කෝච්චින් බරකරත්තත් තනිගොන්කරත්තත් ඇර අනිකුත් සියලුම අවසර ලත් වාහන පළමුවෙනි දෙවෙනි පඞ්ක්‍තිවල වාහනයන් හැටියට පඞ්ක්‍ති නියමකෙරීම සහ ඒ එක එක වාහනයක ගෙණගියයුතු මගීන් ගණන නියමකෙරීමද නිසි බලකාරතැන විසින් කරණු ලැබේ. එක එක වාහනයක් අයිති පඞ්ක්‍තියද ඒ වාහනයේ ගෙණයෑමට අවසර දෙනලද මගීන් ගණනද නිසි බලකාරතැන විසින් අවසරපත්‍රයේ සටහන් කරවනු ලැබේ.

අවසරලත් රථ වාහන ඒවා නවතින පේළියේ සිට යාම් ඊම් කළයුතු බව.

253. කුලියට මගීන් ගෙණයෑමට අවසරලත් යම් රථ වාහනයක් (මෙහි පහත නියම කරණ පරිද්දෙන් ඇර) එය නැවතී සිටීමට නියමකරණලද පේළියක සිට මිස කුලීපැටවීමට යාම් ඊම් කෙරීමට එහි අයිතිකාරයා හෝ දක්කන්නා හෝ විසින් ඉඩප්‍රස්ථා දියයුතු නොවේ.

වාහන නැවැත්වීමට නාගරික සභාව විසින් පේළි නියම කරණ බව

254. අවසරලත් රථ වාහන නවත්වා තබන පොදු පේළි හැටියට කලින්කල ස්ථාන නියම් කෙරීම සහ එබඳු පොදු පේළිවල පිහිටීම අත්ඇරදැමීම හෝ වෙනස්කෙරීම හෝ සභා සම්මතයෙන් කරණලද යෝජනාවක් පිට කොයියම් විටකදී ශුනූත් කෙරීමත් නාගරික සභාවට හැකිවන්නේය.

පහත සඳහන් පොදු පේළි දැනට පාවිච්චිකරණ ඒවා වේත් :—

නොම්මර 1 අවසරලත් අශ්වරථවලට, වාර්ඩ් වීථියේ.
නොම්මර 2 අවසරලත් රික්ෂෝ රථවලට, වාර්ඩ් වීථියේ.
නොම්මර 3 අවසරලත් බක්කි කරත්ත සහ තනිගොන් කරත්තවලට, හර්ස් වීථියේ (ඝඩම ඉදිරිපිට).
නොම්මර 4 අවසරලත් රික්ෂෝ රථවලට, කොට්ටගොඩැල්ල වීථියේ.
නොම්මර 5 කටුගස්තොට පාලම ලඟ.
නොම්මර 6 ත්‍රිකුණාමල වීථියේ උතුරු කෙළවරේ.

**පේළි විවෘතකරණ බව දැනුම්දිය යුතු බව.**

255. මෙකී පොදු පේළි විවෘතකරණවිට ඒ සඳහා කරන්ට යෙදෙන දැන්වීමේ නියම කරණලද දිනයක පොදු ජනයාගේ පාවිච්චියට ඒවා විවෘතකරණ බව තිස් බලකාරතැනට පෙණියන ප්‍රකාර යොග්‍යවූ ප්‍රසිඞ ක්‍රමයකින් සැහෙන පමණ කල්තියා එතැන විසින් දැනුම් දෙවනු ලැබේ; එවක් පටන් එබඳු පොදු පේළියක සිට හෝ අයිතිකාරයාගේ ගෙදර සිට හෝ කුලී පැටවීමෙහි යෙදී සිටින ස්ථානයක සිට හෝ මිස කුලියට දෙන්ට අවසරලත් කොයියම් රථයක්වත් කුලී පැටවීම පිණිස යාම් ඊම් කළයුතු නොවේ.

**පේළියේ තිබෙන සැම රථයකම පසු පැත්තෙන් ඉඩඇර තැබීම.**

256. සැම පේළියකම තිබෙන හතරවෙනි රථයට පසු පැත්තෙන් පයින් ගමන්කරණ මගීන්ගේ යාම ඊම පිණිස නොඅඩුවම අඩුතරමින් අඩි අටක් ප්‍රමාණ ඉඩඇර තැබිය යුතුවේ.

**පේළියේ රථය නැවැත්වියයුතු පිළිවෙළ.**

257. සැම රථයක්ම පොදු පේළියකට පැමිණිවිට එවකට එහි නවත්වා තිබෙන රථවල අනතිම කෙළවරට ගෙණගොස් නැවැත්විය යුතුවා සහ සැම පේළියකම එක පෙළක පමණක් සියලු රථම තබාගත යුතුවේ.

**පේළියේ රථය නවත්වා තිබෙන අතර ඒ කැටුව දක්කන්නා සිටිය යුතු බව.**

258. (වේලාසනින් කුලියට දී තිබෙන්නේවිනම් මිස හෝ මෙහි පහත වෙන්වශයෙන් නියම කරණලද පරිච්ඡෙදන් මිස හෝ විනා) කුලීගෙණයන අවසරලත් රථ සියල්ලම විවේක පිණිස වැඩ නවත්වාසිටින කාලය අත්හැර උදය හයහමාරට පොදු පේළියට පැමිණ සවස හත වන තුරු කුලීගෙණයෑමට ලැස්තිවසිටිය යුතුවා සහ මගීන් ගෙණයෑමට පාවිච්චිකරණ අවසරලත් සැම රථයකම දක්කන්නා එය පේළියේ නවත්වාතිබෙන විට ඒ රථය කැටුව සිටිය යුතුද වේ.

**කුලී මිළ සටහනක් රථය ඇතුලේ තබන්ට ඕනෑ බව.**

259. එවකට අයකරන්ට නියම කුලී මිළ සටහනක් සණ කඩදාසියක අච්චුගස්වා හෝ තහඩුවක කොටවා හෝ කුලී ගෙණයන සැම රථයකම ඇතුල්පැත්තේ හොඳකාර පෙනෙන තැනක සවිකර තැබිය යුතුවා සහ ඒ රථය කුලී ගෙණයෑමට පාවිච්චිකරණ කාලය මුලුල්ලේම එකී සණ කඩදාසිය නොහොත් තහඩුව පහසුවෙන් කියවන්ට පුළුවන්ලෙස නොමැකී තිබෙන්ට ඇරිය යුතුද වේ.

**කුලී මිල ගණන්.**

260. අයකළයුතු කුලීමිළ ගණන් පහත සඳහන් ඒවා වෙත්. තනිගොන් කරත්ත ඇර වෙන රථවලට විශෙෂ පොරොන්දුවක් පිට මිස දුර ප්‍රමාණයේ හැටියට කුලී අයකළ හැකිනොවේ :—

| | උදේ 6ටත් රෑ 7ටත් අතර. රු. ශ. | රෑ 7ටත් උදේ 6ටත් අතර. රු. ශ. |
|---|---|---|
| තනි අශ්වයෙක් අදින පළමුවෙනි පඞක්තියේ රථයකට :— | | |
| උදේ 6 පටන් රෑ 7 වනතුරු | 5 0 | — |
| නොකඩවූ කිසියම් පැය 6කට ... ... | 2 50 | 3 20 |
| පළමුවෙනි පැයට ... ... | 1 20 | 1 50 |
| ඊලඟ සැම පැයකට ... ... | 0 30 | 0 35 |
| පැය බාගයකට ... ... ... | 0 60 | 0 75 |
| තනි අශ්වයෙක් අදින දෙවෙනි පඞක්තියේ රථයකට :— | | |
| උදේ 6 පටන් රෑ 7වනතුරු ... ... | 4 0 | — |
| නොකඩවූ කිසියම් පැය 6කට ... ... | 2 0 | 2 50 |
| පළමුවෙනි පැයට ... ... | 1 0 | 1 25 |
| ඊලඟ සැම පැයකට ... ... | 0 25 | 0 30 |
| පැය බාගයකට ... ... ... | 0 50 | 0 60 |
| අශ්වයින් දෙන්නෙක් අදින රථවලට :— | | |
| තනි අශ්වයෙක් අදින රථයක ගණනින් දෙකෙන් කොටසක් වැඩිකරණු. | | |
| තනි ගොණෙක් අදින කරත්තයකට :— | | |
| සැම පැයකට නොහොත් ඉන් කොටසකට ... | 0 25 | 0 30 |
| හැතැක්මකට ... ... ... | 0 8 | 0 10 |
| පළමුවෙනි පඞක්තියේ ජින්රික්ෂෝ එකකට :— | | |
| පළමුවෙනි පැය බාගයට නොහොත් ඉන් කොටසකට | 0 30 | 0 35 |
| දෙවෙනි පැය බාගයට නොහොත් ඉන් කොටසකට | 0 30 | 0 35 |
| ඊලඟ යම් පැය බාගේකට නොහොත් ඉන් කොටසකට | 0 15 | 0 20 |
| දෙවෙනි පඞක්තියේ ජින්රික්ෂෝ එකකට :— | | |
| පළමුවෙනි පැය බාගයට නොහොත් ඉන් කොටසකට | 0 25 | 0 30 |
| දෙවෙනි පැය බාගයට කොහොත් ඉන් කොටසකට | 0 25 | 0 30 |
| ඊලඟ යම් පැය බාගයට නොහොත් ඉන් කොටසකට | 0 10 | 0 15 |
| කන්දේවීදිය, බ්‍රවුන්රිග්වීදිය, වෝර්ඩ්වීදිය, කච්චේරියේපාර යන මේ වීදිවල යම් ස්ථානයක සිට හෝ මෙකී වීදිවලින් වට කරණලද මායිම් ඇතුළත සහ කච්චේරියේ පටන් කන්දේ වීදියේ කෙළවර දක්වා අදිනලද ඉරකින් වටවූ මායිම ඇතුළත යම් ස්ථානයක සිට හෝ එම වීදිවල වෙනයම් ස්ථානයකට නොහොත් මෙකී මායිම් ඇතුළත එක ගමනකට :— | | |
| පළමුවෙනි පඞක්තියේ ජින්රික්ෂෝ එකකට ... | 0 15 | 0 20 |
| දෙවෙනි පඞක්තියේ ජින්රික්ෂෝ එකකට ... | 0 10 | 0 15 |
| පෝනියෙක් අදින බක්කි කරත්තයකට :— | | |
| පළමුවෙනි පැය බාගයට ... ... | 0 40 | 0 55 |
| දෙවෙනි පැය බාගයට ... ... | 0 40 | 0 55 |
| දෙවෙනි පැයට නොහොත් ඉන් කොටසකට ... | 0 40 | 0 55 |
| ඊලඟ සැම පැයකට හෝ ඉන් කොටසකට ... | 0 16 | 0 26 |
| ගොණෙක් අදින බක්කි කරත්තයකට ඉහත පෙණෙන ගණන්වලින් දෙකෙන් කොටසයි. | | |

**රථයක් අයිතිකාරයා හෝ දක්කන්නා හෝ එය කුලියට දෙන්ට බැඳිසිටින බව. ඒ ගැන කොන්දේසිය ඉල්ලූවිට කුලිය ගෙවන්ට ඕනෑ බව.**

261. කොයියම් අවසරලත් රථයක් වීනමුත් එය කලින් කුලියට දීතිබුනොත් මිස හෝ කුලියට නොදෙන්ට හේතුවූ වෙනයම් ගතයුතු කරුණක් ඇතිවූවහොත් මිස හෝ නැත්නම් ඒ රථය ප්‍රසිඬ පේළියක තිබුනත් අයිතිකාරයා පදිංචි ස්ථානයේ තිබුනත් (වෙන කොයියම්තැනක තිබුනත්) එය කුලියට ඉල්ලන්නාවූ යම් කෙනෙකුට දෙන්ට සහ නාගරිකය ඇතුළත කොයිම කරත්ත පාරක වීනමුත් එක් ස්ථානයක සිට වෙන ස්ථානයකට ඉන් ඔහුව ගෙණයන්ටත් එබඳු යම් රථයක් අයිතිකාරයා නොහොත් දක්කන්නා සියලු වේලෙහිම බැඳී සිටින්නේය. එහෙත් කුලියට නොදීමට හේතුවූ ගතයුතු කරුණක් තිබුනේය යන්න ඔප්පුදීම එය අයිතිකාරයා පිට නොහොත් දක්කන්නා පිට රඳාතිබෙන්නේ වෙයි; තවද නීතියේ ප්‍රකාර නියමකර තිබෙන කුලී මිල ගණන ඉල්ලූවිට ඒ මිළ ගණන ඒ රථය පාවිච්චිකරන්ට ප්‍රථමයෙන් වහාම එය කුලියට ගන්නාවූ තැනැත්තා විසින් එක් අයිතිකාරයාට නොහොත් දක්කන්නාට ගෙවන්ට ඕනෑවාත් ඇර වැඩිදුරටත් කිසියම් පැය දෙළහක කාලයක් ඇතුළත හැතැක්ම දහයකට වැඩිදුර අවසරලත් රථයකින් මගින් ගෙණයන්ට බලකළ හැකිද නොවේ.

**පාවිච්චියට සුදුසු රථ ප්‍රසිඬ පේළිය ඇතුළට නොගන්න බව.**

262. අප්‍රවේසම් සහිතවූ හෝ පලුදු අළුත්වැඩියාකෙරීම් හොඳකාර නොකරණලද හෝ වෙනයම් ආකාරයකින් මගීන්ගේ පහසුවටද, නැගියෑමටද නොවටින්නාවූ හෝ කොයියම් අවසරලත් රථයක් වී නුමුත් කිසිම ප්‍රසිඬ පේළියකට ඇතුල්කළයුතු නොවේ.

**අවසරලත් රථයක් දක්කන අය වීදියේ එහා මෙහා යායුතුනොවන බව.**

263. මගීන් බැඳසවීමටත්, නන්ගවාගැණීමටත්, ඇර කොයියම් අවසරලත් රථයක් වූවත් කිසියම් වීදියක් දිගේ හෝ වෙනයම් රථයක පැත්තෙන් හෝ තබාගැණීමටවත් එහා මෙහා ගෙණයාමටවත් එබඳු රථයක් දක්කන්නෙක් ඉඩදියයුතු නොවේ; වෙනයම් රථයක් දක්කන්නෙකුට යම් කෙනෙකුව බැඳසවීමට හෝ නන්ගවාගැණීමට හෝ අවහිරකෙරීමද නොහොත් බාධාකෙරීමද වෙනයම් අවසරලත් රථයක් දක්කන්නෙකුට කුලියක් ලබාගැණීමට ඉඩනොදී කැමැත්තෙන්ම වැලැක්වීම නොහොත් වලක්වන්ට උත්සාහකෙරීමද ඔහු විසින් නොකළයුතු වේ.

**අවසරපත්‍රයේ අන්දම.**

264. කුලියට දෙන යම් රථවාහනයක අයිතිකාරයාට දෙන්නාවූ අවසරපත්‍රය රථවාහන සම්බන්ධ ව්‍යවස්ථාවේ උප ලේඛනයේ "බී" අක්ෂරය දරණ සටහනේ ප්‍රකාරවාත් ඇර ඒ අවසරපත්‍රය අන්කෙනෙකුට පාවාදියහැකිද නොවේ. එහෙත් තනි පොරොන්දුවක් හෙවත් විශේෂ පොරොන්දුවක් පිට පමණක් කුලියටදෙන්ට යෙදෙන යම් රථයකට තමන්ට පෙනියන ප්‍රකාර සුදුසු නියෝගපිට තමන් කැමති පරිද්දෙන් විශේෂ අවසරපත්‍රයක් දී මේ කාණ්ඩයේ ඉහත පෙණෙන යම් නගර ආඥාපණතකට යටහත්වීමෙන් එබඳු රථයක අයිතිකාරයාව සහ දක්කන්නාවත් නිදහස්කෙරීමට නාගරික සභාපතිතැනට හැකිවන්නේය. එසේ විශේෂ අවසරපත්‍රයක් ලත් රථයක් ප්‍රසිඬ පේළියක් ඇතුළට වැද්දගන්නේ නැත.

**දක්කන්නා කෝට් එකක් ඇගලා තමන්ගේ අවසරපත්‍රයේ නොම්මරය දරණ බාපනයක් ගෙණගියයුතු බව.**

265. අවසරලත් රථයක් දක්කන සැමදෙනෙක්ම ජකෙට්ටුවක් නොහොත් කෝට් එකක් ඇගලා ඒ දක්කන්නාගේ අවසරපත්‍රයේ නොම්මරය අඩංගුකොට නිසි බලකාරතැන විසින් සපයාදෙනලද බාපනයක් ගෙණගිය යුතුවේ.

**සහතිකපත්‍රය ලබාගැණීම පිණිස එක රථයකට අයිති උපකරණ වෙන රථයකට නොයෙදියයුතු බව.**

266. පරීක්ෂක කෙනෙකුගෙන් සහතිකපත්‍රය ලබනලද රථයක හෝ කෝච්චියක හෝ උපකරණවලින් මෙහි පහත දක්වන යම් කොටසක්, වෙනින් රථයකට හෝ කෝච්චියකට හෝ සහතිකපත්‍රයක් ලබාගැණීම අදහස්කොට එහි තබන්ට යෙදුනොත් එය අයිතිකාරයා අපරාධයක් කළායයි දෝෂාරෝපණයකරණුලබන්නේය, එනම් :—

| | |
|---|---|
| ලාම්පු<br>අවසරපත්‍රයේ රාමුවක දමා තිබෙන පිටපත | මෙත්ත<br>තැන්ද නොහොත් වැස්ම |

**සතා නොබැඳි රථයක් පාරක තිබිය නොහැකි බව.**

267. අවසරලත් යම් වාහනයක් කිසියම් ප්‍රසිඬ වීදියකදී හෝ පාරකදී හෝ හදිසියෙන් කඩාවැටුනොත් මිස එසේ නොවීනම්ද, එසේ හදිසියෙන්වූවිට එය එතනින් අහක්කරගැණීමට ඕනෑකරණවාට වඩා දීඝී කාලයක්ද, එබඳු යම් වාහනයක් එහි බඳිනලද හෙවත් යොදනලද ගවයින් හෝ අශ්වයින් හෝ වෙන සතුන් හෝ නැතුව ප්‍රසිඬ වීදියක හෝ පාරක හෝ තිබෙන්ට ඇරීම හෙවත් එසේ තිබෙන්ට අවකාශදීම කිසිකෙනෙක් විසින් නොකළ යුතුවේ. වාහන නැවැත්වීමට සුදුසු ස්ථාන ඇරතබනතුරු මේ නියෝගයේ බලය පවත්වනු නොලැබේ.

**රථවල තිබී සම්භවෙන බඩු ගැණ.**

268. යම්කිසි අවසරලත් වාහනයක් කුලියට ගත්තාවූ නොහොත් ඉන් ගමන්කළාවූ යම් කෙනෙක් කිසියම් බඩුවක් අමතකව එහි දමා ගියේවීනම් ඒ බඩුව ඒ වාහනයේ තිබී සම්භවී පැය දෙළහක් ඇතුළත එසේ එය සම්භවෙනවිට තිබුන අන්දමටම ඒ වාහනය අයිතිකාරයා විසින් හෝ එය දක්කන්නා විසින් හෝ ඉතා ලඟුදුරු පොලිස් ස්ථානයට ඒ බඩුව ගෙණගොස් නොහොත් යවා එය අයිතිකාරයාට නැවත ලබාගන්ට හැකිවීම පිණිස එහි තැබියයුතු වේ; (ඒ බඩුව රන් රිදී ආදී ආභරණයකින් යුක්තනොවීනම්) එය ආපසු දෙන්ට ප්‍රථමයෙන් එය හිමි අය විසින් ගෙවියයුතුවූ ශත විසිපහක ගාස්තුවක් ලැබීමට ඒ බඩුව එසේ ගෙණගොස් දුන්නාවූ නොහොත් යැවූවාවූ වාහනය අයිතිකාරයාට නොහොත් දක්කන්නාට හිමිව තිබේ. එහෙත් එසේ සම්භවූ බඩුව රන් රිදී ආදියෙන් යුක්තවීනම් එය අයිතිකාරයා විසින් වාහනය අයිතිකාරයාට හෝ දක්කන්නාට හෝ රුපියලක ගාස්තුවක් හෙවත් කුලියක් ගෙවියයුතුවේ. එසේ යම් වාහනයක තිබී සම්භව එහි ප්‍රකාර ඉතා ලඟුදුරු පොලිස් ස්ථානයේ තබනලද එබඳු බඩුවක් එසේ තැබූ තැන් පටන් මාසයක් ඇතුළතදී එහි නියම අයිතිකාරයා විසින් ඉල්ලා නොසිටියේ වීනම්, ඒ බඩුව ප්‍රසිඬ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව පොදු ප්‍රවෘත්ති පත්‍ර එකක හෝ වැඩිගණනක හෝ නිසි ප්‍රකාර ප්‍රසිඬකර එසේ ප්‍රසිඬ වෙන්දේසියේ එය විකුණන්ට යෙදෙනවාත් ඇර ඉන් ලැබෙන මුදලෙන් ඒ විකිණීම ප්‍රසිඬකෙරීම සඳහා ගිය වියදම් අඩුකර ඉතුරු මුදල පොදු ආදායමට එකතුකරණු ලැබේ.

## 16 වෙනි කාණ්ඩය.

### ප්‍රසිද්ධ නාන ඉඩම්.

ප්‍රසිද්ධ නාන ඉඩම් වල ලින්වලට තාප්ප තැබීම.

269. වතුර නෑම පිණිස පාවිච්චිකරන්නාවූ පොදු ජනයාට ඉඩඇර තබනලද සෑම ලිඳකටම අඩි දෙකකට වඩා අඩුනොවන උසට ආරක්ෂා තාප්පයක් තිබෙන්ට ඕනෑවා සහ එම තාප්පයේ පිට පැත්ත පොළව මතුපිට පටන් අඩි දෙකක් යටට සිමෙන්ති බදාම දමා තිබෙන්ටත් ඕනෑවේ.

කානු දමා තිබෙන්වද ඕනෑවේ.

270. එබඳු ප්‍රසිද්ධ ලිඳක් හාත්පස ඊට හොඳටම ලංව තිබෙන බිම පිටතට ගලාබසින සෑහෙන කානුවක් දක්වා සාදනලද කානුවකට එහි වතුර ගලාබෑසීමට ඉඩ ඇතිලෙස හැඩ ගසා තිබෙන්ට ඕනෑවේ.

ලින් ලඟ රෙදි ආදිය සේදීම තහනම් බව.

270. එබඳු ප්‍රසිද්ධ ලිඳක නොහොත් ඒ ලඟ අඳින රෙදි පිළි හෝ පෑදුරු හෝ වෙනයම් දෙයක් හෝ සේදීමට බලයනැත්තේ වේ.

බාල්දිවලට තින්ත ගෑම.

272. ඉහතකී අන්දමේ ප්‍රසිද්ධ ලිඳකින් නෑම පිණිස පාවිච්චිකරණ බාල්දිවලට අඩුතරමින් අවුරුද්දකට වරක්වත් තින්ත ගාන්ට ඕනෑවාත් ඈර ඒවා දවස්පතා ශුද්ධපවිත්‍රකරන්ටද ඕනෑවේ.

ලෙඩක් ඇති කෙනෙක් එහි නොනෑම.

273. වන, හොරි කුෂ්ඨාදියෙන් පෙළෙන්නාවූ කෙනෙක් හෝ වෙනයම් වසංගත රෝගය කින් හෙවත් බෝවෙන රෝගයකින් පෙලෙන්නාවූ කෙනෙක් හෝ එබඳු රෝගයකින් ලඟදී සුවවූ කෙනෙක් හෝ එහි යම් ප්‍රසිද්ධ ලිඳක නොහොත් නාගරික සභාව විසින් නාන ඉඩමක් කොට වෙන්කරණලද යම් ස්ථානයක නෑමවත් ඇග සේදීමවත් එහි වතුර වෙන කිසියම් ආකාර යකින් පාවිච්චිකෙරීමවත් නොකළ යුතුවේ.

නියෝග කඩ කෙරීම ගැණ බදු කාරයාට අඩුවම්.

274. එබඳු යම් ප්‍රසිද්ධ ලිඳක අයිතිකාරයා නොහොත් බදුකාරයා තමන් විසින්ම මෙහි ඉහත පෙණෙන අඥාපණත්වල නියෝග ඉෂ්ටකරන්ට ඕනෑවාත් ඈර එයින් යමක් කඩකෙරීමට ඉඩදිය යුතුද නොවේ.

වැවේ නෑම තහනම් බව.

275. නාන ඉඩමක් මෙන් වෙන්කොට තබනලද ස්ථානයක ඈර මහනුවර වැවේ කොයි යම් කොට්ඨාසයකවත් නැතහොත් වැවේ වතුර ගලාබසින දොරටුව ලඟ පාලම යට හෙවත් ඒ ලඟවත් නෑම හෝ යමක් සේදීම හෝ කිසිවෙකු විසින් නොකළ යුතුවේ.

මසුන් ඇල්ලීම තහනම් බව.

276. නාගරික සභාපතිතැනගෙන් අවසර පත්‍රයක් නැතුව මහනුවර වැවේ හෝ උඩ වත්තේකැලේ පොකුණුවල හෝ දුනුමඩලාවේ ඔයේ ජලකර්මාන්ත ජලාසයේ හෝ මසුල් ඇල් ලීමට කිසිකෙනෙකුට බලය නැත්තේ වේ.

වැවේ සතුන් නාවන්ට ඉඩ නොදෙන බව.

277. මහනුවර වැවේවත් නාන ඉඩමක්මෙන් වෙන්කරණලද යම් ස්ථානයකවත් එබඳු නාන ඉඩමකට ගලාබසින යම් දිය පාරකවත් හරකෙක්, අශ්වයෙක්, එළුවෙක්, ඌරෙක්, බැටළු වෙක්, බල්ලෙක් හෙවත් වෙනයම් සතෙක් නැතහොත් අඳින රෙදිපිළි පෑදුරු යනාදී යම් දෙ යක් නෑවීම හෙවත් සේදීම හෝ නාවන්ට හෙවත් සෝදන්ට සැලැස්වීම හෝ එබඳු යම් සතෙක් මොනයම් කරුණක් සඳහා විනුමුත් එහි වැවටවත් නාන ඉඩමකට නොහොත් දිය පාරකටවත් ගෙණයෑම හෙවත් දක්කාගෙණයෑම හෝ කරන්ට කිසියම් කෙනෙකුට බලය ැ වේ.

---

## 17 වෙනි කාණ්ඩය.

### මගපෙන්වන්නන් ගැන.

අවසරලත් මගපෙන්වන්නන් අභරන පැලඳීම.

... නොම්මර 15 ව්‍යවස්ථාවේ නි... ... ... යටතේ පත්කරණලද සෑම අවසර ලත් මගපෙන්වන්නෙක්ම ... "සර්ජ්" රෙදිවලින් සාදනලද ඉස්සරහට පටම පාට පටි අල්ලාපු "කෝට්" එකක් සමග එහි ව්‍යවස්ථාවේ 5 වෙනි වගන්තියේ නියමකර තිබෙන බාපණය පපුවේ දකුණු පැත්තේ පලඳින්ට ඕනෑවේ; "කෝට්" එක නාගරිකසභාව විසින් නොමිලයේ සපයාදෙන්ට යෙදෙනවාත් ඈර අවසර පත්‍රයේ කාලය ඉකුත්වූවිට නො හොත් අලුත් "කෝට්" එකක් දෙන්ට ප්‍රථමයෙන් ආපසු නාගරික සභාවට දියයුතුද වේ.

අත් පොතක් ගෙණයායුතුදවේ.

279. මගපෙන්වන්නෙක්ව කුලියට අඩගහගන්නාවූ යම් කෙනෙක් විසින් හෝ යම් පො ලිස් මුලාදෑනියෙක්වත් නාගරිකසභාවේ මුලාදෑනියෙක්වත් විසින් හෝ ඉල්ලූවිට පෙන්වීම පිණිස අත් පොතක් සෑම අවසරලත් මගපෙන්වන්නෙක් විසින්ම තමන් කැටුව ගෙණයා යුතුවේ; මගපෙන්වන්නෙකුට ඔහුගේ අවසරපත්‍රය ලැබෙන වේලෙහි ඒ අත් පොත නාගරික සභාව විසින් නොමිලයේ දෙනුලැබ නාගරික සභාපතිතැන විසින් කලින් නියමකරන්ට යෙ දෙන ක්‍රමයකට එය සටහන්කොට තැබිය යුතුවේ.

අවසරලත් මගපෙන්වන්නන්ට ගෙවන ගාස්තු.

280. අවසරලත් සෑම මගපෙන්වන්නෙක් විසින්ම තමාගෙන් වැඩගන්නාවූ යම් කෙ නෙකුගෙන් පහත දක්වන ගාස්තු නීතියේ ප්‍රකාර ඉල්ලිය හැකිවේ :—

| | | |
|---|---|---|
| | | සත. |
| පළමුවෙනි පැයට නොහොත් ඉන් කොටසට | ... | 50 |
| ඊට වැඩි සෑම පැයකට නොහොත් ඉන් කොටසකට | ... | 25 |

---

## 18 වෙනි කාණ්ඩය.

### මිනී වැළලීම සහ සොහොන්භූමි ගැන

මිනී වැළලීමට සහ ආදාහනකිරීමට ඉඩදෙන්නේ කොතැන්හිද යන බව.

281. වර්‍ෂ 1862කේ නොම්මර 12 ව්‍යවස්ථාව යටතේ නිසිප්‍රකාර ප්‍රසිද්ධවකරණලද සො හොන් භූමියකවත් (වර්‍ෂ 1894රේ නොම්මර 2 ව්‍යවස්ථාව යටතේ) මිනිවළලන ඉඩමක් හෙවත් ආදාහන භූමියක්මෙන් නාගරිකසභා කන්තෝරුවේ විශෙෂයෙන් ලියා පදිංචිකරණලද ඉඩමක වත් ඈර වෙනයම් ඉඩමක මිනියක් භූමදානකෙරීම හෙවත් ආදාහනකෙරීම හෝ භූමදානකෙරී මට හෙවත් ආදාහනකෙරීමට ආධාරදීම හෝ නාගරික සභාවෙන් විශෙෂ අවසර නැතුව කිසි කෙනෙක් විසින් නොකළ යුතුවේ.

**සොහොන්භූමි සහ අදාහනභූමි ලියාපදිංචිකොට එහි භාරකාරයාගේ නම නියමකර තැබීම.**

282. සොහොන්භූමියක් හෝ අදාහන භූමියක් හෝ තමන් සන්තකකොට තබාගැනීමට බලය ඇත්තාවූ කොයියම් කෙනෙක් වුවත් "සර්වෙයර් ජනරල්" නම් ආණ්ඩුවේ ප්‍රධාන මිනින්දෝරුතැන විසින් හෙවත් නිසිප්‍රකාර අවසරලත් මිනින්දෝරුතැනක් විසින් සහතික කරණලද එබඳු ඉඩමක පිඹුරුකඩදාසිය සමග අමුනනලද ලියවිල්ලකින් ඒ සොහොන්භූමිය හෙවත් අදාහනභූමිය ලියාපදිංචිකරණ ලෙස නාගරික සභාපතිතැනගෙන් ඉල්ලා ඒ ඉල්ලීම් පත්‍රයේ එහි භාරකාරයාගේ නමද සඳහන්කළ යුතුවන්නේය. තවද ඒ භාරකාරයා හැටියට නම නියමකරණලද තැනැත්තාද තමන් ඒ භාරකාරකම සහ එහි කටයුතු කෙරීමත් පිළිගත් බවට සාක්ෂි පිණිස තමන්ගේ අත්සන ඒ ඉල්ලීම්පත්‍රයේ තැබියයුතුවේ.

**භාරකාරයෙකුගේ නම නියම නොකළේවිනම් කවරෙක් භාරකාරයා වන්නේද යන බව.**

283. භාරකාරයෙකුගේ නම නියමනොකළේ විනම් හෙවත් භාරකාරයා හැටියට නම නියමකරණලැබූ තැනැත්තා ඉහතකී ප්‍රකාර ඉල්ලීම්පත්‍රයේ අත්සන් නොකළේවිනම් එසේ සොහොන්භූමියක් නොහොත් අදාහනභූමියක් ලියාපදිංචිකරණලෙස ඉල්ලුම්කරණලද තැනැත්තාම එහි භාරකාරයා හැටියට ගණන්ගණු ලබනවාත්ඇර ඒ සම්බන්ධවූ නියෝග යම් විධියකින් කඩකෙරීම ගැන ඔහු වගකිය යුතුද වේ.

**භාරකාරයෙකුගේ මරණයක් ආදිය වූවහොත් අමුතුවෙන් ලියාපදිංචිකරන්ට ඕනෑ බව.**

284. සොහොන්භූමියක හෝ අදාහනභූමියක හෝ භාරකාරයා මැරෙන්ට යෙදුනොත් හෙවත් යම් හේතුවක් නිසා තමන්ගේ කටයුතුකෙරීම ඔහුට නොහැකිවූවහොත් මේ කාණ්ඩයේ දෙවෙනි ඡේදයෙන් නියමකර තිබෙන පරිද්දෙන් ඒ භූමිය ලියාපදිංචිකරණ ලෙස අමුතුවෙන් ඉල්ලුම්කළයුතුවා සහ ඒ ඉල්ලීම පිට ලියාපදිංචිකෙරීම ඉෂ්ටකරණතුරු නාගරික සභාපතිතැනගෙන් හෙවත් ඒතැන නැතිවිටක සනීපාරක්ෂක මූලාදෘනියාගෙන් විශෙෂ අවසර පත්‍රයක් පිට ඇර ඒ භූමියේ මිනියක් භූමදානකෙරීම හෝ අදාහනකිරීම හෝ නොකළ හැකිවේ.

**භූමදානයට ප්‍රථමයෙන් සහතික පත්‍රය ගැනීම.**

285. "වර්ෂ 1895 උප්පැන්න සහ මරණ ලියාපදිංචිකෙරීමේ ව්‍යවස්ථාවේ" නියමකර තිබෙන සහතිකපත්‍රය සොහොන්භූමිය නොහොත් අදාහනභූමිය භාරකාරයාට පෙන්වනතුරු මිනියක් භූමදානය හෝ අදාහනය හෝ නොකළ හැකිවේ.

**භාරකාරයා විසින් ලේඛනයක් තැබීම.**

286. නාගරික සීමාව තුළ සෑම සොහොන්භූමියක හෙවත් අදාහනභූමියක සිඬකරණලද සියලුම භූමදානවල සහ අදාහනවලත් ලේඛනයක් නාගරික සභාපතිතැන විසින් නියමකරණලද ක්‍රමයකට ඒ සුසානභූමිය භාරකාරයා විසින් තැබීම ඔහුගේ යුතුකමවා පමණකුත් නොව එහි භූමදානයක් හෝ අදාහනයක් හෝ සිඬවී පැය විසිහතරකට වැඩිනොවන කාලයක් ගතවූ විට ඒ ලේඛනයේ පිටපතක් නාගරික සභාවේ කන්තෝරුවට භාරදෙවීමද ඔහුගේ යුතුකම වේ.

**සුසානභූමි නාගරික සභාපතිතැන විසින් පරීක්ෂාකරණ බව.**

287. කොයියම් විටක වුවත් යම් සොහොන්භූමියකට හෝ අදාහනභූමියකට හෝ ගොස් ඒ භූමිය සහ ඒ සම්බන්ධ සියලුම පොත්පත්ද පරීක්ෂාකෙරීමට නාගරික සභාපතිතැනට හෝ එතැනගෙන් ලියවිල්ලක් පිට ඒ සඳහා බලයලත් තැනැත්තෙකුට හෝ බලය තිබේ.

**ඉඩම් ශුබපවිත්‍ර ලෙස තැබීම.**

288. නාගරික සභාපතිතැන විසින් හොඳයයි පිළිගතහැකි ලෙස සෑම සොහොන් භූමියක් හෙවත් අදාහනභූමියක් ශුබපවිත්‍රව සහ යහපත් පිළිවෙළකටද තැබීම ඒ භූමිය භාරකාරයාගේ යුතුකම වන්නේය.

**ගාස්තු සෑහෙන ඒවායයි නාගරික සභාපතිතැන විසින් විධානකිරීම.**

289. භූමදාන සහ අදාහන පිණිස අයකරණ ගාස්තුවල සටහනක් නාගරික සභාපතිතැන විසින් සෑහේයයි විධානකෙරීම සඳහා සෑම සොහොන්භූමියක් හෙවත් අදාහනභූමියක් භාරකාරයෙක් විසින් සාදුදිය යුතුවා සහ නාගරික සභාපතිතැන විසින් එසේ සෑහේයයි විධාන කරණලද ගාස්තු පමණක් අයකළ යුතුද වේ.

**සුසානභූමි වැටක්න්වත් තාප්පයකින්වත් කොටුකර තැබීම.**

290. සෑම සොහොන්භූමියක් හෙවත් අදාහන භූමියක්ම නාගරික සභාපතිතැන විසින් හුදුසුයයි පිළිගන්නාලද වැටකින් හෝ ශක්තිමත් තාප්පයකින් හෝ කොටුකර තැබිය යුතුවේ.

**මෘතශරීර පොදු සොහොන්භූමියේ නොහොත් ලියාපදිංචිකරණලද සොහොන්භූමියක භූමදානකෙරීම.**

291. මහනුවර නාගරිකය ඇතුළත මියයන්ට යෙදෙන සෑමදෙනාගේම මෘතශරීර එකී නාගරිකය සඳහා සූදානම්කර තිබෙන සාමාන්‍ය සොහොන්භූමියේ හෝ සුසානභූමියක් හැටියට ලියාපදිංචිකරණලද සොහොන්භූමියක හෙවත් අදාහන භූමියක හෝ භූමදානකෙරීව නොහොත් අදාහනකෙරීම කළ යුතුවේ.

**නාගරිකයෙන් පිටත මිනී භූමදානකෙරීම පිණිස බලපත්‍රයක් ලැබියයුතු බව.**

292. එකී මහනුවර නාගරිකය ඇතුළත මියයන්ට යෙදෙන යම් කෙනෙකුගේ මෘතශරීරයක් එම නාගරිකය සඳහා සූදානම්කර තිබෙන සාමාන්‍ය සුසානභූමියක හෙවත් එම නාගරිකය සඳහා නිසිප්‍රකාර ලියාපදිංචිකරණලද සොහොන්භූමියක නැතහොත් අදාහන භූමියක මිස වෙනයම් ස්ථානයක හෝ සුසානභූමියක හෝ භූමදානකෙරීමවත් අදාහනකෙරීමවත් පිණිස එකී නාගරිකයේ සීමාවෙන් පිටතට එබඳු යම් මෘතශරීරයක් ගෙණයෑම හෝ ගෙණයන්ට සැලැස්වීම, ඉඩදීම හෙවත් අවකාශදීම හෝ කොයියම් තැනැත්තෙක් හෙවත් තැනැත්තන් විසින්වත් නොකළ යුතුවේ; එහෙත් ඊට සෑහෙන වැදගත් කාරණ පෙන්නා එකී මහනුවර නාගරිකයේ නාගරික සභාපතිතැනට හෝ ඔහු නගරයේ නැතිවිට නාගරික සභාවේ ලේකම්තැනට හෝ ඒ සඳහා ඉල්ලුම්පත්‍රයක් ඔප්පුකළවිට එම සභාපතිතැන විසින් නැතහොත් එම ලේකම්තැන විසින් ඒ ගැන දෙන්ට යෙදෙන බලපත්‍රයේ නම සඳහන්කරණලද යම් තැනැත්තෙකුගේ මෘතශරීරය එකී නගර සීමාවෙන් පිටත කිසියම් ස්ථානයක හෙවත් සොහොන්භූමියක භූමදාන කරන්ටවත් අදාහනකරන්ටවත් පුළුවන් හැටියට තමන්ගේ අත්සන් ඇති බලපත්‍රයක් ලියාදෙන්ට එකී නාගරික සභාපතිතැනට නොහොත් එසේ ඔහු නැතිවිට සභාවේ ලේකම්තැනට බලය තිබෙන්නේය. තවද එබඳු යම් ඉල්ලුම්පත්‍රයක් එකී සභාපතිතැනට (හෙවත් එකී නගරයේ නාගරික සභාවේ ලේකම්තැනට හෝ සනීපාරක්ෂක මූලාදෘනියාට හෝ) ඔප්පුදී හයපැයක් ඇතුළත එකී සභාපතිතැන නැතහොත් එකී ලේකම්තැන ඊට බලපත්‍රයක් දීම ඉෂ්ටනොකෙළේ විනම් එවිට ඒ මෘතශරීරය එකී නගර සීමාවෙන් පිටත කිසියම් ස්ථානයක හෙවත් සොහොන් භූමියක භූමදානකෙරීමට හෝ අදාහනකෙරීමට හෝ ගෙණයෑමට කොයියම් කෙනෙකුට වුවත් බලය තිබෙන්නේය. එසේ ඉල්ලුම්පත්‍රයක් ඔප්පුකළ බව ගැන සහ එසේ ඔප්පුකළ වේලාව ගැනත් සාක්ෂි ඔප්පුදීම ඒ ඉල්ලුම්පත්‍රය ඔප්පුකරණ තැනැත්තාපිට රඳතිබේ.

## 19 වෙනි කාණ්ඩය.

### උකස් ලියාපදිංචිකෙරීම.

**උකස් ලැබුන්කාරයෙක් උකස ලියා පදිංචිකරන්ට ඕනෑ බව.**

293. නාගරිකය ඇතුළත පිහිටා තිබෙන යම් නිශ්චල දේපලාදියක උකසක් නාගරිකසභා කන්තෝරුවේ ලියාපදිංචිකරවා තැබීම එබදු උකසක් ලබනලද සෑම කෙනෙකුට හෝ ඔහුගේ උරුමක්කාරයින්ට හෝ ඉන් එක්කෙනෙකුට හෝ ඒ උකස ලැබුන්කාරයා මැරෙන්ට යෙදුනේවිනම් නඩුමාගීයේ ප්‍රකාර ඔහුගේ දේපල භාරකාරයාට හෝ යුතුව තිබෙනවා පමණක් නොව එබදු යම් උකසක් ලබාසිටින්නාවූ එය ලියාපදිංචිකරවා තැබීමට කැමැත්තාවූ සෑම දෙනෙක්ම ඒ උකස්කරණලද ඉඩමේ විශෙෂ තොරතුරු සම්බන්ධවූ නොහොත් ඒ ඉඩම නිසි ප්‍රකාර දැනගැනීම පිණිස ඕනෑකරන්නාවූ විස්තර ආදිය සමග තමන්ගේ නම සහ පදිංචි ස්ථාන යද එසේ උකස්කළාවූ ඉඩම අයිතිකාරයාගේ නොහොත් උකස්කාරයාගේ නම සහ පදිංචි ස්ථාන යද තමන් විසින්ම හෝ තමන් වෙනුවෙන් කටයුතුකරන්නෙක් ලවා හෝ නාගරික සභාවට දැනුම්දිය යුතුවන්නේය; තවද එසේ දැනුම්දී ඒ තැනැත්තා විසින් ඒ සඳහා ගෙවන්ට ඕනෑකරණ ශත 50ක ගාස්තුව ගෙවූවිට ඉහතකී විස්තර ආදිය ලියාතැබීම පිණිස නාගරිකසභා කන්තෝරුවේ තිබෙන පොතක ඒ විස්තර ආදිය නාගරිකසභාව විසින් ලියා පදිංචිකරණුලැබේ.

**ලියාපදිංචිකිරීමේ පොත පරීක්ෂා කෙරීමට ඉඩ තැබීම.**

294. එකී ප්‍රකාර ලියා පදිංචිකෙරීමේ සෑම පොතක්ම නාගරිකසභාවේ කටයුතුකෙරීමට නියමකර තිබෙන වේලාවලදී එම සභාවට ශත 25ක ගාස්තුවක් ගෙවා සියලු කල්හිම එය පරීක්ෂාකෙරීමට කැමති යම් කෙනෙක් විසින් එසේ පරීක්ෂාකෙරීමට ඉඩප්‍රස්ථා ඇතිව තබනුලැබේ.

**ලියාතහනම්කිරීම නාගරිකසභාව විසින් උකස අයිතිකාරයාට දැනුම්දිය යුතු බව.**

295. මේ කාණ්ඩයේ 1 වෙනි අඥාපණතේ නියමකර තිබෙන පරිද්දෙන් ලියා පදිංචිකරණලද යම් උකසකට බැඳී තිබෙන කිසියම් ඉඩමක් වර්ෂ 1887තේ නොම්මර 7 නාගරිකසභා ව්‍යවස්ථාවේ 149 වෙනි වගන්තිය යටතේ ලියා තහනම්කරන්ට යෙදුනොත් එසේ එය ලියා තහනම්කරන්ට යෙදුන බව සහ ඒ ඉඩම එසේ ලියා තහනම්කෙරීමෙන් අයකරන්ට තිබෙන නාගරික අයබදුවල හිඟ ගණන අසවල් පමණය යන බවත් ඉහතකී ව්‍යවස්ථාවේ 151 වෙනි වගන්තිය යටතේ ඒ ඉඩම විකුණන බව ප්‍රසිද්ධකරන්ට අඩුතරමින් දහහතර දවසකට ප්‍රථමයෙන් ඉහතකී උකස ලියා පදිංචිකෙරෙව්වාවූ අයට නාගරිකසභාව විසින් තැපැල් මාගීයෙන් හෝ කෙනෙක් ලවා භාරදෙවීමෙන් හෝ ලියා දැනුම්දිය යුතුවේ.

**උකස අයිතිකාරයා විසින් හිඟ අයබදු ගෙවිය හැකි බව.**

296. ඉහතකී ප්‍රකාර ලියා තහනම්කරණලද යම් ඉඩමක අයිතිකාරයා හෙවත් උකස්කාරයා විසින් ගෙවියයුතුවූ සියලුම හිඟ අයබදු නොහොත් යම් හිඟෑක් සඳහා එසේ ලියා තහනම් කෙළේවිද ඒ හිඟ ගණන ඒ ඉඩම විකුණන්ට ප්‍රථමයෙන් කොයිවේලාවක හුනුත් නාගරිකසභාවට ගෙවීමට එකී යම් උකස් අයිතිකාරයෙකුට හෝ ඔහුගේ උරුමක්කාරයින්ට හෝ ඉන් එක්කෙනෙකුට හෝ නඩුමාගීයේ ප්‍රකාර ඔහුගේ දේපල භාරකාරයෙකුට හෝ බලය තිබෙන්නේය; තවද එසේ ඒ හිඟ අයබදු ගෙවූවිට ඒ ඉඩම ලියාතහනමෙන් නිදහස්කරණුලැබේ.

---

## 20 වෙනි කාණ්ඩය.

### පාන්ගෙවල් සම්බන්ධ අණපණත් ආදිය.

වර්ෂ 1896යේ නොම්මර 1කේ ව්‍යවස්ථාවේ 20 වෙනි වගන්තියේ 3 වෙනි උප වගන්තියෙන් අලුත්වැඩියාකරන්ට යෙදුනු ප්‍රකාර වර්ෂ 1887තේ නොම්මර 7තේ ව්‍යවස්ථාවේ 122 වෙනි වගන්තිය යටතේ පණවන්ට යෙදුනාවූ මෙකී පහත සඳහන් නගර අඥාපණත් තිරිඟු පිටිවලින් පාන් සාදන්නාවූ පාන්ගෙවල්වලට පමණක් ආදාළවේ :—

**පාන්ගෙවල් වාතය සහ එළිය ඇතුව තිබෙන්ට ඕනෑබව යනාදිය.**

297. සෑම පාන්ගෙයක්ම ඊට හොඳකාර වාතය සහ එළිය ලැබෙන්ට සලස්වා එහි බිත්ති හුනු බදාමෙන් කපරාදුකර සුදුහුනු ගා තිබෙන්ට ඕනෑවත් ඇර බිමට සිමෙන්ති අතුරා හොඳකාර වතුර බැස යෑමට සලස්වා තිබිය යුතුදවේ.

**අඩි 30ක් ඇතුළත කසල වළක් නොතිබිය හැකි බව.**

298. යම් කසල වළක, වැසිකිළියක හෙවත් පල්දෙරූ කානුවක සිට අඩි 30ක් ඇතුළත හෝ එයින් නගින දුගීන්ධය ලැබෙන ස්ථානයක හෝ කිසියම් පාන්ගෙයක් නොතිබිය යුතුවේ.

**මිනිසුන් වසන ගෙයක්මෙන් පාවිච්චිකරන්ට බැරි බව.**

299. පාන්ගෙයක් මෙන් පාවිච්චිකරණ යම් ස්ථානයක් මිනිසුන් පදිංචිව සිටින්නාවූ ස්ථානයක්කොට නොහොත් වෙන මොනයම් කටයුත්තකටවත් පාවිච්චිනොකළ යුතුවේ.

**භාජන උපකරණ ආදිය ශුද්ධ පවිත්‍ර ලෙස තැබීම.**

300. යම් පාන්ගෙයක පාවිච්චිකරන්නාවූ නොහොත් ඊට අයිතිවන්නාවූ සියලුම භාජන, උපකරණ හෙවත් වෙන උවමනා දේවල් ශුද්ධ පවිත්‍රව තැබිය යුතුවේ.

**පිටි සහ වතුර සනීපදායකව තිබෙන්ට ඕනෑ බව.**

301. පාන් සෑදීම පිණිස පාවිච්චිකරන්නාවූ පිටි සහ වතුරද වෙන ද්‍රව්‍යයන්ද සනීපදායකව සහ හොඳවද තිබෙන්ට ඕනෑවේ.

**පාන්ගෙට අයිති ස්ථාන පිරිසිදුව තිබෙන්ට ඕනෑ බව.**

302. පාන්ගෙයකට අයිති ස්ථානයන්හි සහ ඒ අවට සියලුම කුණු කසල යනාදිය අප්‍රමාදව අහක්කරන්ට ඕනෑවා සහ එහි කානු හොඳකාර සෝදුහරින්ටද ඕනෑවේ.

**රෝගයක් ඇති කෙනෙක් වැඩට ගන්ට බැරි බව.**

303. කිසියම් පිළිකුල් රෝගයකින් හෙවත් සපර්ශවීමෙන්වත් ළඟ වැදීමෙන්වත් බෝවිය හැකි රෝගයකින් පෙළෙන්නාවූ කෙනෙක් හෝ එවැනි රෝගකාරයෙකුට ළඟදී සාත්තු කළාවූ කෙනෙක් හෝ ඇඟපත නොසෝදා හෙවත් වෙන අන්දමකින් අපිරිසිදුව සිටින කෙනෙක් හෝ පාන්ගෙයක වැඩට නොගතයුතුවේ.

පාන්ගෙවල් සෝදියිකරබැලීමට යටහත්ව තිබෙන්ට ඕනෑය.

304. සෑම පාන්ගෙයක්ද එහි කටයුතු වැඩපලාදිය කිරීම සහ කරවීමද නාගරික සභාපතිතැන විසින් හෝ සනීපාරක්ෂක මුලාදෑනියා විසින් හෝ මෙහි සභාපතිතැනගේ අවසරපිට ක්‍රියාකරණ වෙන සියලු තැනැත්තන්ම විසින් හෝ සියලු වේලෙහිම සෝදිසිකරබැලීමට ඉඩප්‍රස්ථා ඇතුවද යටහත්වද තිබිය යුතුවේ.

---

## 21 වෙනි කාණ්ඩය.

## සාමාන්‍ය නියෝග.

නොතීසි භාරදීම.

305. යම් ගෙයක; ගොඩනැගිල්ලක හෙවත් ඉඩමක අයිතිකාරයාට හෝ පදිංචිකාරයාට හෝ ඉහත පෙණෙන නගර ආඥාපණත්වලින් නියමකර තිබෙන යම් නොතීසියක් හෙවත් දැන්වීමක් භාරදෙන්ට ඕනෑකලවිට, එබඳු නොතීසිය හෙවත් දැන්වීම එකී ගෙයි හෝ ගොඩනැගිල්ලෙහි හෝ ඉඩමෙහි පදිංචිකාරයාට භාරදෙනුලැබේ, නැතහොත් ඔහුගේ පවුලේ සම්පූර්ණ වයස් ඇති කෙනෙක් වෙත හෝ වැඩකාරයෙක් වෙත හෝ තබා එනුලැබේ, නොහොත් ඒ නොතීසිය හෙවත් දැන්වීම එසේ භාරදියහැකි නොවිනම්ද, හෙවත් එහි යම් පදිංචිකාරයෙක් නොසිටියේවිනම්ද එය ඒ ගෙයි හෝ ගොඩනැගිල්ලෙහි හෝ ඉඩමෙහි හෝ හොඳසාර පෙණෙන තැනක අලවා තබනුලැබේ.

නගර ආඥාපණත් කඩකෙරීම ගැන දඬුවම්.

306. මෙහි පණවනලද කිසියම් නගර ආඥාපණතක් හෝ මින්පසු නීතියේ ප්‍රකාර පණවන්ට යෙදෙන යම් නගර ආඥාපණතක් හෝ එබඳු නගර ආඥාපණත්වලින් තහනම්කරණලද යම් ක්‍රියාවක්වත් වරදක් හෙවත් අපරාධයක් හැටියට ඉන් ප්‍රකාශකරණලද යම් ක්‍රියාවත් කෙරීමෙන් හෝ ඒ නගර ආඥාපණත්වල නියමකරණලද යම් කටයුත්තක් ඉෂ්ටකෙරීම පැහැරඇරීමෙන් හෝ වෙන යම්කිසි ආකාරයකින් හෝ කඩකරන්නාවූ කවරෙක් වීනුමුත් ඒගැන වරදකාරයායයි පෙ[illegible]ගියවිට රුපියල් විස්සකට වැඩිනොවන දඩයකටද, නැවත නැවතත් එසේ අණ කඩකරණලද්දේවිනම්, එබඳු අණ කඩකෙරීම නාගරික සභාපතිතැන විසින් දැනුම්දුන්නාට පසු, එසේ කඩකරණ එක එක දවසට රුපියල් දහයකට වැඩිනොවන ගණන් වැඩිපුර දඩයකටද යටහත්වන්නේය. එහෙත් නාගරික සභාපතිතැනගෙන් ප්‍රථමකොට අවසර නොලැබ යම් නගර ආඥාපණතක් කඩකෙරීම ගැන යම් නඩුශාලාවකට පැමිණිල්ලක් නොකළ හැකිවේ.

---

## උප ලේඛනය.

(2වෙනි කාණ්ඩයේ 11 වෙනි ආඥාපණත) "ඒ" අක්ෂරය දරණ සටහන.

මහනුවර නාගරිකසභාවේදීය.

———— කාරණාව ගැනයි.
———— නමටයි.

ඉහතකී කාරණාව සම්බන්ධව සාක්ෂිකීම පිණිස වර්ෂ 19 —— ක්වූ ————— මස —— වෙනි දින —— කානිසමට (මෙහි විභාගය පවත්වන ස්ථානය සටහන්කරණු) ———— දී මෙම සභාව ඉදිරියේ හෙවත් මෙම සභාවේ කාරක සභාව ඉදිරියේ පෙණීසිටින හැටියට ඔබට මෙයින් ආඥාකරමි.

සභාපතිතැනගේ අනප්‍රකාර,

————

වර්ෂ 19—— ක්වූ ———— මස —— වෙනි දින
මහනුවර නාගරිකසභා කන්තෝරුවේදීය. ————

ලේකම්තැන වම්හ.

(3වෙනි කාණ්ඩයේ 37 වෙනි ආඥාපනත.) "බී." අක්ෂරය දරණ සටහන.

වර්ෂ 1887 නොම්මර 7 නාගරික සභා ව්‍යවස්ථාවේ 138* වෙනි වගන්තියේ නියමකර තිබෙන ලැයිස්තුව.

———— නමටයි.

| වීථිය. | ගෙයි නොම්මරය. | අයිති කාරයා. | පදිංචි කාරයා. | කුලිය හෙවත් අවුරුදුපතා ආදායමේ වටිනාකම. | තොරතුරු. [අයිත්වැඩියාකරන්නේ හා විසින්ද වරිපණම් බදු ගෙවන්නේ හා විසින්ද යන බව මෙහි සටහන් කරණු.] |
|---|---|---|---|---|---|
| | | | | | (ඒ) ———— (ඉඩම් හිමියා හෙවත් පදිංචිකාරයා) විසින් අයිත්වැඩියාකෙරීමේ වියදම් උසුලන්නේය.<br>(බී) ———— (ඉඩම් හිමියා හෙවත් පදිංචිකාරයා) විසින් ප්‍රසිද්ධ අයබදු සහ වරිපනම් ගෙවන්නේය. |

වර්ෂ 19 —— ක්වූ ———— මස —— වෙනි
දින මහනුවරදීය.

අත්සන ————

* 138. වරිපනම් අයබද්දට හෙවත් අයබදුවලට යටහත්වූ යම්කිසි ගෙවල්වල, ගොඩනැගිලිවල නොහොත් ඉඩම්වල අවුරුදුපතා ආදායමේ වටිනාකම තක්සේරුකෙරීම නාගරික සභාවට පුළුවන්වෙන පිණිස එබඳු ගෙවල්වල ගොඩනැගිලිවල නොහොත් ඉඩම්වල බදුගණන්වල හෙවත් අවුරුදුපතා ආදායම්වල ලැයිස්තුවක් ලියාදෙන ලෙස ඒවායේ අයිතිකාරයින්ට නැතහොත් පදිංචිකාරයින්ට නියමකරන්ට නාගරික සභාපතිතැනට බලය ඇතුවාත් ඇර එබඳු කරුණු සඳහාම ඒ ගෙවල්වලට, ගොඩනැගිලිවලට නොහොත් ඉඩම්වලට ඉර උදාවීමේ පටන් ඉර බැසයාමේ කාලය දක්වා යන මේ අතරතුර කොයියම්විටක වුවත් ඇතුල්ව ඒවා පරීක්ෂාකෙරීමටද නාගරික සභාපතිතැනට හෝ ඒ සඳහා එතැන විසින් පත්කරණලද යම් තැනැත්තෙකුට හෝ බලය ඇත්තේය. මෙහි විස්තරකරණලද ලැයිස්තුව සාදාදෙනලෙස තමන්ට නියමකළ දින පටන් සුමානයක් අතරතුර එසේ ඒ ලැයිස්තුව සාදාදීම පැහැරඅරින්නාවූ නොහොත් එය සාදාදෙන්ට බැරියයි කියන්නාවූ කිසියම් කෙනෙක් සහ වැරදිවූ හෙවත් සැබෑ නොවන්නාවූ ලැයිස්තුවක් ඒ බව දැනගෙණම සාදාදෙන්නාවූ කිසියම්කෙනෙක්ද නාගරික සභාපතිතැනට හෝ ඉහතකී ප්‍රකාර ඒතැන විසින් පත්කරණලද යම් තැනැත්තෙකුට හෝ එකී යම් ගෙවල්වලට, ගොඩනැගිලිවලට නොහොත් ඉඩම්වලට ඇතුල්ව ඒවා පරීක්ෂාකෙරීමට හෙවත් උවමනාවිනම් ඒවා මැනබැලීමට ඉඩනොදෙන්නාවූ හෝ බාධාකරන්නාවූ හෝ එය වලක්වන්නාවූ හෝ කිසියම් කෙනෙක්ද රුපියල් පණහකට වැඩිනොවන්නාවූ දඩයකට යටහත්වන්නේය.

මෙදින පටන් සුමානයක් ඇතුළත මෙහි ඉහතකී ලැයිස්තුව සාදුදෙන හැටියට ඉහත නම් පෙණෙන ———— මෙයින් අඥාකරම්හ.

සභාපතිතැනගේ අනප්‍රකාර,

වර්ෂ 19——ක්වූ ———— මස —— වෙනි දින
මහනුවර නාගරිකසභා කන්තෝරුවේදීය. ————

————
ලේකම්තැන වම්හ.

(3 වෙනි කාණ්ඩයේ 38 වෙනි අඥාපණත) "සී" අක්‍ෂරය දරණ සටහන.

වර්ෂ 1887 නොම්මර 7 නාගරික සභා ව්‍යවස්ථාවේ 146*වෙනි වගන්තියේ නියමකර තිබෙන ලෙඛනයයි.

පදිංචිකාරයා ————
වීදිය ————
ගෙයි නොම්මරය ————
බරකරත්තයක්, තනිගොන් කරත්තයක් නොහොත් රික්ෂෝ කරත්තයක් ඇර වෙන මොන අන්දමේ නුමුත් කරත්තවල ගණන ————
මොන අන්දමේ නුමුත් බරකරත්ත සහ තනිගොන් කරත්තවල ගණන ————
රික්ෂෝ කරත්ත ගණන ————
අශ්වයින්, පෝනින් හෙවත් අශ්වතරයින් ගණන ————
කොටළුවන් සහ ගොණුන් ගණන ————
අඟල් විසිහතරකට වැඩි වටප්‍රමාණ රෝද ඇති ලදරුවන්ගේ කරත්ත ගණන ————

වර්ෂ 19—ක්වූ ————මස —— වෙනි
දින මහනුවරදීය.

————
පදිංචිකාරයාගේ අත්සන.

* 128. නාගරිකය ඇතුළත තබාගන්නාවූ හෝ පාවිච්චිකරන්නාවූ හෝ සියලුම රථවාහන, බරකරත්ත, තනිගොන් කරත්ත, අශ්වපෝනි, අශ්වතරයින්, ගොණුන් සහ කොටළුවන් යනාදීන් සඳහා නීතිප්‍රතිපාදක මන්ත්‍රණ සභාවේදී ආණ්ඩුකාරයානන් විසින් දෙනලද අවසරපිට අවුරුදුපතා අයබදු නියමකෙරීමට නාගරික සභාවට යුතුව තිබෙනවාත් ඇර මෙයින් ඒ සභාවට බලයද අවසරයද දෙනලදී.

145. 128 වෙනි වගන්තිය යටතේ ඒ අයබදු ගෙවීමට යටහත් තැනැත්තන්ගේ ලැයිස්තුවක් සහ ඔවුන් එසේ අයබදු ගෙවීමට යටහත්ව සිටින වාහන සහ සතුන්ගේ විස්තර විභාගද, ඒවා සඳහා තක්සේරුකරණලද අයබදු ගණනද, ඊට සම්බන්ධවූ යම් යම් අයවලුන්ට පරීක්‍ෂාකෙරීමට ඉඩප්‍රස්ථා ඇතුව නාගරික සභා කන්තෝරුවේ තබනලද පොතක වෙන වෙනම තීරවල ලියා සූදානම්කර තැබීම නාගරික සභාපතිතැන විසින් වරින්වර සලස්වනු ලැබේ.

146. එබදු ලැයිස්තු සෑදීම නාගරික සභාපතිතැනට පහසුවන්වෙන පිණිස එම සභාපතිතැන නොහොත් එතැනගෙන් අවසරලත් වෙනයම් මූලාදෘනියෙක් විසින් එකී අයබදු ගෙවීමට යටහත්වූනේයයි කල්පනාවෙන සියලු අය වල් වෙතම එකී අයබද්ද තක්සේරුකෙරීමට උවමනායයි නාගරික සභාපතිතැනට ඒත්තුයන අන්දමේ ඔවුන් තබාගණ ඉන්නාවූ වාහන සහ සතුන් සම්බන්ධ තොරතුරු ලියාදීමට ලෙඛනයක් යැවිය යුතුවේ. එසේ ඒ අයබද්ද ගෙවීමට යටහත්වූවත් නොවූවත් ඒ ලෙඛනය යවනුලැබූ සෑම තැනැත්තෙක්ම එය ලියා සම්පූර්ණකොට අත්සන සහ දුතමද එකී බහා නාගරික සභාකන්තෝරුවට ආපසු යැවිය යුතුවේ. තවද ඒ ලෙඛනය බාරගන්ට බැරිය කියන්නාවූ කිසියම් කෙනෙක් හෝ එය තමන්ට ලැබී සුමානයක් ඇතුළත එසේ ලියා ආපසු යැවීම බැරිය කියන්නාවූ පැහැරඅරින්නාවූ හෙවත් නොසැලකීමෙන් අතපසුකරන්නාවූ කිසියම් කෙනෙක් හෝ දැන දැනම අසත්‍යවූ වැරදිවූ තොරතුරු ලියාදෙන්නාවූ කිසියම් කෙනෙක් හෝ රුපියල් පනහකට වැඩිනොවන දඩයකට යටහත්වන්නේය.

මේ ලෙඛනය සුමානයක් ඇතුළත සම්පූර්ණකොට ආපසු එවනලෙස ඉහත නම් පෙණෙන ———— මෙයින් අඥාකරණලදී.

වර්ෂ 19—ක්වූ ———— මස —— වෙනි දින මහනුවර
නාගරික සභාකන්තෝරුවේදීය.
භාරදුන් දිනය, වර්ෂ 19—ක්වූ ———— මස — වෙනි දිනදීය.

සභාපතිතැනගේ අණප්‍රකාර,
————
ලේකම්තැන වම්හ.

(3 වෙනි කාණ්ඩයේ 40 වෙනි අඥාපණත) "ඩී" අක්‍ෂරය දරණ සටහන.

| නොතාරිස්තැනගේ නම. | නොතාරිස්කම ලබන්ට බැඳීසිටින ලියන්නන්ගේ ගණන. | ලියන්නන්ගේ නම්. | බැඳෙන්ට යෙදුන දින. | බැඳීසිටින ලියන්නන් කොපමණකල් වැඩකරගෙණ එනවාද යන වග. |
|---|---|---|---|---|
| | | | | |

මේ සටහන පහළොස් දිනක් ඇතුලතදී පුරවා ආපසුඑවනලෙස ඉහත නම් පෙණෙන —— මෙයින් අඥාකරම්හ.

සභාපතිතැනගේ අණප්‍රකාර,

වර්ෂ 19 —— ක්වූ ———— මස —— වෙනි දින
මහනුවර නාගරිකසභා කන්තෝරුවේදීය. ————

————
ලේකම්තැන වම්හ.

(4 වෙනි කාණ්ඩයේ 65 වෙනි අඥාපණත) "ඊ" අක්‍ෂරය දරණ සටහන.

ප්‍රසිද්ධ වෙළඳම්පලේ කඩයකට දෙන අවසරපත්‍රය.

නොම්මරය ——

මේ අවසරපත්‍රයේ පිටපැත්තේ සඳහන්කරණලද නියෝගවලට යටහත්ව මසකට රුපියල් ——— කඩකුලී ගෙවමින් ප්‍රසිද්ධ වෙළඳම්පලේ නොම්මර —— දරණ කඩය ———— විකිණීම පිණිස පාවිච්චිකරන්ට ———— ———— මෙයින් අවසරදෙන්ට යෙදුනා ඇත.

නාගරිකසභාව කැමතිතාක් කල් මේ අවසරපත්‍රය වලංගුවන්නේය.

වර්ෂ 19 —— ක්වූ ———— මස —— වෙනි
දින මහනුවරදීය.

————
නාගරිකසභාවේ ලේකම්තැන.

අවසරපත්‍රය දෙනලද්දේ මේ නියෝගපිට වේ.

1. ඇප වශයෙන් රුපියල් ——— බැඳිය යුතුවේ; මේ නියෝග ප්‍රකාර කඩනුලි ගෙවන්ට නොයෙදු මෙකී මුදල අපසු නොගෙවනු ලැබේ.

2. මාස්පතා ගෙවියයුතු කඩකුලී නොකඩකොට කල්මත්තෙන් ගෙවිය යුතුවේ.

3. අවසරපත්‍රය අන්කෙනෙකුට පවරාදිය යුතුනොවේ.

4. 7 වෙනි කාණ්ඩයේ 18 වෙනි නගර ආඥාපණතට සහ 6 වෙනි කාණ්ඩයේ අඩංගුව තිබෙන වෙළඳ සම්බන්ධ රෙගුලාසි අණපනත්වලටත් එකඟව අවසරපත්‍රලත් අය ක්‍රියාකළ යුතුවේ.

මෙකී සෑම නියෝගයන්ට මම එකඟවෙමි.

වර්ෂ 19 —— ක්වූ ——— මස වෙනි
දින මහනුවරදීය.

———

———

අවසරපත්‍රය ලත් අයගේ අත්සන.

(7 වෙනි කාණ්ඩය, 91 වෙනි ආඥාපණත) "ඇෆ්" අක්ෂරය දරණ සටහන.

බලකඩඳසිය.

නොම්මරය ——

වර්ෂ 19 —— ක්වූ ——— මස ——. වෙනි
දින මහනුවරදීය.

මෙහි පහත විස්තර සලකුණු පෙණෙන සතා මරන්ට මේ සමග එන ——— ට බලය දෙන්ට යෙදුනාඇත :-

විස්තාර සලකුණු ———

පාට ———

වයස අවුරුදු —— මාස ——යි

දකුණු පැත්තේ හත් නිවරණ ———

වම්පැත්තේ හත් නිවරණ ———

වැඩිදුර තොරතුරු ———.

මාංශ වෙළෙන්දාගේ අත්සන ———

———

———

රජකාරියේ යෙදීසිටින පරීක්ෂකතැනගේ අත්සන.

(7 වෙනි කාණ්ඩය: 99 වෙනි ආඥාපණත.) "ජී" අක්ෂරය දරණ සටහන.

——— විසින් සෝදිසිකර පිළිගන්ට යෙදුන ගවයින් —— ක් අද දින ——— විසින් මරණලදුව (නොහොත් නාගරිකයෙන් පිටතදී මරන්ට යෙදුන ගවයින් —— කුගේ මාංශ පරීක්ෂාකෙරීම පිණිස ගෙනයනලදුව) ඔහු විසින් නොම්මර —— කරත්තයෙන් ගෙණෙන ඒ මාංශ නොම්මර —— දරණ කඩයට ඇතුළත්කලයුතුයි.

වර්ෂ 19 —— ක්වූ ——— මස ——
වෙනි දින මහනුවරදීය.

———

———

සතුන් මරණ මඩුව භාරකාරයා.

(7 වෙනි කාණ්ඩය; 102 වෙනි ආඥාපණත.) "එච්" අක්ෂරය දරණ සටහන.

වර්ෂ 19 —— ක්වූ ——— මස —— වෙනි දින ——— විසින්
පරීක්ෂාකරණලද ගවයින්ගේ ලෙඛනයයි.

| විස්තර සලකුණු. | පාට. | වයස. | හත්නිවරණ. | | මාංශ වෙළෙන්දාගේ නම. | වැඩිදුර තොරතුරු. |
|---|---|---|---|---|---|---|
| | | | දකුණු පැත්තේ. | වම පැත්තේ. | | |
| | | | | | | |

(9 වෙනි කාණ්ඩය; 114 වෙනි ආඥාපණත.) "අයි" අක්ෂරය දරණ සටහන.

බල්ලන් සම්බන්ධ නගර ආඥාපණතේ නියමකර තිබෙන ලෙඛනය.

ගෙයි නොම්මරය ———

වීදිය ———

ගෘහමූලිකයාගේනම ——

| ඇතුළුව සිටින බල්ලන්ගේ ගණන. | විස්තර. | | | | අයිතිකාරයාගේ නම. | ගෙවාප්ප දිනය. |
|---|---|---|---|---|---|---|
| | වර්ගය. | යෝනිය. | පාට. | වෙනත් කියයුතු කරුණු. | | |
| | | | | | | මාර්තු මස 31වෙනි දින හෝ ඊට ප්‍රථම. |

භාරදුන් දිනය ———
වර්ෂ 19 —— ක්වූ ——— මස ——
වෙනි දින මහනුවරදීය.

———

ගෘහමූලිකයාගේ අත්සන.

ඉහත පෙණෙන ලෙබනය සම්පූර්ණකර සතියක් ඇතුළතදී අපසු එවනලෙස ඉහත නම් පෙණෙන ගෘහමූලිකයාට මෙයින් නිෙමකරන්ට යෙදුනා ඇත. එසේකෙරීම පැහැරඅරින්නාවූ යම් කිසිවෙක් රුපියල් විස්සක දඩයකට යටහත්වන්නේය.

සභාපතිතැනගේ අනප්‍රකාර,

වර්ෂ 19 —— ක්වූ ———— මස —— වෙනි දින
මහනුවර නාගරිකසභා කන්තෝරුවේදීය.

———
ලේකම්තැන වම්හ.

---

(9 වෙනි කාණ්ඩය : 119 වෙනි ආඥාපණත.) "ජේ" අක්ෂරය දරණ සටහන.

බල්ලන් ලියාපදිංචිකිරීමේ සහතිකපත්‍රය.

පලාතේ නොම්මරය ——— ලියාපදිංචිකිරීමේ නොම්මරය ———

මෙහි පහත සඳන් විස්තර ඇති බල්ලෙක් (නොහොත් එකෙකුට වැඩිනම්, බල්ලන් ———— ගෙදර පදිංචි ———— විසින් මෙම කන්තෝරුවේ ලියාපදිංචිකර ඒ පිණිස ගෙවියයුතු රුපියල් —— ගාසතුව ගෙවන්ට යෙදුන බව මෙයින් සහතිකකළා ඇත.

බල්ලන්ගේ විස්තර.

වර්ගය ————
යෝනිය ————
පාට ————

මෙම සහතිකපත්‍රය වර්ෂ 19 —— ක්වූ මාර්තු මස 31 වෙනි දින වනතුරු වලංගුවන්නේය.

වර්ෂ 19 —— ක්වූ ———— මස —— වෙනි දින
මහනුවර නාගරිකසභා කන්තෝරුවේදීය.

———
ලේකම්තැන වම්හ.

---

(11 වෙනි කාණ්ඩය: 125 වෙනි ආඥාපණත.) "කේ" අක්ෂරය දරණ සටහන.

———————— යේ ———————— ගබඩාකෙරීමට ———————— ට අවසරදෙන්ට යෙදුනා ඇත.

මේ අවසරපත්‍රය වර්ෂ 19 —— ක්වූ දෙසැම්බර් මස 31 වෙනි දින වනතුරු වලංගුවන්නේය.

සභාපතිතැනගේ අන ප්‍රකාර,

වර්ෂ 19 —— ක්වූ ———— මස —— වෙනි දින
මහනුවර නාගරිකසභා කන්තෝරුවේදීය

———
ලේකම්තැන වම්හ.

---

(12 වෙනි කාණ්ඩය: 157 වෙනි ආඥාපණත) "ඇල්" අක්ෂරය දරණ සටහන.

1. ———— වීථියේ නොම්මර ———— දරණ ඉඩමට ගෙදර පාවිච්චියට ඇර වෙන වැඩට මීම්මක් ඇතුව වතුර සැපයීම පිණිස (මෙහි පහත අයිතිකාරයායයි කියනු ලබන) ———— එක් පක්ෂයකට සහ මහනුවර නාගරික සභාව වෙනුවෙන් එම සභාවේ සභාපතිතැන්පත් (මෙහි පහත සභාපතිතැනයයි කියනු ලබන) ———— අනිත් පක්ෂයටද බැඳී ඒ දෙපක්ෂය අතරවූ පොරොන්දුවයි.

2. ඉහතකී ඉඩමට ගෙදර පාවිච්චියට ඇර වෙන වැඩට වතුර සපයනු ලැබීම සඳහා පහත සඳහන් පොරොනු පිළිපදින්ට ඒ ඉඩමේ අයිතිකාරයා මෙයින් එකගව බැඳෙනලදී.

(ඒ) අගල් ———— ක මීම්මෙන් වතුර සපයනු ලැබීම.

(බී) ඒ මීම්මේ බදු පිණිස මහනුවර නාගරික සභාවට කාර්තුවකට නොහොත් තුන්මසකට නොහොත් ඉන් යම් කොටසකට කල්මත්තෙන් රුපියල් ———— ඒ අයිතිකාරයා විසින් ගෙවීම නැතහොත් ගෙවන්ට සැලැස්වීම.

(සී) එක එක මාසයක් තුළ ඒ ඉඩමට සපයනලද වතුරට ගැලොම් දාහකට රුපියල් ———— බැගින් ඒ අයිතිකාරයා විසින් මහනුවර නාගරික සභාවට ගෙවීම නොහොත් ගෙවන්ට සැලැස්වීම. මින් පළමුවෙනි ගෙවීම වර්ෂ 19—ක්වූ ———— මස පළමුවෙනි දිනදී ගෙවිය යුතුවේ.

3. මීම්ම සඳහා ගෙවියයුතු බද්ද නොහොත් මීම්මේ ගාසතුව ගෙවන්ට නියම දින පටන් පහළොස් දවසක් ඇතුළත නොගෙව්වේවිනම් වෙන්වශයේ වතුර සපයනුලැබීමට ඇති හිමිකම නැතිවන්නේය; තවද නාගරික සභාව විසින් ඒ වතුර සැපයීමද නවත්වනු ලැබේ.

4. වර්ෂ 1896 නොවැම්බර 19 ව්‍යවස්ථාව හා සම්බන්ධවූ මෙහි 12 වෙනි කාණ්ඩයේ නියෝග නොහොත් ඒ වෙනුවට පනවනලද නගර ආඥාපණත් මේ පොරොන්දුවේ කොටසක් මෙන් ගණන්ගනුලැබ මෙහි දෙපක්ෂයම ඊට යටහත් වන්නේය.

5. එක් පක්ෂයක් මේ පොරොන්දුව අවලංගුකරන්ට අදහස්කරගෙණ සිටින බව හත්දවසක් කල්පෙරතුරෙන් අනිත් පක්ෂයට දැනුම්දී එසේ මේ පොරොන්දුව අවලංගුකළ හැකිවේ. එසේ මේ පොරොන්දුව අවලංගුකළහොත් එකී ඉඩමේ අයිතිකාරයාටවත් පදිංචිකාරයාටවත් අමුතු පොරොන්දුවකට බැඳෙනතුරු වෙන් වශයේ වතුර සැපයීම් ලැබීමේ ප්‍රයෝජන විඳීමට බලය නැතිවේ.

**(12 වෙනි කාණ්ඩය, 161 වෙනි ආඥාපණත.) "ඇම" අක්ෂරය දරණ සටහන.**

**මහනුවර නාගරික සභාව.**

නොම්මරය ————

නොම්මර ——— දරණ ඉඩමේ පදිංචිකාරයා නමටයි.

| සම්බන්ධ නොම්මරය. | වතුරවල ගණන. | |
|---|---|---|
| | | ගැලොම්. |
| | වර්ෂ 19—ක්වූ ——— මස — වෙනි දින පරීක්ෂාකෙරීම ——— | |
| | වර්ෂ 19—ක්වූ ——— මස — වෙනි දින පරීක්ෂාකෙරීම ——— | |
| | වියදම්වූ ගැලොම් ගණන | |
| | අතර ගණන ——— | |
| | වර්ෂ 19—ක්වූ ——— මස ——— වෙනි දිනදීය. | අත්සන ——— |

**(12 වෙනි කාණ්ඩය; 164 සහ 165 වෙනි ආඥාපණත්.) "ඇන්" අක්ෂරය දරණ සටහන.**

**මහනුවර නාගරිකසභාව.**

නොම්මරය ———

වර්ෂ 19 —— ක්වූ ———— මස —— වෙනි දින
නාගරිකසභා කන්තෝරුවේදීය.

—— ———විජිතයේ නොම්මර ——— දරණ ඉඩමේ ———— මහතඇති නොම්මර ———— මීටරයේ ප්‍රකාර ———— ඇතුළත වියදම්වූ වතුරේ ගණන් පත්‍රයයි.

| | | |
|---|---|---|
| වර්ෂ 19——ක්වූ ——— මස —— වෙනි දින මීටරය පරීක්ෂාකෙරීම | ගැලොන් | |
| වර්ෂ 19——ක්වූ ——— මස —— වෙනි දින මීටරය පරීක්ෂාකෙරීම | එම | |
| | | |
| වියදම්වූ වතුරේ ප්‍රමාණය | ගැලොන් | |
| නොමිලයේදෙන වතුරේ ප්‍රමාණය | එම | |
| | | |
| වැඩිපුර වියදම්වූ ප්‍රමාණය | ගැලොන් | |
| | | |
| මීටරය පාවිච්චිය සඳහා නෙවියයුතු ගාස්තුව ... ... | රුපියල් | |
| වැඩිපුර වියදම්වූ ගැලොන් 2,000කට ——— බැගින් ... ... | " | |
| ඉහත සාදුන් ගණන ... ... ... | " | |
| | රුපියල් | |

ම. නා. ස. ගණන් භාරකාරතැන.

වර්ෂ 19——ක්වූ ——— මස වෙනි —— දින
මුදල් බාරගත්තා ඇත.

ම. නා. ස. ලේකම්තැන.

**(13 වෙනි කාණ්ඩය; 189වෙනි ආඥාපණත). "ඕ" අක්ෂරය දරණ සටහන.**

**අවසර පත්‍රය.**

වැසිකිළි ශුද්ධකරන්නන් සම්බන්ධව සාදා පනවනලද සියලුම අනපනත්, නියෝග සහ නගර ආඥාපනත් අනුව පිළිපදිමින් මහනුවර නාගරික සීමාව ඇතුළත වැසිකිළි ශුද්ධකරන්නෙක් හෙවත් රාත්‍රිගතව වැසිකිළි මෙහෙයන් නෙක් හැටියට වැඩකෙරීමට ——— පදිංචි ————— ට නාගරික සභාපතිතැන විසින් අවසරදෙන්ට යෙදුනා ඇත.

මේ අවසරපත්‍රයේ ලත් අය විසින් මෙහි කියනලද යම් අනපනත් නියෝගාදියක් කඩකළවිට මෙය අවලංගුකෙරීමට යටහත්ව තිබේ.

සභාපතිතැනගේ අනප්‍රකාර.

වර්ෂ 19 —— ක්වූ ——— මස —— වෙනි දින
මහනුවර නාගරිකසභා කන්තෝරුවේදීය.

ලේකම්තැන වමින.

**ඉහතකී අනපනත් සහ නියෝග.**

1. මේ අවසරපත්‍රය ලත් අයව වැඩට පත්කරගන්නාවූ සැමදෙනාගෙන්ම කලින්කල නාගරික සභාපතිතැන විසින් නියමකරන්ට යෙදෙන ගණන්වල ප්‍රකාර ගාස්තු අයකෙරීමට ඒ අයට බලය ඇත්තේය.

2. මේ අවසරපත්‍රය ලත් අය තමන් වැඩට පනවනලද සියලුම වැසිකිළි රාත්‍රි 10ටත් පාන්දර 3ටත් අතර කාලයේදී හිස්කොට ශුද්ධකළ යුතුවේ; තවද නාගරිකසභාව විසින් පහසු මිළගණනකට සපයන්ට යෙදෙන දුර්ගන්ධය නසන බෙහෙත් ද්‍රව්‍ය ඒ වැඩකෙරීමේදී පාවිච්චිකළ යුතුවාත් ඇර එබදු වැසිකිළිවලින් ඉවත්කරනලද අශුචි ආදිය නාගරික සභාව විසින් සුදුසුයයි ඒත්තුගතහැකි සර නවල පමණක් වළලා හරිආකාර උඩින්වසා දැමියයුතුද වේ.